විශ්වාසය සහ සහභාගිත්වය

INSURANCE
BOARD OF SRI LANKA

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
වාර්ෂික වාර්තාව 2015

පටුන

වසරේ වැදගත් සිදුවීම් 4
සභාපතිතුමියගේ පණිවිඩය 6
අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය 10
මණ්ඩලයේ සාමාජිකයින් 14
මණ්ඩල සාමාජිකයින් පිළිබඳව 15
ජ්‍යේෂ්ඨ කළමනාකරණ කණ්ඩායම 17
කාර්ය මණ්ඩලය 18
සමාලෝචන
- පොදු සමාලෝචනය 22
- සංඛ්‍යානමය සමාලෝචනය 28
- මෙහෙයුම් කටයුතු සමාලෝචනය
  - අධීක්ෂණ සමලෝචනය 60
  - නියාමන සමාලෝචනය 64
  - විමර්ශන සමාලෝචනය 67
  - වෙළඳපොළ සංවර්ධනය සහ බාහිර සබඳතා සමාලෝචනය 70
  - පරිපාලනමය සමාලෝචනය 72
  - මූල්‍ය සමාලෝචනය 73

මූල්‍ය තොරතුරු
- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 76
- මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය 77
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 78
- රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 79
- ගිණුම්කරණ ප්‍රතිපත්ති 80
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 82

විගණකාධිපති වාර්තාව 89
විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම 94
පරිශිෂ්ඨය I 104
පරිශිෂ්ඨය II 105
පාරිභාෂික ශබ්ද මාලාව 107

විශ්වාසය සහ සහභාගිත්වය

වෙනස්වන දේශපාලනික සහ ආර්ථික රාමුවක් තුළ, පසුගිය වසර කිහිපය පුරා සකස්කරන ලද ස්ථිර ප්‍රතිපත්ති තීරණ සහ ක්‍රියාවලි මාලාවක ජයග්‍රහනයන් පසුගිය මූල්‍ය වසරේදී අපට භුක්ති විඳීමට හැකිවිය.

අනුවර්තනය, වෙන්කිරීම සහ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියන් හේතුකොට ගෙන, රක්ෂණ කර්මාන්තය ඉහළ පරිනත මට්ටමකට ලඟාවිය. අවදානම් පදනම් අධීක්ෂක (RBC) වැඩ පිලිවෙලට අනුගතවීම සඳහා අවශ්‍ය අවසන් කාර්යයන් කිරීමට සමාගම් යොමු වූ අතර බොහෝ සමාගම් ඔවුන්ගේ සංයුක්ත රක්ෂණ ව්‍යාපාරය වෙනම නීතිමය ආයතන දෙකකට වෙන්කිරීමත් සමග මෙම වසර වෙන්කිරීමේ ක්‍රියාවලියේ අවසාන අදියරන් කරා යොමුවීම පෙන්නුම් කරන ලදී.

සාමාන්‍ය ව්‍යාපාර රක්ෂණ සමාගම් දෙකක් ඔවුන්ගේ මෙහෙයුම් ඒකාබද්ධ කිරීමට අනුමැතිය ඉල්ලන ලද අතර ඒ සමග දේශිය රක්ෂණ කර්මාන්තයේ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියද ආරම්භ විය.

විශ්වාසය සහ සහභාගිත්වයේ ශක්තිමක් පදනමක් සමග, 2015 වසර තුළ රක්ෂණ මණ්ඩලය විසින් සම්පාදනය කරනු ලබන ප්‍රතිපත්ති ඔප්පුහිමියන් ආරක්ෂා කිරීම සඳහා මෙන්ම රක්ෂණ කර්මාන්තයට ප්‍රතිලාභ අත්කරදීම තහවුරු කිරීමේ අරමුණින්ද රක්ෂණ මණ්ඩලය කර්මාන්තයේ පාර්ශවකරුවන් සමග නිරන්තරයෙන්ම සාකච්ඡාමය ක්‍රියාවලියක නිරතවිය.

දැක්ම

ආසියාවේ රක්ෂණ නියාමනයේ මිනුම් ලකුණ බවට පත්වීම.

මෙහෙවර

රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ අභිවෘද්ධිය සඳහා පහසුකම් සැලසීම සිදුකරලමින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත සුරැකීම.

වසරේ වැදගත් සිදුවීම්

- රක්ෂණ සමාගම් 30ක්
- රක්ෂණ තැරැව්කාර සමාගම් 57ක්
- රක්ෂණ නියෝජිතයින් 45,429ක්
- ග්‍රාම නිලධාරී කොට්ඨාස 866ක් වෙත ලබා දුන් රක්ෂණ දැනුවත්භාවය

රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

	2015	2014	වෙනස %
දළ ලිඛිත වාරික ආදායම (රු. බිලියන)	122	105	16.12
මුළු වත්කම් (රු. බිලියන)	465	421	10.33
දළ දේශීය නිෂ්පාදනයේ % ලෙස ව්‍යාප්තිය	1.09	1.01	8.49
රක්ෂණ ඝනත්වය (රු.)	5,838	5,074	15.04

රක්ෂණ මණ්ඩලයේ කාර්යසාධනය

	2015	2014	වෙනස %
ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදල (රු. බිලියන)	2.64	2.18	21
සෙස් ආදායම (රු. මිලියන)	321.75	273.91	17
වාර්ෂික ගාස්තුව (රු. මිලියන)	103.81	73.44	41

රු. බිලියන 465
රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්

රු. බිලියන 122
රක්ෂණ කර්මාන්තයේ ද.ලි.වා.ආ.

කළමනාකරණ තොරතුරු

“නියාමකයෙකුහට එහි සැබෑ ස්වභාවයෙන්ම තමන් නියාමනය කරන ආයතන නීතියට අනුකූල වන්නේදැයි සොයා බැලීම පැවරී තිබුණද, එම නියාමනය කරනු ලබන කර්මාන්තයේ ඇත්ත ඇති සැටියෙන් සැබෑ ලෝකයේ පළපුරුද්ද අනුව මිස හුදකලාව එය නොකළ යුතු බව මම සැමවිටම විශ්වාස කරමි.”

සභාපතිතුමියගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික පරිසරයෙහි වැදගත් වෙනස්වීම් සිදුවූ 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අප ඉදිරිපත් කරනුයේ සතුටිනි. වසර ආරම්භයේ පැවැත්වූ ජනාධිපතිවරණයත්, ඉන්පසුව පවත්වන ලද මහ මැතිවරණයත් හේතුකොට ගෙන වෙනස් වූ දේශපාලන වාතාවරණය අනුව, රටේ අනාගතය වෙනුවෙන් සකස්වන ආර්ථික ප්‍රතිපත්තීන් මත මූල්‍ය වෙළඳපල බලාපොරොත්තු තබා සිටි අතර ඒ අනුව මෙම වසර තුළ වෙනස්වීම් හා පරිවර්තනද රාශියක් සිදුවූ බව කිවහැක.

2015 වර්ෂය තුළ සංයුක්ත රක්ෂණ සමාගම් ජීවිත හා ජීවිත නොවන ව්‍යාපාර වශයෙන් වෙන් වෙන්ව පවත්වාගෙන යාමේ නීතිමය අවශ්‍යතාවය අනුව බොහෝ රක්ෂණ සමාගම් ඒ අනුව කටයුතු කරන ලද අතර සංයුක්ත සමාගම් ව්‍යාපාර දෙකකට වෙන්කිරීමේ ක්‍රියාවලියේ අවසාන අදියරට මෙම වසර තුළ එළඹීමට හැකිවන ලදී.

රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් මත පනවනු ලැබූ සහ සමස්ථ රක්ෂණ කර්මාන්තයේ යහපත පිණිස සිදුකල මෙම රක්ෂණ ව්‍යාපාර වෙන්කිරීමේ ක්‍රියාවලිය සියලුම රක්ෂණ සමාගම් විසින් සිය කැමැත්තෙන් සහ අධිෂ්ඨානයෙන් සිදුකිරීම අපට ඉමහත් සතුටකි. මෙතෙක් මෙකී ව්‍යාපාර වෙන්කිරීමේ ක්‍රියාවලියට අනුකූල නොවූ සමාගම් කීපය හට තමනට ආවේණික වූ හේතු නිසා එම ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකි වුවද රටේ පවත්නා නීතිය කිසිදු බාහිර ප්‍රතිෂ්ඨාවන් පිළිබඳ සැලකීමකින් තොරව සියලු දෙනාටම එක සමානව බලපාන බැවින් නුදුරු අනාගතයේදීම එම සමාගම් කීපයද එම කාර්යය අවසන් කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මෙවැනි පරිසරයක් තුළ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූලික පරමාර්ථ වන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සලසන අතරම ඔප්පුහිමියන් ආරක්ෂා කිරීම සහ අපගේ මෙහෙවර ප්‍රකාශය සපුරාලීම මගින් ශ්‍රී ලංකාවෙහි තිරසාර රක්ෂණ කර්මාන්තයක් නිර්මාණය කිරීම සඳහා රක්ෂණ මණ්ඩලය කැපවී සිටී.

කාර්ය සාධනය

2015 වසර තුල රක්ෂණ කර්මාන්තය ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර තුළින් රුපියල් මිලියන 122,390 ක සමස්ථ දළ ලිඛිත වාරික ආදායමක් ලබමින් පෙර වසරට වඩා 16.12% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. එය රුපියල් මිලියන 16,992 ක වැඩිවීමකි. 2014 දී වාර්තා කළ 5.44% ට සාපේක්ෂව මෙය සැලකිය යුතු වර්ධනයකි. ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් දෙකම මෙම වර්ෂය තුළ සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කර ඇති බවද කිව හැක.

එසේ වුවද, රක්ෂණ සමාගම් වල මුළු වත්කම් ප්‍රමාණය සලකා බැලීමේදී ජීවිත රක්ෂණ ව්‍යාපාර අංශයේ 23.81% ක වර්ධනයක් පෙන්නුම් කලද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශය 2014 වසරට සාපේක්ෂව 9.75% ක පහත වැටීමක් වාර්තා කර ඇත. 2015 වසරෙහිදී ක්‍රියාත්මක කරන ලද සංයුක්ත සමාගම් වෙන්කිරීම (Segregation) නිසා එකී සමාගම්වල වත්කම් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අතර බෙදීයාම මෙම පහත වැටීමට හේතුවක් විය හැක.

ජයග්‍රහණ

''අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) මොඩලය'' භාවිතාකිරීමේ ක්‍රියාවලියේ අවසන් අදියර කීපය 2015 වර්ෂය තුළ නිමකිරීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි. 2014 වර්ෂයේදී ආරම්භ කොට 2015 වර්ෂය අවසානය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කළ පැරණි ක්‍රමය සහ නව ක්‍රමය සමාන්තරව ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය (Parallel Run) රක්ෂණ සමාගම් වලට නව අවදානම් පාදක ප්‍රාග්ධන නියමයන් යටතේ අවශ්‍ය කරුණු පිළිබඳව යහපත් අවබෝධයක් ලබාදුන් අතර, යම් සමාගමක් එක් නුඹුන්වත් ක්‍රමයකින් වෙනත් ක්‍රමයකට මාරුවීමේදී ස්වභාවයෙන්ම ඇතිවිය හැකි ගැටළු රාශියක් හඳුනාගැනීමටත් ඒවාට විසඳුම් ලබාගැනීමටත් සහාය විය.

2016 හි සිට ඉදිරියට අවදානම් පාදක ප්‍රාග්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම තුළින් අප මණ්ඩලයට සහ රක්ෂකයන්ට ගැටළු රැසකට මුහුණ දීමට ඉඩ ඇත. එහෙත් මෙතෙක් ලබාගෙන ඇති අත්දැකීම් සහ පලපුරුද්ද අනුව ඉදිරි වසර කිහිපයේදී අපට සාර්ථකව මෙම ගැටළු විසඳීමට හැකියාව ලැබෙනු බවට සැකයක් නොමැත.

රක්ෂණ කර්මාන්තය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සහ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයේ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කරමින් සහයෝගීව සහ සම්පව මෙම වසර පුරාවටම කටයුතු කිරීම විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි. නියාමකයෙකුහට එහි සැබෑ ස්වභාවයෙන්ම තමන් නියාමනය කරන ආයතන නීතියට අනුකූල වන්නේදැයි සොයා බැලීම පැවරී තිබුණද, එම නියාමනය කරනු ලබන කර්මාන්තයේ ඇත්ත ඇති සැටියෙන් සැබෑ ලෝකයේ පළපුරුද්ද අනුව මිස හුදකලාව එය නොකළ යුතු බව මම සැමවිටම විශ්වාස කරමි.

මේ අනුව 2015 වසර තුළ රක්ෂණ මණ්ඩලය විසින් සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති, ඔප්පුහිමියන් ආරක්ෂා කිරීම සඳහා මෙන්ම රක්ෂණ කර්මාන්තයට ප්‍රතිලාභ අත්කරදීම තහවුරු කිරීමේ අරමුණින්ද රක්ෂණ මණ්ඩලය කර්මාන්තයේ පාර්ශවකරුවන් සමග නිරන්තරයෙන්ම සාකච්ඡාමය ක්‍රියාවලියක නිරතවිය.

සහයෝගීව කටයුතු කිරීම, රක්ෂණ මණ්ඩලය විසින් මෙකී වසර තුළ අත්කරගන්නා ලද තවත් ජයග්‍රහණයකට ප්‍රධාන සාධකයක් විය. එනම් ''රක්ෂණ නියාමනයෙහි වෙනස්වන හැඩතල'' යන තේමාව යටතේ 2015 ජූලි මස කොළඹදී පැවැත්වූ රක්ෂණ නියාමකයන්ගේ ආසියානු සම්මේලනයයි (Asian Forum of Insurance Regulators). මෙම අන්තර්ජාතික සම්මේලනය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පූර්ණ අනුග්‍රහය යටතේ සාර්ථකව පවත්වන ලද අතර ඒ සඳහා චීනය, තායිවානය, ජපානය, හොංකොං, ඉන්දියාව, මැකාවු, මාලදිවයින, පැපුවා නිව්ගිනියාව, පිලිපීනය, කොරියාව, සිංගප්පූරුව, තායිලන්තය සහ මැලේසියාව ඇතුළු ආසියාවේ රක්ෂණ නියාමකයන් සහභාගී වූ අතර රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ (International Association of Insurance Supervisors) මහලේකම්, ආර්ථික, සහයෝගීතාව සහ සංවර්ධනය සංගමය (Organization for Economic Cooperation and Development), ආසියානු සංවර්ධන බැංකුව (Asian Development Bank) සහ සැමට රක්ෂණයට ප්‍රවේශය (A2ii) යන සංවිධාන වල ජාත්‍යන්තර නියෝජිතයින්ද සහභාගී වූහ. මෙකී ජාත්‍යන්තර සම්මේලනය ඉතා සාර්ථක වූ අතර රක්ෂණ නියාමකයින්ගේ ආසියානු සංසදයේ ඉදිරි ගමන් මාර්ගය පිළිබඳව සහ චීනයේ බීජිං නුවර ස්ථිර මහ ලේකම් කාර්යාලයක් පිහිටුවීමේ යෝජනාවක්ද සමග එය නිමාවට පත්විය. මෙහිදී එක් එක් සාමාජික රටවල ප්‍රයෝජනය සඳහා සාකච්ඡා පත්‍රිකා සකස්කිරීමට කාර්ය සාධක බලකායක් පත්කරගන්නා ලද අතර ශ්‍රී ලංකාවද එහි සාමාජිකයෙක් බවට පත්කරගන්නා ලදී.

2015 වසර තුළ සාමාන්‍ය ව්‍යාපාර රක්ෂණ සමාගම් 2ක් ඔවුන්ගේ මෙහෙයුම් ඒකාබද්ධ කිරීමට අනුමැතිය ඉල්ලන ලද අතර ඒ සමග දේශීය රක්ෂණ කර්මාන්තයේ සමාගම් ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියද ආරම්භ විය.

සභාපතිතුමියගේ පණිවිඩය

දියුණු රටවල් හා සාපේක්ෂව කුඩා ආර්ථිකයක් හිමිවී ඇති ශ්‍රී ලංකාව වැනි රටකට ඒකාබද්ධ කිරීම් හා අත්පත්කර ගැනීම තුළින් එම සමාගම් විසින් සිය ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමේදී සහ රක්ෂණ ව්‍යාප්තිය වර්ධනය කිරීමේදී මෙහෙයුම් කාර්යක්ෂමතා සහ වඩා ශක්තිමත් ශේෂ පත්‍රයන්ගෙන් පරිපූර්ණ දේශීය රක්ෂණ කර්මාන්තයක් ඇතිකිරීමට හැකිවනු ඇත.

ඉදිරි ගමන්මග

සාමාන්‍ය ජනතාව තුල රක්ෂණය පිළිබඳව පූර්ණ අවබෝධයක් නොමැතිකම හා රක්ෂණ ව්‍යාප්තිය අවම මට්ටමක පැවතීම, රක්ෂණ කර්මාන්තය මුහුණපාන ප්‍රධාන ගැටළුවලින් එකක් ලෙස තවදුරටත් පවතී. දළ දේශීය නිෂ්පාදනයේ වැඩිවීමට අනුරූපව ශ්‍රී ලංකාව මැදි ආදායම් රටක් බවට පරිවර්තනය වෙමින් පවතී. මේ අනුව රටෙහි මූල්‍ය අංශයෙහි වැදගත් අංගයක් වන රක්ෂණ ක්ෂේත්‍රය අනාගතයේදී අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට ශක්තිමත් වීම අනිවාර්‍යයෙන්ම සිදුවිය යුතුය.

මෙතෙක් කලක් ප්‍රයෝජනයට නොගත් ප්‍රජාවන්ගේ හැකියාවෙන් ප්‍රයෝජන ලබාගැනීමට නම් ඔවුන් මූල්‍ය නිෂ්පාදන හා සේවාවන්හි සක්‍රීයව යොදාගැනීම සහ සෘජුව සම්බන්ධ කරගැනීම අත්‍යවශ්‍යය. එබැවින් රක්ෂණ කර්මාන්තය, එහි හැකියාවන් නැවත තක්සේරු කොට, රක්ෂණ ව්‍යාප්තිය වර්ධනය කිරීම සඳහා වැඩි අවධානයක් යොමුකරනු ඇතැයි මම විශ්වාස කරමි. විශේෂයෙන් මේ දක්වා ඉතාම අඩුවෙන් සේවා ලබන, එමෙන්ම සිය අවශ්‍යතාවන් පිරිමැසිය හැකි වඩා යෝග්‍ය මූල්‍ය නිෂ්පාදනයන් (රක්ෂණ ක්‍රමයන්) අපේක්ෂා කරන, ග්‍රාමීය හා නාගරික දිළිඳු අංශයන්හි ජනතාව අතර රක්ෂණ ව්‍යාප්තිය වැඩි කිරීමට රක්ෂණ කර්මාන්තයට තවත් බොහෝ දේ සිදුකිරීමට ඇත. අඩු ආදායම්ලාභී කණ්ඩායම් වැඩි වශයෙන් උනන්දුවක් දක්වනුයේ තමන්ගේ අවශ්‍යතා සපුරාලන, සිය පෞද්ගලික ගැටළු වලට විසඳුමක් ලැබෙන එමෙන්ම අංග සම්පූර්ණ සේවාවක් ලබාදෙන පහසුවෙන් ලබාගතහැකි රක්ෂණ නිෂ්පාදන (රක්ෂණ ක්‍රමයන්) කෙරෙහිය. මේ පිළිබඳව අප සැමගේ අවධානය යොමුවීම වැදගත්ය.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, ලෝක බැංකුවේ සහයෝගය සහිතව 2016 වසර තුළදී ක්ෂුද්‍ර රක්ෂණ (Micro Insurance) අංශය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘතියක් දියත්කරනු ඇත. ගෝලීය වශයෙන් පිළිගත් රක්ෂණ ප්‍රමිතීන් පදනම් කොටගෙන ක්ෂුද්‍ර රක්ෂණ අංශය සඳහා විශේෂිත වූ නියාමන වැඩ පිළිවෙලක් සම්පාදනය කිරීමට අපි අපේක්ෂා කරන්නෙමු.

ඇගයීම

අවසාන වශයෙන්, මණ්ඩලයේ මිත්‍ර සාමාජිකයින් විසින් දක්වන ලද නිර්ලෝභී සහයෝගය සහ වටිනා දායකත්වය වෙනුවෙන් මගේ අගයකිරීම සටහන් කිරීමට මම කැමැත්තෙමි. රක්ෂණ කර්මාන්තයට බලපාන විවිධ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා කිරීමේදී සහ ඒවා තීරණය කිරීමේදී ඔවුන්ගේ සක්‍රීය සහභාගීත්වය නියාමකගේ ඉහලම ශක්තියකි.

එමෙන්ම, රක්ෂණ ඔම්බුඩ්ස්මන්, ශ්‍රී ලංකා රක්ෂකයින්ගේ සංගමය, ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ඇතුළු සියලූම රක්ෂණ පාර්ශවකරුවන් ඔවුන් අප සමග පවත්වාගෙන යන විශාල සහයෝගීත්වය සහ සමීප සම්බන්ධතාවය වෙනුවෙන් ස්තූතිය පළකරමි.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරමාර්ථයන් මුදුන්පත් කරගැනීමේදී, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරු සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ කැපවීම සහ උනන්දුව බෙහෙවින් අගය කිරීමට මම කැමැත්තෙමි. ඉදිරි වසර කිහිපය තුළ එම කණ්ඩායම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මෙහෙවර සහ දැක්ම ඉටුකරමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ උපායමාර්ගයන් තවදුරටත් ක්‍රියාත්මක කරනු ඇති බවට මම සුභවාදීව විශ්වාස කරමි.



ඉන්ද්‍රාණි සුගතදාස
සභාපතිනිය

2015 ජූනි 21 දින.

“ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචනය කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍රයන් කිහිපයක් මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අතර 2015 වසරේදී ලෝක බැංකුව විසින් පවත්වනු ලැබූ ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය ක්ෂේත්‍රය තක්සේරු කිරීමේ වැඩසටහන (FSAP) සංවර්ධනය කිරීමේ මොඩියුලයෙන් කිහිපයක් ඉදිරිපත් විය.”

අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය

රක්ෂණ මණ්ඩලයේ 2015 වසරේ කාර්යසාධනය පිළිබඳ වාර්තා කිරීමට ලැබීම මට ඉමහත් සතුටකි. ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තයේ ඉතිහාසය තුළ සැලකිය යුතු වෙනස්වීම් නිශ්චිතවම සිදු කරනු ලැබූ 2015 වසර අභියෝගාත්මක සහ සර්ව ශුභවාදි වසරක් විය. සංයුක්ත රක්ෂණ සමාගම් වෙන් කිරීම ඒවායින් එකක් වූ අතර, එය සැබෑවක් බවට පත්කිරීම සඳහා කර්මාන්තය සහ මණ්ඩලය ස්ථාවර සහ අවංක උත්සාහයන් ගනු ලැබීය. ව්‍යාපාරය තුළ විනිවිදභාවය සහ පාලනයෙහි, වඩාත් ඉහළ මට්ටමක් පෙන්නුම් කරමින්, සංයුක්ත රක්ෂණ සමාගම් 12න්, සමාගම් 9ක් සිය ජීවිත සහ සාමාන්‍ය යන රක්ෂණ ව්‍යාපාර සමාගම් දෙකකට වෙන් කරන ලදි.

කර්මාන්තය ආශ්‍රිත අවදානම හැඟවීම සඳහා කර්මාන්තයට හඳුන්වා දුන් ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණයන් අනෙකුත් සුවිශේෂී පෙරළිය විය. මුලින් හඳුන්වා දුන් සරල රීති පදනම් ප්‍රාග්ධන ආකෘතියක සිට, ජාත්‍යන්තර ප්‍රවනතාවන්ට සරිලන පරිදි නවීන රීති පදනම් ප්‍රාග්ධන ආකෘතියකට කර්මාන්තය සම්ප්‍රාප්ත විය. වසර ගණනාවක් විවිධ මට්ටම් ඔස්සේ පැවැත්වූ පරීක්ෂණ වලින් පසු, මෙම ප්‍රාග්ධන ප්‍රතිසංස්කරණය හඳුන්වා දුන් අතර, කර්මාන්තය එම ක්‍රියාවලියේ අඛණ්ඩ කොටස්කරුවෙක් විය. විදේශීය මූලාශ්‍රයන්ගෙන් තාක්ෂණික සහය සහ හැකියා වර්ධනය අපි ලබාගනු ලැබූවද, ප්‍රමාද නොවී ක්‍රියාත්මක කිරීම සඳහා රීති සකස් කිරීමේ අවසාන වටය අභියෝගයක් විය. බාධක කිහිපයක් තිබුනද, නියමිත වේලාවට ඉලක්ක සපුරාගැනීම සඳහා අභියෝග අතරින් මෙහෙයවීමට අපිට හැකි විය. ඉදිරි වසර කිහිපය තුළ කර්මාන්තයෙහි අවදානම පදනම් අධීක්ෂණ වැඩ පිළිවෙල සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමටද අපි උත්සුක වන අතර, මේ සම්බන්ධයෙන් ක්‍රමානුකූල ආකාරයකින් පාලන තන්ත්‍රය සකස් කිරීම සඳහා මණ්ඩලය කටයුතු කරගෙන යයි.

නියාමන සහ අධීක්ෂණ ප්‍රතිසංස්කරණ

වසර තුළදි සිදුකළ ඉහත කී ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් සමඟ, රක්ෂණ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් අනෙකුත් සමහර නියාමන ප්‍රතිසංස්කරණ ආරම්භ කරන ලදී. එම මූලාරම්භයන් සියල්ලම කර්මාන්තයට ඉතා සමීප සහ මිත්‍රශීලි උපදේශන ක්‍රියාවලින් විය. එකී ප්‍රතිසංස්කරණ තුළින් කර්මාන්තයට අදාළ වන්නා වූ පාරිභෝගික ආරක්ෂාව සහ පාලනය ආශ්‍රිත කරුණු වර්ධනය කිරීම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරන ලදී. එකී කාර්යයන්ගෙන් සමහරක් අවසන් කොට ඇති අතර, අනෙක් කරුණු සම්බන්ධයෙන් පොදු එකඟතාවයකට පැමිණීම සඳහා කර්මාන්තය සමඟ සාකච්ඡා පවත්වමින් සිටිමු. රක්ෂණ විමර්ශකයින්ගේ හැසිරීම පිළිබඳ මාර්ගෝපදේශ, රක්ෂකයින් සහ තැරැව්කරුවන් විසින් පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ, රක්ෂණ නියෝජිතයින් වෙනුවෙන් පවත්වන විමර්ශන සඳහා මාර්ගෝපදේශ, නියෝජිතයින් සඳහා ආචාර ධර්ම සංග්‍රහය, රක්ෂකයින් සඳහා ආයෝජන මාර්ගෝපදේශ, රක්ෂකයින් සහ තැරැව්කාර ප්‍රධාන නිලධාරීන්ගේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ, මණ්ඩලය විසින් ලියාපදිංචි ගතකල සමාගම් විසින් නිකුත් කරනු ලැබූ සෞඛ්‍ය රක්ෂණ ඔප්පු පිළිබඳ මාර්ගෝපදේශ, උපදෙස් සඳහා යොමු කිරීමේ ආකෘතීන් පිළිබඳ මාර්ගෝපදේශ, දැනට පවත්නා ජීවිත රක්ෂණ සංචිත පිළිබඳ මාර්ගෝපදේශ, ආයතනික පාලන රීති, හිඟව පවතින රථවාහන හිමිකම් කියාපෑම්වල වෙන්කිරීම් ආපසු යැවීම් පිළිබඳ මාර්ගෝපදේශ, ප්‍රාරක්ෂකයින් පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන්නා වූ නියමයන් සහ කොන්දේසිවල සංශෝධන, සංවර්ධනය වන වෙළෙඳපොළ හැසිරීම් මාර්ගෝපදේශ යනාදිය එකී ප්‍රතිසංස්කරණවලට ඇතුළත් වේ. අතෘප්තියට පත් වූ ඔප්පුහිමියන් සඳහා පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රියාපටිපාටියද වෙනස් කොට ඇත.

අනාගත මූලාරම්භයන්

ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා සමාලෝචනය කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍රයන් කිහිපයක් මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අතර 2015 වසරේදී ලෝක බැංකුව විසින් පවත්වනු ලැබූ ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය ක්ෂේත්‍රය තක්සේරු කිරීමේ වැඩසටහන (FSAP) සංවර්ධනය කිරීමේ මොඩියුලයෙන් කිහිපයක් ඉදිරිපත් විය. අවදානම් පදනම් ප්‍රාග්ධන පාලනයට අදාළ කටයුතු, අවදානම් පදනම් අධීක්ෂණ ක්‍රමය, රක්ෂණ කර්මාන්ත පනතේ රෙගුලාසි සහ පනත සංශෝධනය කිරීම සහ රක්ෂණ අධීක්ෂකවරුන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) මධ්‍ය රක්ෂණ මූලධර්ම සහිත අනුනීතිකරණය, විශේෂ ක්ෂුද්‍ර රක්ෂණ නියාමන වැඩපිළිවෙලක් සංවර්ධනය කිරීම හරහා වෙළඳපොළ සංවර්ධනය, ක්‍රියාවලි, අලෙවිකරණය සහ ආයතනික නව්‍යකරණය යනාදිය තුළින් වෙළෙඳ පොළ සංවර්ධනය මෙයට ඇතුළත් වේ.

කර්මාන්තයේ කාර්යසාධනය

ප්‍රවර්තක ශක්තිය සමඟ ඉදිරියට යමින්, රක්ෂණ කර්මාන්තය 2011 වර්ෂයට පසු 16.12% ක් ඉහළම සමස්ත වර්ධන අනුපාතයක් සමඟ මෙම වසර තුලදී දල ලිඛිත වාරිකවල ඉහල වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වසරේදී, ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුරු ලැබී ඇති බැවින්. මෙම වාර්තාවෙන් සමස්ත කර්මාන්තයේ දත්ත පිළිබිඹු කරයි.

සාමාන්‍ය රක්ෂණයේ දළ ලිඛිත වාරික තුළින් 2014 වසරේ පැවති 4%ක් වූ වර්ධනයට සාපේක්ෂව 2015 වසරේදී 13%ක සැලකිය යුතු වර්ධනයක් පෙන්වා ඇත. මෙම වසරේදී, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ වර්ධනය (20%) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකවල වර්ධනය (13%) ඉක්මවා ඇත. වසර තුළදී, රථවාහන. ගිනි, මුහුදු සහ විවිධ උප පන්තීන්හි ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළ අතර, රථවාහන රක්ෂණ ව්‍යාපාරය 19%ක සැලකිය යුතු වර්ධන අනුපාතයක් වර්ධනය කරමින් මුළු ලිඛිත දළ වාරිකවලින් 62%ක් නියෝජනය කරන ලදී. සාමාන්‍ය රක්ෂණ කර්මාන්තයේ තවත් එක් ධනාත්මක සාධකයක් වන්නේ 2014 වසරේදි වාර්තා කළ 109% සිට 99% දක්වා ඒකාබද්ධ අනුපාතය අඩුවීමයි. රථවාහන රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ හිමිකම් අනුපාතය, 2014 වසර හා සසඳන විට 0.5 කින් ඉහළ ගිය නමුත් 19% ක ශුද්ධ වියදම් සැලකිය යුතු මට්ටමින් අඩුවීම ඒකාබද්ධ අනුපාතයේ අඩුවීම සඳහා වූ නිශ්චිත හේතුවක් විය. 0.58 සිට 0.62 දක්වා රක්ෂණ ගහණය වැඩිවීම සහ විශේෂයෙන් ගිනි උප පන්තිය දෙගුණවීමෙන් දළ ලිඛිත වාරිකයේ ප්‍රතිශතයක් ලෙස ඉහළ රඳවාගැනීමේ මට්ටම අනෙකුත් සැලකිය යුතු සංවර්ධනයන්ය.

දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරිකවල වර්ධනයද 2011 වසරේ සිට සෑම අවස්ථාවකම ඉහළ මට්ටමක් වාර්තා කරමින් 20%කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. ශ්‍රී ලංකා රක්ෂකයින්ගේ සංගමය විසින් පසුගිය සැප්තැම්බර් හි ප්‍රකාශිත ජීවිත රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාසය මෙම වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක වී ඇත. කෙසේ වෙතත්, දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ජීවිත රක්ෂණ ගහණය 0.43 සිට 0.48 දක්වා සුළු වශයෙන් පමණක් වැඩි වී ඇත.

වසර තුලදී ගෙවන ලද කල්පිරීමේ ප්‍රතිලාභ 20%කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර, දරන ලද මුළු හිමිකම් කියාපෑම්වලින් භාගයකට වැඩිපුර එය නියෝජනය කරයි. තවත් වැදගත් සාධකයක් වන්නේ ජීවිත අංශයෙහි ස්ථාවර පරිසරයක් පෙන්නුම් කරමින් පිළිවෙලින් 27% කින් සහ 8%කින් පවාරණ ප්‍රතිලාභ සහ අහෝසි වූ ඔප්පු අනුපාතය තුළ අඩුවීමක් අපිට දැකගත හැකි වීමයි.

අධ්‍යක්ෂ ජනරාල්වරියගේ සමාලෝචනය

දළ ලිඛිත වාරික/දළ දේශිය නිෂ්පාදිත අනුපාතය 1.09%ක් සමඟ අනෙකුත් නැගීඑන පාලනයන්ට සාපේක්ෂව රක්ෂණ ගහණය තවදුරටත් පහල මට්ටමක පැවතිණ. කෙසේ වෙතත්, රක්ෂණ ගහණය 2014 වසරේදී වාර්තා කළ 1.01% හා සැසඳිමේදී 8%කින් වැඩි වී ඇත. පුද්ගලයෙකුට දළ ලිඛිත වාරිකවලින් නියෝජනය වන රක්ෂණ ඝනත්වය 2014දී වාර්තා කළ රු. 5,074 සිට රු. 5,838 දක්වා වැඩිවී ඇති අතර, එයට දල ලිඛිත වාරිකවල වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවිය.

රක්ෂණ සමාගම්වල මුළු වත්කම්හි වටිනාකම 2011 වසරේ සිට ශක්තිමත් ලෙස වර්ධනය වී ඇති අතර 2014 වසර හා සැසැඳිමේදි 10%ක වර්ධන අනුපාතයක් පෙන්වා ඇත. එසේවුවත්, 2014 හා සැසඳීමේදී වර්ධන අනුපාතයෙහි අඩුවීමක් පවතී. කොටස්හිමියන් ඇතුළු දිගු කාලීන රක්ෂණයේ වත්කම් 2014 වසරට සාපේක්ෂව 24%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කොට ඇති අතර, සාමාන්‍ය රක්ෂණයේ වත්කම් සහ කොටස් හිමියන් 2014ට සාපේක්ෂව 10%ක පහත වැටීමක් වාර්තා කොට ඇත.

රක්ෂණ සමාගම්වල බෙදාහැරීමේ මාර්ග අනුව, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ බෙදාහැරීමේ මාර්ගයේ රක්ෂණ නියෝජිතයින් ඉහලින්ම සිටී. නියෝජිතයින් සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍රය තුළ රක්ෂකයින්ගේ ඍජු ව්‍යාපාර මාර්ග අත්කර ගෙන ඇත.

තැරැව්කාර ව්‍යාපාරයේ කාර්යසාධනය

මුළු දළ ලිඛිත වාරිකවලට තැරැව්කාර සමාග ම්වල දායකත්වය 2014 වසරේ දායකත්වයට සාපේක්ෂව 11%ක වර්ධනයක් වාර්තා කරන ලදි. මෙම දායකත්වය පිළිවෙලින් 98.75% සහ 1.25%ක් වන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය තුළින් උපයන ලද වාරික ආදායමෙන් සමන්විත වේ.

ජාත්‍යන්තර සබඳතා

ආසියානු කලාප හතේ රක්ෂණ නියාමකයින් සහ රක්ෂණ අධික්ෂකයින්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS), ආසියානු සංවර්ධන බැංකුව (ADB), රක්ෂණ මූලාරම්භයට ප්‍රවේශය (A2ii), රක්ෂණ නියාමකයින්ගේ 10 වැනි ආසියානු සංසදය (AFIR) සඳහා ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන සංවිධානය (OECD) වැනි ජාත්‍යන්තර ආයතනවල නියෝජිතයින් එකතු කරමින් අපගේ ප්‍රථම ජාත්‍යන්තර සම්මේලනය සඳහා අප විසින් අනුග්‍රහය ලබාදුන් බැවින් 2015 වසර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට (IBSL) විශේෂිත වසරකි. ආසියා සංසදය, රක්‍ෂණ අධීක්‍ෂකයින්ගේ ජාත්‍යන්තර සංගමය තුළ ඉහළ මට්ටමේ පිළිගැනීමක් ඇතිකිරීම සඳහා අවශ්‍ය වන සුවිශේෂී කරුණු හඳුනාගැනීම හා ඒවා කොළඹ ප්‍රකාශනයට ඇතුළත් කිරීම තුළින් මෙම රැස්වීම සාර්ථක විය. මෙය සාර්ථක කර ගැනීමේ මූලික පියවර ලෙස, ආසියානු නියාමකයින් අතර තොරතුරු හුවමාරු කිරීම පිළිබඳව සංකල්ප පත්‍රිකා, හැකියා වර්ධනය, කලාපීය සහයෝගිතාව සහ රක්ෂණ නියාමකයින්ගේ 10 වැනි ආසියානු සංසදයේ පාලන ව්‍යුහය සංවර්ධනය කිරීම සඳහා කාර්ය බලකායක් ස්ථාපිත කරන ලදී. මෙම සංකල්ප පත්‍රිකා චීනයේ තායිපේ හී රක්ෂණ නියාමකයින්ගේ 11 වැනි ආසියානු සංසදයේදී යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. දැනට චීනයේ රක්ෂණ නියාමක කොමිෂන් සභාව (CIRC) රක්ෂණ නියාමකයින්ගේ ආසියානු සංසදයේ සභාපතිත්වය දරන අතර ලේකම් කටයුතු පිළිබඳ සහයෝගය චීනයේ රක්ෂණ නියාමක කොමිෂන් සභාව විසින් ලබා දේ. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය කාර්යය බලකායක සාමාජිකයෙක් වන අතර තොරතුරු හුවමාරුව පිළිබඳ සාකච්ඡා පත්‍රිකාව සඳහා වගකීමට බැඳි සිටී.

අගය කිරීම

අවසන් කිරීමට පෙර, වැදගත් සිද්ධීන්ගෙන් සපිරි මෙම වසර තුළ අප වෙත ලබාදෙන ලද මඟ පෙන්වීම, අවබෝධය සහ සහයෝගය වෙනුවෙන් මණ්ඩලයේ සභාපතිතුමියට සහ සාමාජිකයින් වෙත මම ස්තූතිය පුදකරමි. මෙම මඟ පෙන්වීම, අවබෝධය සහ සහයෝගය නොමැති වූයේනම් අපගේ කටයුතුවල සාර්ථකත්වය අත්කර ගැනීමට අපට නොහැකි වනු ඇත. එමෙන්ම රක්ෂණ නියාමකයින්ගේ ආසියානු සංසදය සංවිධානය කිරීම සඳහා අපට උපදෙස් සහ ශක්තිය ලබාදිම වෙනුවෙන් සභාපතිතුමාට මාගේ අවංක කෘතඥතාව පළකිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි.

එමෙන්ම මණ්ඩලයට සහයෝගය ලබාදිම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂකයින්ගේ සංගමය (IASL), ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII) හි සභාපතිවරුන් සහ නිලධාරි මණ්ඩලය වෙත මගේ කෘතවේදිත්වය පළකරමි.

අවසාන වශයෙන්, මෙම වසරේ අපගේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉහළ මට්ටමේ බැඳිම සහ කැපවීම වෙනුවෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලයට සහ සේවක මණ්ඩලයට මගේ අගයකිරීම ප්‍රකාශ කර සිටිමි.



දමයන්ති ප්‍රනාන්දු
අධ්‍යක්‍ෂ ජනරාල්

2016 ජුනි 21 වැනි දින.

මණ්ඩලයේ සාමාජිකයින් සහ කාර්ය මණ්ඩලය

මණ්ඩලයේ සාමාජිකයින්



1. **ඉන්ද්‍රාණී සුගතදාස මහත්මිය**
   සභාපතිනි
2. **පී සමරසිරි මහතා**
   සාමාජික
3. **පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය**
   සාමාජික
4. **ඩී එන් ආර් සිරිවර්ධන මහතා**
   සාමාජික
5. **ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා**
   සාමාජික
6. **ජෙරමි බෝලින් මහතා**
   සාමාජික

මණ්ඩලයේ සාමාජිකයින් පිළිබඳව

1) ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය

සභාපතිනිය

1977 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට ඇතුළත් වුනු සුගතදාස මහත්මිය සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අනුයුක්තව සිය වෘත්තීය දිවිය ආරම්භ කරන ලදී. ඇයගේ වසර 35 ඉක්මවා ගිය දීර්ඝ කාලීන රාජ්‍ය සේවා කාලය තුළ අමාත්‍යාංශයන්හි විවිධ වූ ජ්‍යෙෂ්ඨ තනතුරු දරන ලද අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සභාපතිනිය ලෙසද ක්‍රියාකරන ලදී.

වර්තමානයේදී සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපති ධුරයට අමතරව ජාතික සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස සහ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ අධ්‍යක්ෂිකාවක ලෙසද කටයුතු කරයි. සිය රාජ්‍ය සේවා කාලය තුළ සුගතදාස මහත්මිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ජාතික තරුණ සේවා සභාව, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ තේ, පොල්, රබර් යන පර්යේෂණ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක ලෙස ද කටයුතු කර ඇත.

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය ලබා, අනතුරුව ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් සරසවියෙන් ව්‍යාපාර/රාජ්‍ය පරිපාලන ශාස්ත්‍රපති උපාධිය හිමිකරගෙන ඇත. මීට අමතරව, ඇය එක්සත් ජනපද රාජ්‍යයෙන් පිරිනමන හියුබට් එච්. හම්ප්‍රි අධි ශිෂ්‍යත්වයක් ලබාගෙන ඇත.

සුගතදාස මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කරමින්, දූත මණ්ඩල හා ජාත්‍යන්තර ආයතන විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු ගණනාවකට ද සහභාගි වී ඇත.

සුගතදාස මහත්මිය රාජ්‍ය සේවයට කළ දායකත්වය හා විවිධ ක්ෂේත්‍රයන්හි කටයුතු කරමින් ලබාදෙන ලද නායකත්වය අගයමින් ඇය වෙත ප්‍රදානයන් හා සම්මාන කිහිපයක්ම ලැබී ඇති අතර 2013 ඕස්ට්‍රේලියානු ඇලුම්නි විශිෂ්ට සම්මානයෙන්ද කාන්තා කළමනාකාරිත්ව සංවිධාන විසින් වෘතීමය කාන්තාවන් සඳහා පිරිනමන ලද "Inspirational Woman 2014/2015" සම්මානයෙන්ද ඇය පිදුම් ලැබුවාය.

(2) පී. සමරසිරි මහතා

පී. සමරසිරි මහතා වර්තමානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති වේ. නියෝජ්‍ය අධිපති ධූරයට පත් කරනු ලැබීමට පෙර එතුමා සහකාර අධිපති, මුදල් මණ්ඩලයේ ලේකම්, මහ බැංකුවේ අනුකූලතා නිළධාරී සහ බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂ ආදී තනතුරු ගණනාවක සේවය කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ණය තොරතුරු කාර්යාංශයේ සභාපති ධූරය දරන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයකු ද වේ.

සමරසිරි මහතාට කොළඹ විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද ආර්ථික විද්‍යාව පිළිබඳ (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධියක් හා ඇමෙරිකා එක්සත් ජනපදයේ කැන්සාස් විශ්වවිද්‍යාලයෙන් පිරි නමන ලද ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් හිමි වන අතර සංඛ්‍යාලේඛන, ආර්ථික ප්‍රතිපත්ති, බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල නියාමනය හා අධීක්ෂණය, මූල්‍ය තත්ත්ව ස්ථායීතාව, සංස්ථානික පාලනය, ව්‍යවහාර මුදල් කළමනාකරණය, විදේශ විනිමය ප්‍රතිපත්ති, මූල්‍ය බුද්ධි හා කලාපීය සංවර්ධනය ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වසර 33ක අත්දැකීම් සහිත නිලධාරියෙකි.

සමරසිරි මහතා මහ බැංකුව මඟින් ප්‍රකාශයට පත් කළ "මුදල් ගනුදෙනු, බැංකු සහ ආර්ථිකය", "මූලික ආර්ථික විද්‍යා මූලධර්ම විග්‍රහය" සහ "ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති" යන පොත් රචනා කර ඇත. මෙයට අමතරව එතුමා විවිධ ප්‍රකාශන හා පුවත්පත්වලට ආර්ථික හා මූල්‍ය මාතෘකා පිළිබඳ ලිපි පළ කර ඇත.

(3) පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය

පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියකි. රාජ්‍ය සේවය තුළ වසර 34කට වැඩි සේවා කාලය තුළ දී ඇය ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, නිවාස හා නාගරික සංවර්ධනය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂිකා, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් යන ආයතනවල තනතුරු දරා ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති උපාධියක් ද යාපනය විශ්වවිද්‍යාලයේ ගණිතය හා සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධියක් ද නෙදර්ලන්තයේ රොටර්ඩෑම්වල පිහිටි නිවාස හා නාගරික සංවර්ධන අධ්‍යයන ආයතනයේ නාගරික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ඇය සතුය. ඇය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ද වේ.

වෙල්ලප්පිලි මෙනෙවිය වර්තමානයේ දී මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධූරය ද හොබවයි. මෙයට අමතරව ඇය, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂිකාවක් ලෙස සේවය කරමින් සිටී.

(4) ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා

ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝලීය විද්‍යාව පිළිබඳ (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධියක් ද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීති උපාධියක් ද හිමි කර ගෙන ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් පවත්වනු ලබන නීතිපති උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි ශිෂ්‍යයෙකි. ඔහු වෘත්තියෙන් නීතිඥයෙකි. සිරිවර්ධන මහතා 1988 දී සමාගම් පරීක්ෂකවරයෙක් ලෙස සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට බැඳුණු අතර 2001 වසරේ දී සමාගම් අතිරේක රෙජිස්ට්‍රාර් ධුරයට උසස් කරන ලදී. වර්තමානයේදී ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන් කටයුතු කරයි. සිරිවර්ධන මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙක් ද වේ.

(5) දේශබන්දු ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා

දේශබන්දු ආචාර්ය ගුලාම්හුසේන් මහතා

මණ්ඩල සාමාජිකයින් පිළිබඳව

ජපානයේ ටෝකියෝ විශ්ව විද්‍යාලයෙන් ලැබූ දර්ශනශූරී උපාධියක් ද එක්සත් රාජධානියේ ලන්ඩන්වල කින්ග්ස් කොලීජියෙන් ලැබූ උපාධියක් ද හිමි වේ. ආචාර්ය ගුලාම්හුසේන් මහතා "දේශබන්දු, මානවහිතවාදී, ලංකාපුත්‍ර" යන කීර්තිමත් ගෞරව නාමයන්ගෙන් පිදුම් ලැබ ඇති අතර ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ හා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක් ලෙසද (මුළු දිවයිනටම) සාම විනිසුරුවරයෙක් ලෙස ද සේවය කරයි.

ආචාර්ය ගුලාම්හුසේන් ඇඩම් කැපිටල් පීඑල්සී, ඇඩම් කාබන් (පුද්) සමාගම, ෆොරින් ට්‍රේඩ්ස්, ඇඩම් එක්ස්පෝ (පුද්) සමාගම, සෙලොන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ්ස් පීඑල්සී, ස්පයිස් ඔෆ් ලයිෆ් (පුද්) සමාගම, නෙට්වර්ක්ස් කමියුනිකේෂන්ස් (පුද්) සමාගම, ඇඩම් මෙටල්ස් (පුද්) සමාගම, පියෝපියෝ මොරන්ඩි (පුද්) සමාගම, සෝනාක්ෂි ට්‍රස්ට්ස් (පුද්) සමාගම, ඇඩම් එයා කන්ඩිෂනර්ස් (පුද්) සමාගම, ඇඩම් ඔටෝමොබයිල්ස් (පුද්) සමාගම, සීමාසහිත කොළඹ ඇපොතිකර් සමාගම, වාණිජ මණ්ඩලය, හැමිල්ටන් රිසෝට්ස් (පුද්) සමාගම, සෙලෝන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ් සර්පි-ටෙක් (පුද්) සමාගම, කොළඹ ගැල්කුලී හා ප්‍රවාහන සමාගම සහ ඩොබ්වෙල් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයා ලෙස ද සේවය කරයි.

(6) ජෙරෙමි බෝලින් මහතා

ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙක් වන අතර සිඩ්නි විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් හිමි කර ගත් අයෙකි.

රක්ෂණ අංශයේ වසර 20කට වැඩි අත්දැකීම් සහිත ඒ මහතා ශ්‍රී ලංකාව, ඔස්ට්‍රේලියාව සහ මාලදිවයින ආදී රටවල් රාශියක රක්ෂණ සමාගම් හා රක්ෂණ/ප්‍රතිරක්ෂණ තැරැව්කාර සමාගම්වල සේවය කර අත්දැකීම් සහිත ප්‍රවීණයෙකි.

වර්තමානයේ දී NHJ අවදානම් කළමනාකරණ සේවා පී/එල්, ඔක්ටැගන් කන්සල්ටන්ට්ස් පී/එල් සහ එන්ඩ්ලස් අවුට්ඩෝර්ස් පී/එල් යන සමාගම්වල අධ්‍යක්ෂකවරයා ලෙස සේවය කරයි.

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම



1. **දමයන්ති ප්‍රනාන්දු මහත්මිය**
   (අධ්‍යක්ෂ ජනරාල්වරිය)
2. **චමරී ඒකනායක මහත්මිය**
   (සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ)
3. **රාජන් නිරූබසිංහම් මහතා**
   (සහකාර අධ්‍යක්ෂ - නීති)
4. **සුධීර සේනාරත්න මහතා**
   (අධ්‍යක්ෂ - විමර්ශන)
5. **රනිල් අඟුණවල මහතා**
   (අධ්‍යක්ෂ - නීති)
6. **චායා විතානවසම් මහත්මිය**
   (අධ්‍යක්ෂ - මූල්‍ය හා පරිපාලන)
7. **සරෝජා ගුණතිලක මෙනෙවිය**
   (උපදේශක - ජීවගණක)

කාර්ය මණ්ඩලය

1. පවිත්‍රා පුංචිහේවා මහත්මිය
2. චන්ද්‍රිමා කඹුරුගමුව මහත්මිය
3. ප්‍රියංගි ද සිල්වා මහත්මිය
4. කෝකිලා සිරිවර්ධන මහත්මිය
5. ඩෙසිකා රත්නායක මහත්මිය
6. උපේන්ද්‍රා සෙනෙවිරත්න මහත්මිය
7. චමින්ද ලාල් කුමාර මහතා
8. උපලක්ෂි රණසිංහ මෙනෙවිය
9. එතිර්රාජ් ශ්‍රීකාන්තන් මහතා
10. චරිත වික්‍රමසිංහ මහතා
11. සුජීවා රණසිංහ මහත්මිය
12. එච්. පී. අසංක මහතා
13. සනත් උදයංග මහතා
14. ලක්මාලි අල්ගම මහත්මිය
15. ලක්ෂ්මන් විජේසිංහ මහතා
16. ලක්මාල් කළුබෝවිල මහතා
17. කෞශාලි දයාරත්න මහත්මිය

18. හසිනි පෙරේරා මහත්මිය
19. ෂශිනි ප්‍රේමලාල් මහත්මිය
20. රුවිනි ලියනගේ මහත්මිය
21. මෙරීනා ඩයස් මහත්මිය
22. තිළිණි වාකිෂ්ඨ මහත්මිය
23. ඩී. ඩබ්ලිව්. එස්. එස්. සුපුලී මහත්මිය
24. තනුජා ඇන්තනී මහත්මිය
25. වීණා දිනේකා මහත්මිය
26. ශ්‍යාමලී අත්තනායක මහත්මිය
27. රොෂාන් ද කොස්තා මහතා
28. ශානිකා නානායක්කාර මහත්මිය
29. මල්හාරී වික්‍රමසිංහ මහත්මිය
30. ජේ. එම්. ජයතිස්ස මහතා
31. සමන් සේනාධීර මහතා
32. ලසන්ති තොටහේවා මහත්මිය
33. බිම්සර විජේසිංහ මහතා
34. සාරිකා වත්තුහේවා මහත්මිය (ඡායාරූපයේ නැත)
35. චතුරි බණ්ඩාර මහත්මිය (ඡායාරූපයේ නැත)
36. තුෂාරි විජේගුණවර්ධන මහත්මිය (ඡායාරූපයේ නැත)



සමාලෝචන

පොදු සමාලෝචනය	22
සංඛ්‍යානමය සමාලෝචනය	28
මෙහෙයුම් කටයුතු සමාලෝචනය	
- අධීක්ෂණ සමලෝචනය	60
- නියාමන සමාලෝචනය	64
- විමර්ශන සමාලෝචනය	67
- වෙළඳපොළ සංවර්ධනය සහ බාහිර සබඳතා සමාලෝචනය	70
- පරිපාලනමය සමාලෝචනය	72
- මූල්‍ය සමාලෝචනය	73

පොදු සමාලෝචනය

පනත ක්‍රියාත්මක කිරීම

නීති සම්පාදනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ සහ අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සද්භාවයෙන් ද වෘත්තීමය හා විචක්ෂණභාවයෙන් ද යුතුව කරගෙන යනු ලබන බවට සහතික කිරීම (මෙහි මින්මතු මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පරමාර්ථය හා වගකීම වේ.

රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කරුවන්ගේ සමාගම්, රක්ෂණ නියෝජිතයින් හා අලාභ ගලපන්නන් නියාමනය හා අධීක්ෂණය සඳහා අවශ්‍ය නෛතික රාමුව 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත (මෙහි මින්මතු පනත යනුවෙන් සඳහන් කරනු ලබන) මගින් සලසා ඇත.

මෙම පනත 2007 අංක 27 සහ 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත්වලින් සංශෝධනය වී ඇත.

පනත යටතේ වර්ෂය තුළ නිකුත් කරන ලද උප නීති පහත නියාමන ප්‍රතිසංස්කරණ යටතේ දක්වා ඇත.

නියාමන ප්‍රතිසංස්කරණ

රීති

රක්ෂණ නියෝජිතයින්ගේ (තනි පුද්ගලයන් හැරුණුකොට) රෙජිස්ටරය පිළිබඳ නීති

මණ්ඩලය විසින් 2015 වසරේ මැයි මස 27 දිනැති අංක 1916/10 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් රක්ෂණ නියෝජිතයින්ගේ (තනි පුද්ගලයන් හැරුණුකොට) රෙජිස්ටරය පිළිබඳ රීති මගින් පනතේ 78 (1) වගන්තිය යටතේ රක්ෂණ ආයතන සහ රක්ෂණ තැරැව්කාර ආයතන විසින් පවත්වාගෙන යා යුතු රක්ෂණ නියෝජිතයින්ගේ (තනි පුද්ගලයන් හැරුණකොට) රෙජිස්ටරයට අදාළ ආකෘතිය හඳුන්වා දෙන ලදී.

රක්ෂණ ආයතන සඳහා අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය හඳුන්වා දීමේ රීති මණ්ඩලය විසින් 2015 වසරේ දෙසැම්බර් මස 15 වැනි දිනැති අංක 1945/19 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2015 ණය ගෙවීමේ හැකියාවේ සීමා (අවදානම් පදනම් වූ ප්‍රාග්ධනය) රීති හඳුන්වා දෙන ලදී. ඉහත සඳහන් රීතීන් ලෝක බැංකුව විසින් දියුණු කරන ලද රාමුව මත පදනම් වේ. එම රීතීන් සියලුම රක්ෂණ ආයතන සඳහා 2016 ජනවාරි 1 දින සිට අදාළ වන අතර ඒ අනුව 2002 ණය ගෙවීමේ හැකියාව සීමා (දිගුකාලීන රක්ෂණ) රීති සහ ණය ගෙවීමේ හැකියාවේ සීමා (සාමාන්‍ය රක්ෂණය) රීතිවල බලපෑම ඉවත් වේ.

රෙගුලාසි

මණ්ඩලයට ගෙවිය යුතු වාර්ෂික ගාස්තු ඉහළ දැමීම පිළිබඳ රීති

මණ්ඩලය විසින් 2015 මාර්තු මස 25 දිනැති 1907/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2005 රක්ෂණ මණ්ඩල රෙගුලාසි සංශෝධනය කරමින් මණ්ඩලයට ගෙවිය යුතු වාර්ෂික ගාස්තුව ඉහළ දැමීම සඳහා පියවර ගෙන ඇත. රක්ෂණ ආයතන විසින් එක් එක් රක්ෂණ පන්තිය සඳහා පළමු ලිත් වර්ෂය වෙනුවෙන් මණ්ඩලය වෙත ගෙවිය යුතු රු. 100,000.00 වූ වාර්ෂික ගාස්තුව ප්‍රතිශෝධනය කරන ලදී.

මෙහිදී 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ (මෙහි මින්මතු සංශෝධන පනත ලෙස දක්වන) 53 වැනි වගන්තිය යටතේ වෙන් කරන ලද නව රක්ෂණ ආයතන සඳහා පළමු ක්‍රියාකාරී ලිත් වර්ෂයේ පටන් දළ ලිඛිත වාරික ආදායමෙන් 0.075% සිට 0.10% දක්වාත් ඉහළ නංවා ඇත.

පනතේ 96 අ වගන්තිය යටතේ නිකුත් කළ විධාන

2015 මාර්තු 26 වැනි දිනැති අංක 6/6 (අ) හිමිකම් නිරාකරණය කිරීම

පනතේ 96 අ වගන්තිය යටතේ පහත විධානය සියලුම රක්ෂණ ආයතන වෙත නිකුත් කරන ලදී.

සෑම රක්ෂණ කරුවෙක්ම සාමාන්‍ය සහ දිර්ඝ කාලීන රක්ෂණ ඔප්පුවක් මගින් පැන නගින හිමිකමක්

(1) අදාළ හිමිකමේ ප්‍රමාණය සනාථ කිරීමේ හා නිදහස් කිරීමේ ලියවිල්ල ලැබී දින 14ක් ඇතුළත

(11)හිමිකම් පාන තැනැත්තාගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසු ගෙවිය යුතුය.

ඉහත විධානය නිකුත් කරන ලද්දේ 1962 අංක 25 දරන රක්ෂණ පාලන පනත යටතේ නිකුත් කරන ලද 1987 රෙගුලාසිවල අංක 30 රෙගුලාසිය ඉවත් කිරීම හේතුවෙනි.

චක්‍රලේඛ

2015 ඔක්තෝබර් 9 දිනැති අංක 36 දරන චක්‍රලේඛය - එතෙර සෞඛ්‍ය රක්ෂණය - 2013 ඔක්තෝබර් 30 දිනැති අංක 32 දරන චක්‍රලේඛය අවලංගු කිරීම

පනතේ 101 (1) වගන්තිය ප්‍රකාරව ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයට අදාළව හැර, මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව ශ්‍රී ලංකාවේ කිසිම තැනැත්තකු විසින් පනත යටතේ ලියාපදිංචි කර නොමැති රක්ෂණකරුවකු සමඟ කෙලින්ම හෝ අන්‍යාකාරයකින් යම් රක්ෂණ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් කටයුතු කරනු නොලැබිය යුතුය. 2002 ජූනි 5 දිනැති අංක 4 දරන චක්‍රලේඛය ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තකුට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් විදේශීය බලපත්‍රලාභී හෝ ලියාපදිංචි රක්ෂණ ආයතනයකින් සෞඛ්‍ය හෝ සංචාරක රක්ෂණ ඔප්පුවක් ලබා ගත හැකිය.

එනමුත් ඉහත 2002 ජූනි 5 දිනැති අංක 4 දරන චක්‍රලේඛයේ පැවති අඩුලුහුඬුකම් හේතුවෙන් 2013 ඔක්තෝබර් 30 දිනැති අංක 32 දරන චක්‍රලේඛය සංශෝධනය කරන ලදී. එමගින් ශ්‍රී ලංකාවේ ඕනෑම තැනැත්තකුට කෙලින්ම හෝ අන්‍යාකාරයකින් (මණ්ඩලයේ ලිඛිත අනුමැතිය නොමැතිව) විදේශීය බලපත්‍රලාභී හෝ ලියාපදිංචි රක්ෂණ ආයතනයකින් සෞඛ්‍ය හෝ සංචාරක රක්ෂණය ලබා ගත හැකි වනුයේ :

1. විදේශීය සංචාරකයන් සඳහා;
2. සංචාරය කරනු ලබන කාල සීමාව සඳහා;
3. පනත යටතේ ලියාපදිංචි රක්ෂණ තැරැව්කාර සමාගම් මගින් යන්නට යටත්වය.

ඉහත අංක 32 දරන චක්‍රලේඛය මගින් ශ්‍රී ලංකාවේ යම් පුද්ගලයෙක් හට පනතේ 101 වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ අනුමැතිය ඇතිව, මණ්ඩලය හා ලියාපදිංචි වී ඇති රක්ෂණ ආයතනවලින් නිකුත් නොකරන සෞඛ්‍ය සහ සංචාරක රක්ෂණ ආවරණ ලබා ගත හැකිය.

කෙසේවුවද, රක්ෂණ තැරැව්කාර ආයතන සහ රක්ෂණ තැරැව්කාර ආයතන නොවන ආයතන මගින් තම සේවාදායකයන් වෙනුවෙන් විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණ සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව අංක 32 චක්‍රලේඛය අවලංගු කොට අංක 36 නිකුත් කිරීමට පියවර ගන්නා ලදී.

පොදු සමාලෝචනය

චක්‍රලේඛ අංක 36 හි ප්‍රධාන අංග පහත පරිදි වේ. :

1. ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු මෙම චක්‍රලේඛයේ ක්‍රියාකාරී දින වන 2015 ඔක්තෝබර් 9 වන දිනට විදේශීය රක්ෂණ ආයතනයක් හෝ විදේශීය ආයතනයක සෞඛ්‍ය රක්ෂණාවරණයක් තවදුරටත් පවත්වා ගෙන යා හැක්කේ හෝ අළුත් කළ හැක්කේ මේ යටතේ විශේෂ අවසරයක් ලබා නැතත් එම රක්ෂණාවරණය පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර ආයතනයක් හරහා ලබාගෙන ඇත්නම්ය.

2. රක්ෂණ තැරැව්කාර ආයතනයක් අදාළ අවසරය ලබාගැනීම සඳහා මණ්ඩලය වෙත ලිඛිත ඉල්ලීමක් පහත කරුණු සමඟ ඉදිරිපත් කළ යුතුය.

   (1)විදේශීය රක්ෂණ ආයතනය විසින් ලබාදෙන සෞඛ්‍ය රක්ෂණාවරණය පනත යටතේ ලියාපදිංචි රක්ෂණ ආයතන විසින් ලබා නොදෙන බවට ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් තහවුරු කිරීමක්

   (2)විදේශීය රක්ෂණ ආයතනය හෝ වෙනත් ආයතනය විසින් ලබාදෙන රක්ෂණාවරණය පිළිබඳ තොරතුරු

   (3)ඉහත සඳහන් සෞඛ්‍යාරක්ෂණය ලබා දෙන විදේශීය රක්ෂණ ආයතනය හෝ වෙනත් ආයතනය රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකත්වය ලබා ගෙන ඇති රක්ෂණ නියාමක ආයතනයක ලියාපදිංචි හෝ බලපත්‍රලාභි ආයතනයක් බවට ලියකියවිලි

   (4)රක්ෂණ තැරැව්කාර ආයතනය විසින් ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකු සඳහා ලබා දෙන සෑම විදේශීය සෞඛ්‍යා රක්ෂණාවරණයක් සඳහාම රු. 500,000.00 බැගින් වූ මූලික බලය ලබාදීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.

   (5)ආරාවුල් නිරාකරණය කිරීමේ ක්‍රමවේදයන්

3. ඉහත බලය ලබා දෙනුයේ එක් නිශ්චිත විදේශීය රක්ෂණාවරණයක් සඳහා වසරක කාලයක් සඳහා පමණි. යම් රක්ෂණ තැරැව්කාර ආයතනයක් එක් විදේශීය සෞඛ්‍ය රක්ෂණාවරණයකට වඩා අවසර ලබා ගැනීමට බලාපොරොත්තු වේනම් එක් එක් රක්ෂණ ඔප්පුව සඳහා වෙන් වෙන් වශයෙන් අවසර ඉල්ලා සිටිය යුතුය.

අංක 36 චක්‍රලේඛය සලකා බැලීමෙන් අනතුරුව සෞඛ්‍ය රක්ෂණ ඔප්පු හා සම්බන්ධ ප්‍රතිපත්ති හි වෙනස මණ්ඩලය විසින් විනිමය පාලක හට දන්වා ඇති අතර විදේශ මුදල් හුවමාරු වීම් සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කරන ලෙසද ඉල්ලා ඇත.

2015 නොවැම්බර් 23 වෙනි දිනැති අංක 37 දරන චක්‍රලේඛය

අංක 37 දරන චක්‍රලේඛය මගින් සියලුම රක්ෂණ ආයතන හා රක්ෂණ තැරැව්කාර ආයතන මණ්ඩලය විසින් සමාගම් නාමයන් වෙනස් කිරීමට පෙර යෝජිත නම හා ඊට හේතුව දැනුම් දිය යුතු බවට නියම කරන ලදී.

පනතේ 82 (5) වගන්තිය ප්‍රකාර රක්ෂණ තැරැව්කාර ආයතනවල අවම ශුද්ධ ප්‍රාග්ධනය පිළිබඳ කොන්දේසිය

සමහර රක්ෂණ තැරැව්කාර ආයතන ලියාපදිංචි කිරීමේ කොන්දේසියක් වශයෙන් රු. මිලියනයක අවම ශුද්ධ ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතුය. මෙය රු. මිලයන 2.5 ක ගෙවා නිමා කොටස් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමට අමතරවය.

නමුත් මුල් කාලීන රක්ෂණ තැරැව්කාර ආයතන වෙත ඉහත අවම ශුද්ධ ප්‍රාග්ධනය පිළිබඳ කොන්දේසිය පනවා නැත. ඒ අනුව නියාමන අවශ්‍යතා හා සැසඳෙන පරිදි පනතේ 82 (5) වගන්තිය අනුව සියලුම රක්ෂණ තැරැව්කාර ආයතන වෙත කොන්දේසියක් නිකුත් කිරීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2015 සැප්තැම්බර් 30 වන විට රු. 1.125 මිලියනයක අවම ශුද්ධ ප්‍රාග්ධනයක් හා 2016 සැප්තැම්බර් 30 වන විට රු. 2.5ක අවම ශුද්ධ ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතුය.

වෙළෙඳ පොළ ව්‍යුහය

රක්ෂණ සමාගම්

පනතේ 12 වන වගන්තියට අනුව, පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තෙකු ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යාමට මේ පනත යටතේ තත් කාලයේ ලියාපදිංචි වී ඇත්නම් හෝ ලියාපදිංචි කර ඇතැයි සලකනු ලබන්නේ නම් මිස, ඒ තැනැත්තා ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාර කරගෙන යනු නොලැබිය යුතුය.

පනතේ 13 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන්නට උනන්දුවක් දක්වන තැනැත්තෙකු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් වශයෙන් සංස්ථාපනය විය යුතු අතර පනතෙන් නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සියලුම ව්‍යවස්ථාපිත අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව පනත යටතේ ලියාපදිංචි වී රක්ෂකයෙක් වශයෙන් බලපත්‍රය ලබා ගත යුතුය.

වසර අවසාන වන විට සමාගම් 30ක් රක්ෂකයින් ලෙස ක්‍රියාකාරීව පැවැති අතර සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් මත පනවන ලද ලියාපදිංචිය අත්හිටුවීම 2009 වසරේ සිට ක්‍රියාත්මක වේ. රක්ෂණ ව්‍යාපාර සමාගම් මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් රූප සටහන 1 මගින් දැක්වේ. ක්‍රියාකාරීව පවතින සමාගම් 30න් 03ක් දිගු කාලීන හා සාමාන්‍ය යන දෙආකාරයෙන්ම රක්ෂණ කටයුතු කරන සංයුක්ත රක්ෂණ සමාගම් වන අතර සමාගම් 12ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයද සමාගම් 15ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු ද සිදු කරනු ලබයි.

වෙන්කිරීම

(මෙහි මින් පසු "සංශෝධිත පනත" ලෙස හඳුන්වනු ලබන) 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 53 වන වගන්තිය ප්‍රකාරව සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර රක්ෂණ ව්‍යාපාර පන්ති දෙක (මෙහි මින් පසු "වෙන්කළ රක්ෂණ සමාගම්/වෙන් කළ රක්ෂණ සමාගම" ලෙස හඳුන්වනු ලබන) වෙනස් සමාගම් දෙකකට වෙන් කිරීමට අවශ්‍ය වේ.

මණ්ඩලය විසින් රක්ෂණ ව්‍යාපාරයේ සුමට පරිවර්තනයක් සිදු කිරීම සඳහා රක්ෂණ කර්මාන්තයේ නියැලෙන්නන්ගේ අදහස් විමසන ලදුව සංයුක්ත රක්ෂකයින් වෙන් කිරීම පිළිබඳව මාර්ගෝපදේශයක් නිකුත් කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළදී සංශෝධිත පනතේ 53 වැනි වගන්තියට අනුකූලවීම සඳහා සංයුක්ත සමාගම් ඉදිරිපත් කරන ලද අතර, වසර අවසානය වන විට මණ්ඩලය විසින් සමාගම් 3 කට ලියාපදිංචිය ප්‍රදානය කරන ලද අතර සමාගම් 10කට බලපත්‍ර නිකුත් කර ඇත.

පොදු සමාලෝචනය

රූප සටහන 1

රක්ෂණ සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ ව්‍යාපාර පන්තීන්



රක්ෂණ තැරැව්කරුවන්

රක්ෂණ තැරැව්කරුවන් යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද හා රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදීම සඳහා පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වේ. රක්ෂණ තැරැව්කරුවන් යනු තැරැව්කාර ගාස්තු හෝ කොමිස් මුදල් අපේක්ෂාවෙන් රක්ෂණ සමාගමක් හෝ ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ හෝ ඔවුන් වෙනුවෙන් රක්ෂණ ව්‍යාපාර ඇති කිරීම සඳහා රක්ෂණ සමාගම් හෝ රක්ෂණ සහතික දරන්නන් හෝ රක්ෂණය හෝ ප්‍රතිරක්ෂණ සඳහා යෝජනා කරන්නන් අතර අතරමැදියන් ලෙස කටයුතු කරන්නන් අදහස් කෙරේ.

වසර අවසානයේදී සමාගම් 57ක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී තිබුණි. එම සමාගම් අතරින් සමාගම් 36ක් දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර යන දෙකෙහිම ලියාපදිංචි වී සිටි අතර සමාගම් 18ක් සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර කටයුතුවල පමණක් යෙදී සිටියේය. පහත 2 වන රූප සටහන මගින් රක්ෂණ තැරැව්කාර සමාගම් ව්‍යාපාර මෙහෙයුම් සඳහා ලියාපදිංචි වී ඇති පන්තීන් දැක්වේ.

රූප සටහන 2

රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් කරගෙන යනු ලබන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර පන්තීන්



රක්ෂණ නියෝජිතයන්

පනත යටතේ රක්ෂණ සමාගමක් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමක් සමඟ ලියාපදිංචි වී සිටින සහ එම රක්ෂණ සමාගම් හෝ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා රක්ෂණ ව්‍යාපාර සොයා දීම වෙනුවෙන් ප්‍රතිශ්ඨාව ලෙස කොමිස් ලබා ගන්නා පුද්ගලයින් රක්ෂණ නියෝජිතයන් වේ. එලෙස ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් මණ්ඩලය විසින් නිශ්චිතව දක්වා ඇත.

පනතේ 34 වන වගන්තිය අනුව රක්ෂණ නියෝජිතයින් රක්ෂණ සමාගම්වලට රක්ෂණ ව්‍යාපාර සොයා දෙනු ලබන වැදගත් ප්‍රවාහයන්ගෙන් එකක් වේ.

රක්ෂණ සමාගම් විසින් සපයා ඇති තොරතුරුවලට අනුව, වසර තුළදී රක්ෂණ නියෝජිතයින් වශයෙන් බඳවාගෙන ඇති මුළු තනි පුද්ගලයින් සංඛ්‍යාව 16.879ක් පමණ වන අතර එය පසුගිය වසරේ (17,018) ට වඩා 0.82%ක පහළ යාමකි.

වසර අවසානය වන විට රක්ෂණ සමාගම් නියෝජනය කරමින් සිටි මුළු තනි රක්ෂණ නියෝජිත සංඛ්‍යාව 45,433ක් පමණ වූ අතර එය පසුගිය වසරේ 42,958 සිට 5.76%ක ඉහළ යාමකි.

3 වන රූප සටහනින් රක්ෂණ සමාගම් සමඟ ලියාපදිංචි වී සිටින රක්ෂණ නියෝජිතයින් සංඛ්‍යාව නිරූපනය වේ.

රූප සටහන 3

රක්ෂණ සමාගම්වල ලියාපදිංචි තනි රක්ෂණ නියෝජිතයන්

2015.12.31 දිනට මුළු රක්ෂණ නියෝජිතයන්



පසුගිය වසර තුළදී ආසන්න වශයෙන් තනි රක්ෂණ නියෝජිතයින් 237ක් පමණ රක්ෂණ තැරැව්කාර සමාගම් සමඟ ලියාපදිංචි වී ඇත.

සමාගම්වල තත්ත්වය සහ ප්‍රාග්ධන වෙනස්කම්

රක්ෂණ සමාගම් අතරින් රක්ෂණ සමාගම් 7ක් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත. නම් වශයෙන් ඒවා ඒ අයි ඒ ඉන්ෂුවරන්ස් ලංකා පී එල් සී, යූනියන් ඇෂුවරන්ස් පී එල් සී, චීෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පී එල් සී, එච්එන්බී ඇෂුවරන්ස් පී එල්සී, අමානා තකාෆුල් පී එල් සී, ජනශක්ති ඉන්ෂුවරන්ස් පී එල් සී සහ ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පී එල් සී වේ. (සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් සමාගම සහ සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් සමාගම යන සමාගම්වල පාලක සමාගම වන සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පී එල් සී සමාගම කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කොට ඇත).

ලැයිස්තුගත සහ ලැයිස්තුගත නොවූ රක්ෂණ සමාගම්වල ප්‍රතිශතය 4 වන රූප සටහනේ දැක්වේ.

රූප සටහන 4

ලැයිස්තුගත කරන ලද/ලැයිස්තුගත නොකරන ලද රක්ෂණ සමාගම්වල තත්ත්වය



සංශෝධිත පනතින්, රක්ෂණ සමාගම්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගතව තිබීම අවශ්‍ය කරයි. සංයුක්ත රක්ෂණ සමාගම් 2015 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ඒවායේ ව්‍යාපාර කටයුතු වෙන් වෙන් සමාගම් දෙකකට වෙන් කිරීමට සහ 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර ලැයිස්තු ගත කිරීමට ද අවශ්‍ය වේ.

සංශෝධිත පනත බලාත්මක වූවායින් පසුව ලියාපදිංචිය ලැබූ නව රක්ෂණ සමාගමක් මණ්ඩලය මගින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් පසුව වසර තුනක කාලයක් ඇතුලත දී 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු බවට දක්වා ඇත.

පොදු සමාලෝචනය

2011 ජූනි මාසයට පෙරාතුව ලියාපදිංචිය ලද රක්ෂණ සමාගම්, 2015 පෙබරවාරි මාසය වන විට හෝ එදිනට පෙර එක් ව්‍යාපාර පන්තියක් සඳහා තමන්ගේ ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය රු. මිලියන 500ක අවමයක් දක්වා වැඩි කළ යුතු බවට මණ්ඩලය නියම කර ඇත.

2011 ජූනි මාසයට පසුව ලියාපදිංචි වූ රක්ෂණ සමාගම්වලට රු. මිලියන 500කට නොඅඩු ගෙවා නිමි ප්‍රාග්ධනයක් ඇත.

රක්ෂණ සමාගම්වලින් සෙස් බද්දක් අයකිරීම

පනතේ 7 වන වගන්තිය යටතේ ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා සෙස් බද්දක් අයකිරීමේ නියෝගයක් පනවන ලදී. 2002 ජූලි 9 වන දින අංක 1244/5 දරන ගැසට් නිවේදනය මගින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.2% ක්ද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක සමස්ත ශුද්ධ වාරිකයෙන් 0.4% ක්ද වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට බැර කල යුතු බවට පැහැදිලි කොට ඇත. රක්ෂකයන්ගෙන් සෙස් බදු එකතු කිරීම 2003 ජනවාරියේ සිට ක්‍රියාත්මක වූ අතර 2015 වසරේ එසේ එකතු කරන ලද මුදල රු. මිලියන 322 කි.

වගුව 1 මගින් සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල ගැන දැක්වේ.

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල

පනතේ 103 වන වගන්තිය ප්‍රකාර ස්ථාපනය කෙරුණු ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලට රක්ෂකයන්ගෙන් එකතු කළ සෙස් බද්ද තැන්පත් කරනු ලැබේ. වර්තමාන මෙන්ම අනාගත ඔප්පු හිමියන්ගේ ද යහපත උදෙසා මෙම අරමුදල පහත දැක්වෙන කාර්යයන් සඳහා යොදා ගනු ලැබේ.

අ) රක්ෂණ කර්මාන්තය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ දීත්, රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ කටයුතුවලදීත් සිදුවන වියදම් පියවාලීම සහ

ආ) මණ්ඩලය එහි බලතල, වගකීම් හා මෙහෙයුම් ක්‍රියාවට නැංවීමේදී දරනු ලබන වියදම් පියවා ගැනීම

ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති වත්කම් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කෙරේ. 2015 දෙසැම්බර් 31 වන දිනට එම අරමුදලේ සංචිතය රු. මිලියන 2,643ක් විය. මෙය පසුගිය වසරට වඩා (රු. මිලියන 2,183) 21.07% ක වර්ධනයකි.

වගුව 1

සෙස් බද්ද හා ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල



රක්ෂණ බදු

සාමාන්‍ය රක්ෂණ කටයුතුවල කිසිදු පන්තියක් සඳහා වන බදු කිසිවක් දැනට ක්‍රියාත්මක නැත. 2002, 2005 හා 2007 යන වර්ෂවල ජනවාරි 1 වැනි දින සිට අනු පිළිවෙලින් ක්‍රියාත්වක වන පරිදි මෝටර් රථ රක්ෂණය, ගිනි රක්ෂණය සහ කම්කරු වන්දි රක්ෂණය මත ක්‍රියාත්මක වූ බදු අහෝසි කරන ලදී.

පනතේ බලපෑමෙන් නිදහස්වීම

1999 අංක 20 දරන කෘෂි හා වගා රක්ෂණ පනත මගින් ස්ථාපනය කරන ලද කෘෂි හා වගා රක්ෂණ මණ්ඩලය, 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා අපනයනය ණය රක්ෂණ සංස්ථාව සහ 1996 අංක 17 දරන සමාජ රක්ෂණ මණ්ඩලය ආදියට පනතේ 12 (3) වන වගන්තිය ප්‍රකාරව පනතෙන් පැනවෙන නීති රීති අදාළ නොවේ.

ජාතික රක්ෂණ භාර අරමුදල (NITF)

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත මගින් ස්ථාපනය කරන ලද ජාතික රක්ෂණ භාර අරමුදල, පනතට කරන ලද සංශෝධනයක් මගින් මණ්ඩලයේ විෂයපථය තුළට ග්‍රහනය කරනු ලැබ ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල් පනත ප්‍රකාරව මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය විසින් පවත්වාගෙන යනු ලබන වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අරමුදල් ජාතික රක්ෂණ භාර අරමුදලට පවරන ලදී. ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වර්ජන, කැරලි, සිවිල් කැලඹීම් හා ත්‍රස්ත අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ කටයුතු කරන සමාගම් අයකර ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට බැර කළ යුතුය.

2007 අංක 27 දරන සංශෝධිත පනත අනුව සියළු ලියාපදිංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සියළු රක්ෂණ සමාගම් වෙත නියෝගය පනවමින් 2013 ජනවාරි 01 වැනි දින සිට සියලූම වර්ගයේ ප්‍රති රක්ෂණ සම්මුති සහ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30%ක ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දන්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

අනෙකුත් අදාළ කරුණු

මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS)

මෝටර් රථ වාහන පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව නම් වූ ආයතනය ප්‍රවාහන අමාත්‍යංශයේ විෂයපථය යටතේ පවතී.

මෝටර් රථ වාහන රක්ෂණ ආවරණය ලබා දෙන රක්ෂකයින් සෑම කෙනෙකුම තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණයකින් 1%ක් මාර්ග ආරක්ෂණ අරමුදලට දායක කළ යුතුය. මෙම ජාතික සභාවේ පාලක සභාවෙහිද රක්ෂණ මණ්ඩලයට නියෝජනයක් ඇත.

හදිසි අනතුරකදී පීඩාවට පත්වන වින්දිතයින් හට වන්දි ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.

Financial Sector Oversight Council (FSOC)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිහිටුවන ලද අන්තර් නියාමන ආයතන සභාව "Financial Sector Oversight Council" ලෙස නැවත නම්කරනු ලැබ ඇත.

ඉහළ මට්ටමේ කමිටුවක් වන මෙය පිහිටුවීමේ අරමුණ වූයේ මූල්‍ය වෙළෙඳාමෙහි ක්‍රමානුකූල වර්ධනය සඳහා අවශ්‍ය නිසි ප්‍රතිපත්ති සම්පාදනය හා සමස්ත මූල්‍ය පද්ධතියේම අභිවෘද්ධිය උදෙසා සියලු නියාමන නියෝජිතයින් සම්බන්ධීකරණය කරමින් තොරතුරු හුවමාරු කර ගැනීමයි. රක්ෂණ මණ්ඩලය අන්තර් නියාමන සභාවේ ද නියෝජනය වෙයි.

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය (IASL)

1989 දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සාමාජිකත්වය පනත යටතේ ලියාපදිංචිය ලබා ඇති සෑම රක්ෂණ සමාග මකටම ලබා ගත හැකිය. ජාතික රක්ෂණ භාර අරමුදල හැර අනෙක් සියලූ රක්ෂණ සමාගම් මෙම සංගමයේ සාමාජිකයෝය.

පොදු සමාලෝචනය

සියලුම රක්ෂණ සමාගම් හී ප්‍රධාන විධායක නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව සමස්ථ කළමනාකරණය පිළිබඳ වගකීම දරයි.

- ජීවිත රක්ෂණ සංසදය
- සාමාන්‍ය රක්ෂණ සංසදය
- මූල්‍ය තාක්ෂණ අනු කමිටුව
- නීති උපදේශන සංසදය
- මානව සම්පත් අනුකමිටුව
- තොරතුරු තාක්ෂණය පිළිබඳ අනු කමිටුව
- අලෙවිකරණය හා විකුණුම් සංසදය
- ජීවගණක අනුකමිටුව

යන කමිටු විසින් විධායක කමිටුවට සහය වෙමින් ස්වකීය වගකීම් හා අදාළ වන්නා වූ විෂය ක්ෂේත්‍ර පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ ප්‍රධාන අරමුණු

1. රක්ෂණය වන ජනතාව හා රක්ෂකයන්ගේ පොදු යහපත හා සුබසාධනය උදෙසා උපදෙස් සැපයීමටත්, සහයෝගීතාවටත් අවස්ථාව සලසනු වස් ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරයේ නිරතව සිටින සියලු රක්ෂකයන් එකමුතු කිරීම.

2. රක්ෂණ ව්‍යාපාරය තුළ ඒකාකාරී යහපත් ක්‍රියා පිළිවෙතක් සහ උසස් සදාචාරාත්මක මට්ටමක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම මගින් රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ රක්ෂණය වන ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම.

3. සාමාන්‍ය ජනතාව අතර රක්ෂණ අවශ්‍යතා හා වටිනාකම් පිළිබඳ දැනුවත්භාවය ගොඩ නැගීම.

4. ව්‍යවස්ථාදායක හා නියාමන අවශ්‍යතා නිරීක්ෂණය තුළින් රක්ෂණ කර්මාන්තයේ ස්ථායිථාවය හා වර්ධනය සඳහා අදාළ බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීම.

5. වෙනත් රටවල රක්ෂණ ක්‍රමවේද හා තාක්ෂණ උපක්‍රම පරීක්ෂා කිරීම හා පුනරීක්ෂණය කිරීම මගින් වඩාත් සුදුසු ක්‍රමවේදය ශ්‍රී ලංකා වෙළෙඳ පොලට යොදා ගැනීම.

6. අධ්‍යාපන හා පුහුණු වැඩමුළු ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීයභාවය ප්‍රවර්ධනය දිරි ගැන්වීම සහ ඊට සක්‍රීයව සහය වීම. ඒ සඳහා පන්ති, සම්මන්ත්‍රණ, වැඩමුළු, සංවාද, උපදේශන, රැස්වීම් පැවැත්වීම.

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA)

මණ්ඩලය විසින් අනුමත කරන ලද එකම රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය වන්නේ ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයයි. පනතේ 79 වන වගන්තිය අනුව රක්ෂණ තැරැව්කාර සමාගමක් ලෙස ක්‍රියා කිරීමට අපේක්ෂා කරන සෑම සමාගමක්ම මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර මෙම සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට අවශ්‍ය වේ. සංගමය විසින් සකස් කරනු ලැබූ එහි කටයුතු සඳහා අදාළ නීති මාලාව සාමාජික සමාගම් විසින් පිළිපදිනු ලැබිය යුතු වන්නේය.

ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමයේ ප්‍රධාන අරමුණු

රක්ෂණ තැරැව්කරුවන්ගේ කාර්යභාරය පිළිබඳ මහජනතාව තුළ දැනුවත්භාවයක් ඇති කිරීම.

සාමාජිකයින් අතර තාක්ෂණික දැනුම වැඩි කිරීම හා ඉහළ මට්ටමක නිපුනතාවයක් සහ වෘත්තීය භාවයක් ගොඩ නැගීම.

රක්ෂණ පාඨමාලාවන් හැදෑරීම සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට සාමාජිකයන් දිරිමත් කිරීම සහ සහයෝගය ලබාදීම.

නියාමනයන්, රක්ෂකයින්, සහ මහජනතාව සමගින් හොඳ හිත සහ හිතකර සබඳතාවන් පවත්වා ගැනීම.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය (SLII)

1982 වසරේ දී ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය ලාභ නොලබන සංවිධානයක් වන අතර එහි ප්‍රධාන අරමුණ වන්නේ රක්ෂණ ව්‍යාපාරයෙහි නියුක්තවන්නන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමයි. ආයතනය අරමුදල් සපයා ගන්නේ රක්ෂණ සමාගම්වලින් පිරිනමන දායකත්වය තුළින් හා සාමාජිකයන්ගේ වාර්ෂික සාමාජික මුදල්වලිනි.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ ප්‍රධාන අරමුණු

රක්ෂණ ක්ෂේත්‍රයේ නියුතු අයගේ පොදු සංවර්ධනය, ප්‍රගතිය, හා කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය මධ්‍යම සංවිධානයක් ලෙස කටයුතු කිරීම හා ඔවුන්ගේ යහපත පිණිස මෙන්ම රක්ෂණ ව්‍යාපාරය වඩාත් කාර්යක්ෂම කිරීම හා කර්මාන්තය පිළිබඳව වෘත්තීකත්වය ලබාදීම.

රක්ෂණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් වර්ධනය කරවීමට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා පැවැත්වීම තුළින් රක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම, ඕනෑම පිළිගත් අධ්‍යාපන ආයතනයක් හරහා රක්ෂණ ක්ෂේත්‍රයේ ඕනෑම අංශයක විෂයයන් වෘත්තීය මට්ටමින් හැදෑරීම සඳහා සහය දැක්වීමටත්, උනන්දු කිරීමටත් විභාග පැවැත්වීම.

වෘත්තීය කරුණු පිළිබඳ සාකච්ඡා සම්මන්ත්‍රණ හෝ රැස්වීම් පැවැත්වීමටත්, පර්යේෂණ පත්‍රිකා, දේශන ආදිය ඉදිරිපත් කිරීමටත් සාමාජිකයන්ට වැදගත් වන්නා වූ සිදුවීම්, වාර්තා හෝ ලැයිස්තු වැනි දේ සංස්කරණයටත් ඉඩ සැලසීම.

ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය ආරක්ෂා කිරීමටත් ඔවුන්ගේ ප්‍රවර්ධනය පුළුල් කිරීමට මෙන්ම පොදුවේ ගත් කළ රක්ෂණ නිලධාරීන්ගේත්. ආයතනික සාමාජිකයන්ගේත් තත්ත්වයන් ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය වෘත්තීමය අධීක්ෂණය හා පාලනය ඇති කිරීම.

මෙම ආයතනය ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනයට අනුබද්ධව ඇති අතර ලන්ඩනයේ වරලත් රක්ෂණ ආයතනය ඉන්දියාවේ රක්ෂණ ආයතනය සහ ඉන්දියාවේ ජීවගණක සංගමය වැනි වෘත්තීය ආයතනවල විභාග ද මෙහෙයවනු ලබයි. රක්ෂණ කර්මාන්තයෙහි නියලෙන්නන් සඳහා සංගමය විසින් කෙටි කාලීන රක්ෂණ ඩිප්ලෝමා පාඨමාලා ද පවත්වනු ලැබේ.

රක්ෂණ නියෝජිතයන් ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන අය සඳහා පූර්ව බඳවාගැනීම් පරීක්ෂණ සිදු කිරීමේ වගකීම මණ්ඩලය විසින් මෙම ආයතනයට පවරා ඇත. රක්ෂණ ක්ෂේත්‍රයෙහි සාමාන්‍ය හා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පන්ති දෙවර්ගය සඳහාම ආයතනය විසින් පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලැබේ.

පොදු සමාලෝචනය

රක්ෂණ ඔම්බුඩ්ස්මන්

ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් 2005 ජනවාරි මස, රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා ලෙස ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා පත් කර ඇත. ශ්‍රී ලංකා රක්ෂණ සංගමය හා රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම අනුව රක්ෂණ ඔප්පු හිමියන් විසින් රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ආරාවුල් නිරාකරණය හා සමථ කිරීම සඳහා එකී පාර්ශ්වයන් දෙක විසින් තමන්ගේ උපරිමයෙන් කටයුතු කරනු ලැබේ.

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS)

රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ සාමාජිකයෙක් වශයෙන් ඔවුන් විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශන මෙන්ම ප්‍රධාන රක්ෂණ ක්‍රියාපිළිවෙත් සහ සංගමයේ ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ තොරතුරු නිතිපතා මණ්ඩලයට ලැබේ. එම සංගමය විසින් නිර්දේශ කරනු ලබන සමහර ප්‍රධාන රක්ෂණ ක්‍රියා පිළිවෙත් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය ඵලදායී ලෙස අධීක්ෂණය කරනු හා මෙහෙයවනු පිණිස මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

රක්ෂණ නියාමකයින්ගේ ආසියාතික සංසදයේ 10 වැනි වාර්ෂික සමුළුව පැවැත්වීම

"Changing Landscape in Insurance Regulation" යන තේමාව යටතේ මණ්ඩලය විසින් 2015 ජූලි මස, 27 හා 28 යන දෙදින තුළදී රක්ෂණ නියාමකයින්ගේ ආසියාතික සංසදයේ 10 වැනි වාර්ෂික සමුළුව කොළඹදී පවත්වන ලදී.

මෙම සමුළුව සඳහා ආසියාතික කලාපයෙන් රක්ෂණ නියාමකයන් 14 දෙනෙකු ඇතුළුව රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමයේ මහ ලේකම්, Access to Insurance Initiative (A2ii) ආයතනයේ නියෝජිතයන්, ආසියානු සංවර්ධන බැංකුවේ නියෝජිතයන්, හා ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය (OECD) නියෝජිතයන් සහභාගි වූහ.

ඉහත සමුළුවේදී පහත දැක්වෙන මූලික සැසි පවත්වන ලදී.

- තම තමන්ගේ රටෙහි පවතින රක්ෂණ අංශයේ සංවර්ධනයන් පිළිබඳව සමුළුවට සහභාගි වූ එක් එක් නියාමකවරයෙක් විසින් කරුණු ඉදිරිපත් කිරීම.
- ගෝලීය රක්ෂණයේ ප්‍රාග්ධන ප්‍රමිතීන් (Global Insurance Capital Standards) ප්‍රවර්ධනය කිරීම පිළිබඳව රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය මගින් කරන ලද ඉදිරිපත් කිරීම.
- නව ප්‍රාග්ධන ප්‍රමිතීන් ක්‍රියාවට නැංවීමේදී පැනනගින අභියෝග පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව.
- ආසියානු සංවර්ධන බැංකුවේ ආපදා රක්ෂණය, කෘෂි රක්ෂණය හා බදු අත්හිටුවන ලද වාර්ෂික රක්ෂණ පිළිබඳ "High Level Round Table"
- සියලුම දෙනා අන්තර්ගත වන සාමානුපාතික රක්ෂණ රාමුවක් ගොඩ නැංවීම පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව.

ගරු අමාත්‍ය මහින්ද සමරසිංහ මහතා

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිනිය
ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය

තවද එම සමුළුවේ සාමාරම්භක උළෙලෙදී AFIR නිල වෙබ් අඩවිය දියත් කිරීම සිදු විය. එකී සමුළුවට ආසියාතික රක්ෂණ නියාමකවරුන්හට තම අත්දැකීම් බෙදාහදා ගැනීම සඳහා අවස්ථාව උදාකර දුන් අතර වසර 10ක් වූ AFIR හි ඉදිරි ගමන පිළිබඳව සාකච්ඡා කිරීමටද හැකියාව ලබා දුනි. ඒ අනුව AFIR සඳහා කොළඹ ප්‍රකාශයට අනුකූලව ස්ථිර ලේකම් කාර්යාලයක් පිහිටුවීම සඳහා ඉදිරිපත් වූ යෝජනාවක් සමඟ AFIR සමුළුව සාර්ථක ලෙස නිමාවට පත්විය. AFIR හි වර්තමාන සභාපතිත්වය දරන්නේ මහජන චීනයේ රක්ෂණ නියාමන කොමිෂන් සභාව වේ.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ කර්මාන්තය පිළිබඳ දළ විශ්ලේෂණය

2015 වසර ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සඳහා සාර්ථක වසරක් වූ අතර, 2014 වසරේ දී වාර්තා වූ 5.44% ක වර්ධනයට සාපේක්ෂව එහි සමස්ත දළ ලිඛිත වාරිකයෙහි (GWP) 16.12% ක ප්‍රශංසනාත්මක වර්ධන අනුපාතිකයක් පෙන්නුම් කරන ලදී. 2015 වසරේ දී උත්පාදනය කරන ලද සමස්ත දළ ලිඛිත වාරිකය රු. මිලියන 122,390 ක් (2014 : රු. මිලියන 105,399) වූ අතර එය දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ක්ෂේත්‍ර වලින් උත්පාදනය කරන ලද වාරික වලින් සමන්විත විණි. මෙම සැලකිය යුතු වර්ධනය දීර්ඝකාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශ යන ද්විත්වයෙහිම ඉහළ ගිය වාරික ආදායම් සඳහා ආරෝපණය වූ අතර එය පිළිවෙලින් රු. මිලියන 53,575 ක් සහ රු. මිලියන 68,815 ක් ලෙස ගණනය විය.

2015 දී, ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) විසින් රු. මිලියන 1,784 ක් වටිනා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් හි අනිවාර්ය ප්‍රතිරක්ෂණ පැවරීම්වල ප්‍රතිරක්ෂණ වාරික ආදායමක් උත්පාදනය කර ඇත. 2015 දී, ජාතික රක්ෂණ භාර අරමුදල (NITF) හි ප්‍රතිරක්ෂණ වාරික ආදායම 2014 වසරේ උත්පාදිත රු. මිලියන 2,041 ට සාපේක්ෂව 12.59% කින් පහත වැටී ඇත.

2014 දී වාර්තා වූ රු. මිලියන 44,596 ට වඩා 20.14% ක වර්ධනයක් සහිතව 2015 වසරේ දී දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවලින් උත්පාදිත වාරික මුදල් රු. මිලියන 53,575 ක් විය. දිගු කාලීන රක්ෂණ අංශයේ ඉහළ ගිය කාර්ය සාධනයට ප්‍රධාන වශයෙන්ම පාරිභෝගිකයින් සඳහා ගුණාත්මක සේවයක් සහතික කරලීම, මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩි දියුණු කිරීම පිණිස රක්ෂණකරුවන් විසින් දරනු ලබන ප්‍රයත්නයන්, වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා නව ජීවිත රක්ෂණ ඔප්පු හඳුන්වාදීම, පවතින රක්ෂණ ඔප්පු නවීකරණය කිරීම, රක්ෂණය සම්බන්ධ පාරිභෝගික දැනුවත්භාවය ඉහළ නැංවීම සහ ජීවිතාරක්ෂණ සඳහා වන ඉල්ලීම ඉහල නැංවීම පිණිස බලපෑම් ඇතිකරන රටේ සමාජ ආර්ථික තත්ත්වයන් ආදී සාධක ප්‍රධාන වශයෙන් හේතුවී ඇත.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය ද 2014 උත්පාදිත රු. මිලියන 60,803 ට සාපේක්ෂව රු. මිලියන 68,815 ක වටිනාකමින් යුතු දළ ලිඛිත වාරිකයක් උත්පාදනය කරමින් 2015 වසරේ දී 13.18% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත. සාමාන්‍ය රක්ෂණ සමාගම්වලට ස්වකීය ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීම, ආකර්ෂණීය සුවිශේෂී වෙළඳ පොළ අංග ඉලක්ක කරගැනීම, උතුරු සහ නැගෙනහිර පළාත්වල ව්‍යාපාර මෙහෙයුම් පුළුල්කිරීම වැනි යාන්ත්‍රණ හරහා වෙළඳපල පවතින උග්‍ර තරගකාරීත්වය මධ්‍යයේ 2015 වසරේ තම වාරික ආදායාම ඉහළ නැංවීමට සමත්ව තිබීම විශේෂ ලක්ෂණයකි.

රක්ෂණ ව්‍යාප්තිය දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස රක්ෂණ වාරික පිළිබිඹු කරන අතර 2015 වර්ෂයේ සමස්ත කර්මාන්තය වාරික දළ දේශීය නිෂ්පාදිතයෙන් 1.09% ක් වූයේ, 8% ක වර්ධනයක් 2014 සාපේක්ෂව වාර්තා කරමිනි. ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාප්තිය තවමත් ආසියානු කලාපයේ අනිකුත් ආර්ථිකයන්ට වඩා පහළ මට්ටමක පවතින අතර, එයින් පෙනී යන්නේ වර්ධනයවන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට රක්ෂණ නිෂ්පාදන පිරිනමමින් රක්ෂණකරුවන්ට ස්වකීය ව්‍යාපාර පුළුල් කිරීමට සැලකිය යුතු අවස්ථාවන් පවතින බවය. 2015 වසරේ දී, දිගු කාලීන හා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල ව්‍යාප්ත අනුපාතිකයන් පිළිවෙලින් 0.48% (2014 : 0.43%) සහ 0.62% (2014 : 0.58%) ලෙස වාර්තා වූ අතර, පන්ති දෙකෙහිම ව්‍යාප්ත මට්ටම්වල වැඩි දියුණුවක් පිළිබිඹු කරන ලදී.

රක්ෂණ ඝනත්වය ජනගහනයෙන් එක් එක් පුද්ගලයෙකුගේ වාරික ආදායම පිළිබිඹු කරන අතර, 2015 වසරේ එහි වටිනාකම රු. 5,838 ක් වූ අතර රක්ෂණ ඝනත්වය 2014 වසරේ දී වාර්තා වූ රු. 5,074 ට සාපේක්ෂව 15.06% කින් වර්ධනය වී තිබේ. මෙම වර්ධනය ජනගහනයේ අල්ප වර්ධනයට එදිරිව වැඩි වූ වාරික ආදායම හේතුවෙන් ඇති වූවකි.

වගුව 1
වාරික ආදායම සහ ව්‍යාප්තිය

	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014 (ආ)	2015 (ඇ)
වාරික ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර (රු. මිලියන)	35,162	37,477	41,676	44,596	53,575
වාරික ආදායම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර(රු. මිලියන)	46,929	53,213	58,284	60,803	68,815
සමස්ත වාරික ආදායම -රක්ෂණ ව්‍යාපාර (රු. මිලියන)	82,091	90,690	99,960	105,399	122,390
මුලු වාරික ආදායම් වර්ධන අනුපාතය - රක්ෂණ ව්‍යාපාර (%)	17.62	10.48	10.22	5.44	16.12
ප්‍රතිරක්ෂණ වාරික ආදායම(රු. මිලියන)**	199	464	1,042	2,041	1,784
ප්‍රවර්තන වෙළඳපල මිළට දළ දේශීය නිෂ්පාදනය (රු. මිලියන)*	7,219	8,732	9,592	10,448	11,183
දළ දේශීය නිෂ්පාදන වර්ධන අනුපාතය *	8.40	9.10	3.40	4.90	4.80
ව්‍යාප්තිය %(ද.දේ.නි. % ලෙස රක්ෂණ ව්‍යාපාරවල මුළු වාරිකය)	1.14	1.04	1.04	1.01	1.09
ව්‍යාප්තිය %(ද.දේ.නි. % ලෙස දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වාරික)	0.49	0.43	0.43	0.43	0.48
ව්‍යාප්තිය %(ද.දේ.නි. % ලෙස සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වාරික)	0.65	0.61	0.61	0.58	0.62
රක්ෂණ ඝනත්වය - (මුලු වාරික ආදායම - රක්ෂණ ව්‍යාපාර/ ජනගහනය) (රු.)	3,934	4,440	4,857	5,074	5,838
ජනගහනය '000 (මධ්‍ය වාර්ෂික) *	20,869	20,424	20,579	20,771	20,966

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව
** ප්‍රතිරක්ෂණ වාරික ආදායම සාමාන්‍ය රක්ෂණයන්හි ප්‍රතිරක්ෂණ වාරිකවල අනිවාර්ය අත්හැර දැමීම් නියෝජනය කරයි.

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා(ජාතික රක්ෂණ භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්වල මුළු වත්කම්

අන්තර් ඛණ්ඩ ගණුදෙනු ඉවත්කළ පසුව රක්ෂණකරුවන්, ප්‍රතිරක්ෂණකරු වන ජාතික රක්ෂණ භාර අරමුදල විසින් දරනු ලබන සමස්ත වත්කම් ප්‍රමාණය 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 464,944ක් වූ අතර (2014: රු. මිලියන 421,407) එය 2014 ට සාපේක්ෂව 10.33% ක ඉහළ යාමකි. කොටස් හිමියන් ද ඇතුළුව දිගු කාලීන රක්ෂණ ව්‍යාපාර වත්කම් 2015 දෙසැම්බර් මස 31 වැනි දින වන විට රු. මිලියන 305,897 ක් වූ අතර (2014: රු. මිලියන 247,061), 2014 වසරට සාපේක්ෂව 23.81% ක කැපී පෙනෙන වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල සහ සාමාන්‍ය හා සංයුක්ත රක්ෂණකරුවන් හි කොටස්කරුවන්ගේ වත්කම් 2015 දෙසැම්බර් මස 31 වැනි දින වන විට රු. මිලියන 157,001 ක් වූ අතර,(2014: රු. මිලියන 173,964) එය 2014 ට සාපේක්ෂව 9.75% ක පහත වැටීමකි.

කෙසේ වෙතත් ඉහත සඳහන් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වත්කම්වල වර්ධනය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර වත්කම්වල අඩුවීම 2015 ක්‍රියාත්මක සංයුක්ත රක්ෂණ සමාගම්වල විසංගණනය හේතුවෙන් සිදු වූ අතර, එහිදී සංයුක්ත රක්ෂණ සමාගම්හි කොටස් හිමියන් සතු වත්කම් මින් පෙර සැලකිල්ලට ගෙන තිබුණේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යටතේය.

තවද, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රතිරක්ෂණ ව්‍යාපාරවලට අදාළ වත්කම් 2015 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 3,381 ක් වූයේ (2014: රු. මිලියන 3,065) පසුගිය වසර හා සසඳන කළ 10.31% ක වර්ධනයක් වාර්තා කරමිනි.

2011 වසරේ සිට 2015 වර්ෂ දක්වා රක්ෂණ කර්මාන්තවල මුළු වත්කම්, සහ එහි වර්ධන අනුපාතය 1 වන රූප සටහනෙහි දක්වා ඇත.

වගුව 2

රක්ෂණ සමාගම්වල වත්කම්

	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014 (ආ)	2015 (ඇ)
දීර්ඝ කාලීන රක්ෂණය (රු. මිලියන)	165,519	190,642	216,275	247,061	305,897
සාමාන්‍ය රක්ෂණය (රු. මිලියන)	109,482	137,730	155,636	173,964	157,001
ප්‍රතිරක්ෂණය(රු. මිලියන)	655	640	1,453	3,065	3,381
එකතුව	***271,356**	***322,986**	***365,760**	***421,407**	*** 464,944**

*අන්තර් කොටස් ගනුදෙනු 3 වන වගුවට අනුකූලව ඉවත් කර ඇත.

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජාතික රක්ෂණ භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

රූප සටහන 1

රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම් සහ වත්කම්වල වර්ධන අනුපාතය



(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජාතික රක්ෂණ භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්වල වත්කම් ව්‍යාප්තිය

2014 දෙසැම්බර් 31 වන දිනට සහ 2015 දෙසැම්බර් 31 වන දිනට දීර්ඝ කාලීන රක්ෂණ හා කොටස් හිමියන්, සාමාන්‍ය රක්ෂණ සහ කොටස් හිමියන් සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙ හි ප්‍රතිරක්ෂණ කොටස් යටතේ රක්ෂණ සමාගම් අතර වත්කම් බෙදීයාම 3 වන වගුවෙන් පැහැදිලි කර ඇත.

රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්වලින් වැඩිම කොටස එස්එල්අයිසී සමාගම දැරූ අතර, 2015 වසරේ දී රක්ෂණ සමාගම්වල මුළු වත්කම්වලින් 36.03% කට (2014: 38.43%) හිමිකම් කියන ලද්දේ රු. මිලියන 167,540 ක් (2013: රු. මිලියන 161,931) වටිනා වත්කම් හිමිකර ගනිමිනි. 2015 දෙසැම්බර් 31 වන විට එස්එල්අයිසී සමාගම විසින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යටතේ දරන ලද වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. මිලියන 94,914 ක් (2014: රු. මිලියන 90,143) සහ රු. මිලියන 72,626 කි. (2014: රු. මිලියන 71,988).

රු. මිලියන 80,595 වටිනාකමින් යුතුව මුලු වත්කම්වලින් 17.33% ක් හිමිකර ගනිමින් විශාලතම වත්කම් කොටසට හිමිකම් පෑ දෙවැන්නා බවට සෙලින්කෝ සමාගම පත්විය. රු. මිලියන 45,958 වටිනාකමින් යුතුව මුළු වත්කම්වලින් 9.88% ක් හිමිකර ගනිමින් විශාලතම වත්කම් කොටසට හිමිකම් පෑ තෙවැන්නා බවට පත්වූයේ ඒඅයිඒ ලයිෆ් සමාගමයි.

2015 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන 31,014 ක් සහ රු. මිලියන 19,656 ක් වටිනා වත්කම් දැරූ යුනියන් ලයිෆ් සහ සහ ජනශක්ති ලයිෆ් මුළු වත්කම්වලින් 6.67% කට හා 4.23%කට හිමිකම් පාන ලද්දේ රක්ෂණ කර්මාන්තයේ වත්කම් හිමිකාරත්වය අනුව හතරවන හා පස්වන ස්ථාන දිනා ගනිමිනි. ඉහත රක්ෂණකරුවන් පස්දෙනා විසින් මුළු වත්කම්වලින් 74.14% ක් හිමිකරගෙන තිබූ අතර, ඉතිරි 25.86% රක්ෂණ කර්මාන්තයේ අනිකුත් සාමාජිකයින් විසිපස් දෙනා විසින් හිමි කර ගන්නා ලදී.

වගුව 3

රක්ෂණ සමාගම් අනුව මුළු වත්කම් විශ්ලේෂණය

රක්ෂකයා	2014 (අ)						2015 (ආ)					
	දීර්ඝ කාලීන රක්ෂණය (රු. '000)	සාමාන්‍ය රක්ෂණය සහ කොටස් හිමියන් (රු. '000)	ප්‍රතිරක්ෂණය (රු. '000)	අන්තර් අංශ ගනුදෙනු සහ ඉවත් කිරීම (රු. '000)	එකතුව (රු. '000)	%	දීර්ඝ කාලීන රක්ෂණය (රු. '000)	සාමාන්‍ය රක්ෂණය සහ කොටස් හිමියන් (රු. '000)	ප්‍රතිරක්ෂණය (රු. '000)	අන්තර් අංශ ගනුදෙනු සහ ඉවත් කිරීම (රු. '000)	එකතුව (රු. '000)	%
ඒඅයිඒ ලයිෆ්	38,436,443	9,229,720		-	47,666,163	11.31	45,957,923			-	45,957,923	9.88
ඒඅයිඒ ජෙනරල්					-		-	5,647,487		-	5,647,487	1.21
ඒඅයිජී	-	449,598		-	449,598	0.11		234,134		-	234,134	0.05
අලියාන්ස් ජෙනරල්	-	3,264,435		-	3,264,435	0.77		3,943,092		-	3,943,092	0.85
අලියාන්ස් ලයිෆ්	1,467,969	-		-	1,467,969	0.35	1,947,203			-	1,947,203	0.42
අමානා ජෙනරල්	1,432,807	1,764,027		107,552	3,089,282	0.73		2,716,376		119,289	2,597,087	0.56
අමානා ලයිෆ්							2,521,827			57,696	2,464,131	0.53
ආර්පිකෝ	980,743	-		-	980,743	0.23	1,184,539			-	1,184,539	0.25
ඒෂියන් ලයිෆ්	6,716,714	3,589,135		-	10,305,849	2.45	9,814,620			-	9,814,620	2.11
ඒෂියන් ජෙනරල්								2,489,014		-	2,489,014	0.54
සෙලින්කෝ	63,184,332	34,313,040		-	97,497,372	23.14						
සෙලින්කෝ ජෙනරල්								18,849,220		-	18,849,220	4.05
සෙලින්කෝ ලයිෆ්							80,595,478				80,595,478	17.33
කොන්ටිනෙන්ටල්	-	2,037,110		-	2,037,110	0.48		2,544,689		-	2,544,689	0.55
කෝපරේටිව් ජෙනරල්	999,455	2,839,229		-	3,838,683	0.91		3,005,196		-	3,005,196	0.65
කෝප්ලයිෆ්							1,672,432			-	1,672,432	0.36
එච්එන්බී ලයිෆ්	5,930,808	2,583,550		1,394,110	7,120,248	1.69	10,022,562			-	10,022,562	2.16
එච්එන්බී ජෙනරල්								2,710,914		-	2,710,914	0.58
ජනශක්ති ලයිෆ්	8,159,309	12,507,757		-	20,667,067	4.90	19,656,286			-	19,656,286	4.23
ජනශක්ති ජෙනරල්								11,212,847		-	11,212,847	2.41
එල්අයිසී	1,899,682	-		-	1,899,682	0.45	2,056,120			-	2,056,120	0.44
එල්ඕඑල්සී	1,042,182	2,653,278		247,838	3,447,622	0.82						
එල්ඕඑල්සී ජෙනරල්								3,120,836		-	3,120,836	0.67
එල්ඕඑල්සී ලයිෆ්							2,346,342			402,566	1,943,775	0.42
එම්බීඑස්එල්	395,278	1,337,651		-	1,732,929	0.41	517,231	1,427,882		-	1,945,114	0.42
ජා.ර.භා.අ.		8,128,022	3,065,354		11,193,376	2.66		8,454,168	3,380,634	-	11,834,803	2.55
ඔරියන්ට්	-	1,015,302		-	1,015,302	0.24		1,150,664		-	1,150,664	0.25
පීපල්ස්	-	4,577,483		-	4,577,483	1.09		6,459,865		-	6,459,865	1.39
සණස	742,655	1,047,995		-	1,790,650	0.42	920,152	1,170,876		-	2,091,028	0.45
එස්එල්අයිසී	90,142,534	71,988,109		200,137	161,930,506	38.43	94,914,277	72,625,496		-	167,539,773	36.03
යුනියන් ලයිෆ්	25,530,258	10,638,421		733,048	35,435,630	8.41	31,769,676			755,860	31,013,816	6.67
යුනියන් ජෙනරල්								9,238,376		-	9,238,376	1.99
එකතුව	**247,061,169**	**173,963,862**	**3,065,354**	**2,682,685**	**421,407,699**	**100**	**305,896,668**	**157,001,132**	**3,380,634**	**1,335,411**	**464,943,024**	**100**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජාතික රක්ෂණභාර අරමුදල හැර)
(ආ) තාවකාලික සංඛ්‍යා

සටහන්:
1. අන්තර් - අංශ ගණුදෙනු 3 වන වගුව ප්‍රකාරව ඉවත් කර ඇත.
2. සංයුක්ත රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ට අයත් වත්කම් 2015 වසර සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.
3. 2014 වසර සඳහා අලියාන්ස් ලයිෆ්, ආර්පිකෝ සහ එල්අයිසී හැර කොටස් හිමියන්ට අයත් වත්කම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යටතේ වාර්තා කර ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 2

2014 දෙසැම්බර් 31 දිනට සමාගම් මට්ටමින් වත්කම් සංකේන්ද්‍රගතවීම විශ්ලේෂණය



රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්

රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල් 2014 ට වඩා 4.86% ක් වර්ධනය වෙමින් 2015 දෙසැම්බර් මස 31 වන විට රු. මිලියන 134,689 (2014 : රු. මිලියන 128,445) ක් විය. 4 වන වගුවෙන් නිරූපණය වන පරිදි 2015 දෙසැම්බර් 31 වන විට මුළු කොටස් හිමියන්ගේ අරමුදල් පිළිවෙලින් රු. මිලියන 39,242ක් සහ රු. මිලියන 95,447ක් ලෙස ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සහ සංචිතයන්ගෙන් යුක්ත විය. පූර්ව වර්ෂය හා සමානවම, එස්එල්අයිසී සමස්ත රක්ෂණ කර්මාන්තයේ කොටස් හිමියන්ගේ අරමුදලවලින් විශාලතම කොටස හිමිකරගත් අතර, එය 46.88%ක් විය. සෙලින්කෝ ලයිෆ් සහ ජාතික රක්ෂණ භාර අරමුදල පිළිවෙලින් මුළු කොටස් හිමියන්ගේ අරමුදලින් 6.43% කට සහ 6.30%කට හිමිකම් පෑවේ දෙවන සහ තෙවන තැනට පත්වෙමිනි. 2015 දෙසැම්බර් 31 දිනට සෙලින්කෝ ජෙනරල් සහ ජනශක්ති ලයිෆ් සමාගම් මුළු රක්ෂණ කර්මාන්ත කොටස් හිමියන්ගේ අරමුදලින් පිළිවෙලින් 5.91%ක් සහ 5.58%ක් හිමි කර ගන්නා ලදී. ඉහළම ස්ථාන පහෙහි ශ්‍රේණිගත කළ ඉහත සඳහන් කළ රක්ෂණ සමාගම් පහ 2015 දෙසැම්බර් 31 දිනට සමස්ත කොටස් හිමියන්ගේ අරමුදල්වලින් 71.10% කට හිමිකම් පා තිබුණි.

2015 වසරේ දී ක්‍රියාත්මක වූ සංයුක්ත රක්ෂණ සමාගම්වල විසංගමනය හේතු කොටගෙන තනි රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ අරමුදල්වල සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

මෙයට හේතුවූයේ විසංගමනයට පෙර සංයුක්ත රක්ෂණ සමාගම්වල කොටස්හිමියන්ගේ අරමුදල් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ සලකාබැලීමය.

සංඛ්‍යානමය සමාලෝචනය

වගුව 4

රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ගේ මුළු අරමුදල්

රක්ෂකයා	2014 (අ)		2015 (ආ)			
	සමස්ත කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු. '000)	%	ප්‍රකාශිත ප්‍රාග්ධනය (රු. '000)	මුළු සංචිත (රු. '000)	සමස්ත කොටස් හිමියන්ගේ මුළු අරමුදල් (රු. '000)	%
ඒඅයිඒ ලයිෆ්	4,835,259	3.76	511,922	5,850,950	6,362,871	4.72
ඒඅයිඒ ජෙනරල්			1,878,017	52,262	1,930,279	1.43
ඒඅයිජී	216,399	0.17	536,265	(409,203)	127,062	0.09
අලියාන්ස් ජෙනරල්	896,867	0.70	500,000	486,717	986,717	0.73
අලියාන්ස් ලයිෆ්	228,764	0.18	739,624	(525,138)	214,486	0.16
අමානා ජෙනරල්	1,039,367	0.81	1,650,001	40,390	1,690,391	1.26
අමානා ලයිෆ්			500,000	15,594	515,594	0.38
ආර්පිකෝ	621,296	0.48	675,565	(22,912)	652,653	0.48
ඒෂියන් ලයිෆ්	2,370,993	1.85	1,062,500	1,375,435	2,437,935	1.81
ඒෂියන් ජෙනරල්			800,000	(214,611)	585,389	0.43
සෙලින්කෝ	25,269,840	19.67				
සෙලින්කෝ ජෙනරල්			500,200	7,463,161	7,963,361	5.91
සෙලින්කෝ ලයිෆ්			500,001	8,154,425	8,654,426	6.43
කොන්ටිනෙන්ටල්	897,988	0.70	750,000	286,499	1,036,499	0.77
කෝපරේටිව් ජෙනරල්	1,464,133	1.14	1,004,910	486,574	1,491,483	1.11
කෝප්ලයිෆ්			500,000	(13,445)	486,555	0.37
එච්එන්බී ලයිෆ්	2,406,356	1.87	1,171,875	1,339,468	2,511,343	1.86
එච්එන්බී ජෙනරල්			1,150,000	(227,399)	922,601	0.68
ජනශක්ති ලයිෆ්	5,206,641	4.05	4,854,139	2,661,582	7,515,721	5.58
ජනශක්ති ජෙනරල්			4,000,000	171,287	4,171,287	3.10
එල්අයිසී	698,866	0.54	500,000	192,038	692,038	0.52
එල්ඕඑල්සී	1,008,610	0.79				
එල්ඕඑල්සී ජෙනරල්			600,000	215,108	815,108	0.61
එල්ඕඑල්සී ලයිෆ්			800,000	(337,230)	462,770	0.34
එම්බීඑස්එල්	459,735	0.36	1,080,022	(727,273)	352,749	0.26
ජා.ර.භා.අරමුදල(ඇ)	7,723,035	6.01		8,483,299	8,483,299	6.30
ඔරියන්ට්	627,949	0.49	750,000	(232,710)	517,290	0.38
පීපල්ස්	1,409,322	1.10	1,350,000	888,865	2,238,865	1.66
සණස	637,444	0.50	745,058	111,080	856,138	0.64
එස්එල්අයිසී	64,216,314	50.00	6,000,000	57,143,901	63,143,901	46.88
යුනියන් ලයිෆ්	6,210,217	4.83	1,000,000	2,464,929	3,464,929	2.57
යුනියන් ජෙනරල්			3,131,948	272,914	3,404,863	2.54
එකතුව	**128,445,395**	**100**	**39,242,047**	**95,446,557**	**134,688,603**	**100**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භා.අරමුදල හැර)
(ආ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම

2015 දී, ආර්ථිකයේ ප්‍රධාන මූල්‍ය අංශ වල මුළු වත්කම් ප්‍රමාණය 2014 දෙසැම්බර් 31 වන විට වාර්තා කළ රු. බිලියන 12,015 හා සැසඳීමේ දී 2015 දෙසැම්බර් 31 වන විට රු. බිලියන 13,662 ක් දක්වා වර්ධනය වූ අතර එය 13.46% ක වර්ධනයක් විය. 5 වන වගුවෙන් සහ 3 වන සටහනෙන් නිරූපණය වන ආකාරයට 2015 දෙසැම්බර් 31 වන විට බැංකු අංශය රු. බිලියන 9,503 ක් වටිනා වත්කම් සහිතිව මුළු වත්කම්වලින් 69.6% ක් වාර්තා කළේ මූල්‍ය අංශය තුළ එහි ඇති වැදගත්කම සනිටුහන් කරමිනි. ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන 2015 වසරේ දී මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් 15.4% ක් වාර්තා කළේ රු. බිලියන 2,108.1 ක් වටිනා වත්කම් වාර්තා කරමිනි. තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන හා විශේෂිත මූල්‍ය ආයතන 2015 වසරේ දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු. බිලියන 1,042 ක් හා රු. බිලියන 544 ක් වූ වත්කම් වටිනාකම් හිමිව සිටි අතර, මූල්‍ය අංශයෙන් පිළිවෙලින් 7.6% ක් හා 4.0% ක් සඳහා හිමිකම් කීවේය. 2015 වසරේ දෙසැම්බර් 31 දින වන විට රක්ෂණ සමාගම් සතුව රු. බිලියන 464.9 ක් වටිනා වත්කම් තිබුණු අතර මූල්‍ය අංශයේ වත්කම්වලින් 3.4% ක් සඳහා පමණක් හිමිකම් කීවේ 2014 වාර්තා අගය වූ 3.5% හි යම් අඩුවීමක් පෙන්නුම් කරමිනි.

වගුව 5

ප්‍රාග්ධන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම

මූල්‍ය අංශ	වත්කම් බෙදීයාම									
	2011		2012		2013		2014		2015	
	රු. බිලියන	%	රු. බිලියන	%	රු. බිලියන	%	රු. බිලියන	%	රු. බිලියන	%
බැංකු අංශය	5,375.6	69.7	6,377.0	70.3	7,187.5	69.6	8,442	70.3	9,503	69.6
තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	427.1	5.5	621.2	6.9	756.4	7.3	857	7.1	1,042	7.6
විශේෂිත මූල්‍ය ආයතන	338.8	4.4	310.4	3.4	378	3.7	441	3.7	544	4.0
ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන	1,299.4	16.8	1,429.6	15.8	1,632.5	15.8	1,853.6	15.4	2,108.1	15.4
රක්ෂණ සමාගම්	271.4 (අ)	3.6	323.0 (අ)	3.6	365.8 (අ)	3.6	421.4 (ආ)	3.5	464.9 (ඇ)	3.4
එකතුව	**7,712.3**	**100**	**9,061.2**	**100**	**10,320.2**	**100**	**12,015**	**100**	**13,662**	**100**

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා - 2015 (රක්ෂණ සමාගම්වල වත්කම් රක්ෂණ සමාගම්වලින් ලැබූ දත්ත පාදකව පුනස්ථාපනයකර ඇත.)
(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජාතික රක්ෂණභාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යාවන්

රූප සටහන 3

2015 දෙසැම්බර් 31 වන විට ප්‍රධාන මූල්‍ය අංශ අතර මුළු වත්කම් බෙදීයාම



සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්වල ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් පිළිබඳ විශ්ලේෂණය

2015 වසරේ රක්ෂණ අංශයේ සිදු වූ වර්ධනයත් සමඟ අනුරූප වන පරිදි 2014 වර්ෂයේ ක්‍රියාත්මකව පැවති ශාඛා 1,465 හා සන්සන්දනය කරන කල, 27.78% ක සැලකිය යුතු වර්ධනයක් ඇතිව 2015 දෙසැම්බර් 31 දිනට දිවයින පුරා ශාඛා 1,872 ක් රක්ෂණ සමාගම් සතු විය. 6 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි 631 ක් (2014:488) ලෙස වැඩිම ශාඛා ප්‍රමාණයක් බස්නාහිර පළාතේ පිහිටා තිබූ අතර, එය දිවයින පුරා පිහිටි සමස්ත ශාඛා සංඛ්‍යාවෙන් 33.71% ක් විය. දකුණු හා වයඹ පළාත් පිළිවෙලින් ශාඛා 232 ක් (2014:192) සහ 188 ක් (2014:133) ඇතිව දෙවැනියට සහ තෙවැනියට විශාලතම ශාඛා ජාලය ඇති පළාත් විය.

පූර්ව වර්ෂය හා සමානවම, 2015 වසරේ දී අවම ශාඛා ගණන වන 108 (2014:76) ඌව පළාතෙහි පිහිටි නමුත් එය 2014 වසරට සාපේක්ෂව 42.11% ක වර්ධනයක් විය. යුද්ධය අවසානයේ දී උතුරු නැගෙනහිර ප්‍රදේශයෙහි රක්ෂණ ව්‍යාපාරයන්හි අඛණ්ඩ ව්‍යාප්තිය පිළිබිඹු කරමින් උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි ශාඛා ප්‍රමාණය ද පිළිවෙලින් 25.23%කින් සහ 19.23%කින් වැඩි වී තිබුණි.

සෘජු මෙන්ම වක්‍ර සේවා නියුක්ති අවස්ථාවන් සපයා දෙමින් රක්ෂණ කර්මාන්තය ආර්ථිකයට දායක වේ. 2015 වසරේදී රක්ෂණ අංශයේ සමස්ත සේවා නියුක්තිකයින් ගණන 15,830 (2014:15,650) ක් වූයේ 2014 වසරට සාපේක්ෂව 1.15%ක වැඩිවීමකිනි. වැඩිම සේවා නියුක්තිකයින් ගණන බස්නාහිර පළාතේ ස්ථාපිතව සිටි අතර, එය 10,484 (2014:10,287) ක් වූයේ දිවයින පුරා සිටින මුළු සේවක සංඛ්‍යාවෙන් 66.23% ක් නියෝජනය කරමිනි. 2015 වසරේ දී දකුණු හා වයඹ පළාත් දෙවැනියට හා තෙවැනියට වැඩිම සේවකයින් සංඛ්‍යාවක් සහිත පළාත් බවට පත් වී ඇත්තේ පිළිවෙලින් සේවකයින් 986 ක් (2014: 1,143) සහ 883 ක් (2014:725) සහිතවය. 2015 වසරේදී සේවක සංඛ්‍යාව 430 ක් වූ උතුරු පළාත අඩුම සේවක සංඛ්‍යාව සහිත පළාත විය (2014:400).

2015 වසරේ රක්ෂණ සමාගම්වලට සම්බන්ධව සේවය කළ මුළු නියෝජිතයින් සංඛ්‍යාව 45,433 ක් (2014:42,958) වූ අතර, 2014 වසරට සාපේක්ෂව 5.76% ක වර්ධනයක් පෙන්නුම් කරයි. ශාඛාවන් සහ සේවා නියුක්තිකයින් හා සමානවම ජීවිත රක්ෂණ මෙන්ම සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන අලෙවියට අදාළ වැඩිම නියෝජිතයින් සංඛ්‍යාව වූ 17,847 (2014:16,578) බස්නාහිර පළාතේ ක්‍රියාත්මකව තිබුණි. 2015 වසරේ දී දෙවන සහ තෙවන ඉහළම නියෝජිත සංඛ්‍යාවක් දකුණු පළාතේ සහ මධ්‍යම පළාතේ ක්‍රියාත්මක වූ අතර, එය පිළිවෙලින් 5,196 (2014:5,275) සහ 4,554 (2014:4,370) ක් විය. ඌව පළාතෙන් අඩුම නියෝජිතයින් සංඛ්‍යාවක් 2015 වසරේ දී වාර්තා වූ අතර එය 2,258 (2014:2,197)ක් විය.

2015 වසරේ දෙසැම්බර් 31 වන විට දිවයිනේ පළාත් නවය පුරා පිහිටි ශාඛා, සේවකයින් සහ නියෝජිතයින්ගේ සංඛ්‍යාවේ බෙදීයාම 4 වැනි රූපසටහනෙන් පැහැදිලි කරයි.

වගුව 6

2015 දෙසැම්බර් 31 සහ 2014 දෙසැම්බර් 31 දිනයන්ට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව

පළාත	ශාඛා සංඛ්‍යාව		සේවාදායකයින් සංඛ්‍යාව		නියෝජිතයින් සංඛ්‍ය	
	2014	2015	2014	2015	2014	2015
මධ්‍යම පළාත	159	178	941	841	4,370	4,554
නැගෙනහිර පළාත	104	124	506	480	2,310	2,383
උතුරු මැද පළාත	110	132	682	579	2,752	2,850
වයඹ පළාත	133	188	725	883	3,898	4,339
උතුරු පළාත	111	139	400	430	3,369	3,339
සබරගමුව පළාත	92	140	561	687	2,209	2,667
දකුණු පළාත	192	232	1,143	986	5,275	5,196
ඌව පළාත	76	108	405	460	2,197	2,258
බස්නාහිර පළාත	488	631	10,287	10,484	16,578	17,847
එකතුව	**1,465**	**1,872**	**15,650**	**15,830**	**42,958**	**45,433**

රූප සටහන:4

2015 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වූ ශාඛා, සේවකයින් සහ නියෝජිතයින් සංඛ්‍යාව



සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ නාලිකා

රක්ෂණ සමාගම් විසින් ස්වකීය පාරිභෝගිකයන් වෙත ලඟාවීම පිණිස යොදා ගන්නා ප්‍රධාන බෙදාහැරීමේ නාලිකා 5 වන සටහන මඟින් පෙන්වා දෙනු ලැබේ. 2014 වසරට සමානවම, නියෝජිතයින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල ප්‍රධාන බෙදාහැරීම් නාලිකාව ලෙස තවදුරටත් පැවති අතර, වෙළඳපොළ තුළ ස්වකීය ආධිපත්‍යය පිළිබිඹු කරමින් සමස්ත දළ ලිඛිත වාරිකයෙන් 90.04% ක් (2014:91.62%) උත්පාදනය කර තිබුණි. සෘජු අලෙවිකරණය, සහ බැංකු රක්ෂණ (bancassurance) දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල අනෙකුත් බෙදාහැරීම් නාලිකා වූ අතර 2015 වසරේදී දළ ලිඛිත වාරිකයෙන් පිළිවෙලින් 4.84% සහ 3.99% ක් උත්පාදනය කලේය. අනෙකුත් බෙදාහැරීමේ නාලිකා (සමූහ ව්‍යාපාර, ව්‍යවස්ථාපිත ආයතන සහ ශාඛා) සහ තැරැව්කරුවන් 2015 වසර තුළ මුලු දළ ලිඛිත වාරිකයෙන් උත්පාදනය කර තිබුණේ පිළිවෙලින් 0.86%ක් සහ 0.28%ක ප්‍රමාණයක් පමණි.

නියෝජිතයින් ප්‍රධාන බෙදාහැරීම් නාලිකාව වන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර මෙන් නොව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරික උත්පාදනයෙහිලා නියෝජිතයින්, සෘජු අලෙවිකරණය, අනෙකුත් බෙදාහැරීමේ නාලිකා සහ තැරැව්කරුවන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 5 වැනි වගුවේ නිරූපණය කර ඇති පරිදි නියෝජිතයන් විසින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ද.ලි.වා. ආදායමෙන් 28.29% ක් උත්පාදන කර ඇති අතර සෘජු අලෙවිකරණය, අනෙකුත් බෙදාහැරීමේ නාලිකා,තැරැව්කරුවන් සහ බැංකු රක්ෂණය (bancassurance) මඟින් ද ලි.වා. ආදායමෙන් පිළිවෙලින් 27.38%, 23.18%, 17.34% සහ 3.81% ක් උත්පාදනය කර ඇත.

රූප සටහන 5
රක්ෂණ සමාගම්වල බෙදා හැරීමේ නාලිකා



	2014		2015	
	දීර්ඝ කාලීන	සාමාන්‍ය	දීර්ඝ කාලීන	සාමාන්‍ය
නියෝජිතයින්	91.62	29.45	90.04	28.29
තැරැව්කරුවන්	0.47	15.58	0.28	17.34
සෘජු	3.22	38.86	4.84	27.38
බැංකු රක්ෂණය	2.99	3.62	3.99	3.81
වෙනත්	1.70	12.49	0.85	23.18

සංඛ්‍යානමය සමාලෝචනය

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

දළ ලිඛිත වාරික ආදායම

දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් 2014 වසරේ වාර්තා කළ රු. මිලියන 44,596 ක මුදලට සාපේක්ෂව 2015 වසරේදී රු. මිලියන 53,575 ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කර ඇත. 2015 වසර තුළ, දීර්ඝ කාලීන රක්ෂණ සමාගම්, 2014 වාර්තා කළ 7.01% ක වර්ධනයට සාපේක්ෂව වසරේ දී ද්වි සංඛ්‍යාංක වර්ධනයක් වාර්තා කර ඇත. වාර්තා කළ 11.20% ක අගය හා සැසඳීමේ දී දීර්ඝ කාලීන රක්ෂණ වෙළඳපොළ 2014 වසරේ දී 7.01% ක මන්දගාමී වර්ධනයක් වාර්තා කර ඇත. මෙය පසුගිය වසර පහ තුළ දීර්ඝ කාලීන රක්ෂණකරුවන් විසින් වසරින් වසර වාර්තා කළ ඉහළම වර්ධනයයි.

වාරිකවල වර්ධනය ප්‍රධාන වශයෙන්ම නවෝත්පාදන නිපැයුම්, නිර්මාණාත්මක අලෙවිකරණ ව්‍යාපාර, විශේෂයෙන්ම නියෝජිතායතන බලය ආදිය ප්‍රකාරව බෙදාහැරීම් නාලිකා පුළුල් කිරීම සඳහා ආරෝපණය විය. තවද, පොදු මහජනතාව අතර දීර්ඝකාලීන රක්ෂණය පිළිබඳ ඉහළ දැනුමක් ඇති කිරීම පිණිස, 2015 වසරේ සැප්තැම්බර් මස තුළ පැවති ජීවිත රක්ෂණ පිළිබඳ දැනුවත් කිරීමේ මාසය, දීර්ඝ කාලීන රක්ෂණ වෙළඳපල වර්ධනය සඳහා ධනාත්මක අයුරින් දායක වී තිබුණි.

සෙලින්කෝ රක්ෂණ සමාගම රු. මිලියන 13,457 ක (2014:රු. මිලියන 12,003) ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කරමින් 25.12% (2014:26.91%) ක වෙළඳපල කොටසක් අත්කරගෙන ඇත. එච්එන්බීඒ/එච්එන්බී ඇෂුවරන්ස් රු. මිලියන 10,367ක දළ ලිඛිත වාරික ආදායමක් සහ 19.35% (2014: 18.21%) ක වෙළඳපොළ කොටසක් හිමිකර ගෙන වෙළඳපොළේ දෙවැනි ස්ථානය දිනාගැනීමට සමත්ව ඇත. එච්එන්බීඒ වාරික ආදායම 2014 වසරේ වාර්තා වූ රු. මිලියන 8,121 ට සාපේක්ෂව 27.66% කින් ඉහළ ගොස් තිබුණි. පූර්ව වර්ෂයට සමානවම, තෙවන විශාලතම වෙළඳපල කොටස වන රු. මිලියන 8,433, 15.74% හිමිකර ගැනීමට ඒඅයිඒ සමාගමට හැකියාව ලැබුණු අතර ඉන්පසු ස්ථාන හිමිකර ගත්තේ පිළිවෙලින් යුනියන් ඇෂුවරන්ස් රු. මිලියන 6,964, 13% සහ ඒෂියන් එලායන්ස් රු. මිලියන 4,091 7.64% ය. පිළිවෙලින් රු. මිලියන 2,789, 5.21% ක සහ රු. මිලියන 2,536, 4.73%)ක වාරික ආදායමක් වාර්තා කළ එච්එන්බී ජීවිත රක්ෂණ සහ ජනශක්ති ජීවිත රක්ෂණ සමාගම හයවන සහ හත්වන ස්ථානය දිනා ගත්තේය.

2011 සිට 2015 දක්වා වූ වර්ෂ සඳහා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල සමාගම් වශයෙන් දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව 7 වන වගුව සහ 6 වන රූප සටහන මඟින් පෙන්නුම් කරයි. එල්ඕඑල්සී සමාගම එහි දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 1,210 (2014: රු. මිලියන 592) ක් බවට සැලකිය යුතු ලෙස ඉහළ නංවාගෙන ඇත්තේ වෙළඳපල කොටසින් 2.26% (2014:1.33%) ක් වාර්තා කරමින් අටවන ස්ථානයට පත් වෙමිනි. දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමේ සමාගම් අනුව වෙළඳපොළ පංගුව 6 වන රූප සටහන මඟින් නිරූපණය කරයි.

වගුව 7

දළ ලිඛිත වාරිකයන්හි සමාගම් වශයෙන් වන වාරික ආදායම සහ වෙළඳපල පංගුව - දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර

රක්ෂකයා	2011		2012		2013		2014 (අ)		2015 (ආ)	
	වාරික ආදායම (රු. '000)	වෙළඳපොළ කොටස (%)	වාරික ආදායම (රු. '000)	වෙළඳපොළ කොටස (%)	වාරික ආදායම (රු. '000)	වෙළඳපොළ කොටස (%)	වාරික ආදායම (රු. '000)	වෙළඳපොළ කොටස (%)	වාරික ආදායම (රු. '000)	වෙළඳපොළ කොටස (%)
ඒඅයිඒ ලයිෆ්	7,846,447	22.32	6,495,863	17.33	6,863,047	16.47	7,266,574	16.29	8,433,333	15.74
අලියාන්ස් ලයිෆ්	351,299	1.00	532,142	1.42	828,790	2.00	823,456	1.85	919,143	1.72
අමානා ලයිෆ්	303,786	0.86	364,759	0.97	542,986	1.30	679,029	1.52	928,294	1.73
ආර්පිකෝ	-	-	101,900	0.27	206,494	0.50	297,439	0.67	484,226	0.90
ඒෂියන් ලයිෆ්	1,579,191	4.49	2,034,084	5.43	2,520,283	6.05	3,048,148	6.84	4,091,042	7.64
සෙලින්කෝ ලයිෆ්	9,815,943	27.91	10,829,470	28.90	11,122,906	26.69	12,002,524	26.92	13,456,828	25.12
කෝප් ලයිෆ්	269,579	0.77	312,056	0.83	337,623	0.81	402,046	0.90	493,384	0.92
එච්එන්බී ලයිෆ්	1,290,367	3.67	1,500,028	4.00	2,014,547	4.83	2,342,867	5.25	2,788,716	5.21
ජනශක්ති ලයිෆ්	1,871,986	5.32	2,025,075	5.41	2,193,662	5.26	2,170,419	4.87	2,536,298	4.73
එල්අයිසී	295,859	0.84	303,344	0.81	322,268	0.77	348,767	0.78	387,535	0.72
එල්ඕඑල්සී ලයිෆ්	51,427	0.15	106,238	0.28	274,798	0.66	592,422	1.33	1,209,578	2.26
එම්බීඑස්එල්	143,156	0.41	192,780	0.52	251,720	0.60	294,299	0.66	203,235	0.38
සණස	128,113	0.36	203,616	0.54	283,975	0.68	260,867	0.58	311,910	0.58
එස්එල්අයිසී	6,743,073	19.18	7,369,031	19.66	8,397,718	20.15	8,121,159	18.21	10,367,498	19.35
යුනියන් ලයිෆ්	4,471,627	12.72	5,106,323	13.63	5,515,063	13.23	5,945,499	13.33	6,964,390	13.00
එකතුව	**35,161,853**	**100**	**37,476,709**	**100**	**41,675,880**	**100**	**44,595,515**	**100**	**53,575,410**	**100**
වර්ධන අනුපාතය (%)	**12.87**		**6.58**		**11.20**		**7.01**		**20.14**	

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 6

සමාගම් මට්ටමින් දළ ලිඛිත වාරික ආදායමේ වෙළඳපොළ පංගුව - 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර



ඉහළම දළ ලිඛිත වාරික ආදායමක් ජනනය කල ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

සෙලින්කෝ ලයිෆ්, එස්එල්අයිසී, ඒඅයිඒ ලයිෆ්, යුනියන් ලයිෆ් සහ ඒෂියන් ලයිෆ් 2015 වසර තුළ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල ප්‍රධාන රක්ෂණකරුවන් විය. මෙම ප්‍රධාන වෙළඳපල රක්ෂණකරුවන් එක්ව 2015 වසරේදී වාර්තා කළ සමස්ත දීර්ඝකාලීන රක්ෂණවාරික අරමුදලින් 80.85% (2014:81.59%) ට දායකත්වය සපයා ඇත. පසුගිය වසර පහ තුළ ඉතිරි ජීවිත රක්ෂණකරුවන් දසදෙනා විසින් තම කාර්යසාධනය වැඩි දියුණු කරගනිමින් සමස්ත වෙළඳපල කොටසින් 19.15% (2014:18.41%) ක් කරා ළඟා වී ඇත. ප්‍රධාන දායකයින්ගේ සහ අනිකුත් රක්ෂණකරුවන්ගේ වෙළඳපල කොටසෙහි විශ්ලේෂණය 7වන රූප සටහනේ දැක්වේ.

රූප සටහන 7

2011 සිට 2015 දක්වා වූ වර්ෂ සඳහා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ කොටස - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර



	සෙලින්කෝ ලයිෆ්	එස්එල්අයිසී	ඒඅයිඒ ලයිෆ්	යුනියන් ලයිෆ්	ඒෂියන් ලයිෆ්	වෙනත්
2011	27.91	19.18	22.32	12.72	4.49	13.38
2012	28.90	19.66	17.33	13.63	5.43	15.05
2013	26.69	20.15	16.47	13.23	6.05	17.41
2014(ඇ)	26.92	18.21	16.29	13.33	6.84	18.41
2015(ආ)	25.12	19.35	15.74	13.00	7.64	19.15

(ඇ) පුනස්ථාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම් විසින් දැරීමට සිදු වූ හිමිකම්පෑම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

කල්පිරීම, මරණ සහ පවාරණ ප්‍රතිලාභ ඇතුළත්ව දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් විසින් වසර තුළ දරන ලද මුලු හිමිකම් ප්‍රමාණය 8වන රූප සටහනෙහි දැක්වෙන ආකාරයට 2015 වසරෙහි රු. මිලියන 20,936 ක් (2014:රු. මිලියන 20,644) විය.

2015 වසර තුළ රු. මිලියන 11,683ක් දක්වා 19.77% කින් (2014: රු. මිලියන 9,754) සැලකිය යුතු ලෙස කල්පිරීම් ඉහළ ගොස් ඇත. වසර තුළ දැරූ මුලු හිමිකම්පෑම්වලින් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් මෙම හිමිකම්පෑම් නියෝජනය කරන ලදී. ජීවිත රක්ෂණ වෙළඳපලෙහි දුර්වල පැවැත්ම සඳහා බලපෑම් ඇති කරන සංසිද්ධියක් ලෙස පවාරණයන් මුලු හිමිකම්වලින් හතරින් එකක් නියෝජනය කලේය. කෙසේ වෙතත්, 2014 වසරේ රු. මිලියන 7,185ට සාපේක්ෂව 2015 වසරේ දී පවාරණ ප්‍රතිලාභ රු. මිලියන 5,279 දක්වා 26.53%කින් අඩු වී තිබිණි.

2015 වසරේ දී දරන ලද මුලු හිමිකම්වලින් 8.58%ක් නියෝජනය කළ මරණ ප්‍රතිලාභ ප්‍රමාණය මිලියන 1,795ක් විය. තවද, 2014 වසරේ වාර්තා වූ රු. මිලියන 1,889 ට සාපේක්ෂව මරණ ප්‍රතිලාභ ප්‍රමාණය මදක් අඩු වී තිබිණි. සෞඛ්‍ය ප්‍රතිලාභ, අත්තිකාරම් ගෙවීම්, පාර්තෝෂික ආදී අනිකුත් ප්‍රතිලාභ 2014 වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 1,379ට සාපේක්ෂව 2015 වසරේදී රු. මිලියන 1,755ක් විය.

රූප සටහන 8

රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය



	2011	2012	2013	2014 (අ)	2015 (ආ)
අකර්මන්‍යතා ප්‍රතිලාභ	31,183	77,717	45,457	436,518	425,213
මරණ	681,111	789,166	1,358,337	1,889,289	1,795,361
පවාරණ	2,225,506	2,823,924	5,677,638	7,184,611	5,278,539
කල්පිරීමේ ප්‍රතිලාභ	6,242,096	7,860,715	9,839,833	9,754,751	11,683,143
වෙනත්	1,367,512	1,920,859	1,388,698	1,378,929	1,754,618

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2015 වසරේ දී සමාගම් විසින් දරන ලද දීර්ඝ කාලීන රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව 280,753 ක් විය. 8 වන වගුවේ දැක්වෙන පරිදි, පසුගිය වසර පහ තුළ වාර්තා වූ වැඩිම හිමිකම්පෑම් සංඛ්‍යාව මෙයින් නියෝජනය විය. 2015 වසරේ වාර්තා වූ කල්පිරීම් සහ මරණ හිමිකම්පෑම් සංඛ්‍යාව පිළිවෙලින් 105,308 ක් සහ 6,782 ක් විය. තවද පවාරණ හිමිකම්පෑම් ලෙස 43,651 ක් වාර්තා විය. මෙය 2015 වසරේ වූ හිමිකම්පෑම් මුලු සංඛ්‍යාවෙන් 15.55% ක් නියෝජනය කළේය.

වගුව 8

රක්ෂණ හිමිකම්පෑම් සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

	2011	2012	2013	2014	2015
කල්පිරීමේ ප්‍රතිලාභ	98,363	102,465	102,050	107,353	105,308
මරණ	4,328	4,358	5,284	5,795	6,782
අකර්මන්‍යතා ප්‍රතිලාභs	569	578	6,980	8,120	12,540
පවාරණ	25,661	24,631	41,964	46,312	43,651
වෙනත් ප්‍රතිලාභ	45,885	51,773	99,257	84,835	112,472
එකතුව	**174,806**	**183,805**	**255,535**	**252,415**	**280,753**

සංඛ්‍යානමය සමාලෝචනය

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ වත්කම්

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත වත්කම් ප්‍රමාණය 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා රු. මිලියන 305,897ක් (2014:247,061) වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව 23.81%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වර්ෂය හා සමානවම දීර්ඝ කාලීන රක්‍ෂණ අරමුදලින් 30% ක් වන අවම ව්‍යස්ථාපිත ආයෝජන කිරීමේ අවශ්‍යතාවට අනුකූල වන බැවින් සහ අඩු අවදානම් සහිත බව හේතු කොටගෙන රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය ප්‍රධාන ආයෝජන කාණ්ඩය ලෙස වාර්තා විය. 2015 වසරේදී, රජයේ මුලු ආයෝජන රු. මිලියන 136,832 ක් (2014: රු. මිලියන 111,153) වූ අතර, මුලු වත්කම් වලින් 44.73%ක් (2014:44.99%) නියෝජනය කරන ලදී.

විශේෂයෙන් ලැයිස්තුගත කර ඇති සංස්ථා ණය සාධනපත්‍රවල ආයෝජන ප්‍රමාණය අඛණ්ඩව ඉහල මට්ටමක පැවති අතර, 2014 වසරේ රු. මිලියන 40,743ට සාපේක්ෂව රු. මිලියන 51,895ක් වාර්තා විය.මෙය 27.37%ක වර්ධනයක් නියෝජනය කරන ලදී.

අඩු පොලී අනුපාතික තත්ත්වය හේතුවෙන්, තැන්පතුවල ආයෝජනය 2014 අගය වූ රු. මිලියන 37,474 සිට රු. මිලියන 38,644 දක්වා මද වශයෙන් වැඩි වී තිබුණි. 2015 වසරේ දීර්ඝකාලීන රක්ෂණකරුවන් විසින් හිමිකරගෙන තිබූ මුලු වත්කම්වලින් 74.32%ක් (2014: 76.65%) රජයේ සුරැකුම්පත්, සංස්ථා ණය සහ තැන්පතු යන ප්‍රධාන කාණ්ඩවලින් සමන්විත විය.

මීට අමතරව,රක්ෂණකරුවන්ගේ වත්කම් කළඹෙහි ඉඩම් හා ගොඩනැගිලි, ඔප්පු ණය සහ මුදල් සහ මුදල් හා සමාන දෑ ආදිය වැනි අනිකුත් ප්‍රවර්ගයන්ගෙන් සමන්විත වේ. 9 වගුවෙන් සහ 9 රූප සටහනින් දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල වත්කම් සංකේන්ද්‍රණයවීම විදහා දක්වයි.

වගුව 9

2014 සහ 2015 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර

	2014 (අ)		2015 (ආ)	
වත්කම් වර්ගය	රු.000	%	රු.000	%
රාජ්‍ය ණය සුරැකුම්පත්	111,153,045	44.99	136,831,589	44.73
ස්කන්ධ	31,048,723	12.57	40,595,129	13.27
සංස්ථා ණය	40,743,451	16.49	51,895,159	16.96
ඉඩම් හා ගොඩනැගිලි	5,909,483	2.39	8,738,764	2.86
තැන්පතු	37,473,905	15.17	38,643,918	12.63
ඒකක භාර	2,220,790	0.90	2,392,162	0.78
රක්ෂණ ඔප්පු මත ණය	5,708,113	2.31	5,498,162	1.80
වෙනත් වත්කම්	10,635,805	4.30	18,310,155	5.99
මුදල් හා මුදල් සමාන දෑ	2,167,851	0.88	2,991,628	0.98
එකතුව	**247,061,166**	**100.00**	**305,896,666**	**100**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

රූප සටහන 9

2015 දෙසැම්බර් 31 දිනට වත්කම් සංකේන්ද්‍රගතවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර



සංඛ්‍යානමය සමාලෝචනය

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජන ආදායම

අඩු පොළී අනුපාතිකය, කොටස් වෙළඳපල මිල දර්ශකයන්හි සිදුවූ වෙනස්වීම ආදිය දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ආයෝජනවලින් උත්පාදිත මුළු ආයෝජන ආදායම කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. 2015 වසරේ දී මුලු ආයෝජන ආදායම සාමාන්‍ය ආයෝජන රු. මිලියන 260,945 න් රු. මිලියන 24,882 ක් විය. ඒ අනුව, 2015 වසරේ සමස්ත ආයෝජන ඵලදා අනුපාතිකය 9.54% ක් ලෙස වාර්තා විය.

රජයේ ණය සුරැකුම්පත්වලින් ලද ආදායම සාමාන්‍ය ආයෝජනය වූ රු. මිලියන 123,922 න් රු. මිලියන 12,934 ක් විය. භාණ්ඩාගාර බැඳුම්කර ආදායම රු. මිලියන 12,063 ක් වූ අතර, 2015 සමස්ත ආයෝජන ආදායමින් 48.5% ක් විය. කෙසේ වෙතත්, 2014 වසරේදී වාර්තා වූ 11.25% ට සාපේක්ෂව රජයේ සුරැකුම්පත්වල ආයෝජන ඵලදාව 10.43% ක් විය.

සංස්ථා ණය වෙළෙඳපල තුළ ආයෝජනය ආකර්ෂණීය අයුරින් අඛණ්ඩව පැවති අතර, 2015 වසර තුළ සාමාන්‍ය ආයෝජනය රු. මිලියන 9,476කින් රු. මිලියන 46,319 දක්වා වැඩි වී ඇත (2014: රු. මිලියන 36,844). තවද, සංස්ථා ණය රු. මිලියන 5,465 ක ආයෝජන ආදායමක් උත්පාදනය කර ඇති අතර, 2015 වසරේදී 11.80% ක ආයෝජන ඵලදාවක් වාර්තා කරන ලදී.

සාමාන්‍ය කොටස් වෙළඳපලෙහි පෙන්නුම් කරන ලද මන්දගාමී කාර්යසාධනය සමඟින් සාමාන්‍ය කොටස් වලින් ලද ලාභය රු. මිලියන 869 ක් විය. සමාගම් කිහිපයක් රු. මිලියන 595 ක් වූ ප්‍රාග්ධන අලාභයක් 2015 වසර තුළ වාර්තා කළ අතරතුර, සමාගම්වල ලාභාංශ ආදායම රු. මිලියන 1,464 ක් විය. ඒකක භාර වලින් ලද ආයෝජන ආදායම සැලකිය යුතු ලෙස අඩුවී ඇති අතර, 2014 වසරේ වාර්තා වූ රු. මිලියන 531 ට සාපේක්ෂව සාමාන්‍ය ආයෝජන ප්‍රමාණය වූ රු. මිලියන 2,306 න් රු. මිලියන 101 ක් (2014: රු. මිලියන 2,261) ලෙස වාර්තා විය.

2015 වසර තුළ තැන්පතුවල සාමාන්‍ය ආයෝජනය රු. මිලියන 38,059 දක්වා 2.76% කින් අඩු වී ඇත. මේ අතරතුර, 2014 වසරේදී වාර්තා වූ රු. මිලියන 4,563 සිට රු. මිලියන 3,507ක් දක්වා 23.14% කින් අඩුවී ඇත.

එක් රක්ෂණකරුවෙක් විසින් අනුබද්ධිත සමාගම් අලෙවිකිරීම හේතුවෙන් අනිකුත් කාණ්ඩවලින් වූ ආයෝජන ආදායම 2015 වසර තුළ සැලකිය යුතු ලෙස වැඩි වී ඇත.

වගුව 10

සවිස්තරාත්මක සාමාන්‍ය ආයෝජනය සහ ආයෝජන ආදායම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

වර්ගීකරණය	2014(අ)			2015(ආ)		
	ආයෝජන ආදායම (රු. '000)	සාමාන්‍ය ආයෝජනය (රු. '000)	ආයෝජන ඵලදා අනුපාතිකය(%)	ආයෝජන ආදායම (රු. '000)	සාමාන්‍ය ආයෝජනය (රු. '000)	ආයෝජන ඵලදා අනුපාතිකය(%)
රජයේ ණය සුරැකුම්පත්	11,512,106	102,346,152	11.25	12,934,054	123,992,317	10.43
- භාණ්ඩාගාර බැඳුම්කර	10,315,496			12,063,400		
- භාණ්ඩාගාර බිල්පත්	384,095			202,707		
- වෙනත් (රිපෝ)	812,515			667,947		
ස්කන්ධ	3,956,177	27,827,594	14.22	869,042	35,821,926	2.43
- ප්‍රාග්ධන ලාභ/ පාඩු	3,026,181			(595,326)		
- ලාභාංශ	929,996			1,464,368		
සංස්ථා ණය	4,600,656	36,843,640	12.49	5,464,638	46,319,305	11.80
- ණයකර	4,586,742			5,435,533		
- වෙළඳ පත්‍රිකා	20,783			19,925		
- වත්කම් මඟින් සනාථ කරනු ලබන සුරැකුම්පත්	5,910			-		
- වෙනත් සමාන මූල්‍ය උපකරණ	(12,779)			9,180		
ඉඩම් හා ගොඩනැගිලි	2,454	6,019,820	0.04	(1,729)	7,324,124	(0.02)
තැන්පතු	4,563,205	39,140,139	11.66	3,507,413	38,058,912	9.22
- බැංකු	4,344,197			3,300,590		
- මූල්‍ය ආයතන	219,008			206,823		
ඒකක භාර	531,077	2,261,415	23.48	101,312	2,306,476	4.39
රත්රන්	(56)	14,648	(0.38)	-	-	-
ජීවිත රක්ෂණ ඔප්පු මත ණය	56,724	5,471,640	1.04	105,190	5,603,138	1.88
වෙනත්	675,749	916,864	73.70	1,901,613	1,518,722	125.21
එකතුව	**25,898,092**	**220,841,912**	**11.73**	**24,881,533**	**260,944,920**	**9.54**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

සංඛ්‍යානමය සමාලෝචනය

නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව

මෙම වසර තුළ ජීවිත රක්ෂණ සමාගම්, බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීම හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුලින් විශේෂයෙන් නියෝජිත ආයතනයන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම තුළින් ව්‍යාපාරය ඉහල නැංවීමට මූලාරම්භයන් ගෙන තිබේ. මෙම ප්‍රයත්නයන් සමඟින් සමාගම් විසින් නිකුත් කරන ලද නව ඔප්පු සංඛ්‍යාව, 2014 දී 545,303 ට සාපේක්ෂව 2015 වසර තුළ දී සැලකිය යුතු ලෙස 19,34% කින් 650.786 දක්වා ඉහළ ගොස් තිබේ.10 සටහන මඟින් නිරූපණය වන ආකාරයට බලාත්මකව පවතින සමස්ත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2,808,840 කි (2014: 2,604,667). මෙම පසුගිය වසර පහ සඳහා වාර්තා වූ බලාත්මකව පවතින වැඩිම රක්ෂණ ඔප්පු සංඛ්‍යාවයි.

පසුගිය වසර හා සමානව, බලාත්මකව පවතින රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් ලෙස 13.4% විය. තවද බලාත්මකව පවතින දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු ප්‍රමාණය ශ්‍රම බලකායේ ප්‍රතශතයක් ලෙස 2014 දී වාර්තා වූ 29.6% හා සැසඳීමේදී 3.1% කින් වැඩි වී ඇත.

රූප සටහන 10

නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව හා බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර



	2011	2012	2013	2014 (අ)	2015 (ආ)
නිකුත් කරන ලද නව ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව	526,023	514,516	546,292	545,303	650,786
බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව	2,355,449	2,438,340	2,477,695	2,604,667	2,808,840
බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස *	11.3	11.9	12.0	12.5	13.4
බලපවත්නා ජීවිත රක්ෂණ ඔප්පු සංඛ්‍යාව මුළු ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස *	27.5	28.8	28.1	29.6	32.7

* මූලාශ්‍රය: මධ්‍ය වාර්ෂික ශ්‍රම බලකාය සහ ජනගහනය - ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යාවන්
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ ඔප්පු අවලංගුවීම - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

පසුගිය වසර පහ තුළ අවලංගු වූ රක්ෂණ ඔප්පු වල විස්තර 11 වැනි රූප සටහනෙන් දක්වයි. වසර තුළ දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු 358,748 ක් අවලංගු වී තිබුණි. අවලංගු වූ මුළු ඔප්පු සංඛ්‍යාව බලාත්මකව පවතින සමස්ත ඔප්පු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීමේදී 2014 වාර්තා වූ 13.92% ට සාපේක්ෂව 2015 වසරේදී 12.77% ක් ලෙස වාර්තා වීම සුළු වශයෙන් හෝ යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි. අවලංගු වූ නව රක්ෂණ ඔප්පු සංඛ්‍යාව වසරින් වසර වැඩි වී ඇති අතර 2015 වසරේදී 92,222ක් :(2014: 103,500) ලෙස වාර්තා විය.

රූප සටහන 11

2011 සිට 2015 දක්වා අවලංගු වූ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව සහ රක්ෂණ ඔප්පු අවලංගු වීමේ අනුපාතය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය



	2011	2012	2013	2014 (අ)	2015 (ආ)
අවලංගු වූ නව රක්ෂණ ඔප්පු	82,080	94,936	107,906	103,500	92,222
අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු	371,196	332,707	366,506	362,664	358,748
අවලංගු වූ නව රක්ෂණ ඔප්පු ප්‍රමාණය නිකුත් කරන ලද නව රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස	15.6	18.45	19.75	18.98	14.17
අවලංගු වූ මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණය බලපවත්නා මුළු රක්ෂණ ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස	15.76	13.64	14.79	13.92	12.77

(අ) මණ්ඩලයට ඉදිරිපත් කරන ලද ජීව ගණක වාර්තාවලට අනුව
(ආ) තාවකාලික සංඛ්‍යාවන්

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාවය - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

2014 දෙසැම්බර් 31 සහ 2015 දෙසැම්බර් 31 ට රක්ෂණ සමාගම්වල නුබුන්වත් අනුපාතය සහ ඔප්පු වගකීම් වටිනාකම් 11වන වගුවෙන් නිරූපණය වේ. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිකුත් කර ඇති නුබුන්වත් ආන්තික සීමාවන්ට අනුව 2015 දෙසැම්බර් 31 දිනට නුබුන්වත් අනුපාතය '1'ට වැඩියෙන් වාර්තා කරමින් නුබුන්වත් ආන්තිකය සමගින් සියලුම දීර්ඝ කාලීන රක්ෂණ සමාගම් අනුකූල වී ඇත. තවද, 2015 දෙසැම්බර් 31 දිනට දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු වගකීම් ප්‍රමාණය රු. මිලියන 170,095 ක් විය. මෙය 2014 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රු. මිලියන 152,454 ට සාපේක්ෂව 11.57% ක ඉහළයාමක් පෙන්නුම් කරන ලදී.

වගුව 11

2014 සහ 2015 දෙසැම්බර් 31 දිනට සමාගම් අනුව නුබුන්වත්භාවය සහ රක්ෂණ ඔප්පුවල වගකීම් - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2014 දෙසැම්බර් 31 දිනට (අ)		2015 දෙසැම්බර් 31 දිනට (ආ)		
	නුබුන්වත් අනුපාතය (ප.නු.අ./අ.නු.අ.)	ඔප්පු වගකීම් වටිනාකම (රු. .000)	පවත්නා නුබුන්වත් අනුපාතය (රු. .000) (ප.නු.අ.) (රු. .000)	නුබුන්වත් අනුපාතය (ප.නු.අ./ අ.නු.අ.)	ඔප්පු වගකීම් වටිනාකම (රු.. .000)
ඒඅයිඒ ජීවිත	4.32	25,120,062	7,938,606	5.70	27,843,311
අලියාන්ස් ජීවිත	2.30	980,741	88,833	1.27	1,403,433
අමානා ජීවිත	1.10	555,610	161,678	5.52	585,338
ආර්පිකෝ ජීවිත	34.27	283,540	394,263	16.62	474,558
ඒෂියන් ජීවිත	2.66	4,913,375	447,020	1.50	5,963,695
සෙලින්කෝ ජීවිත	10.50	40,315,535	22,942,452	10.42	44,027,618
කෝප් ලයිෆ්	1.05	798,243	272,354	5.26	1,036,476
එච්එන්බී ජීවිත	2.29	5,040,184	736,314	2.15	6,845,464
ජනශක්ති ජීවිත	2.54	6,822,472	630,047	1.58	7,967,906
එස්එල්අයිසී ජීවිත	12.28	1,141,273	587,122	9.04	1,299,526
එල්ඕඑල්සී ජීවිත	5.74	682,942	317,371	5.26	1,206,569
එම්බීඑස්එල් ජීවිත	0.13	336,932	40,820	2.15	380,499
සණස ජීවිත	3.59	693,098	245,236	5.61	873,747
එස්එල්අයිසී ජීවිත	13.22	46,300,512	24,872,920	10.32	48,187,592
යුඑල්ඒ ජීවිත	4.74	18,469,562	3,004,872	2.73	21,999,099
එකතුව	**8.57**	**152,454,081**	**62,679,908**	**7.37**	**170,094,831**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

දළ ලිඛිත වාරික ආදායම

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලී සිටින සියලුම රක්ෂණ සමාගම් 2014 වසරේ උපයන ලද රු. මිලියන 60,803 ක් වූ දළ ලිඛිත වාරික ආදායමට සාපේක්ෂව 2015 වසරේ රු. මිලියන 68,815 ක් උපයා ඇති අතර 12 වගුවේ දැක්වෙන පරිදි 13.18% ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලූම පන්තිවල වැඩි වූ වාරික ආදායම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, රථවාහන රක්ෂණ ව්‍යාපාරය තුළ 2014 වර්ෂයේදී වාර්තා කළ 7.37% ට සාපේක්ෂව 19% ක සැලකිය යුතු වර්ධන අනුපාතයක් වාර්තා කිරීම විශේෂයෙන් සඳහන් කළ හැකිය. 2015 කාලසීමාව තුළ මෝටර් රථ ලියාපදිංචිකිරීම් සංඛ්‍යාවේ වැඩිවීම ඉහත වර්ධනය සඳහා හේතු වී ඇත.

ජාතික රක්ෂණභාර අරමුදල විසින් තහවුරු කර ඇති පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ SRCC හා T වාරික ආදායම 2015 දී රු. මිලියන 3,017 දක්වා (2014 දී රු. මිලියන 2,835) වැඩිවී ඇති අතර, පසුගිය වසරට සාපේක්ෂව 6.42% ක වර්ධනයක් නියෝජනය කෙරේ.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2015 දී 19.77%ක වෙළෙඳ පොළ පංගුවක් වාර්තා කරමින් සහ රු. මිලියන 13,606 ක (2014 : රු. මිලියන 12.114, 19,92%) වාරික ආදායමක් උපයා ගනිමින් අඛණ්ඩව හතරවැනි වරටත් සිය ප්‍රමුඛ ස්ථානය ආරක්ෂා කර ගැනීමට සමත් වී ඇති අතර, සෙලින්කෝ සාමාන්‍ය රක්ෂණය හා ජනශක්ති සාමාන්‍ය රක්ෂණය පිළිවෙලින් රු. මිලියන 12,922, 18.78% (2014:රු. මිලියන 11,432, 18.80%) සහ රු. මිලියන 7,372, 10.71% (2014 : රු. මිලියන 6,492, 10.68%) වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ වෙළෙඳ පොළ තුළ දෙවැනි හා තුන්වැනි ස්ථාන රැක ගන්නා ලදී. යූනියන් සාමාන්‍ය රක්ෂණය සහ ජාතික රක්ෂණ භාර අරමුදල පිළිවෙලින් රු. මිලියන 5,557, 8.08% (2014:රු. මිලියන 4,951, 8.14%) සහ රු. මිලියන 4,541, 6.60% (2014 : රු. මිලියන 4,896, 8.05%) වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ වෙළෙඳ පොළ තුළ හතරවැනි සහ පස්වැනි ස්ථාන රැක ගන්නා ලදී. ඉහළම ස්ථාන පහට හිමිකම් කියන රක්ෂණ සමාගම් සාමුහිකව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ වෙළෙඳ පොළ කොටස අනුව මුළු දළ ලිඛිත වාරිකවලින් 63.94% ක් (2014 : 65.60%) සඳහා දායක වූ අතර 36.06% ක් වූ ඉතිරි කොටස අනෙකුත් රක්ෂකයින් දහතුන් දෙන අතර බෙදා ගන්නා ලදී.

2015 දි රක්ෂණ සමාගම් විසින් අත්කර ගනු ලැබූ වෙළෙඳ පොළ කොටස 12 රූප සටහන තුළින් පැහැදිළි කරයි.

වගුව 12

සමාගම් අනුව දළ ලිඛිත වාරික සහ වෙළෙඳ පොළ කොටස - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2011 (අ)		2012 (අ)		2013 (අ)		2014 (ආ)		2015 (ඇ)	
	වාරිකය (රු 000)	වෙළෙඳ පොළ කොටස(%)	වාරිකය (රු 000)	වෙළෙඳ පොළ කොටස(%)	වාරිකය (රු 000)	වෙළෙඳ පොළ කොටස(%)	වාරිකය (රු 000)	වෙළෙඳ පොළ කොටස(%)	වාරිකය (රු 000)	වෙළෙඳ පොළ කොටස(%)
ඒඅයිඒ සාමාන්‍ය	2,456,347	5.23	2,143,252	4.03	2,428,675	4.17	2,655,577	4.37	3,297,840	4.79
ඒඅයිජී සාමාන්‍ය	942,901	2.01	819,448	1.54	880,060	1.51	414,805	0.68	3,141	0.00
අලියාන්ස් සාමාන්‍ය	1,379,406	2.94	1,397,127	2.63	1,964,907	3.37	2,723,406	4.48	3,244,844	4.72
අමානා සාමාන්‍ය	916,754	1.95	1,125,838	2.12	1,432,135	2.46	1,285,418	2.11	1,438,732	2.09
ඒෂියන් සාමාන්‍ය	582,257	1.24	1,133,240	2.13	1,556,386	2.67	1,638,126	2.69	1,908,901	2.77
සෙලින්කෝ සාමාන්‍ය	9,558,942	20.37	10,434,917	19.61	10,311,479	17.69	11,431,680	18.80	12,921,561	18.78
කොන්ටිනන්ටල් සාමාන්‍ය	1,149,121	2.45	1,545,225	2.90	1,330,515	2.28	1,761,747	2.90	2,309,413	3.36
කෝපරේටිව් සාමාන්‍ය	922,859	1.97	1,135,011	2.13	1,272,941	2.18	1,358,932	2.24	1,692,035	2.46
එච්එන්බී සාමාන්‍ය	1,623,830	3.46	1,635,306	3.07	1,767,361	3.03	2,182,915	3.59	2,541,313	3.69
ජනශක්ති සාමාන්‍ය	5,086,207	10.84	5,773,429	10.85	6,318,626	10.84	6,491,556	10.68	7,372,182	10.71
එල්ඕඑල්සී සාමාන්‍ය	364,735	0.78	1,295,133	2.43	1,485,521	2.55	1,815,486	2.99	2,476,961	3.60
එම්බීඑස්එල්	636,738	1.36	1,049,147	1.97	1,132,789	1.95	961,225	1.58	1,159,209	1.68
ජා.ර.භා. අ:මු:*	3,599,928	7.67	3,518,528	6.61	4,973,357	8.53	4,895,760	8.05	4,540,558	6.60
ඔරියන්ට්	1,749	0.00	308,547	0.58	355,001	0.61	491,127	0.81	746,935	1.09
පීපල්ස්	2,284,578	4.87	2,795,448	5.25	3,085,041	5.30	3,286,063	5.40	3,637,403	5.29
සණස	232,374	0.49	308,142	0.58	322,592	0.55	344,041	0.57	360,302	0.52
එස්එල්අයිසී	11,134,583	23.73	12,359,188	23.23	12,549,763	21.53	12,113,994	19.92	13,606,205	19.77
යූනියන් සාමාන්‍ය	4,055,443	8.64	4,436,052	8.34	5,116,966	8.78	4,950,741	8.14	5,557,189	8.08
මුළු	**46,928,752**	**100**	**53,212,978**	**100**	**58,284,115**	**100**	**60,802,599**	**100**	**68,814,724**	**100**
වර්ධන අනුපාතය (%)	**21.46**		**13.39**		**9.53**		**4.32**		**13.18**	

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 12

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ සමාගම් අනුව දළ ලිඛිත වාරිකවල වෙළෙඳ පොළ පංගුව



සංඛ්‍යානමය සමාලෝචනය

දළ ලිඛිත වාරික ආදායම ජනනය කිරීම අතින් ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2011 වසරේ සිට 2015 වසර දක්වා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම් ජනනය කිරීම අතින් ප්‍රමුඛතම වෙළඳපොළ පංගු වාර්තා කරන ලද සමාගම් පහ සහ අනෙක් රක්ෂකයින් වාර්තා කළ වෙළඳපොළ පංගුව 13 වන රූප සටහනින් නිරූපණය වේ. එස්එල්අයිසී, සෙලින්කෝ සාමාන්‍ය, ජනශක්ති සාමාන්‍ය, යූනියන් සාමාන්‍ය සහ ජාතික රක්ෂණ භාර අරමුදල දළ ලිඛිත වාරිකවල ප්‍රධාන දායකයින් පස්දෙනා විය. එස්එල්අයිසී 2011 වසරේ සිට වෙළෙඳ පොල නායකත්වය අඛණ්ඩව පවත්වා ගෙන ඇති අතර, 2015 දී 19.77% ක වෙළෙඳ පොළ පංගුවක් අත්කර ගෙන ඇත. සෙලින්කෝ සමාගම 2015 වසරේ දී 18.78% ක වෙළඳපොළ පංගුවක් දිනා ගනිමින් සාමාන්‍ය රක්ෂණ වෙළඳපොළේ දෙවැනි ස්ථානය හිමිකර ගෙන සිටී. ජනශක්ති සාමාන්‍ය සහ යූනියන් සාමාන්‍ය රක්ෂණය පිළිවෙලින් 10.71% (2014 : 10.68%) සහ 8.08% (2014 : 8.14%) ක වෙළෙඳ පොළ පංගුවක් අත්කර ගනිමින් තුන් වැනි සහ හතරවැනි ස්ථාන හිමිකර ගෙන සිටී. ජාතික රක්ෂණ භාර අරමුදල 2015 වසරේ දී 6.60%ක (2014 : 8.05%) වෙළඳපොළ පංගුවක් අත්කර ගනිමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ පස්වැනි ස්ථානය හිමිකර ගනු ලැබුව ද, 2014 වසරට සාපේක්ෂව 1.45%ක සෘණ වර්ධනයක් වාර්තා කරන ලදී. අනෙකුත් රක්ෂණ සමාගම්වල වෙළෙඳ පොළ කොටස පසුගිය වසර පහ තුළ වැඩි වී ඇති බව සැලකිය යුතුය.

රූප සටහන 13

2011 වසරේ සිට 2015 වසර දක්වා ප්‍රමුඛතම සමාගම් පහේ සහ අනෙක් රක්ෂකයන්ගේ වෙළඳපොළ පංගුව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



	එස්එල්අයිසී	සෙලින්කෝ	ජනශක්ති	යූනියන්	ජාතික රක්ෂණ භාර අරමුදල (ආ)	වෙනත් රක්ෂකයින්
2011 (අ)	23.73	20.37	10.84	8.64	7.67	28.75
2012 (අ)	23.23	19.61	10.85	8.34	6.61	31.36
2013 (අ)	21.53	17.69	10.84	8.78	8.53	32.63
2014 (ආ)	19.92	18.80	10.68	8.14	8.05	34.41
2015 (ඇ)	19.77	18.78	10.71	8.08	6.60	36.06

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)

(ආ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

දළ ලිඛිත වාරික ආදායම රක්ෂණඋප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2011 සිට 2015 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ පන්තිවලින් උත්පාදිත දළ ලිඛිත වාරික ආදායමේ පන්ති අනුව විශ්ලේෂණය 13 වැනි වගුව සහ 14 වැනි රූපසටහනෙන් නිරූපණය කරයි. ගිනි, මුහුදු, මෝටර් රථ, විවිධ රක්ෂණය සහ වර්ජන කැරලි කෝලාහල, සිවිල් කැළඹීම හා ත්‍රස්තවාදය රක්ෂණය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප පන්තිවලට ඇතුලත් වේ.

පෙර වසර වලට සමානව, මෝටර් රථ රක්ෂණය රු. මිලියන 42,585 ක් (2014: රු. මිලියන 35,787) වූ දළ ලිඛිත වාරික ආදායමක් වාර්තා කරමින් සාමාන්‍ය රක්ෂණ අංශය තුළ සිය ආධිපත්‍ය තවදුරටත් පවත්වා ගෙන ඇති අතර එම අගය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 61.88% ක් නියෝජනය කරයි. මෝටර් රථ රක්ෂණය පසුගිය වසරට වඩා 2015 වසරේ දී 18.99% කින් වර්ධනය වී ඇත.

2015 වසරේ දී, විවිධ රක්ෂණ ව්‍යාපාරය 2014 වසරට සාපේක්ෂව 4.73% කින් වර්ධනය වී ඇති අතර රු. මිලියන 14,573 ක (2014: රු. මිලියන 13.915) වටිනා දළ ලිඛිත වාරික ආදායමක් අත්කර ගනිමින් සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 21.18% ක් සඳහා දායක වී ඇත. ගිනි රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 6,579 ක් (2014: 6,353) දක්වා වැඩි වී ඇති අතර සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 9.56% ක (2014 : 10.45%) කොටසක් සඳහා දායක වී ඇත. මුහුදු රක්ෂණය 2014 වසරට සාපේක්ෂව 7.81% කින් පමණක් වර්ධනය වෙමින්, දළ ලිඛිත වාරික ආදායම රු. මිලියන 2.061 ක් (2014: 1,912) දක්වා වැඩි වී ඇති අතර 2015 දී සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් 3% ක් (2014 : 3.14%) සඳහා දායක වී ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් තහවුරු කර ඇති පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ SRCC හා T වාරික අදායම 2015 දී රු. මිලියන 3,017 දක්වා (2014දී රු. මිලියන 2,835) වැඩිවී ඇති අතර පසුගිය වසරට සාපේක්ෂව 6.41% ක වර්ධනයක් නියෝජනය කෙරේ.

වගුව 13
දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-වර්ග අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

උප පන්තිය	දළ ලිඛිත වාරික ආදායම (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	5,379,788	5,474,094	6,303,725	6,353,292	6,578,842
මුහුදු	1,679,794	1,927,096	1,796,969	1,911,944	2,061,222
මෝටර් රථවාහන	27,356,318	31,844,102	33,331,917	35,786,941	42,584,532
විවිධ	10,506,321	11,686,509	14,307,720	13,915,221	14,573,260
උප එකතුව	**44,922,221**	**50,931,801**	**55,740,331**	**57,967,398**	**65,797,856**
SRCC හා T	2,006,531	2,281,177	2,543,784	2,835,201	3,016,868
එකතුව	**46,928,752**	**53,212,978**	**58,284,115**	**60,802,599**	**68,814,724**

උප පන්තිය	වර්ධනය (%)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	7.33	1.75	15.16	0.79	3.55
මුහුදු	12.07	14.72	(6.75)	6.40	7.81
මෝටර් රථවාහන	29.12	16.40	4.67	7.37	18.99
විවිධ	15.82	11.23	22.43	(2.74)	4.73
උප එකතුව	**22.18**	**13.38**	**9.44**	**4.00**	**13.51**
SRCC හා T	7.29	13.69	11.51	11.46	6.41
එකතුව	**21.46**	**13.39**	**9.53**	**4.32**	**13.18**

උප පන්තිය	ප්‍රතිශත කොටස (%)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	11.46	10.29	10.82	10.45	9.56
මුහුදු	3.58	3.62	3.08	3.14	3.00
මෝටර් රථවාහන	58.29	59.84	57.19	58.86	61.88
විවිධ	22.39	21.96	24.55	22.89	21.18
උප එකතුව	**95.72**	**95.71**	**95.64**	**95.34**	**95.62**
SRCC හා T	4.28	4.29	4.36	4.66	4.38
එකතුව	**100**	**100**	**100**	**100**	**100**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 14

දළ ලිඛිත වාරික ආදායම රක්ෂණ උප-පන්ති අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014 (ආ)	2015 (ඇ)
ගිනි	11.46	10.29	10.82	10.45	9.56
මුහුදු	3.58	3.62	3.08	3.14	3.00
මෝටර් රථ	58.29	59.84	57.19	58.86	61.88
විවිධ	22.39	21.96	24.55	22.89	21.18
SRCC & T	4.28	4.29	4.36	4.66	4.38
කර්මාන්ත වර්ධනය (සාමාන්‍ය රක්ෂණය)	21.46	13.39	9.53	4.32	13.18

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

විවිධ රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික වර්ගය අනුව විශ්ලේෂණය

2011 සිට 2015 වසර දක්වා රක්ෂණ සමාගම් උත්පාදනය කළ දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂකයින්ට අත්හැර දැමූ වාරික ආදායම සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන පන්තිවල රඳවා ගැනීමේ මට්ටම් 15වැනි වගුව සහ 15වැනි රූප සටහනෙන් නිරූපණය වේ.

2014 සහ 2015 වසර තුළදී, විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ වර්ගීකරණය කළ විවිධ රක්ෂණ අංශ විසින් උපයන ලද දළ ලිඛිත වාරික 14 වගුවෙන් පෙන්නුම් කෙරේ. විවිධ රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන වර්ගයන්ට සෞඛ්‍ය සහ ශල්‍යකර්ම, පුද්ගලික අනතුරු, ගුවන් යානා බඳ, බැංකුකරුවන්ගේ හානි රක්ෂණය, සේවක වන්දි රක්ෂණය. මාර්ගස්ථ මුදල් යනාදිය ඇතුළත් වේ. SRCC හා T සහ ප්‍රතිරක්ෂණ ඇතුළුව විවිධ රක්ෂණයෙන් උපයාගත් සමස්ත දළ ලිඛිත වාරික 2015 රු.මිලියන 14,573 දක්වා (2014 : රු.මිලියන 13,915) දක්වා වැඩිවිය. පසුගිය වසරේ මෙන්, සෞඛ්‍ය සහ ශල්‍යකර්ම විවිධ රක්ෂණ ව්‍යාපාරය යටතේ ඉහළම දළ ලිඛිත වාරිකය උපයන ලද අංශය වූ අතර එය 2015 දී රු.මිලියන 8,285 ක් (2014 : රු.මිලියන 7,193) විය.

මෙය SRCC හා T සහ ප්‍රතිරක්ෂණ ඇතුළු සමස්ත දළ ලිඛිත වාරිකවලින් 55.60%ක් නියෝජනය කරන ලදී. පුද්ගලික අනතුරු විවිධ රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත දළ ලිඛිත වාරිකවලින් 9.18%ක් නියෝජනය කරමින් දෙවන විශාලතම වර්ගය බවට පත්විය. විවිධ රක්ෂණ ව්‍යාපාරයේ අනෙකුත් රක්ෂණ වර්ග 2014දී උපයන ලද රු.මිලියන 2,373ක් වූ දළ ලිඛිත වාරික වටිනාකමට සාපේක්ෂව 2015 දි රු. මිලියන 1520 දක්වා 35.95%කින් අඩු වී ඇත.

වගුව 14

2014 හා 2015 සඳහා රක්ෂණ ව්‍යාපාරයේ විවිධ රක්ෂණ උප-පන්තියේ දළ ලිඛිත වාරික ආදායම කාණ්ඩ අනුව විශ්ලේෂණය

	දළ ලිඛිත වාරික ආදායම (රු. '000)	
කාණ්ඩය	2014 (අ)	2015 (ආ)
සෞඛ්‍ය සහ ශල්‍යකර්ම	7,193,386	8,284,561
හිමිකම් අයිතිය	390,491	415,569
පුද්ගලික අනතුරු	1,263,406	1,338,009
කොන්ත්‍රාත්කරුගේ සියලු අවදානම්	172,772	213,337
වෘත්තීය හානිරක්ෂණය	251,586	160,176
චාරිකා රක්ෂණය	302,037	389,156
විශ්වාසතා ඇපය	73,704	137,180
සොර බිය	259,640	252,502
සේප්පුවේ ඇති මුදල් ඇතුළු මාර්ගස්ථ මුදල්	388,982	399,385
මාර්ගස්ථ භාණ්ඩ	69,916	75,101
නිෂ්පාදන වගකීම	49,948	53,632
මහජන වගකීම	159,683	266,540
බැංකුකරුවන්ගේ හානිරක්ෂණය	325,318	342,786
ගුවන්යානා බඳ	577,559	575,595
කම්කරු වන්දි	375,507	477,941
වෙනත්	2,372,637	1,519,825
මුළු විවිධ රක්ෂණ දළ ලිඛිත වාරික ආදායම	**14,226,573**	**14,901,295**
ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා වන වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැලඹීම් හා ත්‍රස්තවාදය මුළු වාරික ආදායම	(293,448)	(294,773)
සහභාග-රක්ෂකයින්ගේ වාරික අදායම (SRCC හා T)	(17,903)	(33,262)
රක්ෂණ කර්මාන්තයේ (සමාගම්වල) ශුද්ධ වාරික ආදයම	**13,915,222**	**14,573,260**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ආ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂණකරුවන් විසින් රඳවා ගැනීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2011 සිට 2015 වසර දක්වා රක්ෂණ සමාගම් උත්පාදනය කළ දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂකයින්ට අත්හැර දැමූ වාරික ආදායම සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන පන්තිවල රඳවා ගැනීමේ මට්ටම් 15 වැනි වගුව සහ 15 වැනි රූපසටහනෙන් නිරූපණය වේ.

2015 වසරේ දී, සාමාන්‍ය රක්ෂකයින් විසින් උත්පාදිත රු. මිලියන 68,815 ක (2014 රු. මිලියන 60,803) සමස්ත දළ ලිඛිත වාරික ආදායමෙන් රු. මිලියන 10,358 ක් (2014: රු. මිලියන 9,519) ප්‍රතිරක්ෂකයින්ට අත්දැර දමා ඇති අතර මෙහි ප්‍රතිඵලය ලෙස සමස්ත රඳවා ගැනීමේ අනුපාතය 84.26%ක් (2014: 83.58%) වී ඇත.

පෙර වසරට සමානව, රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2015 වසරේ දී 97.46%ක අගයක් (2014: 98.22%) සමඟ ඉහළම රඳවා ගැනීමේ අනුපාතයක් වාර්තා කර ඇත. පසුගිය වසර පහට සමානව, විවිධ රක්ෂණය දෙවන ඉහළම රඳවා ගැනීමේ අනුපාතය වාර්තා කළ අතර එය 2014 වසරට සාපේක්ෂව 1.33%ක අඩුවීමක් පෙන්නුම් කරමින් 2015 දී 79.74% දක්වා (2014 : 81.07%) අඩු වී ඇත.

මුහුදු රක්ෂණයේ රඳවා ගැනීමේ අනුපාතය 2014 දී වාර්තා කළ 38.71% හා සැසඳීමේ දී 2015 වසරේ දී 41.25% දක්වා වැඩි වී ඇත. මුහුදු රක්ෂණය සම්බන්ධයෙන් ගත් කළ ප්‍රතිරක්ෂකයින්ට අත්හළ ප්‍රතිරක්ෂණ වාරික ආදායම 2014 වසරේ දී වාර්තා කළ රු. මිලියන 1,172 සිට 2015 වසරේ දී රු. මිලියන 1,211ක් දක්වා 3.33% ඉහළ නැග ඇත.

පෙර වසර හා සමානව ගිනි රක්ෂණය 2015 වසරේ දී අඩුම රඳවා ගැනීමේ අනුපාතය වාර්තා කර ඇති අතර එය 22.32%ක් වී ඇති අතර පසුගිය වසරට සාපේක්ෂව 2.21%කින් වැඩි වී ඇත.

වගුව 15

දළ ලිඛිත වාරික ආදායම, ප්‍රතිරක්ෂණ වාරික ආදායම සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

Class	දළ ලිඛිත වාරික ආදායම (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	5,379,788	5,474,094	6,303,725	6,353,292	6,578,842
මුහුදු	1,679,794	1,927,096	1,796,969	1,911,944	2,061,222
රථවාහන	27,356,318	31,844,102	33,331,917	35,786,941	42,584,532
විවිධ	10,506,321	11,686,509	14,307,720	13,915,221	14,573,260
උප එකතුව	**44,922,221**	**50,931,801**	**55,740,331**	**57,967,398**	**65,797,856**
SRCC හා T	2,006,531	2,281,177	2,543,784	2,835,201	3,016,868
එකතුව	**46,928,752**	**53,212,978**	**58,284,115**	**60,802,599**	**68,814,724**

Class	ප්‍රතිරක්ෂක වාරික ආදායම (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	4,090,136	4,140,877	4,823,732	5,075,545	5,110,528
මුහුදු	847,392	1,326,369	998,976	1,171,768	1,210,958
රථවාහන	387,211	478,478	864,394	636,603	1,083,455
විවිධ	2,302,942	2,752,627	2,700,309	2,634,795	2,953,005
උප එකතුව	**7,627,681**	**8,698,351**	**9,387,411**	**9,518,711**	**10,357,946**

Class	රඳවා ගැනීම (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	1,289,652	1,333,216	1,479,993	1,277,747	1,468,314
මුහුදු	832,402	600,727	797,994	740,176	850,264
රථවාහන	26,969,107	31,365,623	32,467,523	35,150,338	41,501,077
විවිධ	8,203,379	8,933,883	11,607,411	11,280,426	11,620,255
උප එකතුව	**37,294,540**	**42,233,449**	**46,352,921**	**48,448,687**	**55,439,910**

Class	දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස රඳවාගැනීම (%)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	23.97	24.36	23.48	20.11	22.32
මුහුදු	49.55	31.17	44.41	38.71	41.25
රථවාහන	98.58	98.50	97.41	98.22	97.46
විවිධ	78.08	76.45	81.13	81.07	79.74
උප එකතුව	**83.02**	**82.92**	**83.16**	**83.58**	**84.26**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා

(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)

(ඇ) තාවකාලික සංඛ්‍යා

සටහන්:

ජාතික රක්ෂණ භාර අරමුදලට අයත් දළ ලිඛිත වාරික, ප්‍රතිරක්ෂණ වාරික සහ රඳවාගැනීම් ඉවත් කර ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 15

ප්‍රතිරක්ෂණ වාරිකය සහ රක්ෂකයන් විසින් රඳවා ගනු ලැබීම - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014 (ආ)	2015 (ඇ)
මුළු රඳවාගැනීමේ වාරිකය (රු. '000)	7,627,681	8,698,351	9,387,410	9,518,711	10,357,946
මුළු ප්‍රතිරක්ෂණ වාරිකය (රු. '000)	37,294,540	42,233,449	46,352,922	48,448,687	55,439,910
සමස්ත රඳවාගැනීමේ වාරිකය (%)	83.02	82.92	83.16	83.58	84.26

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

16වැනි වගුවේ දක්වා ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන උප-පන්තිවලින් උත්පාදිත ශුද්ධ ඉපැයූ වාරික ආදායම 2014 වසරේ දී උත්පාදිත රු. මිලියන 49,597 මට්ටමේ සිට 2015 වසරේ දී 9.18%කින් වර්ධනය වෙමින් රු. මිලියන 54,148ක් දක්වා වැඩි වී ඇත. රථවාහන රක්ෂණ ව්‍යාපාරය රු. මිලියන 37,946ක් (2014:රු.මිලියන 33,821) වූ ඉහළම ශුද්ධ ඉපැයූ වාරික ආදායමක් වාර්තා කළ අතර 2015 දී වාර්තාකළ සමස්ත ශුද්ධ ඉපැයූ වාරික ආදායමෙන් 70.08%ක් නිරූපණය කරන ලදී.

2015 වසරේ දී දැරූ මුළු ශුද්ධ හිමිකම්පෑම් රු. මිලියන 33,897ක් වූ අතර 2014 වසරේ දී වාර්තා කළ රු. මිලියන 30,016 හා සැසඳීමේ දී 12.93%ක වර්ධනයක් පෙන්නුම් කළේය. රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2015 වසරේ දී දැරූ මුළු ශුද්ධ හිමිකම්පෑම්වලින් 72.55%කට හිමිකම් පෑ අතර රු. මිලියන 24, 593ක (2014:රු.මිලියන 20,281) මුළු ශුද්ධ හිමිකම්පෑමක් වාර්තා කළේය.

ශුද්ධ ඉපැයූ වාරික ආදායමේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ හිමිකම්පෑම් නිරූපණය කරනු ලබන ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය 2015 වසරේ දී විවිධ රක්ෂණය ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉහළම අගයක් වාර්තා කළ අතර එය 77.12%ක් (2014 : 78.41%) පෙන්නුම් කළේය. ඒ අනුව, විවිධ රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය 2014 වසරට සාපේක්ෂව 2015 දී ආන්තික වශයෙන් පහත වැටුණි.

රථවාහන රක්ෂණ ව්‍යාපාරය 2015 වසරේ දී 64.81%ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් වාර්තා කර ඇති අතර 2014 වසරේ දී වාර්තා කළ 59.97%ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයට වඩා එය ඉහළ අගයකි. රථවාහන රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඉපැයූ වාරික ආදායම 2014 දී වාර්තා කළ රු. මිලියන 33,821 සිට 2015 දී 37,946 දක්වා 12.19%කින් වර්ධනය වුව ද, රථවාහන රක්ෂණ ව්‍යාපාරයේ දැරූ ශුද්ධ හිමිකම්පෑම් 2015 වසරේ දී 21.26%කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර එය වඩා ඉහළ ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයකට හේතු වී ඇත.

ගිනි රක්ෂණ ව්‍යාපාරය 2015 වසරේදී 45.77%ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් වාර්තා කරන ලද අතර ඉන් 2014 දී වාර්තාකළ 57.78%ට වඩා සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කරයි. මුහුදු රක්ෂණ ව්‍යාපාරයේ දැරූ ශුද්ධ හිමිකම්පෑම් 35,24% ක ශුද්ධ හිමිකම්පෑම් අනුපාතයක් වාර්තා කර ඇති අතර එය 2014 වසරේ දී වාර්තා කළ 35.37% ට සමාන වේ.

SRCC හා T ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය 2014දි ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සිදුකළ අධි වෙන්කිරීම් හේතු කොට ගෙන 2014 දී වාර්තා කළ 2.11% සිට 2015 දී -0.01% දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇත.

16වන වගුවෙන් සහ 16වන රූපසටහනෙන් නිරූපණය කර ඇති පරිදි 2015 දී සාමාන්‍ය රක්ෂණ අංශය විසින් දැරූ ශුද්ධ වියදම රු. මිලියන 19,522ක් (2014: රු. මිලියන 23,991) වූ අතර එය 2015 වසරේ දී 18.63%කින් පහත වැටී ඇත. SRCC හා T ඇතුළුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ත ශුද්ධ වියදම් අනුපාතය ද 2014 වසරේ වාර්තා කළ 48.37% සිට 2015 වසරේ දී 36.05%ක් දක්වා පහත වැටී ඇත. ශුද්ධ හිමිකම් අනුපාතය සහ ශුද්ධ වියදම් අනුපාතය යන අනුපාත දෙකෙහි එකතුව නිරූපනය කරන ශුද්ධ හිමිකම්පෑම් අනුපාතය 2014 වසරේ දී වාර්තා කළ 108.89% සිට 98.65% දක්වා අඩු වී ඇත. 100%ක් නොඉක්ම වූ ඒකාබද්ධ අනුපාතයක් මඟින් සාමාන්‍ය රක්ෂණ අංශය මඟින් දැරූ මුළු හිමිකම්පෑම් සහ වියදම්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට හිතකර වන ඉපැයූ වාරික ආදායමට වඩා පහළ මට්ටමක මත පවතින බව නිරූපණය කරයි.

සංඛ්‍යානමය සමාලෝචනය

වගුව 16

ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය, ශුද්ධ වියදම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

පන්තිය	ශුද්ධ ඉපැයූ වාරික ආදායම (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	1,145,285	1,452,556	1,405,887	1,241,985	1,283,057
මුහුදු	804,444	546,598	806,277	753,643	804,393
රථවාහන	23,790,270	29,499,705	31,346,284	33,821,396	37,945,841
විවිධ	7,670,795	8,192,094	10,845,577	11,087,494	10,936,252
උප එකතුව	**33,410,794**	**39,690,953**	**44,404,025**	**46,904,518**	**50,969,543**
SRCC හා T	1,864,652	2,185,222	2,406,477	2,692,730	3,178,495
එකතුව	**35,275,446**	**41,876,175**	**46,810,502**	**49,597,248**	**54,148,038**

පන්තිය	දැරූ ශුද්ධ හිමිකම්පෑම් (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	482,646	506,092	810,281	717,626	587,194
මුහුදු	232,189	321,562	432,748	266,560	283,458
රථවාහන	15,544,386	18,351,251	19,514,319	20,281,109	24,592,825
විවිධ	5,683,867	6,176,879	6,170,826	8,694,096	8,433,888
උප එකතුව	**21,943,088**	**25,355,784**	**26,928,174**	**29,959,391**	**33,897,365**
SRCC හා T	(141,694)	37,076	2,332	56,897	(240)
එකතුව	**21,801,394**	**25,392,860**	**26,930,506**	**30,016,288**	**33,897,125**

පන්තිය	ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය (%)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
ගිනි	42.14	34.84	57.63	57.78	45.77
මුහුදු	28.86	58.83	53.67	35.37	35.24
රථවාහන	65.34	62.21	62.25	59.97	64.81
විවිධ	74.10	75.40	56.90	78.41	77.12
උප එකතුව	65.68	63.88	60.64	63.87	66.51
SRCC හා T	(7.60)	1.70	0.10	2.11	(0.01)
එකතුව	**61.80**	**60.64**	**57.53**	**60.52**	**62.60**

පන්තිය	ශුද්ධ වියදම් (රු.000)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
SRCC සහ T (ඈ) හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් ('000)	12,105,102	14,807,142	17,359,623	21,322,543	19,035,896
SRCC & T (ඈ)	329,202	386,071	414,422	2,668,435	486,474
එකතුව	**12,434,304**	**15,193,213**	**17,774,045**	**23,990,978**	**19,522,370**

විස්තරය	ශුද්ධ වියදම් අනුපාතිකය (%)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
SRCC සහ T (ඈ) හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ වියදම් අනුපාතය	36.23	37.31	39.09	45.46	37.35
සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ වියදම් අනුපාතය	35.25	36.28	37.97	48.37	36.05

විස්තරය	ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය (%)				
	2011 (අ)	2012 (අ)	2013 (අ)	2014(ආ)	2015(ඇ)
SRCC සහ T (ඈ) හැර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උප පන්ති සඳහා ශුද්ධ ඒකාබද්ධ අනුපාතය	101.91	101.19	99.74	109.33	103.86
සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඒකාබද්ධ අනුපාතය	97.05	96.92	95.50	108.89	98.65

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා
(ඈ) SRCC සහ T විස්තර ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව ඉහත විශ්ලේෂණය තුළ ඇතුළත් කරන ලදී.

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 16

ශුද්ධ ඉපැයූ වාරික ආදායම, දැරූ ශුද්ධ හිමිකම්පෑම්, ශුද්ධ වියදම්, ශුද්ධ හිමිකම්පෑම් අනුපාතිකය සහ ශුද්ධ ඒකාබද්ධ අනුපාතිකය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය



(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා
(ආ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ඇ) තාවකාලික සංඛ්‍යා

දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

2011 සිට 2015 වසර දක්වා කාලසීමාව තුළ දළ ලිඛිත වාරික ආදායම උත්පාදනයට දායක වූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විවිධ උප-පන්තිවලට අයත් රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 17වැනි වගුවෙන් නිරූපණය කෙරේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සියලුම උපපන්ති ආශ්‍රිත සාමාන්‍ය රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2014 වසරේ දී වාර්තා කළ 4,597,188 සිට 2015 වසරේ දී 5,191,170 දක්වා ඉහළ ගොස් ඇත. 17වැනි වගුවෙන් දක්වා ඇති ආකාරයට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු ඔප්පු සංඛ්‍යාව පසුගිය වසර පහක කාලය තුළ ක්‍රමයෙන් වර්ධනය වී ඇත. රථවාහන රක්ෂණ ව්‍යාපාරය සමස්ත ඔප්පුවලින් 87.97% ක් නියෝජනය කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ තනි උප පන්තියකින් වැඩිම ඔප්පු සංඛ්‍යාවක් ඇති පන්තිය බවට පත් වී තිබේ. රථවාහන රක්ෂණ ඔප්පුවල මුළු සංඛ්‍යාව 2015 වසරේ දී 4,566,914 දක්වා තවදුරටත් වැඩි වූ අතර ඒවා 2,478,380ක තුන්වැනි පාර්ශ්ව රක්ෂණ ඔප්පු සහ 2,088,534ක පූර්ණ රථවාහන රක්ෂණ ඔප්පුවලින් සැදුම්ලත් විය.

ගිනි, මුහුදු සහ විවිධ රක්ෂණ ව්‍යාපාරවල රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2014 වසර හා සැසඳීමේ දී 2015 වසරේ දී වර්ධනය වී ඇත. කෙසේවුව ද, 2014 වසර හා සැසඳීමේ දී 2015 වසරේ දී කම්කරු වන්දි පිළිබඳ රක්ෂණ ඔප්පු සංඛ්‍යාව පහළ බැස ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය

වගුව 17

දළ ලිඛිත වාරික ආදායම නියෝජනය කරන රක්ෂණ ඔප්පු සංඛ්‍යාව- සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

	2011	2012	2013	2014	2015
ගිනි	205,657	186,478	177,749	188,578	215,047
මුහුදු	169,748	154,528	158,893	186,447	190,334
රථවාහන					
තුන්වැනි පාර්ශ්ව පමණක්	2,086,490	1,997,502	2,126,037	2,229,153	2,478,380
පූර්ණ රථවාහන රක්ෂණ	1,213,255	1,476,423	1,669,022	1,775,009	2,088,534
කම්කරු වන්දි පිළිබඳ රක්ෂණ	17,197	17,422	18,717	16,087	14,784
විවිධ					
සෞඛ්‍ය	7,925	10,262	11,609	13,716	17,155
සෞඛ්‍ය හැරුණු කොට	204,782	198,406	167,414	188,198	186,936
එකතුව	**3,905,054**	**4,041,021**	**4,329,441**	**4,597,188**	**5,191,170**

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්

2015 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම්වල සංකේන්ද්‍රණය 18 වගුවෙන් සහ 17 රූප සටහනින් පෙන්නුම් කරයි. 2015 වසරේ දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ වත්කම් ඇතුළු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් රු. මිලියන 157,001ක් (2014:රු. මිලියන 173,964) වූ අතර 2014 වසරේ දෙසැම්බර් 31ට වාර්තා කළ මුළු වත්කම් වටිනාකම හා සැසඳීමේ දී 9.75%ක පහත වැටීමක් වාර්තා කර ඇත. 2015 වසරේ සිට සංයුක්ත රක්ෂණ සමාගම් වෙන් කිරීම් සහ පසුගිය වසර තුළ සාමාන්‍ය රක්ෂණ යටතේ වාර්තා කල කොටස් හිමියන්ගේ වත්කම් මෙම වසරේදී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කිරීම මෙම පහත වැටිමට හේතු විය.

ස්කන්ධය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ප්‍රධාන ආයෝජන වර්ගයන්ගෙන් එකක් ලෙස පැවති අතර රු. මිලියන 46,295ක් වාර්තා කරන ලදී. ස්කන්ධ ආයෝජන 2015 දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු වත්කම් කළඹින් 29.49%ක් නියෝජනය කළේය

රජයේ සුරැකුම්පත්වල ආයෝජනය 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 38,042ක් (2014:රු.මිලියන 31,770) වාර්තා කල අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දෙවැනි විශාලතම වත්කම් කාණ්ඩය නියෝජනය කරන ලදී. ඊට අමතරව, රජයේ සුරැකුම්පත්වල ආයෝජන පසුගිය වසරට සාපේක්ෂව 19.74%ක වර්ධනයක් වාර්තා කළේය. පනතෙන් දක්වා ඇති ආකාරයට සමාගම් තාක්ෂණික සංචිතවල ආයෝජනවලින් අවම වශයෙන් 20%ක් හෝ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන බවටත් ඉතිරි වත්කම් නිර්ණය කිරීම් අංක 1 (Determination1) ප්‍රකාරව සිදු කරන බවටත් මණ්ඩලය විසින් වසර පුරාම වගබලා ගන්නා ලදී.

තැන්පතු ප්‍රමාණය රු. මිලියන 14,729ක් (2014: රු. මිලියන 20,756) සඳහා දායක වූ අතරමුළු වත්කම්වලින් 9.38%ක් නියෝජනය කරන ලදී. ආකර්ශනීය නොවන තැන්පතු අනුපාත හේතු කොට ගෙන 2014ට සාපේක්ෂව 2015 වසර තුල මුළු වත්කම්වල 2.55%ක් පහත වැටීමක් වාර්තා කරන ලදී.

ඉඩම් හා ගොඩනැගිලි, සංස්ථා ණය, අනෙකුත් වත්කම් සහ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ අනෙකුත් ප්‍රධාන වත්කම් කාණ්ඩ වූ අතර 2015 වසරේ දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් මුළු වත්කම්වලින් 6.83%ක්, 5.84%ක්, 5.52%ක් සහ 4.57%ක් සඳහා දායක විය.

වගුව 18

2014 සහ 2015 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස්හිමියන්ගේ වත්කම් සංකේන්ද්‍රගතවීම

	2014 (අ)		2015 (ආ)	
වත්කම් වර්ගය	රු. '000	%	රු. '000	%
රජයේ ණය සුරැකුම්පත්	31,769,804	18.26	38,042,180	24.23
ස්කන්ධ	47,879,441	27.52	46,294,932	29.49
සංස්ථා ණය	7,965,919	4.58	9,170,186	5.84
ඉඩම් හා ගොඩනැගිලි	11,996,569	6.90	10,717,660	6.83
තැන්පතු	20,756,018	11.93	14,728,905	9.38
ඒකක භාර	2,362,112	1.36	1,831,049	1.17
රත්රන්වල ආයෝජන	110,491	0.06	2,491	0.00
ලැබිය යුතු ප්‍රතිරක්ෂණ	6,590,214	3.79	7,174,876	4.57
ඔප්පුහිමියන්ගෙන් හා අතරමැදියන්ගෙන් ලැබිය යුතු වාරික ආදායම	13,580,926	7.81	14,854,319	9.46
දේපළ පිරියත හා උපකරණ	5,234,702	3.01	3,031,498	1.93
වෙනත් වත්කම්	23,219,013	13.34	8,671,785	5.52
මුදල් හා මුදල් සමාන දෑ	2,498,656	1.44	2,481,252	1.58
එකතුව	**173,963,865**	**100**	**157,001,133**	**100**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)

(ආ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

රූපසටහන 17
සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සහ කොටස් හිමියන්ගේ වත්කම් සංකේන්ද්‍රගතවීම - 2015 දෙසැම්බර් 31 දිනට



සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ හා කොටස් හිමියන්ගේ ආයෝජන ආදායම

19 වැනි වගුවෙන් පෙන්වා දෙන පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය ආයෝජනය 2015 දී රු. මිලියන 122,895 දක්වා ඉහළ ගිය අතර එය 2014දී වාර්තාකළ රු. මිලියන 113,411 හා සැසැඳීමේදී 8.36%ක වැඩි වීමකි. 2015 වසර සඳහා වාර්තා කළ මුළු ආයෝජන ආදායම රු. මිලියන 7,102ක් (2014: රු. මිලියන 8,759) වූ අතර 2015 වසරේ දී වාර්තා කළ 5.78% ක සමස්ත ආයෝජන ඵලදාවකට එය හේතු විය.

ස්කන්ධ තුළ සාමාන්‍ය ආයෝජනය, රු. මිලියන 47,087ක (2014 රු. මිලියන 41,427) සාමාන්‍ය ආයෝජනයක් වාර්තාකරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ විශාලතම අයෝජන කාණ්ඩය බවට පත් වූ අතර ස්කන්ධ ආයෝජන ඵලදාව 3.36% ලෙස වාර්තා කරන ලදී. එමෙන්ම, රජයේ සුරැකුම්පත්වල සාමාන්‍ය ආයෝජනය 2015 දී රු. මිලියන 34,906 (2014:රු.මිලියන 29,966) වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළ ආයෝජනයෙහි දෙවන විශාලතම ස්ථානය රැක ගන්නා ලදී. රජයේ සුරැකුම්පත්වලින් උත්පාදිත ආයෝජන ආදායම, 2014 වසරට සාපේක්ෂව 10.61% ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරමින් රු. මිලියන 2,657ක් (2014: රු. මිලියන 2.973) වාර්තා කළ අතර ආයෝජන ඵලදා අනුපාතය 2015 දී 7.61%ක් ලෙස වාර්තා කරන ලදී.

බැංකු සහ මූල්‍ය ආයතනවල තැන්පතුවල සාමාන්‍ය ආයෝජනය රු. මිලියන 17,742ක් වූ අතර 2014 වසරේ දී වාර්තා කළ රු. මිලියන 19,856 හා සැසඳීමේ දී 10.53%ක සෘණ වර්ධනයක් වාර්තා කළේය. තැන්පතුවලින් රු. මිලියන 1,025ක (2014:රු.මිලියන 1,640) ආයෝජන ආදායමක් උත්පාදනය කළ අතර 2014 වසර හා සැසඳීමේ දී 37.47%ක කැපී පෙනෙන පහත වැටීමක් පෙන්නුම් කරයි. තැන්පතුවල ආයෝජන ඵලදාව 2015 වසරේ දී 5.78%ක් වූ අතර 2014 වසරේ දී උත්පාදිත 8.26%ක ආයෝජන ඵලදාව හා සැසඳීමේ දී 2.48% ක පහළ බැසීමක් වාර්තා කළේය.

තවද, 2015 වසරේ දී සංස්ථා ණය, ඉඩම් සහ ගොඩනැගිලි, ඒකක භාර සහ වෙනත් ආයෝජනවලින් පිළිවෙලින් 11.86%ක, 0.05%, 6.91%ක සහ 62.13%ක ආයෝජන ඵලදා අනුපාත උත්පාදනය කළේය.

සංඛ්‍යානමය සමාලෝචනය

වගුව 19

සවිස්තරාත්මක ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

වර්ගය	2014(අ)			2015(ආ)		
	ආයෝජන ආදායම (රු. '000)	සාමාන්‍ය ආයෝජන (රු. '000)	ආයෝජන ඵලදා අනුපාතය (%)	ආයෝජන ආදායම (රු. '000)	සාමාන්‍ය ආයෝජන (රු. '000)	ආයෝජන ඵලදා අනුපාතය (%)
රජයේ ණය සුරැකුම්පත්	2,972,870	29,966,376	9.92	2,657,461	34,905,992	7.61
- භාණ්ඩාගාර බැඳුම්කර	1,608,179			1,626,662		
- භාණ්ඩාගාර බිල්පත්	535,623			345,291		
- වෙනත් (රිපෝ)	829,068			685,508		
ස්කන්ධ	2,431,584	41,426,961	5.87	1,580,380	47,087,187	3.36
- ප්‍රාග්ධන ලාභ/ අලාභ	1,061,387			190,854		
- ලාභාංශ	1,370,197			1,389,526		
සංස්ථා ණය	1,010,606	6,969,483	14.50	1,016,453	8,568,052	11.86
- ණයකර	985,538			991,438		
- වාණිජ පත්‍රිකා	8,635			21,129		
- වත්කම් අනුබල සුරැකුම්පත්	10,333					
- සමාන වෙනත් මූල්‍ය උපකරණ	6,100			3,886		
ඉඩම් හා ගොඩනැගිලි	10,913	11,537,337	0.09	6,050	11,357,114	0.05
තැන්පතු	1,639,876	19,855,959	8.26	1,025,338	17,742,461	5.78
- බැංකු	1,368,330			782,906		
- මූල්‍ය සමාගම්	271,546			242,432		
ඒකක භාර	238,938	2,202,467	10.85	144,797	2,096,580	6.91
රත්රන්	(606)	71,355	(0.85)		56,491	
වෙනත්	455,216	1,380,770	32.97	672,011	1,081,601	62.13
එකතුව	8,759,397	113,410,708	7.72	7,102,490	122,895,478	5.78

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ආ) තාවකාලික සංඛ්‍යා

සටහන:
ශ්‍රී.ලං.ර.සංස්ථාව. එම්බීඑස්එල් සහ සණස යන සංයුක්ත රක්ෂණ සමාගම්වල කොටස්හිමියන්ට අයත් ආයෝජන ආදායම සහ සාමාන්‍ය ආයෝජන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ වාර්තා කොට ඇත.
.

රක්ෂණ සමාගම්වල නුබුන්වත්භාවය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

20 වැනි වගුව මඟින් 2014 දෙසැම්බර් 31 දිනට සහ 2015 දෙසැම්බර් 31 දිනට එක් එක් සාමාන්‍ය රක්ෂණ සමාගම් මඟින් වාර්තා කළ නුබුන්වත් අනුපාතය සහ තාක්ෂණික සංචිත පැහැදිලි කරයි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සාමාන්‍ය නුබුන්වත්භාව අනුපාතය 2014 වසරේදී පැවති 2.8 හා සැසඳීමේදී 2015 වසර අවසානයේදී 2.59ක් විය. එසේ වුවත්, රක්ෂණ සමාගම් හතරක් 2015 දෙසැම්බර් 31 දිනට නුබුන්වත්භාවය පිළිබඳ ආන්තික අවශ්‍යතාවයට අනුකූලවීමට අසමත් වූ අතර මේ සම්බන්ධයෙන් මණ්ඩලය සුදුසු ක්‍රියාමාර්ගය ගෙන ඇත. රක්ෂණ සමාගම්වල තාක්ෂණික සංචිත වගකීම 2015 වසර අවසානයට රු. මිලියන 46,756ක් (2014: රු. මිලියන 40,200 වූ අතර 2014 වසරට සාපේක්ෂව 16.31% ක ධනාත්මක වර්ධනයක් නියෝජනය කරයි.

සංඛ්‍යානමය සමාලෝචනය

වගුව 20

2014 සහ 2015 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ සමාගම්වල නුබුන්වත්බව සහ තාක්ෂණික සංචිත සමාගම් අනුව විශ්ලේෂණය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

රක්ෂකයා	2014(අ)		2015 (ආ)			
	නුබුන්වත් අනුපාතය	තාක්ෂණික සංචිත (රු. 000)	පවත්නා නුබුන්වත් ආන්තිකය (රු. 000)	අවශ්‍ය නුබුන්වත් ආන්තිකය (රු. 000)	නුබුන්වත් අනුපාතය	තාක්ෂණික සංචිත (රු. 000)
ඒඅයිඒ ජෙනරල්	3.13	1,833,987	1,419,434	520,089	2.73	2,055,784
ඒඅයිජී	2.78	72,002	97,752	50,000	1.96	37,146
අලියාන්ස් ජෙනරල්	1.44	1,278,412	596,005	414,133	1.44	1,721,995
අමානා තකාෆුල් ජෙනරල්	1.01	493,240	235,338	256,999	0.92	548,157
ඒෂියන් එලායන්ස් ජෙනරල්	1.71	999,641	220,604	357,299	0.62	1,160,041
සෙලින්කෝ ජෙනරල්	1.48	6,110,117	2,911,584	2,114,069	1.38	6,504,627
කොන්ටිනෙන්ටල්	2.52	761,969	808,295	344,545	2.35	1,014,865
කෝපරේටිව් ජෙනරල්	1.24	1,076,600	192,258	331,227	0.58	1,229,298
එච්එන්බීඒ ජෙනරල්	3.24	1,150,323	662,337	441,411	1.50	1,407,205
ජනශක්ති ජෙනරල්	1.71	4,327,793	2,983,964	1,308,855	2.28	4,785,305
එල්ඔීඑල්සී ජෙනරල්	1.45	1,326,137	608,241	440,389	1.38	1,885,375
එම්බීඑස්එල්	1.18	539,107	87,897	123,975	0.71	454,850
ඔරියන්ට්	4.05	259,891	297,276	120,344	2.47	432,036
පීපල්ස්	1.60	2,581,583	1,269,729	701,661	1.81	2,870,881
සණස	2.84	177,876	82,897	53,966	1.54	162,689
එස්එල්අයිසී	3.80	11,929,930	10,490,470	2,743,171	3.82	13,646,766
යූනියන් ජෙනරල්	3.17	3,152,537	2,722,386	926,530	2.94	3,471,493
ජා.ර.භා.අ.	4.90	2,128,643	7,758,204	1,639,840	4.73	3,367,198
එකතුව	**2.80**	**40,199,788**	**33,444,671**	**12,888,503**	**2.59**	**46,755,711**

(අ) පුනස්ථාපිත විගණන සංඛ්‍යා (ජා.ර.භාර අරමුදල හැර)
(ආ) තාවකාලික සංඛ්‍යා

සංඛ්‍යානමය සමාලෝචනය

නව, අලුත් කළ සහ පවත්නා රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

21 වන වගුවේ පෙන්වන පරිදි, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දැනට ක්‍රියාත්මක මුළු රක්ෂණ ඔප්පු සංඛ්‍යාව 2015 වසර අවසානයට 5,123,180ක් වූ අතර එය 2014 වසරේදී වාර්තා කළ 4,459,684 හා සැසඳීමේදී 14.88% ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2015 දී රථවාහන රක්ෂණය, ක්‍රියාත්මකව පැවති රක්ෂණ ඔප්පුවලින් 88.57%ක් නියෝජනය කළ අතර එය 2,473,136ක් වූ තුන්වැනි පාර්ශ්ව රක්ෂණ ඔප්පු සහ 2,064,460 ක් වූ විස්තීරණ ඔප්පුවලින් සමන්විත විය. ක්‍රියාත්මකව පවත්නා ගිනි රක්ෂණ ඔප්පු ප්‍රමාණය 2014 වසර අවසානයේදී වාර්තා කළ 182,808 ප්‍රමාණයේ සිට 2015 දී 226,638 දක්වා වැඩි වී ඇත. ක්‍රියාත්මකව පැවති කම්කරු වන්දි ඔප්පු ඇතුළු විවිධ රක්ෂණය සහ මුහුදු රක්ෂණය පිළිවෙලින් 3.89%ක් සහ 3.11%ක් නියෝජනය කරන ලදී.

වසර තුළදී, රක්ෂණ සමාගම් නව ඔප්පු 2,460,564 ක් ලියා ඇති අතර, එය පසුගිය වසරට සාපේක්ෂව 23.85%ක වැඩිවීමකි. 2014 වසරේ අළුත් කරන ලද ඔප්පු සංඛ්‍යාව වන 2,615,005 හා සැසඳීමේදී 2015 වසර තුළදී රක්ෂණ ඔප්පු 2,779,509ක් අළුත් කොට ඇත.

වගුව 21

නව, අලුත් කළ සහ පවත්නා රක්ෂණ ඔප්පු පිළිබඳ විස්තර - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය

උප පන්තිය	2014			2015		
	නව රක්ෂණ	අලුත් කළ ඔප්පු	වසර අවසානය වනවිට ක්‍රියාත්මකව ඇති ඔප්පු	නව රක්ෂණ	අලුත් කළ ඔප්පු	වසර අවසානය වනවිට ක්‍රියාත්මකව ඇති ඔප්පු
ගිනි	69,731	122,025	182,808	85,041	144,348	226,638
මුහුදු	183,957	2,286	157,806	187,167	3,879	159,563
රථ වාහන	1,597,703	2,413,204	3,902,997	2,033,228	2,575,150	4,537,596
3වැනි පාර්ශ්නය පමණක්	895,971	1,329,523	2,227,949	1,079,452	1,393,729	2,473,136
විස්තීර්ණ	701,732	1,083,681	1,675,048	953,776	1,181,421	2,064,460
ඩබ්ලිව් සී අයි (කම්කරු වන්දි) ඇතුළු විවිධ	135,390	77,490	216,073	155,128	56,132	199,383
එකතුව	**1,986,781**	**2,615,005**	**4,459,684**	**2,460,564**	**2,779,509**	**5,123,180**

ප්‍රතිරක්ෂණ ව්‍යාපාර

ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රාථමික රක්ෂයින් වෙත ප්‍රතිරක්ෂණය ලබාදෙන ශ්‍රී ලංකාවේ එකම ආයතනය වේ. 2012 දෙසැම්බර් 31 දින අංක 1791/4 අංක දරන රජයේ ගැසට්පත්‍රය අනුව, සෑම සාමාන්‍ය ප්‍රතිරක්ෂණයකින්ම ඇතිවන ප්‍රාථමික රක්ෂකයින්ගේ මුළු වගකීමෙන් 30% ක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරා දීමට සියලුම ප්‍රාථමික රක්ෂකයින් බැඳී සිටී. 2015 කාලසීමාව තුළ, ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ වාරික ආදායම රු. මිලියන 1,784ක් වූ අතර එය 2014 දී උපයන ලද රු. මිලියන 2,041 ට සාපේක්ෂව 12.59%ක පහත වැටීමකි. වාරික ආදායමෙහි මෙම පහත වැටීමට රු. මිලියන 8,007ක් වූ (2014 : රු. මිලියන 9,519) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු ප්‍රතිරක්ෂණ වාරිකවල 15.88% කින් පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු වූ අතර එය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ බොහෝ උප පන්තීන් සඳහා, විශේෂයෙන් ගිනි රක්ෂණ ව්‍යාපාරය තුළ රඳවාගැනීමේ මට්ටම් වර්ධනයවීම සඳහා හේතු විය. ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය විසින් දරන ලද මුළු වත්කම් 2014 වසර අවසානයේදී වාර්තා කළ රු. මිලියන 3,065ක වටිනා වත්කම්වලට සාපේක්ෂව 10.31%ක වැඩිවීමක් පෙන්නුම් කරමින් 2015 දෙසැම්බර් 31 දිනට රු. මිලයන 3,381ක් විය. 2015 වසර අවසානයේදී, ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය රු. මිලියන 2,640ක් (2014 : රු. මිලියන 1,955) රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අතර, ඉන් රු. මිලියන 186 ක (2014 රු. මිලියන 79) ආයෝජන ආදායමක් උපයන ලදී. ඒ අනුව, ආයෝජන ඉපයීම් අනුපාතය 2015 දී 8.10%කි (2014 : 5.74%).

2015 කාලසීමාව තුළ, ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ප්‍රතිරක්ෂණ හිමිකම් කියාපෑම් 278ක් ලැබුණ අතර ගෙවන ලද හිමිකම් කියාපෑම්වල වටිනාකම රු. මිලියන 796කි. එමෙන්ම 2015 කාලසීමාව තුළ, දරන ලද ශුද්ධ හිමිකම්පෑම් රු. මිලියන 1,265ක් වූ (2014 : රු. මිලියන 774) අතර, එය 68.30%ක (2014 : 45.75%) හිමිකම් අනුපාතයකට හේතු විය. ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය 2014 දී දරන ලද වියදම් රු. මිලියන 279 ක් වූ අතර එය 2015 කාලසීමාව තුල රු. මිලියන 539 ක් විය. ඒ අනුව එය 93.19%ක සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කල අතර, එය 29.1% ක (2014 :16.43%) වියදම් අනුපාතයකට හේතු විය. ඒ අනුව, හිමිකම් අනුපාතයේ සහ වියදම් අනුපාතයන්හී එකතුව වන ඒකාබද්ධ අනුපාතය 2014 දී වාර්තා කළ 62.18% ට වඩා 35.22% ක සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කරමින් 2015 දී 97.40%ක් විය.

සංඛ්‍යානමය සමාලෝචනය

රක්ෂණ තැරැව්කාර සමාගම්

රක්ෂණ තැරැව්කාර සමාගම්වල කාර්යසාධනය

2015 වසර තුළ දී රක්ෂණ තැරැව්කාර සමාගම් පනස් හතක් වෙළඳපොල තුළ ක්‍රියාත්මක වූ අතර රු. මිලියන 16,330 ක් වූ දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදන කළේය. ඒ අනුව රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායම 2014 වසරේ දී උත්පාදිත රු. මිලියන 14,717 හා සැසඳීමේ දී 2015 දී 10.96%ක වර්ධනයක් වාර්තා කළේය. පිළිවෙලින් රු. මිලියන 206 ක් සහ රු. මිලියන 16,124 ක් වූ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදිත වාරික ආදායම මෙම මුළු දළ ලිඛිත වාරික ආදායමට ඇතුලත් විය. රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදිත මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 98.74%ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායම නිරූපණය කළ අතර දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය නිරූපණය කළේ 1.26% ප්‍රමාණයක් පමණි.

පෙර වසර හා සමානවම 2015 වසර තුළදී දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කෙරෙහි රක්ෂණ තැරැව්කාර සමාගම්වල දායකත්වය එතරම් වැදගත් නොවූ අතර රක්ෂණ තැරැව්කාර සමාගම්වලින් උත්පාදනය කර ඇත්තේ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 0.38%ක් (රු. මිලියන 53,575)පමණි.රක්ෂණ තැරැව්කාර සමාගම් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මුළු දළ ලිඛිත වාරික ආදායමෙන් 23.43%ක් උත්පාදනය කර ඇති අතර (වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කැළඹීම් හා ත්‍රස්තවාදය වාරික ආදායම ඇතුළුව) එය රු. මිලියන 68,815ක් විය.

22වැනි වගුවෙන් නිරූපණය කර ඇති පරිදි 2015 වසරේ දී රක්ෂණ තැරැව්කාර සමාගම් විසි තුනක් අතුරින් එක් එක් සමාගම රු. මිලියන 100 ඉක්මවන දළ ලිඛිත වාරික ආදායමක් ප්‍රසම්පාදනය කළ අතර මෙම රක්ෂණ තැරැව්කරුවන් සාමූහිකව රු. මිලියන 15,188 ක දළ ලිඛිත වාරික ආදායමක් උත්පාදනය කළේය. ඉතිරි රක්ෂණ තැරැව්කාර සමාගම් තිස් හතර රු. මිලියන 1,142ක් උත්පාදනය කර ඇත.

වගුව 22

රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම - 2015

		දළ ලිඛිත වාරික ආදායම (*)					
		දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය		සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය		එකතුව	
	රක්ෂණ තැරැව්කාර සමාගමේ නම	(රු. 000)	වෙළඳපොළ පංගුව (%)	(රු. 000)	වෙළඳපොළ පංගුව (%)	(රු. 000)	වෙළඳපොළ පංගුව (%)
1	ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	7,310	3.56	302,331	1.88	309,641	1.90
2	එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	375	0.18	379,527	2.35	379,902	2.33
3	ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	-	-	555,990	3.45	555,990	3.41
4	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	-	-	1,247,902	7.74	1,247,902	7.64
5	සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	46	0.02	2,231,407	13.84	2,231,453	13.67
6	කොලොම්බෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,324	0.64	273,173	1.69	274,497	1.68
7	කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	63,782	31.02	1,946,679	12.07	2,010,461	12.32
8	ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	16,438	8.00	991,549	6.15	1,007,987	6.17
9	ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	-	-	129,878	0.81	129,878	0.80
10	එසාජි කරීම්ජී ඇන්ඩ් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්	16,720	8.13	359,505	2.23	376,225	2.30
11	ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	16,425	7.99	1,389,042	8.61	1,405,467	8.61
12	ෆෝසයිට් ඉන්සුවරන්ස් ඇන්ඩ් රීඉන්සුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	-	-	169,173	1.05	169,173	1.04
13	ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්	27	0.01	103,789	0.64	103,816	0.64
14	ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්	799	0.39	137,610	0.85	138,409	0.85
15	මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	-	-	174,170	1.08	174,170	1.07
16	නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	10,573	5.14	1,223,715	7.59	1,234,288	7.56
17	ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,299	0.63	219,870	1.36	221,169	1.35
18	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	-	-	1,166,721	7.24	1,166,721	7.15
19	රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	11,536	5.61	397,602	2.47	409,138	2.51
20	සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	5,257	2.56	503,327	3.12	508,584	3.10
21	සෙන්කඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	-	-	718,966	4.46	718,966	4.40
22	ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	19,701	9.58	200,934	1.25	220,635	1.35
23	සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	1,084	0.53	192,477	1.19	193,561	1.19
	උප-එකතුව	**172,696**	**84.00**	**15,015,337**	**93.12**	**15,188,033**	**93.01**
	වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් (34)	**32,889**	**16.00**	**1,108,754**	**6.88**	**1,141,643**	**6.99**
	මුළු එකතුව	**205,585**	**100**	**16,124,091**	**100**	**16,329,676**	**100**

* රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් එවන ලද තොරතුරු පදනම් කර ගෙන දළ ලිඛිත වාරික ආදායම් පෙන්වා ඇත.

සංඛ්‍යානමය සමාලෝචනය

රූප සටහන 18

2006 සිට 2015 දක්වා රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කළ දළ ලිඛිත වාරික ආදායම



	2006	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015
දීර්ඝ කාලීන රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන)	144	158	195	188	243	296	195	191	158	206
සාමාන්‍ය රක්ෂණය ද.ලි.වා.ආ. (රු. මිලියන)	6,028	7,393	8,781	8,698	9,317	10,193	12,532	14,189	14,559	16,124
මුළු ද.ලි.වා.ආ. (%) ලෙස තැරැව්කාර සමාග ම්වල දායකත්වය	14.34	14.55	15.43	15.44	14.43	12.78	14.03	14.39	13.96	13.34

රක්ෂණ සමාගම් සඳහා කෙටි යෙදුම්

ඒඅයිඒ ජීවිත	:	ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී
ඒඅයිඒ සාමාන්‍ය	:	ඒඅයිඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
ඒඅයිජී	:	ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
අලියාන්ස් සාමාන්‍ය	:	අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
අලියාන්ස් ජීවිත	:	අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
අමානා සාමාන්‍ය	:	අමානා තකාෆුල් පීඑල්සී
අමානා ජීවිත	:	අමානා තකාෆුල් ලයිෆ් ලිමිටඩ්
ආර්පිකෝ	:	ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී
ඒෂියන් ජීවිත	:	ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී
ඒෂියන් සාමාන්‍ය	:	ඒෂියන් එලායන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
සෙලින්කෝ	:	සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී
සෙලින්කෝ සාමාන්‍ය	:	සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
සෙලින්කෝ ජීවිත	:	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
කොන්ටිනෙන්ටල්	:	කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්
කෝපරේටිව් සාමාන්‍ය	:	කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්
කෝප්ලයිෆ්	:	කෝප්ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
එච්එන්බී ජීවිත	:	එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී
එච්එන්බී සාමාන්‍ය	:	එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
ජනශක්ති ජීවිත	:	ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී
ජනශක්ති සාමාන්‍ය	:	ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
එල්අයිසී	:	ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ්
එල්ඕඑල්සී	:	එල්ඕඑල්සී ඇසට් හෝල්ඩින් ලිමිටඩ්
එල්ඕඑල්සී සාමාන්‍ය	:	එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
එල්ඕඑල්සී ජීවිත	:	එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ්
එම්බීඑස්එල්	:	එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්
එන්අයිටීඑෆ්	:	ජාතික රක්ෂණ භාර අරමුදල
ඔරියන්ට්	:	ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
පීපල්ස්	:	පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
සණස	:	සීමාසහිත සණස රක්ෂණ සමාගම
එස්එල්අයිසී	:	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්
යූනියන් ජීවිත	:	යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී
යූනියන් සාමාන්‍ය	:	යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් ලිමිටඩ්

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

අධීක්ෂණ සමාලෝචනය

රක්ෂණ සමාගම්

1. මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තා පිළිබඳ සමාලෝචනය

අ. වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ජීවගණකඥ වාර්තා

පනතේ විධිවිධාන ප්‍රකාරව සියලුම රක්ෂණ සමාගම් ඔවුන්ගේ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අදාළ මූල්‍ය වර්ෂය අවසන් වී හය මසක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. තවද, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ නිරත වී සිටින සමාගම් විසින් ජීවගණකඥ වාර්තාවක් සහ එහි සංක්ෂිප්තයක් වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා සමඟ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වෙතත් ජීවිත සහ සාමාන්‍ය වශයෙන් වෙන් වූ රක්ෂණ සමාගම් මූල්‍ය වර්ෂය අවසන් වී මාස හතරක් ඇතුළත විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික ව්‍යවස්ථානුකූල වාර්තා මණ්ඩලය වෙත යොමු කිරීමට සංයුක්ත සමාගම් වෙන් කිරීමේ මාර්ගෝපදේශය අනුව කළ යුතු වේ.

මණ්ඩලය විසින් ඉහත වාර්තාවල නිරවද්‍යතාව සහ පනතේ අඩංගු විධිවිධානවලට අනුකූලව නියමිත දිනට ඉදිරිපත් කර ඇති ද යන කරුණු සමාලෝචනය කරන ලදී. වාර්තාවන් සමාලෝචනය කිරීමේදී මණ්ඩලය විසින් අධීක්ෂණය කරන ලද ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවලින් බැහැරවීම්, වෙනත් විෂමතාවයන් සහ හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම සඳහා අදාළ රක්ෂණ සමාගම් දැනුවත් කරන ලදී. තවද, ක්ෂේත්‍රගත විමර්ශනයෙන් හා රක්ෂණ සමාගම්වල නිලධාරීන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය වූ සැලකිය යුතු කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී.

ආ. අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය (RAS)

සියලුම රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ අවදානම් තක්සේරු කිරීමේ සාරාංශය සෑම වසරකම මාර්තු මස තිස්වක් වැනි දිනට ප්‍රථම මණ්ඩලය වෙත යොමු කළ යුතු වේ. එක් එක් රක්ෂණ සමාගමේ ආයතනික ව්‍යුහය, හිමිකාරත්වය, ව්‍යාපාරික පැතිකඩ, ඉහළ කළමනාකාරිත්වය, අලෙවිකරණය හා බෙදාහැරීමේ මාර්ග, රක්ෂණ හිමිකම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය ආදී කරුණු පිළිබඳව මණ්ඩලය විසින් මෙකී වාර්තා සමාලෝචනය කිරීමෙන් අධ්‍යයනය කළේය.

ඇ. ප්‍රතිරක්ෂණ ක්‍රියාපටිපාටි සමාලෝචනය

පනතේ 31 (1) වගන්තිය අනුව සියලුම රක්ෂණ සමාගම් විසින් සහතික කරන ලද ප්‍රතිරක්ෂණ ආවරණ ගිවිසුම් හා ක්‍රියාපටිපාටි මණ්ඩලය වෙත වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වේ. මණ්ඩලය විසින් නියම කරනු ලැබූ තක්සේරු අවශ්‍යතා සම්පූර්ණ කරන ලද ප්‍රතිරක්ෂකයින්ගෙන් ප්‍රතිරක්ෂණ ආවරණ ලබා ගෙන ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා එකී ලේඛන සමාලෝචනය කරනු ලැබීය. එමෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල වෙත අනිවාර්යයෙන් යොමු කළ යුතු ප්‍රතිරක්ෂණ ප්‍රතිශතයන් නිසි ලෙස සපුරා ඇත්ද යන්න පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කරන ලදී.

තවද, සියලුම රක්ෂණ සමාගම් විසින් එක් එක් සමාගම මගින් එළඹුනු Facultative ප්‍රතිරක්ෂණ ආවරණ සෑම කාර්තුවක් අවසන් වී දින 45 ක් ඇතුළත මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, මණ්ඩලය විසින් එම වාර්තාවල නිරවද්‍යතාවය සහ අනෙකුත් කරුණු පිළිබඳව සියුම්ව සමාලෝචනය කරන ලදී.

ඈ. කාර්තුමය වාර්තා

සියලුම රක්ෂණ සමාගම් විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව එක් එක් කාර්තුව අවසන් වී දින හතලිස් පහක් ඇතුළත ඔවුන්ගේ කාර්තුමය ව්‍යවස්ථානුකූල වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. 2015 වසරේ සියලු කාර්තු සඳහා සමාගම් විසින් ඉදිරිපත් කළ වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කර එක් එක් රක්ෂණ සමාගමේ කාර්යසාධනය සහ පනතේ රීති සහ රෙගුලාසිවලට අනුකූලව ඉදිරිපත් කර ඇත්දැයි නිර්ණය කරන ලදී. එකී රක්ෂණ සමාගම්වල කාර්තුමය කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා මණ්ඩලය විසින් දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන අංශ දෙකෙහිම වාරික ආදායම, ප්‍රාරක්ෂණ ලාභය සහ ශුද්ධ ලාභය පදනම් කරගෙන විශ්ලේෂණය කළ අතර රක්ෂණ සමාගම් හී කාර්තුමය කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා පසුගිය වසරේ අනුපාත සමඟ සැසැඳීමක් සිදුකළ අතර ඒ සඳහා එක් එක් සමාග මෙහි ලාභදායකත්වය, සමස්ත වියදම් සහ හිමිකම්පෑම පිළිබඳව අවධානය යොමු කරන ලදී. තවදුරටත් එක් එක් රක්ෂණ සමාගමෙහි නුබුන්වත්භාවය, ද්‍රවශීලතාවය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකභාවය ඇතුළු වත්කම්, වගකීම් තත්ත්වය සහ අනුපාත පරීක්ෂා කිරීමෙන් සෑම රක්ෂණ සමාග මකම එක් එක් කාර්තුව සඳහා මූල්‍ය තත්ත්වය විමර්ෂණය කරන ලදී.

එකී වාර්තා සමාලෝචනය කිරීමේදී හඳුනාගත් පනතේ රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙසත් එකී නිවැරදි කළ වාර්තා මණ්ඩලය වෙත යොමු කරන ලෙසටත් අදාළ සමාගම් වෙත උපදෙස් ලබා දුනි.

සියලුම රක්ෂණ සමාගම් විසින් සෑම කාර්තුවකම ඔවුන් පනතේ විධිවිධාන සහ රීති සපුරාලන බවටත් 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු විධිවිධාන පනතට අනුකූල වී ඇති බවටත් සහතික කිරීමේ වාර්තා දෙකක් (A) සහ (B) වශයෙන් මණ්ඩලයට යොමු කළ අතර මණ්ඩලය එකී වාර්තාවල නිරවද්‍යතාවය සමාලෝචනය කරන ලදී.

ඉ. මාසික වාර්තා

මණ්ඩලය විසින් නිකුත් කළ නියෝගවලට අනුව රක්ෂණ සමාගම් අටක් එක් එක් මාසය අවසන් වී දින පහළොවක් ඇතුළත ඔවුන්ගේ මාසික ව්‍යවස්ථානුකූල වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු විය. මෙම නියමය සමාගම් විසින් ඉදිරිපත් කරනු ලබන කාර්තුමය වාර්තාවලට අමතරව සැපයිය යුතු වේ. එක් එක් සමාග ම්වල මූල්‍ය තත්ත්වය පනතේ රීති සහ රෙගුලාසිවලට අනුකූලදැයි සමාලෝචනය කිරීම සඳහා මෙම මාසික වාර්තා පරීක්ෂා කර බැලූ අතර, හඳුනාගත් රීති සහ කොන්දේසිවලින් බැහැරවීම් සහ විෂමාචාරයන් නියමිත කාලයක් තුළ නිවැරදි කර මණ්ඩලයට යොමු කරන ලෙසට උපදෙස් ලබාදුනි.

2. නුබුන්වත් ආන්තික හැකියාවේ සීමාව පිළිබඳ අනුකූලතාව අධීක්ෂණය කිරීම

සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරවල රීතිවලට අනුව සෑම රක්ෂණ සමාගමක්ම පනතේ රීති රෙගුලාසි ප්‍රකාරව අවම නුබුන්වත්බවේ ආන්තිකයක් පවත්වාගෙන යා යුතු වේ. එමෙන්ම සෑම

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

සමාගමක්ම මාසික/කාර්තුමය/වාර්ෂික ව්‍යාවස්ථානුකූල වාර්තා සමඟ නුඹුන්වත් ආන්තිකය ගණනය කිරීම් මණ්ඩලය වෙත යොමු කළ යුතු වේ. එක් එක් සමාගම් නුඹුන්වත්බවේ ආන්තික රීතිවලට අනුකූලබව තහවුරු කර ගැනීම සඳහා එම ගණනය කිරීම් සමාලෝචනය කරන ලදී. රක්ෂණ සමාගම් විසින් අවශ්‍ය කරන නුඹුන්වත් ආන්තික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අසමත් වී තිබුනි නම් සහ ගණනය කිරීම් නිරවද්‍ය නොවුනි නම් නිශ්චිත කාලපරිච්ඡේදයක් ඇතුළත නිවැරදි කිරීමට සහ පනතේ රීතිවලට අනුකූලවීමට නිසි පියවර ගන්නා ලෙසට මණ්ඩලය උපදෙස් දෙන ලදී.

3. නිශ්චිත ආයෝජනවල අනුකූලතා අධීක්ෂණය කිරීම

අ. රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම.

පනතේ විසිපස් වන වගන්තියට අනුව සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වූ තාක්ෂණික සංචිත, වත්කම්වලින් 20% ට නොඅඩු ප්‍රමාණයක් සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සඳහා වූ දිගුකාලීන රක්ෂණ අරමුදලේ වත්කම් වලින් 30% ට නොඅඩු ප්‍රමාණයක් රක්ෂකයින් විසින් රජයේ සුරැකුම්පත්වල ආයෝජනවල, පවත්වාගෙන යා යුතු වේ. පනතේ 25 වන වගන්තියට අනුකූල වීම සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් මාසික/කාර්තුමය/වාර්ෂික පදනම මත රක්ෂණ සමාගම් විසින් රජයේ සුරැකුම්පත්වල කර ඇති ආයෝජන සියුම්ව අධීක්ෂණය කරන ලදී. මෙම ආයෝජනවල නිරවද්‍යතාවය සහ හිමිකාරත්වය තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් සමාගම වෙත නිකුත් කරන ලද තැන්පතු පිළිබඳ ප්‍රකාශන මණ්ඩලය විසින් විමර්ශණය කරනු ලැබිණි. විමර්ශනයේදී හඳුනා ගනු ලැබූ නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිශ්චිත කාලසීමාවක් තුළ නිවැරදි කර මණ්ඩලය වෙත යොමු කරන ලෙසට අදාළ රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

ආ. තීරණයන් අනුව කෙරෙන වෙනත් ආයෝජන

2011 මාර්තු එක වන දිනැති නිර්ණය කිරීම් අංක එක සහ පසුව සිදුකෙරුණු සංශෝධනවලට අනුව, සියලුම රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හී ශේෂව තිබෙන වත්කම් හා දිගුකාලීන රක්ෂණ අරමුදලේ ශේෂව තිබෙන වත්කම් ආයෝජන කළ යුතු වේ. රක්ෂණ සමාගම් විසින් මණ්ඩලය වෙත යොමු කළ ආයෝජන විස්තර මණ්ඩලය විසින් සියුම්ව නිරීක්ෂණය කළ අතර හඳුනාගත් පනතේ රීතිවලින් බැහැරවීම් නිශ්චිත කාලයක් තුළ නිවැරදි කර මණ්ඩලය වෙත යොමු කරන ලෙස අදාළ සමාගම් වලට දැනුම් දෙන ලදී.

4. මූල්‍ය විශ්ලේෂණයන්

මණ්ඩලය විසින් හසුරවනු ලබන පැමිණිලි සහ විමර්ශනයන්ට අදාළව නිවැරදි තීරණ ගැනීමට උපකාරයක් වන ලෙස ඇතැම් රක්ෂණ සමාගම් පිළිබඳ මූල්‍ය තොරතුරු ඇගයීමට ලක් කළ අතර, වැඩිදුර අවශ්‍ය විස්තර හා තොරතුරු එක් එක් සමාගම් වෙතින් ලබා ගන්නා ලදී.

5. අවදානම් පාදක ප්‍රාග්ධනය (RBC) ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා

2009 වර්ෂයේදී මණ්ඩලය ලෝක බැංකුවේ හා FIRST Initiative ආයතනයේ සහය ඇතිව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව නියාමනය කිරීම සඳහා, ඒ වන විට තිබූ රීති පදනම් ආකෘතිය වෙනුවට අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතියක් ගොඩ නැගීම ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන ප්‍රධාන අදියර හතරකින් සමන්විත වූ අතර, බොහෝ සන්ධිස්ථාන සැලසුම් කළ ආකාරයට නිසි අවස්ථාවන්වලදී නිම කර ගැනීමට හැකියාව ලැබිණි. 2014 වසරේ ආරම්භ කළ අනිවාර්යය සමාන්තර සමාලෝචනය 2015 වර්ෂය අවසන් වන තෙක් සාර්ථකව ක්‍රියාත්මක වූ අතර, ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා සපුරාලීම 2016 වසරේ සිට සියලු රක්ෂණ සමාගම් වෙත අනිවාර්ය කෙරිණි.

අවදානම් පාදක ප්‍රාග්ධන නියමය - 2015 අනුව සෑම රක්ෂණ සමාගමක් විසින් ම පවත්වා ගත යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය (TAC) රුපියල් මිලියන 500 ලෙසත්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) 120% ක් ලෙසත්, (සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරයන් සඳහා) නියම කරන ලදී. මෙම අවශ්‍යතාවන් නිසි පරිදි පවත්වා ගෙන යන්නේද පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා මණ්ඩලය විසින් සාමාන්‍ය ආකෘති පත්‍රයක් සහ ප්‍රශ්නාවලියක් රක්ෂණ සමාගම් වෙත ලබා දී ඇති අතර, රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ කාර්තුමය වාර්තා මණ්ඩලයට ඉදිරිපත් කිරීමේදී මෙම ලියකියවිලි නිසි පරිදි සම්පූර්ණ කර ලබා දිය යුතු බවට නියම කර ඇත. ඒ අනුව සමාන්තර සමාලෝචනයට අනුගත වෙමින් රක්ෂණ සමාගම් දෙකක් හැර අනෙකුත් සියලුම රක්ෂණ සමාගම් මෙම ආකෘති පත්‍රය සහ ප්‍රශ්නාවලිය නිසි ලෙස සම්පූර්ණ කර 2015 වර්ෂයේ සියලුම කාර්තු සඳහා මණ්ඩලය වෙත යොමු කරන ලදී. මණ්ඩලය විසින් එම ලියකියවිලි නිසි පරිදි එවා ඇත්දැයි ප්‍රාග්ධන නුඹුන්වත්බවේ ආන්තික රීති සමඟ සසඳා බලන ලද අතර, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ගැටළු ඇති රක්ෂණ සමාගම් වෙත එය නිසි පරිදි සපුරා ගැනීම සඳහා ඉදිරි සැලසුම් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙනු ලැබීය.

තවද, එක් එක් කාර්තුවෙහි ලද ප්‍රතිඵල මණ්ඩලය විසින් සමාලෝචනය කර එහිදී හඳුනාගත් අභියෝගතා සහ සංශෝධන පිළිබඳව රක්ෂණ සමාගම් දැනුවත් කරන ලදී.

අවදානම් පාදක ප්‍රාග්ධන රෙජිමය ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා මූලාරම්භයන් -

අ. අවදානම් රහිත ශූන්‍ය කූපන් පොලී අනුපාත වක්‍රය

අවදානම් පාදක ප්‍රාග්ධන රෙජිමය 2015 යටතේ නුඹුන්වත්බවේ ආන්තිකය ගණනය කිරීම සඳහා අවදානම් රහිත ශූන්‍ය කූපන් පොළී අනුපාත වක්‍රයක් රක්ෂණ සමාගම් විසින් භාවිතා කළ යුතු වේ. ඒ අනුව, පනතේ 32 වැනි රීතිය යටතේ රක්ෂණ සමාගම් විසින් සුදුසු ගණිතමය ආකෘතියක් භාවිතා කරමින්, තමන් විසින්ම සකසා ගත් ශූන්‍ය කූපන් පොළී අනුපාත වක්‍රයක් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර ගණනය කිරීම සඳහා වන වක්‍රය මණ්ඩලයේ පෙර අනුමැතිය යටතේ භාවිතා කළ යුතු වේ. එමෙන්ම මණ්ඩලය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අවදානම් රහිත ශූන්‍ය කූපන් පොළී අනුපාත වක්‍රයක් ද භාවිතා කළ හැකිය.

වසර දෙකක් පැවති සමාන්තර සමාලෝචන කාලපරිච්ඡේදයේදී මෙවැනි අවදානම් රහිත ශූන්‍ය කූපන් පොළී අනුපාත වක්‍රයක් ප්‍රකාශයට පත් කර නොතිබුණු බැවින් එක් එක් රක්ෂණ සමාගම් විවිධ වක්‍ර භාවිතා කිරීමට පෙළඹිනි. එයට පිළියමක් ලෙස මණ්ඩලය ශ්‍රී ලංකා මහා බැංකුවේද සහය ඇතිව ශූන්‍ය කූපන් පොළී අනුපාත වක්‍රයක් පනතේ 32 වැනි රීතිය අනුව ගොඩ නැගීමට පියවර ගන්නා ලදී.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ආ. නුඹුන්වත්බවේ ආන්තික (අවදානම් පාදක ප්‍රාග්ධන) රීති 2015

රක්ෂණ සමාගම් වෙතින් පැනයක් යොමු කරමින් මණ්ඩලයට දන්වා සිටියේ පනතේ රීති 6 (1) අනුව කාර්තුමය තක්සේරු කිරීම් සමාගම් හී අභ්‍යන්තර සේවයේ නියුතු ජීවගණකඥයින් ලවා සිදු කළ හැකි බැවින් වසර අවසානයේ තක්සේරු කිරීම් පමණක් බාහිර ජීවගණකඥයින් යොදා සිදු කළ යුතු බවත්ය. කෙසේ නමුත් මේ පිළිබඳ වැඩිදුරටත් පැහැදිළි කරමින් පනතේ 6 (1) රීතිය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමට මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබීය.

ඇ. අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපාය මාර්ග

අවදානම් පාදක ප්‍රාග්ධනය මත අවම ප්‍රාග්ධන අවශ්‍යතා පවත්වා ගැනීමට අසමත්වන රක්ෂණ සමාගම් සඳහා මණ්ඩලය මගින් අනුකූල නොවීම් සඳහා එම සමාගම්වලට එරෙහිව නිවැරදි පියවර ගැනීමට සිදුවනු ඇත. ඒ සඳහා අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග සම්පාදනය කිරීමට තීරණය විය. මේ තුළින් රක්ෂණ සමාගම් හි මූල්‍ය තත්ත්වයක් ක්ෂය වීමට පෙර හෝ වගකීම් පියවීමේ හැකියාව අර්බුදකාරී තත්ත්වයන්ට තුඩු දීමට පෙර මණ්ඩලයේ අධීක්ෂණයට මැදිහත් වනු ඇත. අවදානම් පාදක ප්‍රාග්ධනය මත බලාත්මක උපායමාර්ග ගැනීමේ ප්‍රධානතම අරමුණ වනුයේ රක්ෂණ සමාගම්වල පැනනැගිය හැකි ගැටළුකාරී තත්ත්වයන් මුල් අදියරේදීම හඳුනාගෙන එය වර්ධනයවීමට ප්‍රථම නිසි විසඳුම් ලබාදීමයි.

6. ක්ෂේත්‍රගත විමර්ශන

2015 වසර තුලදී අවදානම් පාදක අධීක්ෂණ ක්‍රමවේදය අනුව මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්වල ක්ෂේත්‍රගත විමර්ශන සයක් පවත්වන ලදී. අවදානම් පාදක අධීක්ෂණයේ එක් කොටසක් ලෙස ක්ෂේත්‍රගත විමර්ශන දෙකක් ලෝක බැංකු උපදේශකවරුන්ගේ මැදිහත්වීම තුළින් පවත්වනු ලැබීය. 2015 වසර තුලදී පවත්වනු ලැබූ ක්ෂේත්‍රගත විමර්ශනවල මූලිකම අරමුණ වූයේ අවදානම් පාදක ප්‍රාග්ධන රීතීන් ක්‍රියාත්මක කිරීමට ඇති සූදානම අධීක්ෂණය කිරීමය. තවද, මෙම විමර්ශනවලදී මණ්ඩලය විසින් රක්ෂණ සමාගම්හි මෙහෙයුම්, පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් සමාලෝචනය කර පනතේ විධිවිධාන සහ අනෙක් රීති හා මණ්ඩලයේ රෙගුලාසි පැළිපැදීම අගයන ලදී. තවද, අදාළ රක්ෂණ සමාග ම්වල මෙහෙයුම් පද්ධති, ප්‍රතිපත්ති සහ පටිපාටීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම පිණිස රක්ෂණ සමාගම් හී ජ්‍යේෂ්ඨ නිලධාරීන් අභ්‍යන්තර/බාහිර විගණකයින් සහ ජීවගණකඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. තවදුරටත් මුදල් විශුද්ධිකරණ පනතේ මාර්ගෝපදේශවලට අනුගත වීමේදී අධීක්ෂණය කරනු ලැබීය.

ක්ෂේත්‍රගත විමර්ශන අතරතුරදී කරන ලද නිරීක්ෂණ, වැඩි දියුණු කිරීම සඳහා මණ්ඩලයේ නිර්දේශ සමඟ අදාල රක්ෂණ සමාගම් හි ප්‍රතිචාර ලබා ගැනීම සඳහා ඔවුන් වෙත විමර්ශන වාර්තා යොමු කරන ලදී. තවද විමර්ශන අතරතුරදී අධීක්ෂණය උල්ලංඝනය කිරීම සඳහා සුදුසු පියවර ගන්නා ලදී.

7. ශ්‍රී ලංකා මහ බැංකුවට වෙත තොරතුරු ඉදිරිපත් කිරීම

කාර්තුමය වාර්තාවලින් එක් රැස්කර ගත් තොරතුරු මත පදනම්ව මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය පිළිබඳ මූල්‍ය තොරතුරු කාර්තුමය පදනමකින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පද්ධති ස්ථායිතා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. වාරික ආදායම, ලාභදායීත්වය, ද්‍රවශීලත්වය ආදී කාර්තුමය වාර්තාවලින් එක්රැස් කළ විස්තර මත පදනම්ව රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය අගයනු ලැබීය.

8. රක්ෂණ කර්මාන්තයේ අත්පොත - 2015

2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලය විසින් රක්ෂණ කර්මාන්තයෙන් එක්රැස් කර ගනු ලැබූ තොරතුරු සහ සංඛ්‍යා ලේඛන පදනම් කරගෙන රක්ෂණ කර්මාන්තයේ අත් පොත රක්ෂණ කර්මාන්තයේ සහ පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ප්‍රකාශයට පත් කරනු ලැබීය. මෙම අත්පොතෙහි රක්ෂණ කර්මාන්තයේ මුළු වත්කම්, රක්ෂණ ව්‍යාපාරයේ උප පන්තින්හී දළ වාරික, පුළුල් ආදායම් ප්‍රකාශය සහ රක්ෂණ සමාගම් හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ද, රඳවා තබාගැනීමේ අනුපාතය, හිමිකම් අනුපාතය, ඒකාබද්ධ අනුපාතය වැනි අනුපාතද ඇතුළත්ව සකස් කරන ලදී.

9. සංයුක්ත රක්ෂකයන් වෙන් කිරීම

2015 වර්ෂයේ ජනවාරි මස 1 වැනි දිනයේ සිට බලපැවැත්වෙන පරිදි සංයුක්ත සමාගම් හතක් සිය රක්ෂණ ව්‍යාපාර ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් ලෙස වෙන් කරන ලදී. තවද සංයුක්ත සමාගම් දෙකක් 2015 වර්ෂය තුළදී තම රක්ෂණ ව්‍යාපාර දෙකකට වෙන් කරන ලදී. මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන සමාගම් දෙකකට වෙන් කිරීමේ මාර්ගෝපදේශවලට අනුව මෙම සියලුම රක්ෂණ සමාගම් නිශ්චිතව දක්වා ඇති වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව ඉහත කී සියලුම වෙන් කරන ලද සමාගම් එම වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මණ්ඩලය විසින් එම වාර්තා පරීක්ෂා කළ අතර එහි දී හඳුනාගත් ඇතැම් කරුණු මණ්ඩලය විසින් අදාළ සමාගම්වලට සුදුසු පියවර ගැනීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.

වෙන් කරන ලද රක්ෂණ සමාගම් හි වත්කම් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අතර මාරු කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ මධ්‍යම තැන්පතු ක්‍රමයන් හී අත්‍යවශ්‍ය අනුකූලවීම් පිළිබඳ මණ්ඩලය දැනුවත් කරනු ලැබීය. ඒ අනුව වෙන් කරන ලද සමාගම් හි වත්කම් මාරු කිරීම පිළිබඳව කිසිදු විරෝධයක් නොපෑමේ ලිපියක් මණ්ඩලය විසින් නිකුත් කරන ලෙස එම සමාගම් ඉල්ලා සිටි අතර එම සියලුම සමාගම් සඳහා මණ්ඩලය විසින් කිසිදු විරෝධයක් නොපෑමේ ලිපි නිකුත් කරනු ලැබීය.

10. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය

ලෝක බැංකුවේ හා FIRST Initiative ආයතනයේ සහය ඇතිව මණ්ඩලය විසින් මණ්ඩලයේ අධීක්ෂණ කාර්යය ශක්තිමත් කිරීමේ පරමාර්ථය ඇතිව 2013 වසරේදී අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2015 වසරේ අප්‍රේල් මස අවසන් කරනු ලැබීය. අවදානම් පාදක අධීක්ෂණ (RBS) ව්‍යාපෘතිය මගින් අවදානම් පාදක අධීක්ෂණ, ප්‍රතිරක්ෂණය, ප්‍රතිරක්ෂකයින්, අලාභ ගලපන්නන්, ආයෝජන, ආයෝජන සබැඳි නිෂ්පාදන (Products) ආදී ක්ෂේත්‍ර සම්බන්ධව මණ්ඩලයේ අධීක්ෂණ හැකියාව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියට අයත්වනු ලැබිණ. තවද පෙර අවදානම් පාදක ප්‍රාග්ධන

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

ව්‍යාපෘතියට අයත් වූ කොටසක් වන අවදානම් පාදක ප්‍රාග්ධන රීති පිළියෙල කිරීම් අවසන් කිරීමද මෙම ව්‍යාපෘතියට අයත්වනු ලැබීය.

11. කාර්තුමය, වාර්ෂික සහ ජීවගණකඥ වාර්තා සංශෝධනය කිරීම

මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ නිශ්චය කිරීම් අනුව සියලුම රක්ෂණ සමාගම් විසින් ඔවුන්ගේ කාර්තුමය, වාර්ෂික සහ ජීවගණකඥ වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. 2016 වසරේ ජනවාරි 1 වන දින සිට සියලුම ඒ සඳහා නියාමන වාර්තා ද සංශෝධනය වීමට අවශ්‍ය විය. ඒ අනුව අවදානම් පාදක ප්‍රාග්ධන රීති ක්‍රියාත්මක කිරීමට වාර්තා කරන ලද ආකෘති මණ්ඩලය විසින් සමාලෝචනය කිරීම ආරම්භ කරන ලදී.

12. රක්ෂණ සමාගම්වල ආයෝජන සහ රක්ෂණ අරමුදල් කළමනාකරණය පිළිබඳ මාර්ගෝපදේශ

2015 වසර ආරම්භයේදී මණ්ඩලය විසින් මණ්ඩලයේ උපදේශන ජීවග ණකඥයින්ගේ සහය ඇතිව රක්ෂණ අරමුදල සහ ආයෝජන කළමනාකරණය පිළිබඳ ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුව අදියර දෙකකින් සමන්විත වූ අතර ඒ සඳහා රක්ෂණ කර්මාන්තයෙහි නියුතු සාමාජිකයින් 140 කට වැඩි පිරිසක් සහභාගි විය. ඉන්පසුව මණ්ඩලය විසින් පහත අංශයන් සඳහා මාර්ගෝපදේශ කෙටුම්පත් කරන ලදී.

අ) රක්ෂණ සමාගම්වල ආයෝජන සඳහා මාර්ගෝපදේශ

රක්ෂණ සමාගම්වල ආයෝජන සඳහා මාර්ගෝපදේශ කෙටුම්පත් කරනු ලැබුවේ රක්ෂණ සමාගම්වල ආයෝජන කටයුතුවලදී ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය කිරීමට අවශ්‍ය ගුණාත්මක අවශ්‍යතා සපුරාලීමටය. මෙය අවදානම් පාදක ප්‍රාග්ධනය සහ අවදානම් පාදක අධීක්ෂණය ආකෘතියේ අවශ්‍යතාවයක් විය.

ආයෝජනය කරන්නා වූ ප්‍රමාණය, ආයෝජන ක්‍රියාවලීන්ගේ සංකීර්ණතාවය වැනි විවිධ සාධක පදනම් කරගෙන රක්ෂණ සමාගම් විවිධ වූ ක්‍රමවේදයන් ආයෝජන කළමනාකරණය සඳහා යොදා ගනු ලැබේ. කෙසේ වෙතත්, සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්ගේ මූලික සිද්ධාන්ත වනුයේ වගකීම සහ වගකිව යුතු බව වන අතර මේ සඳහා ශක්තිමත් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ප්‍රමාණවත් නිරීක්ෂණ සහ පාදක ක්‍රම අවශ්‍ය වන අතර එය උපදේශනවල ඇතුළත් කර ඇත.

ආ.) රක්ෂණ අරමුදල කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ

රක්ෂණ අරමුදල කළමනාකරණය කිරීමේ මාර්ගෝපදේශ කෙටුම්පත් කරනු ලැබුවේ නියමිත පරිදි වත්කම්, වගකීම් හා වියදම් එක් එක් රක්ෂණ අරමුදල සඳහා බෙදා වෙන් කිරීමටය.

ඉහත උපදේශන මාලාව ශ්‍රී ලංකා රක්ෂණ කරුවන්ගේ සංගමයේ අදහස් ද සලකා බලා අවසන් කිරීමට නියමිතයි.

රක්ෂණ තැරැව්කාර සමාගම්

1. කාර්තුමය වාර්තා, මාසික වාර්තා, අන්තර්කාලීන මූල්‍ය ප්‍රකාශන සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය.

2010 පෙබරවාරි 25 දින අංක 1642/16 දරන ගැසට් නිවේදනය (පළමු උපලේඛනය) අනුව සියලු රක්ෂණ තැරැව්කරුවන් ඔවුන්ගේ කාර්තුමය වාර්තා සහ අන්තර් කාලීන මූල්‍ය ප්‍රකාශන එක් එක් කාර්තුව අවසන් වී දින 45ක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

රක්ෂණ තැරැව්කාර සමාගම් බහුතරයක් සිය කාර්තුමය වාර්තා සහ අන්තර් කාලීන මූල්‍ය ප්‍රකාශන එකී නියමිත කාලසීමාව ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. රක්ෂණ තැරැව්කරුවන් ඉදිරිපත් කළ කාර්තුමය වාර්තා මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබීය. වාර්තා සමාලෝචනය අතරතුරදී කිසියම් නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් සහ විෂමතා නිරීක්ෂණය කලේ නම් මණ්ඩලය නියම කළ කාලසීමාවක් තුළ දී ඒවා නිවැරදි කරනු පිණිස අදාළ තැරැව්කරුවන්ට දැනුම් දෙනු ලැබීය.

රක්ෂණ තැරැව්කාර සමාගම් වල විගණනය කළ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසානයේ සිට මාස හයක් ඇතුළත මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් කළ විගණන කළ මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. නියාමන අවශ්‍යතාවලින් බැහැරවීම් නිවැරදි කිරීම සඳහා ඒවා පිළිබඳ අදාළ තැරැව්කාර සමාගම්වලට දැනුම් දෙන ලදී.

2. **වාරික එකතු කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම**

පනතේ 89 වැනි පරිච්ඡේදයට අනුව රක්ෂකයන් වෙනුවෙන් රක්ෂණ වාරික එකතු කරනු ලබන රක්ෂණ තැරැව්කරුවන් විසින් එකතු කරනු ලබන රක්ෂණ වාරික දෙසතියක් ඇතුළත ඒ ඒ අදාළ රක්ෂකයන් වෙත ප්‍රේෂණය කළ යුතුය. මණ්ඩලය විසින් කාර්තුමය වාර්තා නිරීක්ෂණය කිරීම තුලදී සහ ක්ෂේත්‍රගත විමර්ශන අතරතුරදී රක්ෂණ තැරැව්කරුවන් විසින් පනතේ 89 වැනි වගන්තිය පිළිපැදීම පිළිබඳව සියුම්ව අධීක්ෂණය කරනු ලැබීය. එකී විධිවිධානවලට අනුකූල නොවන රක්ෂණ තැරැව්කරුවන්ට විරුද්ධව මණ්ඩලය අවශ්‍ය පියවර ගනු ලැබිණ.

3. **ක්ෂේත්‍රගත විමර්ශන**

පනතට සහ මණ්ඩලයේ රීති හා රෙගුලාසිවලට අනුකූල වන ආකාරයෙන් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්ෂණය කිරීම සඳහා 2015 වසර තුළදී මණ්ඩලය විසින් ක්ෂේත්‍රගත විමර්ශන අටක් පවත්වන ලදී. ක්ෂේත්‍රගත විමර්ශනවල දී සිදුකළ නිරීක්ෂණ නිවැරදි කිරීමේ පියවර සඳහා නිර්දේශ සමඟ අදාළ රක්ෂණ තැරැව්කරුවන්ගේ අවධානයට යොමු කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී මණ්ඩලය විසින් නියාමන පියවර ගනු ලැබිණ.

4. **ලියාපදිංචිය අලුත් කිරීම**

2016 වසර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ඔවුන්ගෙන් ලැබූ ඉල්ලුම්පත්‍ර මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලදී. මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ඔවුන්ගේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය වාර්තා විශ්ලේෂණය කරමින් රක්ෂණ තැරැව්කරුවන්ගේ මූල්‍ය තත්ත්වය අගයනු ලැබිණ.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

නියාමන සමාලෝචනය

රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

පනතේ 53 වගන්තියට අනුකූලව සමාගම් 3ක් රක්ෂණ සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී. එමෙන්ම දීර්ඝ කාලීන රක්ෂණය සඳහා ලියාපදිංචි වීම සඳහා එක් සමාගමක් විසින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද අතර එය තවමත් අධීක්ෂණය වෙමින් පවතී.

නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සහ රක්ෂණ තැරැව්කාර සමාගම්වල ලියාපදිංචිය අළුත්කිරීම්

මණ්ඩලය විසින් 2012 වසරේ අප්‍රේල් 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රක්ෂණ තැරැව්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා නව ඉල්ලුම් පත්‍ර භාර ගැනීම තාවකාලිකව නතර කර ඇත. ඒ අනුව, මෙම වසර තුළ දී රක්ෂණ තැරැව්කරුවන් ලෙස ක්‍රියා කිරීම සඳහා නව ලියාපදිංචි කිරීම් ප්‍රදානය කර නොමැත.

කෙසේවුවද, සාමාන්‍ය රක්ෂණය සඳහා ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාග මක් දීර්ඝ කාලීන රක්ෂණය සඳහා ලියාපදිංචිය ඉල්ලුම් කළ අතර මණ්ඩලය ඊට අනුමැතිය ලබා දී ඇත.

2015 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේ අපේක්ෂාවෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් 57කින් ඉල්ලුම් පත්‍ර මණ්ඩලය වෙත ලැබී තිබෙන අතර එම සමාගම් පනත යටතේ අවශ්‍ය නියමයන් සම්පූර්ණ කර ඇති බැවින් 2016 වසර සඳහා එම සියලුම සමාගම්වලට සිය ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රදානය කර ඇත.

ඇමුණුම 11 : මණ්ඩලයේ ලියාපදිංචි වී සිටින රක්ෂණ තැරැව්කාර සමාගම්වල නාම ලේඛනය ඔවුන්ට කර ගෙන යාමට අවසර ලබා දී ඇති රක්ෂණ ව්‍යාපාර පන්තිය/ පන්ති සහ ලියාපදිංචි කාලපරිච්ඡේදය දැක්වේ.

බලාත්මක කිරීමේ ක්‍රියාවලිය

රක්ෂණ සමාගම්

අත්හිටුවීම්

මණ්ඩලය විසින් වසර තුළ අත්හිටුවීම් පැනවූයේ නැත. කෙසේ වුවද, 2009 වසරේදී සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් සම්බන්ධයෙන් පනවන ලද අත්හිටුවීම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

සෙලින්කෝ තකාෆුල් රක්ෂණ ඔප්පු හිමියන්ගේ හිමිකම් පෑම් තක්සේරු කිරීම වසර තුළදී අවසන් කරන ලදී. හිමිකම් පෑම් නිරවුල් කිරීම ඇරඹීම සඳහා සෙලින්කෝ තකාෆුල් ලිමිටඩ් විසින් සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය සහ නව අධ්‍යක්ෂ/අධ්‍යක්ෂවරුන් පත්කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා ගත් පසු සිදු කරනු ඇත.

විධාන

පනතේ 57වැනි වගන්තිය අනුව මණ්ඩලය විසින් රක්ෂණ සමාගමකට විධානයන් නිකුත් කර:

- එම සමාගමට ආශ්‍රිත, පාලිත, පාලක හෝ සමාගම් සමූහයක සාමාජික සමාග මක් සමඟ හෝ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව ගනුදෙනුවලට ඇතුළත් වීම තහනම් කර ඇත.
- එම සමාගමට වෙනත් නිශ්චිත ව්‍යාපාර ඇතුළු සංවිධානයක් සමඟ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව ගනුදෙනුවලට ඇතුළත් වීම තහනම් කර ඇත.
- කොටස්කාර සමාගමක අධ්‍යක්ෂවරයෙක්ට ඉල්ලා අස්වීමට නියම කර ඇත.
- සමාගම නියම කර ඇත්තේ
  - (i) මාසික වාර්තා ඉදිරිපත් කිරීමට සහ
  - (ii) එකම සමූහයක සමාගම් සමඟ මණ්ඩලයේ අනුමැතිය නොමැතිව ගනුදෙනුවලට ඇතුළත් වීම තහනම් බවටය.

මණ්ඩලය විසින් පනතේ 57 වැනි වගන්තිය යටතේ රක්ෂණ ආයතනයකට පහත පරිදි විධානයන් නිකුත් කර ඇත.

- පහත කරුණු ඇතුළත් සවිස්තරාත්මක සැලැස්මක් ලබා දිය යුතුය.
  - (අ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු ඈවර කරනුයේ කෙසේද සහ
  - (ආ) නිරවුල් නොකළ රක්ෂණ හිමිකම් පෑම් ඉදිරියේදී නිරවුල් කරනුයේ කෙසේද යන්න පිළිබඳවය.
- පනතේ 86 වගන්තිය ප්‍රකාරව රක්ෂණ සමාගම ඈවර කිරීම පිළිබඳ ඉල්ලුම් පත්‍රයක් අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කල යුතුය.

එම සමාගමට 57 වගන්තිය යටතේ තවත් විධානයක් නිකුත් කරමින් නියම කරන ලද්දේ අධිකරණ කාර්යය පටිපාටිය අවසන් වන තෙක් ශ්‍රී ලංකාවෙන් පිටතට මුදල් ප්‍රේෂණය නොකරන ලෙසයි.

එක් රක්ෂණ සමාගමක් මූල්‍ය සමාග මක් සමඟ අනාගත වාරික මුදල් උකසට ගනිමින් උගස් බැඳුම්කරයකට ඇතුළත් වී ඇති බව මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී. පනතේ 57 වගන්තිය යටතේ මණ්ඩලය විසින් විධානයක් නිකුත් කරමින් එම සමාගමට ඔවුන්ගේ බාහිර විගණක මගින් මූල්‍ය සමාගම් පවරා දී ඇති සුරැකුම් (උකස් දේපල සහ අනාගත වාරික මුදල්) ඉහත උගස් බැඳුම්කරයේ උකස් වටිනාකම සඳහා ප්‍රමාණවත්ද යන්න පිළිබඳව සහ උකස් බැඳුම්කරය නිදහස් කරන තෙක් එම දේපල කිසිදු අවහිරයකින් තොර බවට සහතිකයක් ලබා දිය යුතුය.

පනතේ 57 වැනි වගන්තිය අනුව යම් රක්ෂණ කරුවෙකුගේ කටයුතු මහජන යහපතට හෝ රක්ෂණ ඔප්පු දරන්නන්ගේ යහපතට හානිවන පරිදි හෝ රක්ෂණකරුගේ යහපතට අහිතකර වන පරිදි පවත්වාගෙන යනු ලබන බවට මණ්ඩලය සෑහීමට පත්වන අවස්ථාවක, ඒ රක්ෂණකරු වෙත විධාන නිකුත් කිරීමේ බලය මණ්ඩලය සතුව පවතී.

එසේ නිකුත් කළ විධාන රක්ෂකයන් විසින් පැළිපැද තිබෙන්නේද යන්න තීරණය කිරීම සඳහා එවැනි විධාන සම්බන්ධයෙන් මණ්ඩලය ඉතා සමීප හා අඛණ්ඩ අධීක්ෂණයන් ක්‍රියාත්මක කරයි.

අවවාද කිරීම්

එක්තරා රක්ෂණ කරුවෙක් ප්‍රතිරක්ෂකයෙකු සමඟ වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුමකට එළඹීමේදී පනතේ 31 (1අ) වගන්තියේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන එකී රක්ෂකයා හට මණ්ඩලය අවවාද කරන ලදී.

පනතේ 31 (1අ) වගන්තියේ ප්‍රතිපාදන අනුව සියලුම ලියාපදිංචි රක්ෂණ සමාගම් සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා වන ප්‍රතිරක්ෂණ වගකීමෙන් 50%ක් නොඉක්මවන ප්‍රතිශතයක් ජාතික රක්ෂණ භාර අරමුදලට ලබා දිය යුතුය. මේ සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අංක 1791/4 දරන ගැසට් නිවේදනය අනුව, සියලු රක්ෂණ සමාගම් වෙත නියෝග කර ඇත්තේ 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු වර්ගයේ ප්‍රතිරක්ෂණ සම්මුතීන් හා වෛකල්පිත ප්‍රතිරක්ෂණ සැලසුම් සඳහා 30%ක් ජාතික රක්ෂණ භාර අරමුදලට දායක කළ යුතු බවට දක්වා ඇත. මීට පෙර මෙම ප්‍රතිශතය 20%ක් විය.

පනතේ 29 වගන්තිය හා 2002 සැප්තැම්බර් අංක 1255/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකළ 78 (4) වගන්තිය යටතේ සාදන ලද 2 (ඈ) රීතිය උල්ලංඝනය කිරීම හේතුවෙන් මණ්ඩලය විසින් එක්තරා රක්ෂණ සමාගමක් වෙත අවවාද කරන ලදී.

- පනතේ 29 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව මිස, යම් රක්ෂණකරුවෙකුගේ අධ්‍යක්ෂ ධූරය දරන යම් තැනැත්තෙකුට හෝ ඒ තැනැත්තා එවැනි යම් තනතුරක් දරන

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

යම් සමාගමකට හෝ ඒ රක්ෂකයා විසින් නිකුත් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පුවක් උකස් කිරීම මත වූ ණයක් නොවන යම් ණයක් ඒ රක්ෂණකරු විසින් ප්‍රදානය කරනු නොලැබිය යුතුය. ඒ ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් ඇපයක් දී ඇති බවට මණ්ඩලය සෑහීමට පත් වන්නේනම් පමණක් මණ්ඩලය විසින් එලෙස අනුමැතිය දෙනු ලැබේ.

2002 සැප්තැම්බර් අංක 1255/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකළ 78 (4) වගන්තිය යටතේ සාදන ලද 2 (ඈ) රීතිය ප්‍රකාරව රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචිය ලබා දිය යුත්තේ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද වෙනත් ආයතනයක් මගින් පවත්වනු ලබන පූර්ව බඳවා ගැනීමේ පරීක්ෂණය සමත් වූ පුද්ගලයන් හට පමණී.

- පනතේ 38 (1) වගන්තිය හා 2011/3/01 දිනැති නිශ්චයන් #1 උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන වෙනත් රක්ෂණකරුවෙකු හට මණ්ඩලය විසින් අවවාද කරන ලදී.

  පනතේ 38 (1) වගන්තියේ දැක්වෙන ආකාරයට, තනිව හෝ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයකට අමතරව දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන සෑම රක්ෂණ කරුවෙක් විසින්ම :

(අ) දීර්ඝ කාලීන රක්ෂණ යනුවෙන් හඳුන්වනු ලබන වෙනම අරමුදලක් පවත්වා ගෙන යා යුතු අතර ඒ රක්ෂණකරු විසින් කරගෙන යනු ලබන දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ලැබෙන සියලූ මුදල් ඒ අරමුදලට බැර කළ යුතුය. තවද,

(ආ) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම් වෙනත් යම් පන්තියක රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් වූ වත්කම්වලින් වෙන්ව තබාගනු ලැබිය යුතුය.

2011 මාර්තු 01 වන දින දරන නීර්ණය කිරීමේ අංක 1 සහ පසුකාලීන සංශෝධනවලට අනුව, සියලූම රක්ෂකයන් විසින් ඔවුන්ගේ තාක්ෂණික සංචිතයන්හී ශේෂව තිබෙන වත්කම් හා දිගු කාලීන රක්ෂණ අරමුදලෙහි ශේෂව තිබෙන වත්කම් 'අ' වගුවේ දක්වා තිබෙන ආයෝජන වර්ගවල, එහි දක්වා තිබෙන උපරිම ප්‍රතිශතයන්ට යටත්ව තනි ආයෝජන ලෙස ආයෝජනය කිරීම අවශ්‍ය වේ.

රක්ෂණ තැරැව්කාර සමාගම්

අත්හිටුවීම්

- පනතේ 86 (2) වගන්තිය උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන එක් රක්ෂණ තැරැ ව්කාර සමාගමක් 2015 නොවැම්බර් 05 සිට 2015 නොවැම්බර් 23 දක්වා අත්හිටුවන ලදී. පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව සෑම රක්ෂණ තැරැව්කරුවෙක්ම එහි ගිණුම්කරණ කාලපරිච්ඡේදය අවසානයේ මාස 06ක් ඇතුළත ශේෂ පත්‍රයත්, ලාභ හා අලාභ ගිණුමත් සහ සුදුසුකම්ලත් විගණකකරුවන් විසින් සහතික කළ එම ගිණුම සඳහා වූ සටහනක් ඇතුළත්ව එහි විගණනය කළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

- පනතේ 84 (1) වගන්තිය උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගමක් මණ්ඩලය විසින් අත්හිටුවන ලදී. එකී සමාගමට කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීමට හා මණ්ඩලය විසින් පනවනු ලබන අනෙකුත් කොන්දේසි සහ අනුකූල වීම සඳහා එකී අත්හිටුවීම මණ්ඩලය විසින් කිහිප වරක් දීර්ඝ කරන ලදි. නමුත් එම සමාගම, ඊට අනුකූල වීමට අපොහොසත් වූ නිසා, 2015 ජූලි 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කරන ලදී.

අවවාද කිරීම්

පනතේ 86 (1) වගන්තියේ ප්‍රතිපාදනවලට අනුකූල වීමට අපොහොසත්වීම හේතු කොට ගෙන මණ්ඩලය විසින් රක්ෂණ තැරැව්කාර සමාගම් 4කට අවවාද කරන ලදී.

2010 පෙබරවාරි 25 දිනැති අංක 1642/16 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 07 වන රීතිය සමඟ කියවෙන පනතේ 86 (1) වගන්තිය මගින් වෙනත් කරුණු අතර දැක්වෙන්නේ සෑම රක්ෂණ තැරැව්කරුවෙකු විසින්ම රක්ෂණ තැරැව්කාර සමාගම් ප්‍රධාන නිලධාරියා සහ එම සමාගමේ අධ්‍යක්ෂවරයෙකු විසින් සහතික කරනු ලැබූ කාර්තුමය වාර්තාව එක් එක් කාර්තුව අවසානයේදී දින 45ක් ඇතුළත දී මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බවයි.

මීට අමතරව පනතේ 86 (2) වගන්තියේ ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන වෙනත් රක්ෂණ තැරැව්කාර සමාගම් 02කට මණ්ඩලය විසින් අවවාද ලිපි නිකුත් කරන ලදී.

යම් රක්ෂණ තැරැව්කරුවකු පනත යටතේ යම් වරදකට වරදකරු බව තීරණය කර ඇති හෝ යටත් පිරිසෙයින් වෙන් වෙන් අවස්ථා තුනකදී මණ්ඩලය විසින් ලිඛිතව අවවාද කර හෝ පරීක්ෂාකාරී වන ලෙස දැනුම් දී ඇති විටදී, පනතේ 84 (1) (ඈ) වගන්තියේ ප්‍රතිපාදන මගින් එකී රක්ෂණ තැරැව්කරුගේ ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ තැරැව්කරු වෙත නිකුත් කරන ලද සහතිකයක් අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට මණ්ඩලය වෙත බලය පවරා දී ඇත.

විධාන

රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් පවත්වා ගෙන යා යුතු අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය පවත්වා ගෙන යාමට අපොහොසත් වූ රක්ෂණ තැරැව්කාර සමාගම් 2ක් හට ඔවුන්ගේ ප්‍රාග්ධනය ඉහළ නැංවීමට හා මාස හයක කාලසීමාවක් සඳහා මාසික වාර්තා ඉදිරිපත් කරන ලෙසට මණ්ඩලය විසින් පනතේ 96 (අ) වගන්තිය යටතේ විධාන කරන ලදී.

නියාමන/උපදේශාත්මක ක්‍රියාමාර්ග

1. සියලූම රක්ෂණ සමාගම් වෙත නිකුත් කර ඇති විධාන අංක 1හි අදාළත්වයෙන් තමන් නිදහස් කරන ලෙසට එක්තරා රක්ෂණ සමාගමක්, මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉල්ලීමක් කරන ලදී.

   පනතේ 99 (1) වගන්තියට අනුව, රක්ෂණකරුවන්, රක්ෂණ නියෝජිතයන් හා තැරැව්කරුවන් විසින් නිකුත් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්වල අසත්‍ය, වැරදි සහගත හෝ මහජනයා නොමග යවන සුළු යම් තොරතුරක් හෝ කරුණක් ඇතුළත් නොවිය යුතුය.

   මණ්ඩලය විසින් නිකුත් කර තිබෙන අංක 01 දරන විධානය මගින් සෑම රක්ෂණ සමාගමක් විසින්ම පනතේ 99 (1) වගන්තිය ප්‍රකාරව එකී සමාගම කටයුතු කරන බවට තහවුරු කරන සහතිකයක් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සහතික කිරීම සමගින් මණ්ඩලය වෙත ලබාදීම අනිවාර්ය කර ඇත. එකී විධානයෙන් නිදහස් කිරීමක් ලබා දෙන ලෙස එක් රක්ෂණ සමාගමක් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය. එම සමාගම 2014 ජූනි මස සිට ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ රක්ෂණ ව්‍යාපාර කටයුතු අවසන් කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටින, එමෙන්ම දැනට කිසිදු ප්‍රචාරක දැන්වීමක් පුවත්පත් වල පළ කිරීම හෝ ගුවන් විදුලියේ හෝ වෙනත් කිසියම් මාධ්‍යයක ප්‍රචාරය කිරීම සිදු නොකරන සමාගමක් වන බැවින් මණ්ඩලය එම ඉල්ලීමට එකඟ විය.

2. ගල්ෆ් කලාපයේ සේවයේ නියුතු ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයන් වෙනුවෙන් විදේශීය රක්ෂණ සහ ප්‍රති රක්ෂණ සමාග මක් විසින් නිකුත් කළ රක්ෂණාවරණ හා සම්බන්ධිත සේවාවන් පවත්වාගෙන යාම සඳහා එකී විදේශිය රක්ෂණ සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට එක් රක්ෂණ සමාගමක් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටියේය.

   පනතේ 12 (4) වගන්ති ප්‍රකාරව පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තෙකු විසින් රක්ෂණ ව්‍යාපාරය නොවන වෙනත් ආකාරයක ව්‍යාපාරයක් කරගෙන යනු නොලැබිය යුතු අතර මණ්ඩලයේ පූර්ව ලිඛිත කැමැත්ත ඇතිව පමණක් පනත යටතේ ලියාපදිංචි කිරීමක් ලබාගන්නා ලද යම් රක්ෂණ ව්‍යාපාරයක් සඳහා එකී රක්ෂණ ව්‍යාපාරයට අනුයාත හෝ ඒ හා සම්බන්ධ යම් මූල්‍ය සේවා ව්‍යාපාරයක් කරගෙන යාමට හැකියාව ලබා දී ඇත.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

අදාළ සමාගම විසින් සපයනු ලබන සේවාව රක්ෂණ ව්‍යාපාරයට සම්බන්ධ මූල්‍ය සේවා ව්‍යාපාරයක් ලෙස සැලකුණු බැවින් මණ්ඩලය විසින් ඇතැම් කොන්දේසිවලට යටත්ව ඒ සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී.

3. එක් රක්ෂණ සමාගමක් පිහිටුවන ලද නව පාලිත සමාගම් දෙක සඳහා මණ්ඩලය විසින් ලියාපදිංචිය සහ බලපත්‍ර ලබාදීම වලක්වමින් අධිකරණ නියෝගයක් ලබා දෙන ලෙස එම සමාගමේ කොටස් කරුවකු විසින් මණ්ඩලයට සහ රක්ෂණ සමාගමට එරෙහිව රිට් ආඥාවක් අයැද සිටියේය. කෙසේවුවද, කොටස්කරු විසින් එකී අයැදුම පසුව ඉල්ලා අස්කර ගන්නා ලදී.

4. සභාධිපත්‍ය දේපලක් ඉදිකිරීම සම්බන්ධයෙන් රක්ෂණ සමාගමක් බැඳුම්කර දෙකක් නිකුත් කරන ලදී. කෙසේවුවත්, සමාගම විසින් පොරොන්දු වූ ඇප මුදල ගෙවීම ප්‍රතික්ෂේප කළ බැවින් හිමිකම් ඉල්ලුම්කරු එම ආරාවුල මණ්ඩලය වෙත යොමු කරනු ලැබීය. කොන්දේසිවල සඳහන් වන පරිදි බැඳුම්කර සඳහා ගෙවීම් සිදු කිරීමට ලිඛිත නියෝගයක් ප්‍රමාණවත් වුවත්, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීමක් පදනම් කරගෙන රක්ෂණ සමාගම විසින් අදාළ ගෙවීම සිදුකිරීම අත්හිටුවා තිබුණි. එබැවින්, බැඳුම්කරයට අදාළව ඉල්ලුම්කරු විසින් සිදුකරන ලද ඉල්ලීම ඉෂ්ට කරන ලෙසට මණ්ඩලය විසින් පනතේ 98 වගන්තිය ප්‍රකාරව රක්ෂණ සමාගමට නියෝග කරන ලදී.

   රක්ෂණ සමාගම එකී ඉල්ලීම පූර්ණ වශයෙන් ඉෂ්ට කළ බැවින් ආරාවුල විසඳුණු අතර ඉල්ලීම ප්‍රකාරව ලද මුළු මුදල බේරුම්කාර මණ්ඩලය සිය නියෝගය ලබා දෙන තෙක් දෙපාර්ශ්වයේම එකඟත්වයෙන් ඉල්ලුම්කරු විසින් තාවකාලික ගිණුමක තැන්පත් කර ඇත.

5. අළුතින් පිහිටුවන ලද රක්ෂණ සමාගම් කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතු ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සමාගමය මණ්ඩලය වෙත ඉල්ලීමක් කරන ලදී.

   සංශෝධිත පනතේ 15 අ වගන්තිය ප්‍රකාරව පනතේ 15 වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමෙන් වසර තුනක කාලයක් ඇතුළතදී 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතුය. මේ අනුව, එකී සංශෝධිත පනත බලාත්මකවූ 2011 පෙබරවාරි මාසයෙන් පසු ලියාපදිංචිය ලැබූ සෑම නව රක්ෂණ සමාගමකටම මෙන්ම සංයුක්ත සමාගම් වෙන් කිරීමෙන් පසු ලියාපදිංචිය ලැබූ වෙන් කළ රක්ෂණ සමාගම් වලටද මෙකී ප්‍රතිපාදන අදාල වේ.

   තවද, සංශෝධිත පනතේ 52 වගන්තිය පරිදි 2011 පෙබරවාරි මාසයට පෙර ලියාපදිංචි වී සිටි රක්ෂණ සමාගම් 2016 පෙබරවාරි මාසය වන විට හෝ ඊට පෙර බලපත්‍රලාභී කොටස් හුවමාරුවක ලැයිස්තුගත විය යුතුය. මේ නිසා, ශ්‍රී ලංකා රක්ෂණ සංගමය විසින් වෙන් වෙන්වූ නව රක්ෂණ සමාගම් වලට තවදුරටත් සිය මෙහෙයුම් පිරිවැය හවුලේ පවත්වාගෙන යාම සීමා කිරීමට පැනවූ අවුරුදු 5 සීමා බාධකය ඉවත් කරන ලෙසටත්, කාල සීමා බාධාවකින් තොරව එකී සමාගම් වලට සිය මෙහෙයුම් පිරිවැය හවුලේ පවත්වාගෙන යාමටත් අවස්ථාව සලසා දෙන ලෙස මණ්ඩලයෙන් ඉල්ලීමක් කරන ලදී. එනමුත් මෙබඳු ඉල්ලීමක් සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කාලයක් ඉක්ම ගොස් නොතිබූ නිසා මණ්ඩලය වසින් රක්ෂණ සංගමයේ ඉල්ලීමට අනුමැතිය දීම එම අවස්ථාවේදී ප්‍රතික්ෂේප කරන ලදී.

6. සංයුක්ත රක්ෂණ සමාගමක සාමාන්‍ය හා දීර්ඝකාලීන රක්ෂන පන්තීන් දෙක සඳහාම සිය සේවය ලබාදුන් රක්ෂණ නියෝජිතයින්ට එම සංයුක්ත සමාගම වෙන් වෙන් සමාගම් දෙකක් බවට පත්වූ පසුව සාමාන්‍ය රක්ෂණ සමාගමක් යටතේ සහ දීර්ඝකාලීන රක්ෂණ සමාගමක් යටතේ රක්ෂණ පන්තීන් දෙක සඳහා සිය සේවය තවදුරටත් ලබාදිය හැකි පරිදි පනත සංශෝධනය වන්නේද යන කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංගමය මණ්ඩලයෙන් විමසීමක් කරන ලදී. එනමුත්, මෙම ගැටළුවට පිළියමක් ලෙස ඉදිරිපත් කළ යෝජිත සංශෝධිත පනත් කෙටුම්පත විමසීම කළ දිනය වන විටත් බලාත්මක කර නොතිබුණි. එබැවින් අදාළ සංශෝධනය බලාත්මක වන දිනය තෙක් කාලසීමාව සඳහා වෙන් කිරීමට නතු වූ සංයුක්ත රක්ෂණ සමාගමක් වෙන්කිරීමේ දිනයට පෙරාතුව එකී සමාගමේ සුදුසුකම් ලාභී, ලියාපදිංචි රක්ෂණ නියෝජිතයකුට එම සංයුක්ත සමාගමෙන් වෙන් කිරීමට ලක්වූ දීර්ඝකාලීන රක්ෂණ සමාගම සහ සාමාන්‍ය රක්ෂණ සමාගම වෙනුවෙන් සිය ප්‍රචාරණ කටයුතු පවත්වාගෙන යාම සඳහා මණ්ඩලයේ අවසරය ප්‍රදානය කරන ලදී.

7. එක් රක්ෂණ සමාගමක් ආවශ්‍ය නොවූ වත්කමක් ලෙස සලකනු ලද බදු දේපලක් එක් වර්ෂයක කාල සීමාවක් සඳහා එම සමාගමේ නුබුන්වත් ආන්තික රීතිය ගණනය කිරීම් වලදී ආවශ්‍ය වන වත්කමක් ලෙසට සලකා බලන ලෙසත්, එමගින් ව්‍යාපාරික හේතූන් මත එම දේපළ සම්බන්ධයෙන් ණය ලබාගැනීමට අවස්ථාවක් සලසා දෙන ලෙසත්, එලෙසම එකී ලබාගන්නා ණය සහ ආවශ්‍ය නොවූ වත්කම් සමාගමේ නුබුන්වත් ආන්තික රීතිය ගණනය කිරීමේදී සැලකිල්ලට නොගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී. මෙකී ඉල්ලීම් මණ්ඩලයේ නීති රීති හා රෙගුලාසි වලට සම්පූර්ණයෙන් පටහැනි බැවින් සමාගමේ ඉල්ලීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

8. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුකරයකින් නිදහස් කරන ලද එක්තරා රක්ෂණ සමාගමක පූර්ව අධ්‍යක්‍ෂකවරයෙක් විසින් තමා සේවය කරනු ලැබූ රක්ෂණ සමාගමෙන් ඔහුට අයවිය යුතු හිඟ පාරිතෝෂික මුදල් ඔහුට ලබාදෙන මෙන් විධානයක් එකී රක්ෂණ සමාගමට එරෙහිව නිකුත් කරන මෙන් මණ්ඩලය වෙත කරන ලද ඉල්ලීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

9. එක් රක්ෂණ සමාගමක් වෙත 2009 වර්ෂයේදී නිකුත් කරන ලද විධාන හතරක් 2014 වර්ෂයේදී මණ්ඩලය විසින් සංශෝධනය කර ඇත. එකී සංශෝධිත විධානයට අනුව අදාළ සමාගම අනුබද්ධ සමාගම්, ශාඛා ආදිය පිහිටුවීමට පෙර මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වේ. මෙකී සංශෝධිත විධානයද ඉවත් කරන ලෙස රක්ෂණ සමාගම කළ ඉල්ලීම සලකා බැලූ මණ්ඩලය එම රක්ෂකයා හට ඔවුන්ගේ ආශ්‍රිත සමාගම් වලින් සේවා ලබාගත හැකි වන පරිදි විධානය ඉවත් කිරීමට තීරණය කළේය.

10. යම් ජීවිත රක්ෂණ හිමියෙකුට සිය රක්ෂණ ඔප්පුව අවලංගු කිරීම සඳහා අයිතිය ඇති කාලසීමාව එනම්, ඔප්පුව අවලංගු කිරීමේ අයිතියේ කාල සීමාව (cooling - off period) නිශ්චිත වශයෙන් කොපමණ කාලයක්ද යන බව රක්ෂණ සමාගම් දක්වා නැති බව මණ්ඩලය විසින් හඳුනාගන්නට යෙදුණි. එබැවින් ඔප්පුව අවලංගු කිරීමේ අයිතියේ සම්මත කාල සීමාව ලෙස ඔප්පුව රක්ෂණ හිමියා අතට පත්වූ දිනයේ සිට දින විසි එකක කාල සීමාවක් අදාළ කරගත යුතු බව මණ්ඩලය විසින් තීරණය කර ඇත. තවද, මෙකී සම්මත කාල සීමාව ක්‍රියාවට නැංවීම සඳහා සම්බන්ධිත දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශනයන් සහ අංක 02 දරන විධානයද සංශෝධනයට මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත.

11. සංශෝධිත පනතින් හඳුන්වා දුන් විධිවිධාන ප්‍රකාරව රක්ෂණ සමාගම් වල අධ්‍යක්‍ෂකවරු පත් කිරීම සඳහා මණ්ඩලය විසින් ඉල්ලුම් පත්‍ර රාශියකට අනුමැතිය ප්‍රදානය කර ඇත.

12. පනතේ විධි විධාන අනුව ප්‍රධාන නිලධාරීන් පත් කිරීම සඳහා අනුමැතිය අපේක්‍ෂාවෙන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍ර රාශියකට මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදී.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

විමර්ශන සමාලෝචනය

වත්මන් හා අනාගත ඔප්පු හිමියන්ගේ සුභසිද්ධිය ආරක්ෂා කිරීමේ සමස්ථ පරමාර්ථය යටතේ, රක්ෂණ හිමිකම්පාන්නන්, විසින් මණ්ඩලය වෙත යොමු කරනු ලබන, රක්ෂණ වන්දි ගෙවීම් සම්බන්ධයෙන් රක්ෂකයන් හා හිමිකම්පාන්නන් අතර හටගන්නා, ආරවුල් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට හා ඒවා නිරාකරණය කිරීමට මණ්ඩලයට බලතල ඇත. එමෙන්ම, කිසියම් රක්ෂකයෙකු, තැරැව්කරුවෙකු හෝ නියෝජිතයෙකුගේ විෂමචාරයක් හෝ අක්‍රමිකතාවයක් පිළිබඳ පැමිණිලි ද මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලබයි.

මණ්ඩලය වෙත යොමු කළ ආරවුලක් හෝ පැමිණිල්ලක් (රක්ෂකයෙකු, තැරැව්කරුවකු හෝ නියෝජිතයෙකුට එරෙහිව) සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු ලබන විටකදී, ආරවුලේ අනෙක් පාර්ශවයට හෝ පැමිණිල්ලට ලක්වූ පාර්ශවයට තම ස්ථාවරයට අදාල කරුණු පැහැදිලි කිරීමට අවස්ථාවක් දෙනු ලැබේ. අවශ්‍ය වුවහොත් දෙපාර්ශවයෙන්ම වැඩිදුර තොරතුරු සහ පැහැදිලි කරගැනීම් ලබාගනු ලැබේ. මීට අමතරව, කාරණය නිරාකරණය කිරීම සඳහා අදාල රාජ්‍ය ආයතනයන්ගෙන් හා ස්වාධීන විශේෂඥයන්ගෙන් ද අවශ්‍ය අවස්ථා වලදී මණ්ඩලය විසින් උපදෙස් ලබාගනී.

2015 වසර තුළ දී යොමු කළ සහ විමර්ශන අවසන් කළ පැමිණිලි

2015 වසර තුළ දී මණ්ඩලය වෙත නව පැමිණිලි 266 ක් යොමු වී ඇත. වසර තුළ දී මුළු පැමිණිලි 274 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කොට ඇත. විමර්ශනය අවසන් කරන ලද පැමිණිලි අතුරින්, මණ්ඩලයේ මැදිහත් වීම මත, රක්ෂණ හිමිකම්පෑම් 54 කට අදාල වන්දි ගෙවීමට රක්ෂකයින් විසින් කටයුතු කරන ලදී. එසේ මණ්ඩලයේ මැදිහත් වීම මත ගෙවන ලද රක්ෂණ වන්දි වල මුළු වටිනාකම රුපියල් මිලියන 28.3 ක් පමණ වේ.

පසුගිය වසර පහ (5) ක කාලය තුළ මණ්ඩලය වෙත යොමු කෙරුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 1,335 කි. පහත 1 වන රූප සටහන අනුව, වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ 2013 වසරේ දී වන අතර ඉනික්බිතිව එම සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු වී ඇත.

රූප සටහන 1 - පසුගිය වසර පහ (5) තුළ මණ්ඩලයට යොමු කෙරුණු පැමිණිලි



2015 වසර තුළ මණ්ඩලය වෙත මාසිකව ලැබුණු පැමිණිලි පිළිබඳ විස්තරයක් පහත 2 වැනි රූප සටහන මගින් දැක්වේ. නොවැම්බර් මාසයේ දී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් (31) වාර්තා වී ඇති අතර අඩුම පැමිණිලි සංඛ්‍යාවක් වන පැමිණිලි 11 ක් ජනවාරි මාසයේ දී වාර්තා වී ඇත. 2 වැනි රූප සටහනෙන් හෙළිවන ආකාරයට වසරේ අවසාන භාගය වන විට මාසිකව ලැබුණු පැමිණිලි ගණන වැඩි වී ඇත. වසර මැද භාගයේ දී මණ්ඩලය විසින් විද්‍යුත් මාධ්‍ය හරහා සිදුකරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්, එසේ මාසික පැමිණිලි ගණන වැඩි වීමට හේතු වූ බවට සැලකිය හැක.

රූප සටහන 2 - 2015 වසර තුලදී මණ්ඩලය වෙත ලැබුණු පැමිණිලි පිළිබඳ විශ්ලේෂණය - මාසිකව



2015 වසරේ දී ලැබුණු මුළු පැමිණිලිවල වර්ගීකරණයක්, 2014 වසරට අදාල තොරතුරු ද සමග 3 වන රූප සටහනේ දක්වා ඇත. ඒ අනුව, වසර තුළ දී යොමු වූ මුළු පැමිණිලි වලින් 151 ක් (57%) සහ 86 ක් (32%) පිළිවෙලින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් විය. සාමාන්‍ය හෝ දීර්ඝ කාලීන ලෙස වර්ගීකරණය කළ නොහැකි (උදා - නියෝජිතයන්ගේ සුදුසුකම් පිළිබඳ පැමිණිලි) 29 ක් (11%) මණ්ඩලයට ලැබී ඇත. 2014 වසර සමග සසඳන කළ, යොමු කළ මුළු පැමිණිලි වල සංකලනයෙහි පැහැදිලි වෙනසක් දක්නට තිබේ. එනම්, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළ පැමිණිලි 57% දක්වා වැඩි වීම (2014 වසරේදී එය 40% ක් විය) සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි 32%කට අඩු වීමයි (2014 වසරේදී එය 52% ක් විය).

රූප සටහන 3 - 2014 සහ 2015 වර්ෂ වලදී මණ්ඩලය වෙත යොමු කළ පැමිණිලි වර්ගීකරණය



දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාලව යොමු කළ පැමිණිලි, එසේ පැමිණිලි කිරීමට හේතු වූ මූලික කාරණාවට අනුව සිදුකළ වර්ගීකරණයක් පහත 1 වැනි වගුවේ දක්වා ඇත. හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම හා ඔප්පු අවලංගු කිරීම/ පුනස්ථාපනය හෝ ගෙවූ වාරික මුදල් ආපසු ලබාගැනීම යන කරුණු ඇසුරෙන් වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් ලැබී ඇත.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

වගුව 1 - දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලි : කාරණාව අනුව

ගැටළුව	#	%
හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම	34	39.54
ඔප්පු අවලංගු කිරීම/ පුනස්ථාපනය හෝ ගෙවූ වාරික මුදල් ආපසු ලබාගැනීම	34	39.54
ගෙවූ හිමිකම් මුදල/ කල් පිරීමේ/ පවාරණ වටිනාකම සමග එකඟ නොවීම	6	6.97
වාරික ගෙවීම හෝ ගෙවූ වාරික අවභාවිතය	4	4.65
වෙනත්	8	9.30
එකතුව	**86**	**100.00**

දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු යටතේ හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීමට ප්‍රධානතම හේතුව ලෙස නිරීක්ෂණය වූයේ රක්ෂණ ඔප්පුව ලබාගැනීමේ දී රක්ෂණ යෝජනා පත්‍රය මගින් සියළු වැදගත් කරුණු හෙළිදරව් නොකිරීමයි. මණ්ඩලය විසින් සිදු කරන ලද විමර්ශනවලදී පෙනී ගියේ ඇතැම් රක්ෂණ ඔප්පු හිමියන් විසින් තමන්ගේ සෞඛ්‍ය හෝ රෝග ඉතිහාසය පිළිබඳ සියළු කරුණු රක්ෂණ යෝජනා පත්‍රය මගින් හෙළිදරව් කොට නොතිබූ බවයි. රක්ෂකයා හා රක්ෂිතයා යන දෙපාර්ශවය විසින්ම උපරිම සද්භාවයෙන් යුතුව කටයුතු කිරීම රක්ෂණ ගිවිසුමක අත්‍යාවශ්‍ය අංගයක් වන බැවින්, රක්ෂණ ඔප්පු හිමියන් විසින් මොනයම් හෝ වැදගත් කරුණක් අනාවරණය නොකිරීම, හිමිකම් ප්‍රතික්ෂේප වීමට සහ රක්ෂණ ඔප්පුව අවලංගු වීමට හේතු වේ. සමහර අවස්ථාවන්හි දී, යෝජනා පත්‍රය පිරවීමේ දී සියළු කරුණු හෙළිදරව් කිරීමේ වැදගත්කම හා එසේ හෙළි නොකිරීමෙන් විය හැකි ප්‍රතිවිපාක පිළිබඳ රක්ෂණ නියෝජිතයන් විසින් යෝජකයා වෙත පැහැදිලි ලෙස විස්තර කර නැති බවත් නිරීක්ෂණය විය. කෙසේවෙතත්, යම් හෙළිදරව් නොකිරීමක්, හිතාමතා හෝ වංචනික ලෙස සිදුනොකරන ලද්දක් බවට පැහැදිලි වූ අවස්ථාවන් හි දී සහ අදාල කරුණු අවදානම බාර ගැනීමට වැදගත් නොවන බවට පෙනී ගිය අවස්ථාවන්හි දී ඒ සඳහා මැදිහත් වී යම් සහනයක් සැලසීමට මණ්ඩලයට හැකි විය.

දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පු යටතේ හිමිකම් ප්‍රතික්ෂේප වීමට බලපාන තවත් ප්‍රධාන හේතුවක් ලෙස පෙනී ගියේ නියමිත දිනට වාරික මුදල් නොගෙවීම හේතුවෙන්, වන්දි ඉල්ලුම් කරනු ලබන දිනය වන විට, ඔප්පුව අප්‍රාණික වී තිබීමයි. අදාල රක්ෂණ වාරික මුදල් සමාගම වෙත ලැබී නොතිබුණ ද තම රක්ෂණ නියෝජිතයා වෙත නියමිත දිනට පෙර මුදල් බාරදුන් බවට තහවුරු කිරීමට ඔප්පුහිමියන් හට හැකි වූ අවස්ථා වලදී, ඒ සම්බන්ධයෙන් මැදිහත් වී අදාල රක්ෂණ හිමිකම් ගෙවීමට මණ්ඩලය විසින් නියෝග කරන ලදී.

පැමිණිලි වලින් 7%කට අදාල කාරණාව වූයේ තම ඔප්පු අවලංගු කොට ගෙවූ වාරික මුදල් ආපසු ලබාගැනීම සඳහා කරන ලද ඉල්ලීම් රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කිරීම ය. රක්ෂණ ඔප්පුවේ කොන්දේසි සහ රක්ෂණයේ මූලික සංකල්ප පිළිබඳ නොදැනුවත්භාවය මෙවැනි ඉල්ලීම් වලට හේතු වී තිබුණි. දීර්ඝ කාලීන රක්ෂණ ඔප්පුවක් අවලංගු කොට ගෙවූ වාරික මුදල් ආපසු ලබාගත හැක්කේ රක්ෂණ ඔප්පුවේ "ඔප්පුව අවංලගු කිරීම" කොන්දේසිය යටතේ සඳහන් නිශ්චිත කාල සීමාව තුළ දී පමණි. රක්ෂණ ඔප්පුව සඳහා කරනු ලබන ගෙවීම් බැංකුවක මුදල් තැන්පත් කිරීමට සමාන වන බවට සමහර ඔප්පුහිමියන් හට වැරදි අවබෝධයක් තිබෙන බව ද පෙනෙන්නට තිබේ. ඔප්පුව ආරම්භයේ සිට වසර තුනක් (3) ක් ගත වන තෙක් වාරික මුදල් ගෙවීමෙන් පසු එම මුදල් ආපසු ලබාගත හැකි බවට රක්ෂණ නියෝජිතයා විසින් සාවද්‍ය තොරතුරු සහ සහතිකයක් ලබාදුන් බවත් මණ්ඩලය වෙත ලැබුණු සමහරක් පැමිණිලිවල සඳහන් වී තිබුණි. ඔප්පුව අවලංගු කොට ගෙවූ මුදල් ආපසු ලබා ගැනීම සඳහා ඉල්ලීම් කිරීමට හේතු වී ඇති තවත් කරුණක් වූයේ මූල්‍ය අපහසුතා නිසා වාරික මුදල් දිගටම ගෙවාගෙන යා නොහැකි වීමයි. එයට හේතුව ලෙස දක්නට ලැබුණේ, දීර්ඝ කාලීනව තම ගෙවීමේ හැකියාවට වඩා ඔප්පුව යටතේ ලැබෙන අතිරේක ප්‍රතිලාභ පිළිබඳව ඔප්පු හිමියන් විසින් ඔප්පුව ආරම්භයේ දී වැඩි අවධානය යොමු කිරීමයි. සානුකම්පිත පදනම මත අවස්ථා කිහිපයක දී හැර මෙවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් සහාය වීමට මණ්ඩලයට හැකියාවක් නොතිබුණි.

ඉහත කී ප්‍රධාන ගැටළු මග හරවා ගැනීම සඳහා ඉක්මන් පිළියමක් ලෙස මණ්ඩලය විසින් පවත්වනු ලබන දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී රක්ෂණ යෝජනා පත්‍රය මගින් සියළු වැදගත් කරුණු හෙළිදරව් කිරීමේ වැදගත්කම; ඔප්පු අවලංගු කිරීමට අදාල කොන්දේසි; රක්ෂණ යෝජනා පත්‍රය අත්සන් කිරීමට පෙර එහි අඩංගු ප්‍රශ්න, ඊට ලබාදුන් පිළිතුරු සහ ඔප්පුවේ කොන්දේසි පිළිබඳ අවධානය යොමු කිරීමේ වැදගත්කම; රක්ෂණයේ මූලික සංකල්ප; නියමිත දිනට වාරික ගෙවීමේ වැදගත්කම; තමන්ගේ ගෙවීම් හැකියාවට අදාල අත්‍යවශ්‍ය ආවරණ පමණක් ලබාගැනීමේ වැදගත්කම; බැංකුවක මුදල් තැන්පත් කිරීමේ හා රක්ෂණ ඔප්පුවක් පවත්වාගෙන යාමේ වෙනස යන කරුණු කෙරෙහි මූලික අවධානය යොමු කෙරිණි. මීට අමතරව, රක්ෂකයන්ගේ, රක්ෂණ තැරැව්කරුවන්ගේ සහ රක්ෂණ නියෝජිතයන්ගේ ව්‍යාපාරික චර්යාව සම්බන්ධයෙන් අනාගත නියාමන මැදිහත් වීම් වලදී සේවා සපයන්නන්ගේ පාර්ශවයෙන් ඉහත ගැටළු වලක්වා ගැනීම සම්බන්ධයෙන් ගතයුතු පියවර පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

රක්ෂකයන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනිමෙන් පසු; රක්ෂණ වන්දි ප්‍රමාණය, කල් පිරීමේ වටිනාකම් සහ පවාරණ වටිනාකම් සම්බන්ධයෙන් මතු වූ ආරවුල් වලදී මණ්ඩලය මැදිහත් වී ඔප්පු හිමියන්ට අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාදෙන ලදී. පසුගිය වසරට (24) සාපේක්ෂව වාරික මුදල් අවභාවිතය සහ වාරික මුදල් ගෙවීමට අදාල පැමිණිලි මේ වසරේ දී (4) සැලකිය යුතු අයුරින් අඩු වී ඇති බව නිරීක්ෂණය විය. වාරික මුදල් වංචා කිරීම් අවම කිරීමට සහ වාරික ගෙවීම් සඳහා විකල්ප ක්‍රම ගණනාවක් ඔප්පුහිමියන් වෙත ලබාදීමට රක්ෂකයන් විසින් ගෙන ඇති පියවර මෙන්ම මණ්ඩලය විසින් නිකුත් කර ඇති වාරික මුදල් අවභාවිතයට අදාල රීතීන් ක්‍රමවත් ලෙස ක්‍රියාත්මක වීම, එසේ එම පැමිණිලි අඩු වීමට දායක වී ඇති බවට සැලකිය හැකිය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාල පැමිණිලිවලින් බහුතරය (75%) මෝටර් වාහන රක්ෂණය සම්බන්ධයෙන් වේ. එම ප්‍රතිශතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ මෝටර් වාහන රක්ෂණයට අදාල දළ ලිඛිත වාරික ආදායමේ ප්‍රතිශතයට අනුරූපී වේ. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි ඒවා පැනනැගීමට හේතු වූ කරුණු අනුව වර්ගීකරණයක් පහත 2 වගුවේ දැක්වේ.

වගුව 2 - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය පිළිබඳ පැමිණිලි : කාරණාව අනුව

ගැටළුව	#	%
හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීම	105	69.54
යෝජිත හිමිකම් මුදල් ප්‍රමාණවත් නොවීම	27	17.88
හිමිකම් ගෙවීම ප්‍රමාද වීම	12	7.95
වෙනත්	7	4.63
එකතුව	**151**	**100.00**

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යටතේ ලැබුණු පැමිණිලි වලට අදාල ප්‍රධාන කාරණාව (70%) වූයේ හිමිකම් ගෙවීම ප්‍රතික්ෂේප වීමයි. බීමත්ව රිය පැදවීම, වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති රියදුරෙකු රිය පැදවීම සහ රියදුරු මාරු කිරීම, එසේ මෝටර් වාහන රක්ෂණයට අදාල හිමිකම් ප්‍රතික්ෂේප වීමට බලපෑ ප්‍රධාන හේතු වේ. මෝටර් වාහන වන්දි ඉල්ලීමට අදාල හිමිකම් ගෙවීමේ දී; අනතුර සිදු වූ වේලාව, අනතුර පිළිබඳ දැනුම් දුන් වේලාව සහ එසේ දැනුම් දීමේ දී ප්‍රකාශ කරනු ලැබූ කරුණු, අනතුර පිළිබඳ පොලිස් ස්ථානයට කරනු ලැබූ ප්‍රකාශයේ අඩංගු කරුණු සහ ස්වාධීන විමර්ශනයන්හි දී හෙළි වූ කරුණු රක්ෂකයන් විසින් සැලකිල්ලට ගනු ලබයි. සාමාන්‍යයෙන්, රියදුරු බීමත්ව සිට ඇති අවස්ථාවන්හි දී හෝ අනතුර වූ අවස්ථාවේ දී රථය පැදවූ රියදුරුට වලංගු රියදුරු බලපත්‍රයක් නොමැති වූ විටක දී, අනතුර පිළිබඳ රක්ෂකයාට දැනුම් දීමට සහ ඒ සම්බන්ධයෙන් ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කිරීමේ දී අසාමාන්‍ය ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එවැනි අවස්ථාවලදී වන්දි ගෙවීමට රක්ෂණ සමාගම වගකිව යුතු

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

නැත. කෙසේ වෙතත්, රක්ෂණ හිමිකම් ඉල්ලුම් කරන්නන්ගේ පාර්ශවයෙන් සිදුවන ඉහත කී ප්‍රමාදයන්, සමහර අවස්ථාවන්හි දී, ගෙවිය හැකි සත්‍ය හිමිකම් නිරාකරණය කිරීමට පවා කල්ගත වීමට හේතු වන බව දක්නට ලැබුණි. ඒ අනුව, අදාල කරුණු වල වැදගත්කම පිළිබඳව මණ්ඩලය විසින් සිදු කරනු ලබන දැනුවත් කිරීම් වැඩසටහන් වලදී අවධාරණය කරනු ලැබේ. මෝටර් වාහන හිමිකම් ප්‍රතික්ෂේප වීමට බලපෑ අනෙකුත් කරුණු වූයේ: වන්දි ඉල්ලුම්කරන්නාට වාහනය පිළිබඳ රක්ෂණීය අයිතියක් නොමැති වීම, රක්ෂණය නොකරන ලද කාරණාවක් සඳහා අනතුර සිදුවන අවස්ථාවේ දී වාහනය භාවිතා කිරීම (උදා - කුළියට දීම) සහ නියමිත දිනට වාරික නොගෙවීම නිසා ඔප්පුව අවලංගු වී තිබීමයි.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ ලැබුණු පැමිණිලි වලින් 17.88%ට අදාල කාරණාව වූයේ රක්ෂකයා විසින් යෝජිත හිමිකම් මුදල ප්‍රමාණවත් නොවීමයි. අනතුර සිදු වූ දිනට වාහනයේ වෙළඳපොල වටිනාකම සඳහා තවත් ස්වාධීන තක්සේරු වටිනාකමක් ලබාගැනීම මගින්, පූර්ණහානි වලට අදාල වන්දි ඉල්ලීම් වලදී, පැන නැගුණු ආරවුල් නිරාකරණය කිරීමට මණ්ඩලයට හැකි විය. හිමිකම් මුදල සම්බන්ධයෙන් පැන නැගුණු අනෙකුත් ආරවුල් වලට හේතු වී තිබුණේ වන්දියට අදාල රක්ෂකයන්ගේ දායකත්වය හෝ ඔප්පු අතිරික්තය පිළිබඳ නොදැනුවත්භාවය සහ තක්සේරුගත අළුත්වැඩියා කිරීම් පිරිවැයට සිදුකරන ලද වෙනස් කිරීම් පිළිබඳව ඔප්පුහිමියන්ට ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් රක්ෂකයන් විසින් ලබා නොදීමයි. රක්ෂණ වන්දි ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් ලැබුණු සියළු පැමිණිලි (12) නිරාකරණය කිරීමට මණ්ඩලයට හැකි විය.

තවද, රක්ෂකයන් විසින් ඔප්පු හිමියන් සහ වන්දි ඉල්ලුම්කරන්නන් සමග සන්නිවේදනය කරන ආකාරය, සන්නිවේදනය කරන කරුණු වල පැහැදිලි බව සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ගත වන කාලය පිළිබඳව වැඩි අවධානයක් යොමු කළහොත්, රක්ෂකයන්ට එරෙහිව මණ්ඩලයට යොමු කෙරෙන පැමිණිලි හා වන්දි ගෙවීම සම්බන්ධ ආරවුල් බොහොමයක් වලක්වා ගත හැකිව තිබූ බව නිරීක්ෂනය විය.

වෙනත් පැමිණිලි

ප්‍රධාන රක්ෂණ ව්‍යාපාරයන් දෙකට වර්ගීකරණය කළ හැකි පැමිණිලි වලට අමතරව, 2015 වසර තුළ වෙනත් පැමිණිලි 29 ක් මණ්ඩලය වෙත යොමු වී ඇත. සාවද්‍ය මූල්‍ය පරිහරණය මත සේවය අවසන් කළ රක්ෂණ නියෝජිතයින් විසින් නැවත රක්ෂණ කර්මාන්තයට සම්බන්ධ වීමට අවස්ථාව ලබාදෙන ලෙස කරන ලද අභියාචනාවන් ද මීට ඇතුළත් වේ. ඔප්පුහිමියන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් එවැනි අභියාචනා සම්බන්ධයෙන් සහය වීමට මණ්ඩලයට හැකි විය. පනතේ සඳහන් මණ්ඩලයේ විෂය පථය යටතේ, ලැබුණු අනෙකුත් සියළුම පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ව්‍යාපාරික චර්යාව නියාමනය කිරීම

- *රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු*

  රක්ෂණ නියෝජිතයන්ට අදාල කරුණු පිළිබඳ සාකච්ඡා කොට අදාල පියවර ගැනීම සඳහා මණ්ඩලය, ශ්‍රී ලංකා රක්ෂණකරුවන්ගේ සංගමය (IASL) ශ්‍රී ලංකා රක්ෂණ තැරැව්කරුවන්ගේ සංගමය (SLIBA) සහ ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ (SLII) සාමාජිකත්වයෙන් කමිටුවක් පත්කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී නියෝජිතයන්ගේ සේවය අවසන් කිරීමේ සහ දුක්ගැනවිලි පිළිබඳ කටයුතු කිරීමේ මාර්ගෝපදේශනයන් ඉහත කමිටුව විසින් සාකච්ඡා කර අවශ්‍ය වෙනස්කම් සිදු කරන ලදී. නියෝජිතයන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියක් ද කෙටුමපත් කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනස්කම් මේ වන විට සිදු කෙරෙමින් පවතී.

- *රක්ෂකයන් සහ රක්ෂණ තැරැව්කරුවන් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමට අදාල මාර්ගෝපදේශයන්*

  ව්‍යාපාරික චර්යාව පිළිබඳව වන 19 වන රක්ෂණ හර මූල ධර්මය (ICP) අනුව, තමන් වෙත ලැබෙන පැමිණිලි ඉක්මන් හා සාධාරණ ක්‍රමවේදයකට අනුව නිරාකරණය කිරීම සඳහා රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් සතුව ප්‍රතිපත්ති සහ ක්‍රියාපිළිවෙත් තිබිය යුතු බවට රක්ෂණ නියාමකයන් විසින් වග බලා ගත යුතු වේ. ඒ අනුව, රක්ෂකයන්ගෙන් දැනට පවතින ක්‍රියාපිළිවෙත් සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව රක්ෂකයන් හා රක්ෂණ තැරැව්කරුවන් විසින් පැමිණිලි නිරාකරණය කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශනයන්, මණ්ඩලය විසින් සකස් කරන ලදී. කෙටුම්පත් මට්ටමේ තිබෙන මෙම මාර්ගෝපදේශනයන් රක්ෂණ කර්මාන්තයේ නියැලෙන්නන්ගේ අදහස් විමසීමෙන් පසුව නිකුත් කිරීමට අදහස් කෙරේ.

- *විමර්ශකයන්ගේ චර්යාව පිළිබඳ මාර්ගෝපදේශයන්*

  රක්ෂණ කර්මාන්තය පිළිබඳ මහජනතාවගේ විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම සඳහා රක්ෂණ කර්මාන්තයට සම්බන්ධ සෑම පුද්ගලයකුටම කාර්යභාරයක් පැවරී ඇති අතර, මහජන විශ්වාසය ගොඩනැංවීම සඳහා ඔවුන්ගේ චර්යාව ඉතා වැදගත් වේ. වන්දි කළමණාකරන ක්‍රියාවලියේ දී වංචාකාරී රක්ෂණ හිමිකම්පෑම් හඳුනාගැනීමෙන් රක්ෂණ විමර්ශකයන් විසින් වැදගත් කර්තව්‍යක් ඉටු කරයි. කෙසේවෙතත්, සිය කාර්යභාරය ඉටුකිරීමේ දී ඇතැම් රක්ෂණ විමර්ශකයන් විසින් යොදාග න්නා අනුමත කළ නොහැකි ආකාරයේ හැසිරීම් හා චර්යාවන් මණ්ඩලයට නිරීක්ෂණය විය (උදා - තමන්ව වැරදි ලෙස හඳුන්වා දීම). මෙම තත්වය රක්ෂණ කර්මාන්තයේ නියැලෙන්නන්ගෙන් බලාපොරොත්තු වන වෘත්තීමයභාවයට අහිතකර ලෙස බලපායි. එබැවින්, රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ප්‍රශස්ත ව්‍යාපාරික හැසිරීම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රක්ෂණ විමර්ශකයන්ගේ චර්යාවට අදාල අවම ප්‍රමිතීන් ඇතුලත් කොට මණ්ඩලය විසින් මාර්ගෝපදේශයන් ගොඩනංවන ලදී. කෙටුම්පත් මට්ටමේ තිබෙන මෙම මාර්ගෝපදේශයන්ද රක්ෂණ කර්මාන්තයේ නියැලෙන්නන්ගේ අදහස් විමසීමෙන් පසුව නිකුත් කිරීමට අදහස් කෙරේ.

- *පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම පිළිබඳව වන රක්ෂණ හර මූලධර්ම (ICP)19.1 සහ 19.2 ට අනුගත වීමේ දී පවතින පරතරයන් අවම කිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම*

  රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය (IAIS) මගින් සකස් කර ඇති රක්ෂණ හර මූලධර්මයන් (Insurance Core Principles) මගින් රක්ෂණ කර්මාන්තය නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගත් රාමුවක් සපයයි. ව්‍යාපාරික චර්යාව පිළිබඳව වන 19 වන රක්ෂණ හර මූලධර්මය (ICP) මගින් පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම, අලෙවියට පෙර ක්‍රියාවලීන් සහ අලෙවියෙන් පසු ඔප්පුවට අදාල සේවා සැපයීම යන අංශ ආවරණය වේ. රක්ෂණ අධීක්ෂකයන්ගේ ජාත්‍යන්තර සංගමය මගින් 19 වන රක්ෂණ හර මූලධර්මය දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීමට අදාල තත්වය වසර ආරම්භයේ දී සමාලෝචනය කෙරිණි. එහිදී අනාවරණය වූ කරුණු සහ හඳුනාගත් පරතරයන් විශ්ලේෂණය කිරීමෙන් පසු 19.1 සහ 19.2 යන ප්‍රමිතීන් යටතේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි ලාංකීය නියාමන රාමුවේ සිදුවිය යුතු වෙනස්කම් වලට අදාල නිර්දේශයන් මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

වෙනත් කටයුතු

- *පැමිණිලි නිරාකරණය කිරීමේ අභ්‍යන්තර ක්‍රමවේදය සමාලෝචනය කිරීම*

  මණ්ඩලය වෙත ලැබෙන පැමිණිලි නිරාකරණය කිරීම සඳහා සකස්කොට තිබූ පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රමවේදය සමාලෝචනයකොට, එය තවත් වැඩිදියුණු කිරීම සඳහා සිදු කරන ලද වෙනස් කිරීම් වලින් අනතුරුව ඔක්තෝබර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාවට නංවා ඇත.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

වෙළඳපොළ සංවර්ධන සහ බාහිර සබඳතා සමාලෝචනය

රක්ෂණය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට බලපාන එක් ප්‍රධාන සාධකයකි. අවදානම් පැවරීමේ ක්‍රියාවලියක් ලෙස රක්ෂණය යන සංකල්පය හා එහි වටිනාකම පිළිබඳව මහජනතාවගේ දැනුවත්භාවය ප්‍රමාණවත් නොමැති බව පෙනී ගොස් ඇත. රක්ෂණයේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම හා රක්ෂණය සම්බන්ධයෙන් මහජනතාවගේ විශ්වාසය වැඩි දියුණු කිරීමේ අරමුණින්, සමාලෝචිත කාලය තුල මණ්ඩලය විසින් විවිධ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. රක්ෂණ වෙළඳ පොළ ප්‍රවර්ධනය කිරීමට අමතරව, වත්මන් හා අනාගත රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත වෙනුවෙන්, රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේ දී හා එය පවත්වා ගෙනයාමේදී සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණු පිළිබඳව දැනුවත් කිරීමටද මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී අවධානය යොමුවිය. රක්ෂණ ඔප්පුවක් යටතේ තම අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳව ද රක්ෂණ ඔප්පු හිමියන් දැනුවත් කරන ලද අතර, සතුටුදායක රක්ෂණ ආවරණයක් ලබාගැනීමට එම දැනුවත්භාවය අවශ්‍ය වේ. අදාල සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ සිදුකරන ලද දැනුවත් කිරීමේ වැඩ සටහන් පිළිබඳ විස්තර පහතින් දක්වා ඇත.

දැනුවත් කිරීමේ වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි දී පවත්වන ලද වැඩසටහන්

මේ වසරේ දී ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රාජ්‍ය නිලධාරීන් ඉලක්ක කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන්, මණ්ඩලය විසින් පවත්වන ලදී. මෙම වැඩ සටහන් මණ්ඩලය විසින් පවත්වන ලද්දේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගයෙනි. රක්ෂණයේ වටිනාකම, ඔප්පු හිමියන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් වලට අමතරව, රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය හා එහි කාර්යභාරය පිළිබඳව ද සහභාගිවන්නන් දැනුවත් කරන ලදී. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය හා ආකල්ප පිළිබඳව වැටහීමක් තිබෙන රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සමඟ අදහස් හුවමාරු කර ගැනීමට මෙමගින් අවස්ථාවක් ලැබුණි.

ග්‍රාම සේවා වසම් 866 ක් ආවරණය වන පරිදි වැලිගම, අත්තනගල්ල, වැලිමඩ, පානදුර, පන්නල, කන්තලේ, මාවනැල්ල, අඹගමුව, මීරිගම, නාගොඩ, ඇහැලියගොඩ

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩසටහනක්

හා මැදවච්චිය යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කොට්ඨාශ දින රැස්වීම්වලදී දැනුවත් කිරීමේ වැඩසටහන් දොළහක් (12) පවත්වන ලදී. අදාල ප්‍රදේශවල ග්‍රාම නිලධාරීන්, දිවිනැගුම/සමෘද්ධි, කෘෂිකර්ම, සංවර්ධන හා පොලිස් නිලධාරීන් ඇතුළුව රාජ්‍ය නිලධාරීන් 1,730 ක් පමණ මෙම වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

අනිකුත් වැඩසටහන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවත්වන ලද ඉහත කී ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහන්වලට අමතරව, වසරේ අග භාගයේදී මණ්ඩලය විසින් පහත සඳහන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී:

- හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලයේ සහයෝගය ඇතිව, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාපාරික ප්‍රජාව වෙනුවෙන් ද වැඩසටහනක් පවත්වන ලදී.

හම්බන්තොට දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය

- පාසල් ශිෂ්‍යයින් අතර රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් කොළඹ 08, සුසමයවර්ධන විද්‍යාලයේ වැඩ සටහනක් පවත්වන ලදී.

- බෙන්තොට ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත රක්ෂණය පිළිබඳ වැඩ මුළුවක් පවත්වන ලද අතර ඒ සඳහා ප්‍රදේශයේ ශිෂ්‍යයින්, පාසල් ගුරුවරුන්, ව්‍යාපාරිකයින් හා රාජ්‍ය සේවකයින් සහභාගිවිය.

විද්‍යුත් මාධ්‍ය හරහා දැනුවත් කිරීම

මහජනතාව දැනුවත් කිරීමේ වඩාත්ම ඵලදායී මාධ්‍ය ලෙස මණ්ඩලය විසින් විද්‍යුත් මාධ්‍ය හඳුනාගෙන ඇත. සමාලෝචිත වසර තුල මහජනතාව දැනුවත් කිරීම සඳහා මණ්ඩලයේ නිලධාරීන් පහත සඳහන් වැඩ සටහන්වලට සහභාගිවිය:

- ශ්‍රී ලංකා රූපවාහිනී සේවය ඔස්සේ විකාශනය කරන ලද "ව්‍යාපාරික ලෝකය" ප්‍රවෘත්තිමය වැඩසටහන
- ශ්‍රී ලංකා රූපවාහිනී සේවය ඔස්සේ විකාශනය කරන ලද "නුග සෙවන" සජීවී සාකච්ඡාමය වැඩසටහන
- ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලද, "සුභාරති" සජීවී සාකච්ඡාමය වැඩසටහන

ඊට අමතරව, ජූලි මාසය හා නොවැම්බර් මාසය තුළ ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ "සිටි එෆ් එම්" සේවය ඔස්සේ, වත්මන් හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව පිළිබඳව වැදගත් කරුණු කියවෙන කෙටි පණිවිඩ දිනපතා "පැයෙන් පැය පුවත්" විකාශනයෙන් පසුව (දිනකට 10 වරක්) ප්‍රචාරය කරන ලදී. මෙකී දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස, මහජනතාවගේ දැනුවත්භාවයේ ඉහළයාමක් සිදුවූ බව, ඉන් අනතුරුව මණ්ඩලය වෙත ලැබුණු විමසීම් හා පැමිණිලිවල ඉහළයාම මගින් දක්නට ලැබුණි.

ගුවන් විදුලි වැඩසටහනක්

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

මුද්‍රිත මාධ්‍යන් හරහා දැනුවත් කිරීම

සමාලෝචිත වසර තුළ මණ්ඩලය විසින් පහත දැක්වෙන පුවත්පත් නිවේදන හා දැන්වීම් ප්‍රකාශයට පත්කරන ලදී.

පුවත්පත් නිවේදන

- "2014 වසරේ දී රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය" පිළිබඳ පුවත්පත් නිවේදනය - 2015 ජූලි මාසයේ දී පළවිය.
- "2015 වසරේ පළමු අර්ධ වාර්ෂික කාලසීමාවේ දී රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය" පිළිබඳ පුවත්පත් නිවේදනය - 2015 ඔක්තෝම්බර් මාසයේ දී පළවිය.

පුවත්පත් දැන්වීම්

- ලියාපදිංචි රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් පිළිබඳව වාර්ෂිකව පළ කෙරෙන පුවත්පත් දැන්වීම 'සුපරීක්ෂාකාරීව කටයුතු කිරීම' යන මාතෘකාව යටතේ - 2015 අප්‍රේල් මාසයේ දී පළවිය.
- ජීවිත රක්ෂණයක් ලබාගැනීමේ ඇති වැදගත්කම, රක්ෂණයක් ලබාගැනීමේ දී සැලකිය යුතු කරුණු, රක්ෂණ ඔප්පුහිමියන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් යන කරුණු මතු කරමින් 'ජීවිත රක්ෂණය' පිළිබඳව පුවත්පත් දැන්වීම - 2015 අප්‍රේල් මස පළවිය.

10 වන ආසියානු රක්ෂණ නියාමකයින්ගේ රැස්වීමට (AFIR) අදාල මාධ්‍ය ආවරණය

මණ්ඩලයේ සත්කාරකත්වයෙන් පවත්වන ලද ඉහත කී ආසියානු රක්ෂණ නියාමකයින්ගේ රැස්වීම ජූලි මාසයේ කොළඹ දී පවත්වන ලදී. මෙම රැස්වීමට අදාලව පහත සඳහන් දෑ මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රකාශයට පත්කරන ලදී.

- රැස්වීම පිළිබඳව හඳුන්වා දෙමින් පළකරන ලද පුවත්පත් ලිපිය
- රැස්වීමට සත්කාරකත්වය ලබාදීම පිළිබඳව පළකරන ලද පුවත්පත් නිවේදනය
- ප්‍රධාන ආරාධිතයින්ගේ හා ප්‍රධාන සහභාගිවූවන්ගේ පණිවිඩ ඇතුළත්ව රැස්වීම පැවැති දින පළකරන ලද පුවත්පත් අතිරේකය.
- රැස්වීම හා එහි සාකච්ඡා කරන ලද කරුණු පිළිබඳව පළකරන ලද පුවත්පත් ලිපිය

ප්‍රකාශන

පහත සඳහන් ප්‍රකාශන මුද්‍රණය කරන ලද අතර, විශේෂයෙන්ම, දැනුවත් කිරීමේ වැඩසටහන් වල දී ඒවා බෙදාහරින ලදී:

- 'රක්ෂණ ඔප්පුවක් ලබා ගැනීමේ දී සැළකිය යුතු කරුණු' පිළිබඳව භාෂා තුනෙන්ම පළකරන ලද පෝස්ටරය
- 'මෝටර් රථ රක්ෂණය' පිළිබඳ අත්පත්‍රිකාව
- 'රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමේ දී සැලකිය යුතු කරුණු' පිළිබඳ අත්පත්‍රිකාව
- 'රක්ෂණ යෝජනා පත්‍රයක් පිරවීමේ දී දැන ගත යුතු කරුණු' පිළිබඳ අත්පත්‍රිකාව
- 'ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය' පිළිබඳව අත්පත්‍රිකාව

අත්පත්‍රිකා

ඉහත කී ප්‍රකාශන, පුවත්පත් නිවේදන හා දැන්වීම් කියවීමට හා බාගත කිරීමට හැකිවන පරිදි මණ්ඩලයේ වෙබ් අඩවියේ (www.ibsl.gov.lk) ඇතුළත් කර ඇත.

අනෙකුත් කටයුතු

රක්ෂණ නිමැවුම් විශ්ලේෂණය කිරීම

වර්ෂ 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධිත) පනතේ 37 වන වගන්තියට අනුව, රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත ප්‍රමාණවත් පරිදි ආරක්ෂා වන්නේ ද යන්න තවදුරටත් විමසා බැලීම සඳහා සියළුම නව රක්ෂණ (ඔප්පු) ආකෘති මණ්ඩලය වෙත ගොනු කළයුතුය. තවද, රක්ෂණ අලෙවිකරණ සංකල්පයන්ට අනුව රක්ෂණ ඔප්පු හඳුන්වා දිය යුත්තේ ඔප්පුහිමියන්ගේ අවශ්‍යතා හෝ ඉල්ලුමට සරිලන පරිදිය. මණ්ඩලය වෙත ගොනු කරනු ලබන රක්ෂණ ඔප්පු වර්ග අතරින්, වාර්ෂිකව එක් වර්ගයක් තෝරාගෙන, එම රක්ෂණ ඔප්පුවල අඩංගු වන්නාවූ කොන්දේසි හා ප්‍රතිලාභ ව්‍යුහය තුල අන්තර්ගත දෑ පිළිබඳ අධ්‍යයනයක් සිදුකරනු ලබන අතර, එහි පරමාර්ථය වන්නේ එකී රක්ෂණ ඔප්පු තවදුරටත් වැඩි දියුණු කිරීම මගින් රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත ආරක්ෂා කිරීමයි. මෙම අධ්‍යයනයේ සොයාගැනිම් මත පදනම්ව කෙරෙන්නා වූ නිර්දේශයන්, රක්ෂණ සමාගම් වෙත ඉදිරිපත්කොට ඔවුන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

මහජන තොරතුරු විමසීම්

සමාලෝචිත වසර තුළදී රක්ෂණය පිළිබඳව ජනතාවගෙන්, ඔප්පුහිමියන්ගෙන් හා අනිකුත් අදාල පාර්ශව වලින් ඉදිරිපත්වූ විවිධ විමසීම් සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

පරිපාලනමය සමාලෝචනය

මානව සම්පත්

ඕනෑම සංවිධානයක සාර්ථකත්වය විශාල වශයෙන්ම රැඳී තිබෙන්නේ එහි ක්‍රියාකාරිත්වයට හවුල් වන්නා වූ පුද්ගලයින්ගේ විශේෂඥ ඥානය මතය. මණ්ඩලයේ සාර්ථක උපක්‍රමවල කශේරුව (කොඳුනාරටිය) වන්නේ අපගේ මානව සම්පත් බැව් අප විශ්වාස කරන්නේ එබැවිනි.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සියළුම රක්ෂණ සහතික දරන්නන්ගේ සහ අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක විය යුතුය යන අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම උදෙසා අවශ්‍ය යුතුකම් සහ කාර්යභාරය හඳුනා ගැනිම තුළින් මණ්ඩලය සිය සංවිධාන ව්‍යුහය ස්ථාපනය කර ඇත.

අපේක්ෂිත වෘත්තිකයින් නිසි කලට බඳවා ගැනීම තුලින් මානව සම්පත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර මේ වසර තුළදී මණ්ඩලය විසින් ගන්නා ලදී. මෙම පියවර සාක්ෂාත් කර ගැනීම උදෙසා සමාලෝචිත වසර තුළ දී එක් අධ්‍යක්ෂවරයෙක්, විධායක නිලධාරීන් දෙදෙනෙක් ස්ථිර කාර්ය මණ්ඩලයට බඳවා ගන්නා ලදී. 2015 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩලය 41 ක් විය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පහත වගුවෙන් දැක්වේ.

නිළධාරීන් සංඛ්‍යාව	අධ්‍යාපනික / වෘත්තීය සුදුසුකම්					
	පශ්චාත් උපාධිය ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම්	පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම්	පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය	ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම්	ප්‍රථම උපාධිය	වෘත්තීය සුදුසුකම්
41	05	02	02	10	08	03

පුහුණු කිරීම්

ආයතනික අරමුණු සහ කාර්යසාධනය වර්ධනය කර ගැනීම උදෙසා දැනුම සහ වෘත්තීයමය නිපුණතාවන් ලබා ගැනීමට සේවක මණ්ඩලයට සහායවීමේ අරමුණින් පුහුණු සහ සංවර්ධන ප්‍රතිපත්තීන් වෙත අවධානය යොමු කරන ලදී. සේවක මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීම උදෙසා දේශීය මෙන්ම විදේශීය පුහුණු අවස්ථාවන් ඔවුන් වෙත වගුවේ දැක්වෙන පරිදි ලබා දෙන ලදී.

වර්ගය	2014 (රු.)	2015 (රු.)
දේශීය පුහුණු	2,204,709/-	1,752,935/-
විදේශීය පුහුණු	7,701,049/-	8,144,101/-

කාර්ය මණ්ඩල සුභසාධනය

කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය සහ ධෛර්යය වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ සුභසාධනය වැදගත් සාධකයකි. එබැවින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නේවාසික සහ බාහිර වෛද්‍ය පහසුකම්, හදිසි අනතුරු රක්ෂණාවරණ, වාහන ණය, ආපදා ණය හා උත්සව අත්තිකාරම් වැනි සිත්ගන්නා සුළු සුභසාධනයන් ලබා දෙන ලදී. තව ද, කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සබැඳියාවන් වර්ධනය කිරීම උදෙසා නේවාසික පුහුණු වැඩසහනක් සහ වාර්ෂික සුහද හමුව පවත්වන ලදී.

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

මූල්‍ය සමාලෝචනය

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල (PPF)

රක්ෂණ පනතේ නියමයන්ට අනුව රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල වෙනුවෙන් එකතුවන මුදලින් (සෙස්), නියම කොට ඇති කටයුතු සඳහා ක්ෂණිකව යොදවන්නට අවශ්‍ය නොවන මුදල් විචක්ෂණ ලෙස උපරිම ප්‍රතිලාභ ලැබෙන අන්දමින් මෙම වසර තුළ දී ද මණ්ඩලය විසින් ආයෝජනය කරන ලද අතර 1 වැනි රූපසටහනෙන් එම සෙස් බදු ආදායමත් ආයෝජන ආදායමත් විදහා දක්වයි.

රූප සටහන 1

2011-2015 කාලපරිච්ඡේදය සඳහා සෙස් බදු ආදායම සහ ආයෝජන ආදායම



	2011	2012	2013	2014	2015
සෙස් ආදායම (රු. මිලියන)	217	237	246	274	322
ආයෝජන ආදායම (රු. මිලියන)	80	136	236	158	145

ඉහත ප්‍රස්ථාරය මගින් පසුගිය වසර පහ තුළ සෙස් බදු ආදායමේ වර්ධනයක් පෙන්නුම් කරයි. පොළී අනුපාතිකවල පහළ බැසීම හේතුවෙන් ආයෝජන ආදායම 2014 සිට 2015 දක්වා සුළු අඩු වීමක් පෙන්නුම් කර ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වටිනාකම පසුගිය වසර පහ තුළ වර්ධනය වී ඇති අන්දම 2 වැනි රූපසටහන මගින් පෙන්නුම් කරයි.

රූප සටහන 2

2011 - 2015 කාලපරිච්ඡේදය සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ අගය



	2011	2012	2013	2014	2015
අරමුදලේ වටිනාකම (රු. මිලියන)	1,276	1,622	1,778	2,183	2,643

2015 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය පහත දක්වා ඇත.

රූප සටහන 3

2015 දෙසැම්බර් 31 වැනි දිනට රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ වත්කම් සංයුතිය



මණ්ඩලයේ සමස්ථ ආදායම ජනනය වන්නේ පහත දැක්වෙන ප්‍රභවයන්ගෙනි:

- රක්ෂකයින් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචිය සඳහා අයකරන ලියාපදිංචි කිරීමේ ගාස්තු
- රක්ෂණ සමාගම්වලින් අය කරන වාර්ෂික ගාස්තු
- වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරීම සඳහා රක්ෂණ තැරැව්කාර සමාගම් වලින් අය කරන ගාස්තු
- අතිරික්ත අරමුදල් ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම

2011 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ සමස්ත ආදායම බෙදී ඇති ආකාරය 4 වැනි රූපසටහන මගින් දැක් වේ.

රූප සටහන 4

2011 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ ආදායම



	2011	2012	2013	2014	2015
වාර්ෂික ගාස්තු (රු. මිලි)	35	61	70	73	104
ලියාපදිංචි හා ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු (රු. මිලි)	3	5	4	4	9
වෙනත් ආදායම් (රු. මිලි)	1	2	1	2	2
ප්‍රදාන හඳුනා ගැනීම් (රු. මිලි)	6	7	5	4	5
මුළු ආදායම් (රු. මිලි)	44	75	80	83	119

මෙහෙයුම් කටයුතු සමාලෝචනය

පසුගිය වසරට සාපේක්ෂව 2015 වසරේ දී වාර්ෂික ගාස්තුව මූලිකවම වැඩිවී ඇත්තේ එම ගාස්තුව අයකරන ප්‍රතිශතය 0.075% සිට 0.1% දක්වා වැඩි කිරීම හේතුවෙනි.

මණ්ඩලයේ වියදම්

මණ්ඩලයේ මුළු වියදම් 2010 වසරේ සිට 2015 වසර දක්වා වැඩි වී ඇත. පනතේ විධිවිධානයන්ට අනුකූලව ආදායම සහ වියදම අතර හිඟය රක්‍ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් පියවාගෙන ඇත.

2011 සිට 2015 කාලපරිච්ඡේදය දක්වා මණ්ඩලයේ සමස්ථ වියදම 5 වන රූපසටහනෙන් දැක්වේ.

රූප සටහන 5

2011 සිට 2015 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ථ වියදම



	2011	2012	2013	2014	2015
මුළු වියදම (රු. මිලියන)	74	94	105	107	123

මූල්‍ය තොරතුරු

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	76
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය	77
මුදල් ප්‍රවාහ ප්‍රකාශන	78
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	79
ගිණුම්කරණ ප්‍රතිපත්ති	80
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	82

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත සහ උපකරණ	1	11,274,097	13,501,813
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - කුළී සහ විද්‍යුත් තැන්පතු හා භාණ්ඩාගාර බැඳුම්කර	2	1,091,418,880	14,759,880
ජංගම වත්කම්			
භාණ්ඩ තොග	3	445,902	274,845
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන හා වෙනත්	2 & 22	1,551,778,353	2,168,146,893
අනෙකුත් ජංගම වත්කම්	4 & 22	21,841,991	26,625,594
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය		1,000,000	-
මුදල් හා මුදල් හා සමාන දෑ	5	575,848	38,313
මුළු වත්කම්		2,678,335,071	2,223,347,338
සංචිත හා වගකීම්			
සංචිත			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල	6	2,643,197,233	2,182,906,773
ප්‍රත්‍යාගණන සංචිතය		7,389,652	7,389,652
වගකීම්			
ජංගම නොවන වගකීම්			
ප්‍රදාන	7	4,965,789	6,480,560
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	8 & 22	8,035,447	5,757,098
		13,001,236	12,237,657
ජංගම වගකීම්			
ලද අත්තිකාරම්		7,526,285	11,726,535
අනෙකුත් ජංගම වගකීම්	9	7,220,665	9,086,721
		14,746,950	20,813,256
මුළු සංචිත හා වගකීම්		2,678,335,071	2,223,347,338

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් වෙත පැවරේ.

ඉහත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිටු අංක 80 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු වේ.

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සහ ඒ වෙනුවෙන්,



ඉන්ද්‍රාණි සුගතදාස
සභාපතිනිය



පුෂ්පා වෙල්ලප්පිලි
සාමාජිකා

කොළඹ, ශ්‍රී ලංකාව
2015 පෙබරවාරි 26

මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
ආදායම			
අයභාරය	10 & 16	113,149,245	77,586,076
ප්‍රදාන හඳුනා ගැනීම්	7 & 22	4,527,482	4,398,353
පොලී ආදායම		1,559,380	1,359,409
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කිරීම්	6 & 22	3,513,004	24,200,995
වෙනත් ආදායම්	11	225,376	151,722
මුළු ආදායම		122,974,487	107,696,556
වියදම්			
කාර්ය මණ්ඩල පිරිවැය	12 & 22	(70,205,520)	(59,306,548)
වෘත්තීය ගාස්තු	13	(2,388,225)	(2,181,575)
මෙහෙයුම් වියදම්	14	(49,986,744)	(45,858,876)
මූල්‍ය සහ අනෙකුත්	15	(206,872)	(186,428)
මුළු වියදම්		(122,787,361)	(107,533,427)
බදුවලට පෙර ශුද්ධ අතිරික්තය (ඌණතාවය)		187,126	163,129
බදු		(187,126)	(163,129)
බදුවලට පසු ශුද්ධ අතිරික්තය (ඌණතාවය)		-	-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය		-	-

පිටු අංක 80 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය			
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		-	-
ක්ෂය සඳහා ගැලපීම්		5,214,297	4,696,716
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන		2,278,349	2,564,617
දේපල පිරියත හා උපකරණ විකුණුම් අලාභය		(15,028)	73,035
විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම්		-	(152,839)
ප්‍රත්‍යාගණන වියදම්		-	(6,000)
ප්‍රදාන හඳුනාගැනීම		(4,527,482)	(4,398,353)
ආදායම් බදු		187,126	163,129
පොලී ආදායම		(1,559,380)	(1,359,409)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම		1,577,882	1,580,897
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම			
තොගවල (වැඩිවීම) / අඩුවීම		(171,058)	138,207
ලැබිය යුතු දෑ වල (වැඩිවීම) / අඩුවීම		4,760,311	(11,520,120)
අත්තිකාරම් ලැබීම් වල වල (වැඩිවීම) / අඩුවීම		(4,200,249)	6,864,118
ණය හිමියන් සහ උපචිතයන්හි (වැඩිවීම) / අඩුවීම		(1,866,056)	1,087,707
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද මුදල් ප්‍රවාහය		(1,477,052)	(3,430,088)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය		100,830	(1,849,192)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබු/(ක්‍රියාකාරකම් සඳහා යෙදු) මුදල් ප්‍රවාහය			
රජයේ සුරැකුම්පත් වල ආයෝජනය		(1,000,000)	-
පොලී ආදායම		1,395,547	1,226,203
දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		41,158	3,000
දේපල පිරියත සහ උපකරණ මිලට ගැනීම්		(3,012,711)	(937,098)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(2,576,006)	292,106
මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලැබු මුදල් ප්‍රවාහය			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ප්‍රාග්ධන මාරුකිරීම්		3,012,711	937,098
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		3,012,711	937,098
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම)		537,535	(619,988)
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		38,313	658,301
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		575,848	38,313
අතැති සහ බැංකුවේ ඇති මුදල්	5	575,848	38,313

පිටු අංක 80 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

	සටහන්	2015 රු.	2014 සංශෝධිත රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ශුද්ධ වර්ධනය		460,290,461	405,206,443
කාරක ප්‍රාග්ධන වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම		460,290,461	405,206,443
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම			
රජයේ සුරැකුම්පත් වලින් ලැබිය යුතු පොලියෙහි (වැඩිවීම) / අඩුවීම		22,849,356	44,652,630
ලැබිය යුතු සෙස් බදුවල (වැඩිවීම) / අඩුවීම		(10,300,000)	(15,500,000)
කුළී තැන්පතුවල (වැඩිවීම) / අඩුවීම		-	(3,671,220)
අරමුදල් කළමනාකරණ ගිණුමේ ශේෂය වැඩිවීම / (අඩුවීම)		5,734,821	(4,210,677)
සෙස් අරමුදලින් මාරු කළ යුතු අරමුදල්හි වැඩිවීම / (අඩුවීම)		(8,944,939)	11,373,276
		9,339,238	32,644,009
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		469,629,699	437,850,451
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය			
රජයේ සුරැකුම්හි ආයෝජනය		(1,677,958,452)	(292,650,451)
ස්ථාවර තැන්පතුවල ආයෝජන		1,208,400,000	(145,200,000)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/(යෙදවූ) ශුද්ධ මුදල් ප්‍රවාහය		(469,558,452)	(437,850,451)
මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම (අඩුවීම)		71,247	-
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		1,000,000	1,000,000
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		1,071,247	1,000,000
බැංකුවේ ඇති මුදල්	2	1,071,247	1,000,000

පිටු අංක 80 සිට 88 දක්වා ඉදිරිපත් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පදනම මත සකස් කර ඇති අතර ඒවා ඉදිරිපත් කිරීමේ දී අගයන් ආසන්නම ශ්‍රී ලංකා රුපියලට දක්වා ඇත.

යථායෝග්‍ය පරිදි ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරියේ දැක්වෙන සටහන් මගින් අනාවරණය කර ඇත.

1.2 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇති අතර, එම මූල්‍ය ප්‍රකාශන එම ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලතාවය දක්වනු ලැබේ.

1.3 වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සිදුවීම්

වාර්තා කරන දිනයෙන් පසු හටගන්නා සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ කාර්යයේ දී සැලකිල්ලට ගෙන අවශ්‍ය ගැලපීම් හෝ අනාවරණයන් කර ඇත.

1.4 සංසන්දනාත්මක සංඛ්‍යාවන්

ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම හා අනුකූල විය යුතු ආකාරයට පෙර වර්ෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

1.5 බදුකරණය

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතෙහි ප්‍රතිපාදනයන් හා අනුකූලව ගණනය කර ඇත.

පොලී හා ලාභාංශ ආදායම හැර මණ්ඩලයේ අනෙකුත් ආදායම් මේ වන විට ආදායම් බදුවලින් නිදහස් කර ඇත.

1.6 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

සියළුම විදේශීය මුදලින් සිදු වූ ගනුදෙනු ඒවා සිදු වූ අවස්ථාවේ දී පැවැති විනිමය අනුපාතිකයන් පාදකව, වාර්තා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් අගයට පරිවර්තනය කර ඇත.

2. වත්කම් සහ අගය කිරීමේ පදනම

2.1 දේපල, පිරියත හා උපකරණ ස්වසන්තක අයිතිය සහිත දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් / ප්‍රත්‍යාගණන අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට නිරූපණය කර ඇත. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට ඇතුළත් වන්නේ, අත්පත් කර ගැනීමේ පිරිවැය සමඟ එම වත්කම් අපේක්ෂිත භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම්වල එකතුවයි.

2014 වසරේ දී මෝටර් වාහන ප්‍රත්‍යාගණනයන් ඒ සම්බන්ධ වෘත්තිය නිපුණතා ලත් ආයතනයක් මගින් සිදුකරන ලදී. ලබන වසර තුල දී අනෙකුත් ස්ථාවර වත්කම් බාණ්ඩයන් සම්බන්ධයෙන්ද ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර අවසන් කිරීමට මණ්ඩලය අපේක්ෂා කෙරේ.

ක්ෂය

වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය පුරා පහත අනුපාත පාදකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය ගණනය කරනු ලැබේ.

	වාර්ෂික (%)
මෝටර් වාහන	25
ලී බඩු, වැද්දුම් සහ සවි කිරීම්	12.5
කාර්යාල හා විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ	25
පුහුණු උපකරණ	25

ක්ෂය ප්‍රතිපාදන එම වත්කම් මිල දී ගත් දින සිට කරනු ලැබේ. ක්ෂය ප්‍රතිපාදනය වත්කම භාවිතයෙන් ඉවත් කරන තෙක් කරනු ලැබේ. වත්කම් විකුණුම් ලාභ/අලාභ වත්කම් විකුණුම් මුදල එකී වත්කමේ ලියා අඩුකල අගය සමඟ සංසන්දනය කිරීමෙන් නිශ්චය කෙරේ.

2.2 ආයෝජන

රජයේ සුරැකුම්පත්හි සහ ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම්හි කර ඇති ආයෝජන අගය කර ඇත්තේ ඒවායේ පිරිවැයට හෝ මුහුණත් අගය යන 2න් අඩු අගයට වන අතර, ඒවා සඳහා වර්ෂය අවසානය තෙක් පොලී උපචිත පදනම මත ගිණුම් ගත කර ඇත.

2.3 තොග

තොග ඒවායේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්වලින් අඩු අගයට දක්වා ඇත. තොගවල පිරිවැය නිශ්චය කිරීමේ දී ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ ක්‍රමය (ප්‍ර.ලැ.ප්‍ර.නි) ඒ සඳහා පාදක කරගෙන ඇත.

2.4 ලැබිය යුතු දෑ

ලැබිය යුතු දෑ නිරූපණය කර ඇත්තේ, ඇස්තමේන්තුගත උපලබ්ධි අගයටයි.

2.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේ පරමාර්ථය සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවලින් නියෝජනය වන්නේ බැංකුවේ මුදල් සහ අතැති මුදල්ය.

3. බැරකම් සහ ප්‍රතිපාදන

3.1 විශ්‍රාම ප්‍රතිලාභ

3.1.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - පාරිතෝෂික

සේවකයන් සඳහා සේවක පාරිතෝෂිකය ප්‍රථම සේවා වර්ෂයේ සිට සම්පූර්ණ ප්‍රතිපාදනය කෙරෙන ආකාරයට ගිණුම් ගත කර ඇත.

කෙසේ වෙතත් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත හා අනුකූලව ගෙවීම් පිළිබඳව වගකීම ඇති වන්නේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද්දේ නම් පමණි.

3.1.2 නිශ්චිත සහභාග සැලසුම් - සේ.අ.අ. සහ සේ.නි.භා.අ.

නිශ්චිත ව්‍යවස්ථාවන් සහ නියාමන හා අනුකූලව මණ්ඩලයේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට සහ සේවක භාරකාර අරමුදලට දායකවීමට සුදුසුකම් ලබති. මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත පිළිවෙළින් 12% ක සහ 3% ක මුදලක් දායක කරයි.

3.2 බැරකම්

බැරකම් අතරින් වාර්තා කරන දිනයෙන් පසු වර්ෂයක් තුළ දී හෝ ඉල්ලුම් කළවිටක දී ගෙවිය යුතු වන දෑ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම බැරකම් සේ වර්ගීකරණය කර ඇත. වාර්තා කරන දිනයෙන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

පසු වර්ෂයකින් ඔබ්බට ගෙවිය යුතු සියළුම ගෙවීම් ජංගම නොවන බැරකම් ගණයට ඇතුළත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සියළුම දන්නා බැරකම් ඒවායේ පිරිවැයට ඇතුළත් කර ඇත.

3.3 ප්‍රදාන

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් සහ ක්ෂුද්‍ර රක්ෂණ ව්‍යාපෘතියෙන් ලැබුනු සියළුම වත්කම් ප්‍රදාන සේ හඳුනා ගන්නා අතර එම වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය තුළ දී ඒවා හඳුනා ගනු ලැබේ.

4. ආදායම් සහ වියදම්

4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

4.2 වියදම් හඳුනා ගැනීම

මණ්ඩලය පවත්වාගෙන යෑමේ දී දරනු ලබන සියළුම වියදම් වියදමට වැඩි ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා ආදායමට එරෙහිව ලියාහරිනු ලැබේ.

4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය මතයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 දේපළ පිරියත හා උපකරණ

	මෝටර් වාහන රු.	ලී බඩු, වෑද්දුම් හා සවිකිරීම් රු.	කාර්යාල උපකරණ (විද්‍යුත් දත්ත සැකසුම් සහ වෙනත්) රු.	පුහුණු උපකරණ රු.	එකතුව රු.
පිරිවැය					
2015 ජනවාරි 01 දිනට ශේෂය	10,000,000	12,489,186	21,386,791	141,450	44,017,427
එකතු කිරීම්	-	1,274,556	1,738,155	-	3,012,711
බැහැර කිරීම්	-	(102,552)	(20,758)	-	(123,310)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	10,000,000	13,661,190	23,104,187	141,450	46,906,828
සමුච්චිත ක්ෂය					
2015 ජනවාරි 01 දිනට ශේෂය	893,773	9,991,208	19,489,184	141,450	30,515,615
වර්ෂය සඳහා අය කිරීම්	2,500,000	1,439,010	1,275,287	-	5,214,297
බැහැර කිරීම්	-	(96,042)	(1,139)	-	(97,181)
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**3,393,773**	**11,334,176**	**20,763,332**	**141,450**	**35,632,731**
ලියා අඩු කළ අගය					
2015 දෙසැම්බර් 31 දිනට	**6,606,227**	**2,327,013**	**2,340,856**	**-**	**11,274,097**
ලියා අඩු කළ අගය					
2014 දෙසැම්බර් 31 දිනට	9,106,227	2,497,978	1,897,609	-	13,501,813

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
2 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල - ආයෝජන සහ අනෙකුත්			
ජංගම නොවන වත්කම්			
කුළී සහ විද්‍යුත් තැන්පතු		14,759,880	14,759,880
භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජන		1,076,659,000	-
		1,091,418,880	14,759,880
ජංගම වත්කම්			
රජයේ සුරැකුම්හි ආයෝජන	22	1,411,999,903	810,700,451
ස්ථාවර තැන්පතුවල ආයෝජන	22	-	1,208,400,000
රජයේ සුරැකුම්පත් හා ස්ථාවර තැන්පතුවලින් ලැබිය යුතු පොලිය	22	59,114,564	81,963,920
ලැබිය යුතු සෙස් බදු	16	86,800,000	76,500,000
අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය		952,525	6,687,347
බැංකුවේ ඇති ශේෂය		1,071,247	1,000,000
		1,559,938,239	2,185,251,718
අඩුකලා			
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කල යුතු අගය	22	8,159,886	17,104,826
		1,551,778,353	2,168,146,893
මුළු වත්කම්		2,643,197,233	2,182,906,773
3 භාණ්ඩ තොග			
මුද්‍රණ ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග		358,832	261,005
මුද්දර		87,070	13,840
		445,902	274,845
4 අනෙකුත් ජංගම වත්කම්			
තැන්පතු		190,744	185,481
වෙනත් ලැබිය යුතු දෑ		309,684	274,334
ලැබිය යුතු රඳවා ගැනීමේ බදු		1,208,602	1,082,063
එකතු කළ අගය මත බදු පාලන ගිණුම		815,602	1,239,629
ලැබිය යුතු පොළී- භාණ්ඩාගාර බිල්පත්		4,228	-
සේවක ණය *		4,948,645	4,911,857
අත්තිකාම් සහ පෙර ගෙවීම්		1,554,512	1,441,005
අරමුදල් කළමණාකරන ගිණුමේ ශේෂය		4,650,087	386,400
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කල යුතු අගය	22	8,159,886	17,104,826
		21,841,991	26,625,594
* කාර්යය මණ්ඩලය සඳහා ප්‍රදානය කළ ණය			
ජනවාරි 1 දිනට ශේෂය		4,911,857	3,682,040
වර්ෂය තුළ දී ප්‍රදානය කළ ණය		3,232,000	4,151,000
		8,143,857	7,833,040
වර්ෂය තුළ දී ණය ආපසු ගෙවීම්		(3,195,212)	(2,921,183)
දෙසැම්බර් 31 දිනට ශේෂය		4,948,645	4,911,857
5 මුදල් සහ මුදල් හා සමාන දෑ			
බැංකුවේ ඇති මුදල්			
ලංකා බැංකුව		575,848	38,313
		575,848	38,313

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
6 රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල			
ආරම්භක ශේෂය	22	2,182,906,773	1,776,115,148
වර්ෂය තුළදී ලද සෙස් බදු	16	321,747,380	273,912,607
භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය මත පොළී		70,257,878	15,155,232
ප්‍රති මිල දී ගැනීම් සහ ඉල්ලුම් ගිණුම් මත පොළී		34,917,246	38,138,752
භාණ්ඩාගාර බැඳුම්කර මත පොළී		7,036,326	-
ස්ථාවර තැන්පතු මත පොළී		32,827,399	104,682,472
අරමුදල් කළමණාකරණ ගිණුමේ ශේෂය මත පොළිය		49,800	57,070
		2,649,742,802	2,208,061,281
අඩු කළා:			
මෙහෙයුම් වියදම් සඳහා මාරු කිරීම්	22	3,513,004	24,200,995
ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම්		3,012,711	937,098
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් මුළු මාරු කිරීම්		6,525,714	25,138,093
බැංකු ගාස්තු		19,855	16,415
		6,545,569	25,154,508
අවසාන ශේෂය		2,643,197,233	2,182,906,773
7 ප්‍රදාන			
වසර ආරම්භයේ දී ශේෂය	22	6,480,560	9,941,815
රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලෙන් ප්‍රාග්ධන වියදම්		3,012,711	937,098
අඩු කළා: වර්ෂය තුළ දී ක්‍රමක්ෂය කිරීම්		(4,527,482)	(4,398,353)
වසර අවසානයේ දී ශේෂය		4,965,789	6,480,560
සටහන - ප්‍රදාන හඳුනා ගැනීම			
ප්‍රදානයන්, මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ ප්‍රකාශයේ පහත අනුපාත යටතේ හඳුනාගෙන ඇත.			
මෝටර් රථ වාහන		25%	
කාර්යාල උපකරණ - වෙනත් සහ වි.ද.සැ.		25%	
ලී බඩු වැද්දුම් සහ සවි කිරීම්		12.5%	
පුහුණු උපකරණ		25%	
8 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්			
වසර ආරම්භයේ දී ශේෂය		5,757,098	4,930,502
වසර තුළ ප්‍රතිපාදන		2,278,349	979,434
අඩුකළා - වසර තුළ සිදු කරන ලද ගෙවීම්		-	(152,839)
වසර අවසානයේ ශේෂය		8,035,447	5,757,098
9 අනෙකුත් ජංගම වගකීම්			
උපචිත වියදම්		6,169,951	8,224,664
සේවක අර්ථසාධක අරමුදල් සඳහා කළ යුතු ගෙවීම්		660,714	568,981
සේවක භාරකාර අරමුදල් සඳහා කළ යුතු ගෙවීම්		99,108	85,348
උපයන විට බදු සඳහා කළ යුතු ගෙවීම්		207,889	194,954
වෙනත්		83,003	12,775
		7,220,665	9,086,721

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
10 අයභාරය			
රක්ෂණ සමාගම්වලින් වාර්ෂික ගාස්තු		103,811,505	73,440,757
ලියාපදංචි කිරීමේ සහ අළුත් කිරීමේ ගාස්තු		9,337,740	4,145,319
		113,149,245	77,586,076
11 වෙනත් ආදායම්			
මෝටර් වාහන ණය මත පොළී		25,583	28,862
ආපදා ණය මත පොළී		142,229	103,325
ස්ථාවර වත්කම් විකුණුම් ලාභ		15,028	-
වෙනත් ආදායම්		42,537	19,535
		225,376	151,722
12 කාර්ය මණ්ඩල වියදම			
කාර්ය මණ්ඩල වැටුප්		38,492,392	31,045,384
සේ.අ.අ. 12%		4,667,638	3,833,446
සේ.භා.අ. 3%		1,166,910	958,362
සභාපතිනියගේ වියදම් - දීමනා		1,004,589	900,000
සභාපතිනියගේ ඉන්ධන වියදම්		239,090	347,220
අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් ගාස්තු		457,500	413,500
පුහුණුවන නිළධාරී දීමනා		91,315	-
අතිකාල		147,337	123,941
කාර්ය මණ්ඩල වෛද්‍ය වියදම්		1,644,315	1,545,903
කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය		839,140	655,636
ගිනි හා පුද්ගල රක්ෂණය		483,391	450,411
කාර්ය මණ්ඩල සුබසාධන		1,513,780	1,345,887
කාර්ය මණ්ඩල පුහුණු - දේශීය		1,752,935	2,204,709
විදේශ ගමන් හා පුහුණු- අධ්‍යක්ෂක මණ්ඩල හා කාර්ය මණ්ඩල		8,144,101	7,701,049
කාර්ය සාධනය පදනම් කරගත් දිරි දීමනා		2,047,954	1,754,948
ප්‍රචාරණය - බඳවා ගැනීම්		223,620	324,945
අධ්‍යක්ෂක දුරකථන		220,950	166,410
නිවාඩු දීමනා		637,964	764,260
අධ්‍යක්ෂකවරුන්ගේ වාහන දීමනා		3,291,096	2,925,000
අධ්‍යක්ෂකවරුන්ගේ ඉන්ධන දීමනා		861,154	866,101
සේවක පාරිතෝෂික	22	2,278,349	979,434
		70,205,520	59,306,548
13 වෘත්තීමය ගාස්තු			
උපදේශක සේවා ගාස්තු		2,388,225	2,181,575
		2,388,225	2,181,575

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට	සටහන්	2015 රු.	2014 (සංශෝධිත) රු.
14 මෙහෙයුම් වියදම්			
කාර්යාල කුලී		27,740,409	23,976,701
රථ ගාල් කිරීමේ ගාස්තු		345,621	332,185
දුරකථන හා අන්තර්ජාල වියදම්		1,567,818	1,633,011
විදුලිය		1,327,103	1,356,878
කාර්යාල නඩත්තු කිරීම්		402,472	459,213
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		2,990,021	2,871,798
මහජන දැනුවත් කිරීම්		3,769,091	1,836,159
සංග්‍රහ වියදම්		91,770	248,237
ගමන් වියදම් - දේශීය		102,658	81,919
කාර්යාල උපකරණ නඩත්තු වි.ද.සෑ හා වෙනත්		1,030,533	1,088,963
සාමාජිකත්වය - IAIS		2,541,784	2,487,748
සාමාජිකත්වය - IIAP		-	33,125
ප්‍රචාරණය - වෙනත්		-	109,200
රැස්වීම් ගාස්තු		1,812,680	953,295
පුවත්පත් හා පුස්තකාල පොත්		122,768	139,820
තැපැල් හා පණිවිඩ ගාස්තු		187,740	1,039,937
විගණන ගාස්තු - විගණකාධිපති		43,800	470,000
අභ්‍යන්තර විගණන ගාස්තු		(1,035,000)	-
ක්ෂය		5,214,297	4,696,716
වෙළඳ බදු		(17,000)	-
පොදු වියදම්		144,618	104,244
නීති වියදම්		205,069	166,861
විමර්ශන වියදම්		19,314	4,572
අධීක්ෂණ වියදම්		199,018	383,293
වාහන නඩත්තු		77,159	157,174
වාහන රක්ෂණ		229,143	309,245
වාහන ඉන්ධන වියදම්		185,783	270,829
ජාතිය ගොඩනැගීමේ බදු		688,075	574,717
වත්කම් ඉවත් කිරීමේ අලාභය		-	73,035
		49,986,744	45,858,876
15 මූල්‍ය හා වෙනත් වියදම්			
බැංකු ගාස්තු		206,872	186,428
		206,872	186,428

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

16. ජාතික රක්ෂණ භාර අරමුදලින් ලැබිය යුතු මුදල්

2011 අංක 03 දරණ රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ (සංශෝධන) පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව ජාතික රක්ෂණභාර අරමුදල, පනත යටතේ ලියාපදිංචිකල පුද්ගලයෙක් / ආයතනයක් ලෙස සැලකේ. ඒ අනුව අරමුදල 2011 වසරේ සිට වාර්ෂික ගාස්තු හා සෙස් බදු මණ්ඩලයට ගෙවීමට බැඳී සිටි.

වර්ෂ 2011 සිට 2013 දක්වා ජාතික රක්ෂණ භාර අරමුදලින් අයවිය යුතු වාර්ෂික ගාස්තු හා සෙස් බදු වටිනාකම නිශ්චය කල හැකි වුවද, 2015 වසර සඳහා ගෙවිය යුතු වාර්ෂික ගාස්තු හා 2014, 2015 වසර සඳහා ගෙවිය යුතු සෙස් බදු ජාතික රක්ෂන භාර අරමුදල සිය විගණිත ගිණුම් තවමත් අවසන් කර නොමැති බැවින් නිශ්චය කල නොහැක.

වර්ෂ 2011 සිට 2013 දක්වා ජාතික රක්ෂණ භාර අරමුදල මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල තවමත් සාකච්ඡා මට්ටමින් පවතී.

17. බදුකරණය

බදුකරණය සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ 2006 අංක 10 දරණ ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලවයි.

17.1 රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපල ගනුදෙනු වෙනුවෙන් රඳවාගත් බදු සඳහා ලැබෙන නාමික බැර

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ අංක 137 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත උපයන පොලී ආදායම අදාළ තක්සේරු වර්ෂය සඳහා වන ව්‍යවස්ථාපිත ආදායමේ කොටසක් සේ සලකන අතර එම පොලිය වෙනුවෙන් නාමික බදු බැර සඳහා හිමිකාරත්වය ලැබේ.

ඒ අනුව රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනුවලින් මණ්ඩලය විසින් උපයන ලද ශුද්ධ ආදායම දළ ආදායම බවට පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් නාමික බදු බැර වටිනාකම රුපියල් 149,436/- ක් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදල විසින් රජයේ සුරැකුම්පත් පිළිබඳ ද්විතීය වෙළඳපොළ ගනුදෙනු මත කරනු ලැබූ ආයෝජනයන්ගෙන් උපයන ලද පොලී ආදායම ගිණුම්ගත කර හඳුනාගෙන ඇත්තේ ශුද්ධ අගයටය.

18. ප්‍රාග්ධන බැඳියාව

2015 දෙසැම්බර් 31 දිනට කිසිදු ප්‍රාග්ධන බැඳියාවකට එළැඹ නොමැත.

19. අසම්භාව්‍ය බැරකම්

2015 දෙසැම්බර් 31 දිනට කිසිදු අසම්භාව්‍ය බැරකමක් නොමැත.

20. වාර්තා කරන දිනෙන් පසු හටගත් සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කළ යුතු හෝ අනාවරණය කිරීම අවශ්‍ය වන කිසිදු සිද්ධියක් වාර්තා කරන දිනට පසු සිදු වී නොමැත.

21. සම්බන්ධිත පාර්ශව අනාවරණ

ඩී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා, එස්.ආර්. ආටිගල මහතා, නලින් ආටිගල මහතා හා සමන්ත කුමාරසිංහ මහතා නව රජය බලයට පත්වීම හේතුවෙන් 2015 ජනවාරි 20 දින සිට බලපැවැත්වෙන පරිදි සිය ධුරයන්ගෙන් ඉල්ලා අස්විය. ඉන්පසු මණ්ඩලය පහත පරිදි සමන්විත විය.

ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය - (සභාපතිනිය)

පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය - නිල බලයෙන් පත්වූ සාමාජිකා (නියෝජ්‍ය ලේකම් මහා භාණ්ඩාගාරය) - 2015 පෙබරවාරි 24

පී සමරසිරි මහතා - නිල බලයෙන් පත්වූ සාමාජික (ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය අධිපති ශ්‍රී ලංකා මහා බැංකුව) - 2015 මාර්තු 09

ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා - නිල බලයෙන් පත්වූ සාමාජික (සමාගම් රෙජිස්ට්‍රාර්)

ජෙරම් බෝලින් මහතා - 2015 පෙබරවාරි 10 දින සිට

ආචාර්ය අලි අස්ගාර් ශබීර් ගුලාම්හුසේන් මහතා -2015 මාර්තු 20 දින සිට

අසංග අබේගුණසේකර මහතා - 2015 අප්‍රේල් 07 දින සිට 2015 අගෝස්තු 31 දක්වා

සමාලෝචිත වර්ෂය තුළ දී මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්ගේ සංස්ථාපිත සම්බන්ධතාවය පහත වගුවෙන් නිරූපණය කෙරේ.

සාමාජිකයාගේ නම	සම්බන්ධිත ආයතනයේ නම	සම්බන්ධතාව
ඉන්ද්‍රාණි සුගතදාස මහත්මිය	කළුබොවිටියාන තේ කම්හල් සමාගම එන් ඩී බී බැංකුව	අධ්‍යක්ෂිකා අධ්‍යක්ෂිකා
පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය	ලංකා බැංකුව වාහන දුම්පරීක්ෂා භාර අරමුදල විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම	අධ්‍යක්ෂිකා සභාපතිනිය භාණ්ඩාගාර නියෝජිත (නිරීක්ෂක නිලධාරිනි)
පී සමරසිරි මහතා	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය ශ්‍රී ලංකා සුරැකුම්කුපත් හා විනිමය කොමිෂන් සභාව	උපසභාපති සාමාජික (2015 සැප්තැම්බර් 29 සිට)
ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත අධීක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරුවන්ගේ ආයතනය	මණ්ඩල සාමාජික මණ්ඩල සාමාජික මණ්ඩල සාමාජික
ජෙරම් බෝලින් මහතා	ඔක්ටගන් කන්සල්ටන්ස් (පෞද්) සමාගම එන්ඩ්ලස් අවුට්ඩෝස් (පෞද්) සමාගම එන්විච්ජේ රිස්ක් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්) සමාගම	අධ්‍යක්ෂක අධ්‍යක්ෂක අධ්‍යක්ෂක

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සාමාජිකයාගේ නම	සම්බන්ධිත ආයතනයේ නම	සම්බන්ධතාව
ආචාර්ය අලි අස්ගාර් ශබීර් ගුලාම්හුසේන් මහතා	ඇඩම් කැපිටල් පීඑල්සී	අධ්‍යක්ෂක
	සිලෝන් ඇන්ඩ් ෆොරින් ට්‍රේඩ්ස් පීඑල්සී	අධ්‍යක්ෂක
	ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී	අධ්‍යක්ෂක (2015 ජුලි 06 දක්වා)
	ඔරියන්ට් ගාමන්ට්ස් පීඑල්සී	අධ්‍යක්ෂක (2015 නොවැම්බර් 17 දක්වා)
	බිස්නස් චේම්බර් ඔෆ් කොමර්ස්	අධ්‍යක්ෂක
	ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇපරල් ආයතනය	අධ්‍යක්ෂක (2015 මාර්තු 31 දක්වා)
	ඇඩම් එක්ස්පෝ (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් කාබන්ස්(පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් කැපිටල් මයික්‍රෝ ක්‍රෙඩිට් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	නෙට්වර්ක් කොමිනිකේෂන්ස් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් මෙටල්ස්(පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් කෝපරේට් සෙක්‍රටේරියල් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් එයා කන්ඩිෂනර්ස් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් ඇපරල්ස් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් ඔටොමොබයිල්ස් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	සොනක්ෂි ට්‍රස්ට් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ඇඩම් ට්‍රස්ට් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	වෙල්වින් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ජියෝර්ජියෝ මොරැන්ඩි (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	ස්පයිස් ඔෆ් ලයිෆ් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	සිලෝන් ඇන්ඩ් ෆොරින් සර්ජිටෙක් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	කලම්බෝ ඇපොතිකරීස් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
	කලම්බෝ ෆ්‍රේට් ඇන්ඩ් ට්‍රාන්ස්පෝට් සමාගම	අධ්‍යක්ෂක
	ඩොඩ්වෙල් ඇන්ඩ් කම්පනි සමාගම	අධ්‍යක්ෂක
	හැමිල්ටන් රිසෝට්ස් (පුද්) සමාගම	අධ්‍යක්ෂක
අසංග අබේගුණසේකර මහතා	අදාල තොරතුරු සපයා නැත	
බී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා	ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය	සභාපති
	ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය	සභාපති
	ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය - අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලත් විශේෂ ප්‍රසම්පාදන කමිටුව	සාමාජික
	වෙස්ට් කෝස්ට් පවර් පුද්. සමාගම	මණ්ඩල සාමාජික
නලින් ආටිගල මහතා	තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	කොමිෂන් සාමාජික
සමන්ත කුමාරසිංහ මහතා	නේචර්ස් බියුටි ක්‍රියේෂන්ස් ලිමිටඩ්	සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ
	මල්ටිකෙම් ඉන්ටනැෂනල් ලිමිටඩ්	සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ
	මල්ටිකෙම් එක්ස්පෝට්ස් (පුද්) සමාගම	සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ
	ඉකෝ ප්‍රොටෙක්ට් ඉන්ජිනියරින් (පුද්) සමාගම	සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ
	ලංකා බයෝ ෆර්ටිලයිසස්(පුද්) සමාගම	සභාපති / කළමණාකාර අධ්‍යක්‍ෂ

වෙළඳපොළ වටිනාකම් මත සිදු කරන ලද සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු මත සිදු කල ගනුදෙනු හැර උක්ත ආයතන සමඟ සමාලෝචිත වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගනුදෙනුවක් සිදු කර නොමැත.

22. සංසන්දනාත්මක සංඛ්‍යා (පෙර වර්ෂය) ගැලපීම

වර්ෂ 2015 සිට මණ්ඩලය සිය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට නොව රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීමට තීරණය කරන ලද බැවින් ආයෝජන, පිරිවැය හෝ මුහුණත් අගය යන අගයන් 2න් අඩු අගයට පෙන්වා ඇති අතර ලැබිය යුතු ආයෝජන පොළී වෙනමම හඳුනා ගෙන ඇත.

තවද, පාර්තෝෂික ගැලපීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් අංක 3.1.1 පැහැදිලි කල පරිදි සිදුකර ඇති අතර ඒ අනුව වර්ෂ 2014 හා ඊට පෙර වර්ෂ සඳහා පාර්තෝෂික වෙන්කිරීම් පිළිවෙලින් රු. 300,147/- න් හා රු. 1,585,184/- න් වැඩි වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්‍ෂන අරමුදලින් කල යුතු මාරු කිරීම් එම අගයන් වලින්ම වැඩිවී ඇත.

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: ටීආර්ඊ/සී/අයිබීඑස්එල්/2015/23
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016 ඔක්තෝබර් 24 දින

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 8 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2016 අගෝස්තු 01 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාව

2 මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, මණ්ඩලය විසින් ආදායම් උපචිත පදනම මත ඉදිරිපත් කර ඇති බව සඳහන් කර තිබූ නමුත් ජාතික රක්ෂණ භාර අරමුදලින් 2011 සිට 2015 දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබිය යුතු ලෙස හඳුනාගත් රු.21,788,225 ක සෙස් ආදායම හා රු.2,911,605 ක වාර්ෂික ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණ අතර අරමුදලින් ඉකුත් වර්ෂයන්ට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.7,668,309 ක් වූ සෙස් ආදායම, ප්‍රවර්ථන වර්ෂයේ ආදායමට කරන ලද ගැලපීමක් ලෙස ගිණුම්වල ඇතුළත් කර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2014 වර්ෂයට පෙර සහ 2014 වර්ෂයේ සිට පවතින රක්ෂණ ආදායම් ඉදිරියට ලැබීම් පිළිවෙලින් රු.484,511 ක් හා රු.1,550,060 ක් මණ්ඩලයේ ආදායම ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත හා එහි සංශෝධන පනත	
(i) 33 (2) උප වගන්තිය	රක්ෂණකරුවකුගේ අධ්‍යක්ෂවරයෙකු ලෙස යම් තැනැත්තෙකුගේ යෝජිත පත් කිරීමක්, තෝරා පත් කිරීමක් හෝ නම් කිරීමක් පිළිබඳව රක්ෂණකරුගෙන් මණ්ඩලය වෙත දැන්වීමක් ලැබුණු අවස්ථාවකදී, මණ්ඩලය විසින් ඒ දැන්වීම ලැබී දින තිහක් (30) ඇතුළත එම පත් කිරීම, තෝරාපත් කිරීම හෝ නම් කිරීම, අනුමත කිරීම හෝ අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ යුතු වුවද රක්ෂණ සමාගම් දෙකක එවැනි පත්කිරීම් සඳහා වූ ඉල්ලීම මණ්ඩලය වෙත ලැබී තිබියදී, ඒ සඳහා ක්‍රියාකිරීමට වසර 1 සිට 3 කට වඩා වැඩි කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණි.
(ii) 38 (1)(ආ) වගන්තිය	දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම්, වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ වත්කම්වලින් වෙන්ව තබා ගත යුතු වුවද ලියාපදිංචි රක්ෂණ සමාගම් 11 න් රක්ෂණ සමාගම් 8 ක් 2015 වර්ෂයේදී වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කර තිබුණ ද සමාගම් 3 ක් එසේ ලියාපදිංචි කර නොතිබුණි.
(iii) 103 (2) වගන්තිය හා 2005 සැප්තැම්බර් 29 දිනැති අංක 1412/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 10 වගන්තිය	රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ බැරට ඇති මුදල්, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ පොදු ආරක්ෂාව අරභයා උපයෝගී කර ගනු ලැබිය යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී, මණ්ඩලය විසින් මෙහෙයුම් ඌනතාවය සඳහා රු.3,513,004 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.3,012,711 ක් අරමුදලින් ලබා ගෙන තිබුණි.

විගණකාධිපති වාර්තාව

(ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ

(i) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 9.14 ජේදය

පරිපාලන අත් පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබා ගත යුතු වුවද, විගණිත දිනය වූ 2016 ජූනි 30 සින වන විටත් භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබියදී එහි ඇතුළත් කර තිබුණු පරිදි මණ්ඩලයේ නිලධාරීන් 31 දෙනෙකුට රු.50,000 බැගින් එකතුව රු.1,550,000 ක උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි.

(ii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/2/2015 දරන චක්‍රලේඛයේ 3 ජේදය

නිවාස දුරකථන, ජංගම දුරකථන හෝ අන්තර් ජාල පහසුකම් ලබා ගැනීමේදී මිලදී ගැනීමට සිදුවන උපකරණ හා උපාංග සඳහා දැරීමට සිදුවන පිරිවැය අදාල නිලධාරියා විසින් දැරිය යුතු බව සඳහන් වුවද මණ්ඩලය විසින් නිලධාරීන් 4 දෙනෙකු වෙත ලබාදුන් පිරිවැය රු.111,032 ක්වූ ජංගම දුරකථන 04 ට අදාළ මුදල් නිළධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ බදු පෙර ලාභය රු. 187,126 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.163,129 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය රු.23,997 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ සමාගම්වලින් ලැබෙන වාර්ෂික ගාස්තු රු.35,563,169 ක් වැඩිවී තිබුණද රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අරමුදලට මාරු කිරීම් රු.20,687,991 ක් අඩුවීමද සේවක පාරිශ්‍රමික රු.10,898,972 කින් හා මෙහෙයුම් වියදම් රු.4,127,872 ක් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී බදු පෙර ලාභය සියයට 38 කින් අඩුවී තිබුණද නැවත එය 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලය ගැනීමේදී 2011 වර්ෂයේදී රු.42,311,901 ක්වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.75,606,943 ක් දක්වා සියයය 79 කින් වර්ධනය වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධන

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණ හා වගකීම වන්නේ, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, ගෞරවාන්විතව ද රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා වන වෘත්තීමය හා විචක්ෂණ ආකාරයෙන්ද, කර ගෙන යනු ලබන බවට වගබලා ගැනීමයි.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලකදී එය විමර්ශණය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලය සතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලද පැමිණිලි වලින් පැමිණිලි 41 ක් 2016 ජූනි 27 දින වනවිටත් විසඳා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ දී රක්ෂණය හා රක්ෂණ කර්මාන්තය පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීමට කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 11 කට ලිපි යොමු කර තිබුණද, ඒ තුළ නොවූ පාසලක දැනුවත් කිරීමේ එක් වැඩසටහනක් පමණක් සිදු කර තිබුණි.

(ඇ) වර්තමානයේ රක්ෂණ කර්මාන්තය තුල භාවිතා කරනු ලබන නියාමන රාමුව (Regulatory Framework), රක්ෂණ අධිකාරීන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) රක්ෂණ මූලික මූලධර්ම (ICÂ) සමඟ සංසන්දනය කර පාර්ශවෝගිකයාට සාධාරණ සැලකිල්ලක් (FTC)ලබාදීමට හැකිවන පරිදි නිර්මාණය කිරීම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් එක් කාර්යයක් වුවද එය නිර්මාණය කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර සකස්කළ වාර්තාව 2015 දෙසැම්බර් 08 දින අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු නමුත් ඊට අදාල ඉදිරි කටයුතු විගණිත දිනය වූ 2016 ජූනි 27 දින වන විට අවසන් කර නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

4.2 ආර්ථික නොවූ ගනුදෙනු

අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මුද්‍රණය කරන ලද පිරිවැය රු.2,277,122 ක්වූ වාර්ෂික වාර්තා පිටපත් 1667 ක් ඉතිරි වී තිබීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අත්පත්‍රිකා මගින් රක්ෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවල මුද්‍රණය කිරීමට සැලසුම්කර තිබූ ''සෞඛ්‍ය රක්ෂණය ගැන ඔබ දැනගත යුතු දේ හා රක්ෂණ ඔප්පු හිමියෙකු වශයෙන් ඔබගේ අයිතිවාසිකම් හා යුතුකම් හා අයිතිය පිළිබඳ දැනුවත් වන්න'' යන අත්පත්‍රිකා මුද්‍රණය කර තිබුණේ 2016 ජූලි මාසයේ වන අතර 2016 ජූලි 28 වන විටත් දැනුවත් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) රක්ෂණ කර්මාන්තයේ හා රක්ෂණ ඔප්පු හිමියන්ගේ යහපත උදෙසා රක්ෂණ ඔප්පු වැඩිදියුණු කිරීමේ අදහසින් සමාගම්වල රක්ෂණ නිපැයුම් සමාලෝචනයට ලක් කිරීම සඳහා වර්ෂය තුළ ගිනි රක්ෂණය පිළිබඳව නිර්දේශ සමාලෝචනය කිරීම් තෝරා ගෙන තිබුණද, වර්ෂය අවසාන වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) 2009 වර්ෂයේදී මණ්ඩලය විසින් පෞද්ගලික රක්ෂණ සමාගමක් වෙත අත්හිටුවීමක් පනවා තිබුණු අතර ඊට අදාල මූලික අයිතිවාසිකම් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර එම සමාගම් වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීමට එකී සමාගමේ වත්කම් බැහැර කිරීම සඳහා මණ්ඩලය විසින් 2012 ජූලි 06 දින, සමාගම් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. ඒ අනුව ඉදිරිපත් කර තිබූ අව්‍යාජ හිමිකම් පෑම් 142 න් කිසිම වන්දි හිමිකම් පෑමක් විගණිත දිනය වූ 2016 ජූනි 16 දින වන විටත් නිරවුල් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) මණ්ඩලය විසින් 2012 අප්‍රේල් 22 දින පල කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, රක්ෂණ තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම් අත්හිටුවා තිබුණු අතර එය 2016 මාර්තු මාසය වන විටත් ඉවත් කර නොතිබියදී සාමාන්‍ය රක්ෂණය සඳහා පමණක් ලියාපදිංචි වී තිබූ එක් රක්ෂණ සමාගමක් වෙත දීර්ඝ කාලීන රක්ෂණය සඳහා 2015 මැයි මාසයේ සිට මණ්ඩලයේ ලියාපදිංචිය ලබා දී තිබුණි. 2015 මැයි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා වසරක කාලයක් තුළ එම සමාගම දීර්ඝ කාලීන රක්ෂණය සඳහා ක්‍රියාකාරී නොවුණද, 2016 වර්ෂය සඳහා ලියාපදිංචිය අළුත් කිරීමක්ද සිදු කර තිබුණි.

(ඉ) මණ්ඩලය විසින් අධීක්ෂණය කෙරෙමින් පැවතුණ නුබුන්වත් ආන්තික (Solvency Test) නීතිවලට හා අවධානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘති රීති අනුව සියළුම රක්ෂකයන් විසින් අවම නුබුන්වත් ආන්තිකයක් පවත්වා ගතයුතු වුවද මුළු ප්‍රාග්ධන වටිනාකම දිගින් දිගටම පහත වැටී තිබුණු සමාගමක් හා නුබුන්වත් බව (Solvency Ratio) පිළිබඳ අනුපාතය, 2015 වර්ෂයේදී පවත්වා ගත යුතු මට්ටමට වඩා අඩු මට්ටමක පැවති සමාගමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඊ) ආයතනයක් විසින් සමාලෝචිත වර්ෂයට අදාල කාර්තුමය වාර්තා හා අනුකූලතා සහතික (Compliance Certificate) මණ්ඩලය වෙත ලබාදී නොතිබුණු නමුත් මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) රක්ෂකයන් විසින් ආයතනවල සිදු කරනු ලබන විමර්ෂණ සඳහා පොදුවේ භාවිතයට ගත හැකි මාර්ගෝපදේශන සංග්‍රහයක් සකස් කිරීමට සැලසුම් කර තිබුණද, ඊට අදාල සංශෝධිත කෙටුම්පත් වාර්තාව 2016 ජූනි 14 දින රක්ෂණ කර්මාන්තයට සම්බන්ධ පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනීමට යොමු කර තිබීම නිසා විගණිත දිනය වූ 2016 ජූනි 27 දින වන විටත් එය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.

(ඌ) රක්ෂකයන් විසින් හිමිකම් පෑම් ඉල්ලීම් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් හරහා විමර්ශනයන් විධිමත්ව සිදු කිරීම සඳහා 2013 වර්ෂයේ සිට මණ්ඩලය සැලසුම් කර තිබුණද, ඊට අදාල කෙටුම්පත් මාර්ගෝපදේශන සංග්‍රහයට අවසන් අනුමැතිය 2016 ජූලි 28 දින වන විටත් ලැබී නොතිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ තනතුරුවලට අදාල බඳවා ගැනීමේ පරිපාටිය සඳහා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

විගණකාධිපති වාර්තාව

(ආ) පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (නීති හා බලාත්මක කිරීම) තනතුර සඳහා 2015 මැයි 18 දින කොන්ත්‍රාත් පදනම මත නිළධාරියෙකු බඳවාගෙන තිබුණු අතර මෙම බඳවා ගැනීමට අදාලව පල කරන ලද පුවත් පත් දැන්වීමේ වයස් සීමාව ''අවුරුදු 35 සිට අවුරුදු 50 දක්වා යනුවෙන් සඳහන් කර තිබුණි. මේ සඳහා ලැබුණු අයදුම්පත් අතුරින් සුදුසුකම්ලත් නිලධාරීන් 9 දෙනෙකු වූ අතර ඒ අතුරින් ස්ථිරව නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු නොකොට වයස 33 ක නිළධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

(ඇ) බඳවා ගැනීම් පරිපාටියෙන් බැහැරව 2012 ඔක්තෝම්බර් මාසයේ 2016 පෙබරවාරි 29 දින දක්වා විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කළ ගිවිසුමක් මත ජීවගණක උපදේශක තනතුර සඳහා නිලධාරිනියක් බඳවාගෙන තිබුණි. ඇයගේ පැමිණීම හා පිටවීම් තහවුරු කර නොගෙන 2012 ඔක්තෝම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා එකතුව රු.7,514,871 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ඈ) අනුමත තනතුරක් නොවූ ජීවගණක තනතුර සඳහා 2015 ජූනි සිට 2016 ජූනි මාසය දක්වා මාසිකව රු.15,000 ක දීමනාවක් මත නිලධාරියෙකු බඳවාගෙන සිටියදී බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව 2016 ජනවාරි 01 දින සිට මාසිකව රු.200,000 ක දීමනාවක් ගෙවීමට වසර 02 ක කාලයක් සඳහා පුද්ගලයෙකු කෝන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වන ඡේදය ප්‍රකාරව, අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු වුවද, මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්ම එසේ සකස් කර නොතිබුණි.

5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ අයිතම් 53 ක අයවැයගත හා තථ්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 100 දක්වා අධි ප්‍රතිපාදනයන් පැවතීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) අරමුදල් පාලනය	අරමුදලට අදාළ නොවන වියදම් පියවා ගැනීම හා ඉදිරියේදී දැරීමට සිදු වන වියදම් සඳහා මුදල් වෙන් කිරීම.
(ආ) කාර්ය මණ්ඩල පරිපාලනය	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව හා පත්වීම දින නොසලකා වැටුප් වර්ධක ගෙවීම.
(අ) ආදායම් පාලනය	(i) අනුමැතියකින් තොරව වාර්ෂික ගාස්තු ආපසු ගෙවීම. (ii) ආදායම් උපචිත පදනම මත හඳුනා නොගැනීම.

එච්.එම්.ගාමිණි විජේසිංහ
විගණකාධිපති

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
2.2	**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**	
2.2.1	**ගිණුම්කරණ ප්‍රතිපත්ති**	
	ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව මණ්ඩලය විසින් ආදායම් උපචිත පදනම මත ඉදිරිපත් තර ඇති බව සඳහන් කර තිබූ නමුත් ජාතික රක්ෂණ භාර අරමුදලින් 2011 සිට 2015 දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබිය යුතු ලෙස හඳුනාගත් රු.21,788,225 ක සෙස් ආදායම හා රු.2,911,605 ක වාර්ෂික ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණු අතර අරමුදලින් ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ රු.7,668,309ක් වූ සෙස් ආදායම, ප්‍රවර්ථන වර්ෂයේ ආදායමට කරන ලද ගැලපීමක් ලෙස ගිණුම්වල ඇතුළත් කර තිබුණි.	14 (2) (C) කෙටුම්පත් වාර්තාවේ සඳහන් කර තිබුයේ මණ්ඩලය විසින් ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබිය යුතු රු.53,220,457 ක සෙස් ආදායම ද රු.10,349,888 ක වාර්ෂික ගාස්තුද අප ගිණුම් වල හඳුනාගෙන නොතිබුණු බවයි. කරුණු එසේ හෙයින් අප මීට පෙර 2015 හා 2016 ජනවාරි මස දැනුම් දුන් පරිදි අගයන් නිවැරදිව තක්සේරු කිරීමට අපහසු වීම හා මෙවන් විශාල අගයන් එකී ආදායම් ලැබීම පිළිබඳ නිශ්චිත තහවුරු කිරීමක් නොමැතිව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම විචක්ෂණ සංකල්පයට අනුරූප නොවන බැවින් එකී ආදායම් හඳුනාගෙන නොමැති නමුත් ඒ පිළිබඳ හෙලිදරව්වක් / තොරතුරු, සටහනක් මගින් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇත. 2011, 2012 වර්ෂ සඳහා ලැබිය යුතු සෙස් අගයන්ට අදාළව උපචිත පදනම මත හඳුනාගත් අගයන්ට අදාළ ගැළපුම් දැනටමත් සිදුකර ඇති බැවින් 2015 ජාතික රක්ෂණ භාර අරමුදලින් ලද සෙස් ආදායම, (රු.7,668,309), ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුකූල ඇස්තමේන්තුවල වෙනස්වීමක් ලෙස (changing estimates) සලකා ප්‍රවර්තන වසරේ ආදායමට ගළපා ඇත.
2.2.2	**ගිණුම්කරණ අඩුපාඩු**	
	2014 වර්ෂයට පෙර සහ 2014 වර්ෂයේ සිට පවතින රක්ෂණ ආදායම් ඉදිරියට ලැබීම් පිළිවෙලින් රු.484,511 ක් හා රු.1,550,060 ක් මණ්ඩලයේ ආදායම ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	විමසුමේ සඳහන් රු.1,550,060/- ක අගය රු.1,555,060/- ලෙස සංශෝධනය විය යුතු වේ. 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ අංක 81, 83 වගන්ති ප්‍රකාරව හා අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1414/19 හි 2 (බී) රීති අනුව, රක්ෂණ තැරැව්කාර ආයතනයක් ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචිය අළුත් කිරීම හා නව රක්ෂණ සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අයැදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදීම අදාළ ගාස්තු ගෙවිය යුතු වේ. එලෙස ලැබෙන මුදල් අදාළ ආයතනය ලියාපදිංචි කිරීම / ලියාපදිංචිය අළුත් කිරීම සඳහා මණ්ඩලය අනුමත කරන තෙක් කලින් ලද ලැබීම් ගිණුමේ සටහන් කෙරේ. අදාළ අනුමැතිය ප්‍රදානය කිරීමෙන් අනතුරුව නියමිත අගයයන් ආදායම් ගිණුමට මාරු කෙරේ. තවද, 2014 වර්ෂයේ හා ඊට පෙර සිට පැවත එන රු.2,039,571/- ක අගයෙන් රු.1,500,000/- ක් සමන්විත වනුයේ රු.500,000/- බැගින් රක්ෂණ සමාගම් 3න් මණ්ඩලයේ නියමයන්ට අනුව සාමාන්‍ය හා දිගු කාලීන ලෙස වෙන් වශයෙන් ලියාපදිංචි කිරීමේ (segregation) අවශ්‍යතාවය මත නව ලියාපදිංචිය සඳහා ලද මුදල්ය. ඉන් එක් රක්ෂණ සමාගමක් වෙන් වශයෙන් ලියාපදිංචි කිරීමට (segregation) අවශ්‍ය අදාළ පියවර ගෙන නොමැති අතර, අනෙක් රක්ෂණ සමාගම් වලට ප්‍රමාණවත් ප්‍රාග්ධන වටිනාකමක් නොමැත. කරුණු එසේ හෙයින් මණ්ඩලය විසින් ලියාපදිංචිය අනුමත කිරීමෙන් අනතුරුව අදාළ අගයන් ආදායමක් ලෙස හඳුනා ගැනේ. ඉතිරි රු.539,571/- සම්බන්ධයෙන් අදාළ මුදල් එක් එක් ආයතන වෙත ආපසු යැවීම (Refund) හෝ 2017 වසර සඳහා ලියාපදිංචිය අළුත් කිරීමේදී එකී ආයතනයන් විසින් ගෙවිය යුතු මුදලින් අඩුකර ඉතිරි මුදල පමණක් ගෙවීමට උපදෙස් දීම හෝ නැතහොත් ගතයුතු විකල්ප ක්‍රියාමාර්ගය දැනටමත් සාකච්ඡා කරමින් පවතින අතර මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් ලබාගැනීමටද අපේක්ෂා කෙරේ.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම		
(අ)	2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත හා එහි සංශෝධන පනත	
(i)	33 (2) උප වගන්තිය රක්ෂණ කරුවකුගේ අධ්‍යක්ෂවරයෙකු ලෙස යම් තැනැත්තෙකුගේ යෝජිත පත්කිරීමක්, තෝරා පත් කිරීමක් හෝ නම් කිරීමක් පිළිබඳව රක්ෂණකරුගෙන් මණ්ඩලය වෙත දැන්වීමක් ලැබුණු අවස්ථාවකදී, මණ්ඩලය විසින් ඒ දැන්වීම ලැබී දින තිහක් (30) ඇතුළත, එම පත් කිරීම, තෝරා පත්කිරීම හෝ නම් කිරීම, අනුමත කිරීම හෝ අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ යුතු වුවද, රක්ෂණ සමාගම් දෙකක එවැනි පත්කිරීම් සඳහා වූ ඉල්ලීම් ලැබී තිබියදී, ඒ සඳහා ක්‍රියාකිරීමට වසර 1 සිට 3 කට වඩා වැඩි කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණි.	එකී රක්ෂණ සමාගම විසින් සිය අධ්‍යක්ෂ මණ්ඩලයට නව සාමාජිකයන් 5 ක් නම් කර, 2015 පෙබරවාරි මස 20 වන දින මණ්ඩලය වෙත ලිඛිත දැනුම්දීමක් කරන ලදී. මෙම ඉල්ලීම ඉදිරිපත් කරන ලද්දේ එවකට එම සමාගම අයත් වූ මුදල් අමාත්‍යාංශයේ උපදෙස් මතය. නමුත්, අදාල සමාගම විසින් එකී අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීම අනුමත කිරීමට අදාලව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛණ එවා නොතිබුණ අතර, ඒවා 2015 මැයි 27 වන විට ඉදිරිපත් කරන බවට දන්වා තිබුණි. එහෙත්, එදින වන විට ඔවුන් නව අධ්‍යක්ෂවරුන් 4 දෙනෙකුට අදාල ලිපි ලේඛණ පමණක් ඉදිරිපත් කළ අතර, සපයා තිබූ ඒවාද අඩුපාඩු සහිත විය. එකී ඉල්ලීමේ තිබූ අඩුපාඩු ලිපි ලේඛණ පිළිබඳව කැදවා යවා, ඒවා සම්පූර්ණ කිරීමෙන් අනතුරුව 2015 ඔක්තෝබර් 23 දින එකී අධ්‍යක්ෂවරුන් 5 පත් කිරීම් අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ඒ වන විට මහා මැතිවරණය පැවැත් වූ බැවින් හා එම කාල වකවානුවේදී සමාගම පොදු ව්‍යවසාය සංවර්ධන දෙපාර්තමේන්තුව යටතට අනුයුක්ත කර ඇති බැවින්, නැවත අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස් වීමේ ප්‍රවනතාවයක් තිබූ බැවින් ද, එකී මූලික අධ්‍යක්ෂවරුන් 5 දෙනාගේ පත්කිරීම පිළිබඳව සමාගම දැනුවත් කිරීම ප්‍රමාද කරන ලෙස රක්ෂණ මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. මේ අතර 2015 නොවැම්බර් 20 දිනැති ලිපිය මගින් සමාගම දැනුම් දී සිටියේ ඒ වන විට සමාගම අයත් වූ පොදු ව්‍යවසාය සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කලින් නම් කළ අධ්‍යක්ෂවරයෙක් 2015 නොවැම්බර් 5 සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්වන බවත්, ඒ වෙනුවට වෙනත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පත්කරන බවත් ය. එකී අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීමට අදාල ලියවිලි වල තිබූ අඩුපාඩු සමාගම මගින් සම්පූර්ණ කිරීමෙන් පසුව, අප විසින් නැවතත් අදාල පත් කිරීම් සඳහා අනුමැතිය ඉල්ලා 2016 මාර්තු මස රක්ෂණ මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට දැනුම් දෙන ලදී. මීට අමතරව අප විසින් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත දැනට ඔවුන් පත් කර ඇති විධායක හා විධායක නොවන අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුකූල නොවන බවද දැනුම දෙන ලදී. එකී පත්කිරීම් 2016 මාර්තු 31 දින අනුමත කරන ලදී.
(ii)	38 (1) (ආ) වගන්තිය දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වත්කම්, වෙනත් යම් පංතියක රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් වූ වත්කම් වලින් වෙන්ව තබාගත යුතු වුවද ලියාපදිංචි රක්ෂණ සමාගම් 11න් රක්ෂණ සමාගම් 8 ක් 2015 වර්ෂයේදී වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කර තිබුණද සමාගම් 3ක් එසේ ලියාපදිංචි කර නොතිබුණි.	එකී රක්ෂණ සමාගම් 2ක් විභේදනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සම්පාදනය කිරීමට අපොහොසත් වී ඇත. ඒ අනුව මණ්ඩලය විසින් ඔවුනට සංශෝධිත පනතේ 53 වන වගන්තිය සමග අනුකූල වීම සඳහා අවසාන වශයෙන් කාල සීමාවන් දී ඇත. අනෙක් සමාගම රජයේ රක්ෂණ සමාගමක් වේ. මේ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ දැනුවත් කර ඇත.
(iii)	103 (2) වගන්තිය හා 2005 සැප්තැම්බර් 29 දිනැති අංක 1412/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 10 වන වගන්තිය රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ බැරට ඇති මුදල්, රක්ෂණ ඔප්පු දරන්නන්ගේ පොදු ආරක්ෂාව අරභයා උපයෝගී කරගනු ලැබිය යුතු වුවද, ඊට පටහැණිව සමාලෝචිත වර්ෂයේදී, මණ්ඩලය විසින් මෙහෙයුම් ඌණතාවය සඳහා රු.3,513,004 ක් හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.3,012,711ක් අරමුදලින් ලබාගෙන තිබුණි.	මණ්ඩලයේ අනෙකුත් මෙහෙයුම් වියදම් හා ප්‍රාග්ධන වියදම් සෘජුව / වක්‍රව මණ්ඩලයේ බලතල, කාර්යයන් හා වගකීම් ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් දරනු ලබන අතර ඒ අනුව එකී වියදම් රක්ෂණ ඔප්පු දරන්නන් හා අනාගත රක්ෂණ ඔප්පු දරන්නන්ගේ ප්‍රතිලාභ ලබාදීමේ අපේක්ෂාවෙන් හා රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ කාර්යය සඳහා දරන ලද වියදම් වේ. ඉහත සඳහන් පරිදි මණ්ඩලයේ මෙහෙයුම් වියදම් අංක 1412/30 ගැසට් පත්‍රයේ 10 වන රීතිය යටතේ ආවරණය වන බැවින්, එකී වියදම් පියවා ගැනීමට රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලේ ඇති මුදල් උපයෝගී කරගතහැකි වුවද, මණ්ඩලය සිය ප්‍රධාන ආදායම් මූලයන් වන ලියාපදිංචි ගාස්තු හා වාර්ෂික ගාස්තුවලින් පියවා ගත නොහැකි වටිනාකම, එනම් වාර්ෂික ඌණතාවය පමණක් රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් ලබාගන්නා බව කරුණාවෙන් සලකන්න.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
2.3	**නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**	
(ආ)	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	
(i)	2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන චක්‍රලේඛයේ 9.14 ඡේදය පරිපාලන අත්පොතක් සකස් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කර එකඟතාවය ලබාගතයුතු වුවද, විගණිත දිනය වූ 2016 ජුනි 30 දින වන විටත් භාණ්ඩාගාර ලේකම්ගේ එකඟතාවය ලැබී නොතිබියදී එහි ඇතුළත් කර තිබුණු පරිදි මණ්ඩලයේ නිලධාරීන් 31 දෙනෙකුට රු.50,000 බැගින් එකතුව රු.1,550,000 ක උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි.	 රු. 50,000/-ක් උත්සව අත්තිකාරම් ලෙස ලබාදීම සඳහා 2009 දෙසැම්බර් මස 17 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී තිබෙන අතර එය අපගේ පරිපාලන අත්පොතෙහි 14.1 වගන්තිය යටතේ සඳහන් වේ. කෙසේ වුවද, 2014.12.02 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මුදල් අමාත්‍යාංශයේ, පරිපාලන අත්පොත සම්බන්ධයෙන් පැවති සාකච්ඡාවේදී එකී ගෙවීම 2009 වසරේ සිට කරගෙන යන බැවින් ඒ සම්බන්ධයෙන් විරෝධතාවයක් පල නොකළ අතර, පරිපාලන අත්පොත භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් දුන් උපදෙස් පදනම් කරගෙන සංශෝධනය කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසට දැනුම් දෙන ලදී. එකී උපදෙස් අනුව පරිපාලන අත්පොත සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කෙරේ.
(ii)	2015 මැයි 25 දිනැති අංක PED/2/2015 දරන චක්‍රලේඛයේ 3 ඡේදය නිවාස දුරකථන, ජංගම දුරකථන හෝ අන්තර් ජාල පහසුකම් ලබා ගැනීමේදී මිලදී ගැනීමට සිදුවන උපකරන හා උපාංග සඳහා දැරීමට සිදුවන පිරිවැය අදාළ නිලධාරියා විසින් දැරිය යුතු බව සඳහන් වුවද මණ්ඩලය විසින් නිලධාරීන් 4 දෙනෙකු වෙත ලබාදුන් පිරිවැය රු.111,032 ක්වූ ජංගම දුරකථන 04 ට අදාළ මුදල් නිළධාරීන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	 අදාළ දුරකථන මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කරනු ලැබුවේ 2015.01.28 දින වන අතර මිලදී ගැනුම් ඇණවුම නිකුත් කරනු ලැබුවේ 2015.06.03 දිනය. මෙම මිලදී ගැනීම අදාළ මිලදී ගැනුම් ක්‍රියා පරිපාටිය අනුගමනය කර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු සිදු කරන ලදී. මෙම මිලදී ගැනීම පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දැනුවත් කළ අතර ඔවුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ අදාළ මිලදී ගැනීම සිදු වී ඇත්තේ චක්‍රලේඛය නිකුත් කළ කාල පරිච්ඡේදය තුළදී බැවින් එකී ජංගම දුරකථනවල මිල ගණන් අයකර නොගන්නා ලෙසය.
3.	**මූල්‍ය සමාලෝචනය**	
3.1	**මූල්‍ය ප්‍රතිඵලය**	
	ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ බදු පෙර ලාභය රු.187,126 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.163,129ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභය රු.23,997 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රක්ෂණ සමාගම් වලින් ලැබෙන වාර්ෂික ගාස්තු රු.35,563,169 ක් වැඩිවී තිබුණද රක්ෂණ ඔප්පු දරන්නන්ගේ අරමුදලට මාරුකිරීම් රු.20,687,991ක් අඩුවීමද සේවක පාරිශ්‍රමික රු.10,898,972 කින් හා මෙහෙයුම් වියදම් රු.4,127,872 ක් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී බදු පෙර ලාභය සියයට 38කින් අඩුවී තිබුණද නැවත එය 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේදී රු.42,311,901ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී රු.75,606,943 ක් දක්වා සියයට 79කින් වර්ධනය වී තිබුණි.	විශ්ලේෂණ සටහනකි.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
4.	**මෙහෙයුම් සමාලෝචනය**	
4.1	**කාර්ය සාධනය**	
	2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 3වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ අරමුණ හා වගකීම වන්නේ, ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, ගෞරවාන්විතවද, රක්ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්ෂණ සහතික දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂාවන වෘත්තීමය හා විචක්ෂණ ආකාරයෙන්ද, කරගෙන යනු ලබන බවට වගබලා ගැනීමයි. ඉහත සඳහන් අරමුණු ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.	
(අ)	රක්ෂිතයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන රක්ෂණ හිමිකම් ගෙවීමක් සම්බන්ධ ආරවුලකදී එය විමර්ශනය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල මණ්ඩලය සතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලද පැමිණිලි වලින් පැමිණිලි 41ක් 2016 ජුනි 27 දින වන විටත් විසඳා නොතිබුණි.	2015 වර්ෂයේ මණ්ඩලය වෙත යොමු කරන ලද පැමිණිලි වලින් 2016.06.27 දිනට විමර්ශන කටයුතු අවසන් නොවී තිබූ පැමිණිලි 41 සම්බන්ධ වත්මන් තත්ත්වය පහත දක්වා ඇත: ■ පැමිණිලි 11 - විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර අදාල නිර්දේශයන් (2016 අගෝස්තු මස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිතව ඇත. ■ පැමිණිලි 08 - විමර්ශන කටයුතු අවසන් කර ඇති අතර අදාල නිර්දේශයන් (2016 ජූලි මස අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේ දී) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත. ■ පැමිණිලි 05 - අදාල ආරවුල් නිරාකරණය වී ඇත. ■ පැමිණිලි 03 - වැඩිදුර විමර්ශන කටයුතු පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය තොරතුරු තෙවන පාර්ශවයෙන්ගෙන් ලැබීමට නියමිතය. ■ පැමිණිලි 05 - විමර්ශන කටයුතු ඉදිරියට පවත්වා ගෙන යෑමට අවශ්‍ය තොරතුරු රක්ෂණ සමාගම්වලින් ලැබීමට නියමිතය. ■ පැමිණිලි 04 - විමර්ශනයෙන් අනවාරණය වූ කරුණු පැමිණිලිකරුගේ අදහස් විමසීම සඳහා යොමු කරනු ලැබ ඇති අතර ඒ සඳහා ඔවුන්ගේ ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටී. ■ පැමිණිලි 05 - අදාල පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡාවන් පැවැත්වීමට කටයුතු යොදා ඇත.
4.	**මෙහෙයුම් සමාලෝචනය**	
4.1	**කාර්ය සාධනය**	
(ආ)	සමාලෝචිත වර්ෂය තුළදී රක්ෂණය හා රක්ෂණ කර්මාන්තය පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීමට කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 11කට ලිපි යොමුකර තිබුණද, ඒ තුළ නොවූ පාසලක දැනුවත් කිරීමේ එක් වැඩසටහනක් පමණක් සිදුකර තිබුණි.	රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීමේ අරමුණින්, පාසල් සිසුන් සඳහා රක්ෂණයේ වැදගත්කම මෙන්ම මූලික රක්ෂණ සංකල්ප පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කරන ලදී. මේ සඳහා අවස්ථාවක් ලබා ගැනීම සඳහා දිවයිනේ ප්‍රධාන පාසැල් (කොළඹ හා ඉන් පිට) ගණනාවකම විදුහල්පතිවරුන් දුරකථනය හරහා ඇමතූ අතර එහිදී ලැබුණු බහුතර ප්‍රතිචාරය වූයේ පාසැල්වල දැනටමත් ක්‍රියාත්මක විෂයානුබද්ධ හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සිසුන්ගේ හා ගුරුවරුන්ගේ කාලය යොදවා ඇති හෙයින් රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා වෙන්වූ අවස්ථාවක් ලබා දීමට අපහසු බවයි. විදුහල්පතිවරුන්ගේ මෙම ප්‍රතිචාරය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ආරම්භයක් වශයෙන් කොළඹ අවට තොරාගත් පාසැල්වලට අපගේ අරමුණ පැහැදිලි කරමින් සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට අවස්ථාව ඉල්ලමින් ලිපි යොමුකිරීමට තීරණය කෙරිණ. තවද, රක්ෂණ මණ්ඩලය මගින් දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වාගෙන යන ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අමතරව සැලසුම් කරන ලද වැඩසටහනක් වන බැවින්, ආරම්භයේදී වසරකට පැසැල් 2ක් හෝ 3ක් ඉලක්ක කර ඒවා පැවැත්වීම වඩා යෝග්‍ය බව හැඟුණි. වැඩසටහන් 2ක් හෝ 3ක් පමණක් සංවිධානය කිරීමේ අරමුණින් පාසැල් 11කට ලිපි යවන ලදී. එක් වැඩසටහනක් පවත්වා ඇත. කෙසේ වෙතත් මේ වන විට පවත්වා ඇති පාසැල් දැනුවත් කිරීමේ වැඩ සටහන් වලදී ලද අත් දැකීම් අනුව ප්‍රාදේශීය ලේකම් මට්ටමින් පවත්වාගෙන යන වැඩසටහන් වඩාත් පිරිවැය - ඵලදායී හා ප්‍රයෝජනවත් බව පෙනී ගොස් ඇත.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
4.	**මෙහෙයුම් සමාලෝචනය**	
4.1	**කාර්ය සාධනය**	
(ඇ)	වර්තමානයේ රක්ෂණ කර්මාන්තය තුළ භාවිතා කරනු ලබන නියාමන රාමුව (Regulatory Framework), රක්ෂණ අධිකාරීන්ගේ ජාත්‍යන්තර සංගමයේ (IAIS) රක්ෂණ මූලික මූලධර්ම (ICPS) සමඟ සංසන්දනය කර පාරිභෝගිකයාට සාධාරණ සැලකිල්ලක් (FTC) ලබාදීමට හැකිවන පරිදි නිර්මාණය කිරීම ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් එක් කාර්යයක් වුවද එය නිර්මාණය කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් කර සකස් කළ වාර්තාව 2015 දෙසැම්බර් 08 දින අධ්‍යක්ෂ මණ්ඩලයට අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණු නමුත් ඊට අදාළ ඉදිරි කටයුතු විගණිත දිනය වූ 2016 ජූනි 27 දින වන විටත් අවසන් කර නොතිබුණි.	විමර්ශන අංශයේ 2016 ක්‍රියාකාරී සැලැස්ම අනුව පාරිභෝගිකයාට සාධාරණ සැලකිල්ලක් (FTC) ලබා දීම සඳහා වන මාර්ගෝපදේශයන් සකස් කිරීමට නියමිතව ඇත. ඒ අනුව, 2015 දෙසැම්බර් 08 දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කළ නිර්දේශය අනුව, එකී මාර්ගෝපදේශයන් සැකසීමට අවශ්‍යව ඇති, රක්ෂණ සමාගම් හා අතරමැදි සමාගම් (intermediaries) විසින් දැනට ක්‍රියාත්මක කර ඇති අදාල ප්‍රතිපත්ති හා පරිචයන් පිළිබඳ තොරතුරු ලබාගැනීමට නියමිතව තිබුණි. ඒ අනුව, සියළු රක්ෂණ සමාගම් හා අතරමැදි ආයතන්ගෙන් අදාල තොරතුරු කැඳවා ඇති අතර මේ වන විට අදාල තොරතුරු ලැබෙමින් පවතී. එම තොරතුරු සමාලෝචනය කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් අදාල ඉදිරි කටයුතු සිදු කෙරෙනු ඇත.
4.2	**ආර්ථික නොවූ ගනුදෙනු**	
	අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා මුද්‍රණය කරන ලද පිරිවැය රු.2,277,122 ක් වූ වාර්ෂික වාර්තා පිටපත් 1,667ක් ඉතිරි වී තිබීම නිසා ඒ වෙනුවෙන් දරන ලද වියදම නිශ්ඵල වියදමක් වී තිබුණි.	වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීමේදී මාධ්‍ය තුනෙන්ම මුද්‍රණය සඳහා පොදු කාර්ය පිරිවැයක් දැරීමට සිදුවන අතර එය අදාළ මිළ කැඳවුමෙන් පැහැදිලිව නිරීක්ෂණය වේ. ඉංග්‍රීසි පිටපත් 350ක් සඳහා ඒකක පිරිවැය රු. 1,150/-ක් වන අතර සිංහල සහ දෙමළ පිටපත් 100 බැගින් මුද්‍රණය කිරීමේදී ඒකකයක පිරිවැය රු. 3,450/-ක් දක්වා ඉහළ ගොස් ඇත. ඒ අනුව ප්‍රමාණය අඩුවන විට ඒකක පිරිවැය වැඩිවන බව ඔබට මෙම මිළ ගණන් වලින් පැහැදිලි වනු ඇතැයි විශ්වාස කරන අතර මීට පෙර වර්ෂ වලදී මුද්‍රණය කරන ලද ඉංග්‍රීසි පිටපත් සංඛ්‍යාව 500 සිට 350 දක්වාත් සිංහල පිටපත් සංඛ්‍යාව 200 සිට 100 දක්වාත් අඩු කර 2014 වර්ෂය සඳහා මිළ ගණන් කැඳවා තිබීමෙන් මුද්‍රණය කරන ප්‍රමාණය අඩු කිරීමට දැනටමත් ක්‍රියාත්මක කර ඇති බව ඔබට පැහැදිලි වනු ඇත. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය වශයෙන් ගුණාත්මක තත්වයෙන් යුත් වාර්ෂික වාර්තාවක් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත නිකුත් කිරීම පෙරදැරි කරගෙන වාර්ෂික වාර්තා මුද්‍රණය සිදු කරන අතර එය ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව සිදුකොට ඇත. අන්ධ විද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවන් සඳහා බ්‍රේල් ක්‍රමයට පොත් සකස් කිරීමට මේ වන විට ප්‍රයෝජනයට නොගන්නා වර්ෂ කිහිපයකට අදාළ වාර්ෂික වාර්තා 1,667 ක් ලබාදෙන ලදී. මෙවැනි 120 gsm ඝනකමැති පිටු භාවිතයෙන් ඔවුනට අවශ්‍ය පොත් පත් බ්‍රේල් ක්‍රමයට සකස් කර ගතහැක.
4.	**මෙහෙයුම් සමාලෝචනය**	
4.3	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**	
(අ)	අත්පත්‍රිකා මගින් රක්ෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ පළමු හා දෙවන කාර්තුවල මුද්‍රණය කිරීමට සැලසුම් කර තිබූ ''සෞඛ්‍ය රක්ෂණය ගැන ඔබ දැනගත යුතු දේ හා රක්ෂණ ඔප්පු හිමියෙකු වශයෙන් ඔබගේ අයිතිවාසිකම් හා යුතුකම් හා අයිතිය පිළිබඳ දැනුවත් වන්න'' යන අත් පත්‍රිකා මුද්‍රණය කර තිබුණේ 2016 ජූලි මාසයේ වන අතර 2016 ජූලි 28 වන විටත් දැනුවත් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.	සැලසුම් කර තිබූ පරිදි, අදාළ අත්පත්‍රිකාවල ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ මූලික කෙටුම්පත් 2015 වසර මුල් භාගයේ දී පිළියෙල කෙරිණ. නමුත්, දිවයිනපුරා මෙම අත් පත්‍රිකා බෙදා හැරෙන නිසාත්, විශාල ප්‍රමාණයක් එකවර මුද්‍රණය කෙරෙන බැවින් අන්තර්ගතය ඉතා සැලකිල්ලෙන් තීරණය කළ යුතුව තිබූ නිසාත්, වරින් වර කර්මාන්තයේ සිදුවූ නියාමන අවශ්‍යතාවයන් හා භාවිතයන්ගේ වෙනස්කම් වලට අනුව මූලික කෙටුම්පත වරින්වර වෙනස්කිරීමට සිදුවූ නිසාත් සහ ක්ෂේත්‍රයේ නියාමන අධිකාරිය වශයෙන් ඒවායේ අන්තර්ගතය සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතුව තිබූ නිසාත් එම අත්පත්‍රිකාවන්හි අන්තර්ගතය සඳහා අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ කෙටුම්පත සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කර ගැනීමට බාහිර භාෂා පරිවර්තකයන්ගේ සේවය ලබාගන්නා ලදී. නමුත්, එම පරිවර්තනයන් අවශ්‍ය අදහස සන්නිවේදනය වන අයුරින් නැවතත් සමාලෝචනය කර අවසන් කරන විට 2016 පෙබරවාරි මස තෙක් කල් ගතවිය. ඉන් අනතුරුව ඒවා මුද්‍රණය සඳහා මිල ගනන් කැඳවීමෙන් පසුව තෝරාගත් මුද්‍රණකරු වෙත ටෙන්ඩරය 2016 අප්‍රේල් මාසයේදී ප්‍රදානය කරන ලදී. ඒ අනුව මේ වන විට අත්පත්‍රිකා මුද්‍රණය කිරීම නිම කර ඇත.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
4.3	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**	
(ආ)	රක්ෂණ කර්මාන්තයේ හා රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත උදෙසා රක්ෂණ ඔප්පු වැඩිදියුණු කිරීමේ අදහසින් සමාගම්වල රක්ෂණ නිපැයුම් සමාලෝචනයට ලක්කිරීම සඳහා වර්ෂය තුළ ගිනි රක්ෂණය පිළිබඳව නිර්දේශ සමාලෝචනය කිරීම තෝරාගෙන තිබුණද, වර්ෂය අවසාන වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි.	සැලසුම් කළ පරිදි ගිනි රක්ෂණ ඔප්පු සම්බන්ධයෙන් 2015 වසර තුළදී සමාලෝචනය කරන ලද අතර ඊට අදාළ නිර්දේශ ඇතුළත් වාර්තාව 2015 නොවැම්බර් මස වන විට පිළියෙල කරන ලදී. එහි අඩංගු නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර තව දුරටත් සමාලෝචනය කොට වැඩි දියුණු කිරීමේ අදහසින්, එම වාර්තාව ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයේ අදහස් විමසීම සඳහා යොමු කෙරුණු අතර ඒ සම්බන්ධයෙන් පැවැත්වුණු සාකච්ඡා වලින් අනතුරුව අදාළ නිර්දේශ ඇතුළත් වාර්තාවේ අවසන් කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා 2016 මාර්තු මස ඉදිරිපත් කෙරුණු අතර එසේ අනුමත වූ නිර්දේශයන් රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන සමාගම්වල අදහස් විමසීම සඳහා මේ වන විටත් යොමුකර ඇත.
(ඇ)	2009 වර්ෂයේදී මණ්ඩලය විසින් පෞද්ගලික රක්ෂණ සමාගමක් වෙත අත්හිටුවීමක් පණවා තිබුණු අතර ඊට අදාළ මූලික අයිතිවාසිකම් නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදුන් නියෝග ප්‍රකාර එම සමාගම වෙත ඉදිරිපත් කරනු ලබන අව්‍යාජ රක්ෂණ හිමිකම් පෑම් ක්‍රමවත්ව බේරුම් කිරීමට එකී සමාගමේ වත්කම් බැහැර කිරීම සඳහා මණ්ඩලය විසින් 2012 ජූලි 06 දින, සමාගම සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹී තිබුණි. ඒ අනුව ඉදිරිපත් කර තිබූ අව්‍යාජ හිමිකම් පෑම් 142න් කිසිම වන්දි හිමිකම් පෑමක් විගණිත දිනය වූ 2016 ජූනි 16 දින වන විටත් නිරවුල් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.	අදාළ සමාගම සඳහා නව අධ්‍යක්ෂවරයෙක් පත් කිරීම සඳහා කරන ලද ඉල්ලීම සලකා බැලීමේදී, මණ්ඩලය විසින් 2013 පෙබරවාරි 07 දිනැති ලිපිය මගින් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සහතික පිටපතක් එකී සාංගමික ව්‍යවස්ථාව අනුව (සමාගම් ලේකම් විසින් සහතික කරන ලද) නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියාපටිපාටිය හා නව අධ්‍යක්ෂවරුන් පත් කිරීමට මණ්ඩලයේ අනුමතියට එවීමේදී පනතේ 33 ඊ (1) වගන්තිය ප්‍රකාරව සැපයිය යුතු ලියවිලි එවන ලෙස දන්වන ලදී. ඊට පිළිතුරු එවීමට සමාගම ප්‍රමාද වු හෙයින්, 2013 අප්‍රේල් 3 දින සිහිකැඳවීමක් යවන ලදී. සමාගමේ පිළිතුරු අප වෙත ලැබුණේ 2013 මැයි 8 වන දිනය. සපයන ලද තොරතුරු වල තිබූ අඩුපාඩු හා නව අධ්‍යක්ෂවරිය පත්කිරීමට අදාල සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවලියේ පිටපතක් ඉල්ලා 2013 අප්‍රේල් 02 වන දින නැවත සමාගම වෙත ලියන ලදී. ඊට අමතරව දැනට මෙම සමාගමේ එක් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු පමණක් සිටින නිසා නව අධ්‍යක්ෂවරයෙකු පත් කර ගැනීමට හැකි වන පරිදි සාංගමික ව්‍යවස්ථාව වෙනස්කර එය සමාගම් රෙජිස්ට්‍රාර් මගින් සහතික කර අප වෙත ඉදිරිපත් කරන ලෙසටද දැනුම් දෙන ලදී. සමාගම ඊට පිළිතුරු යොමු කර ඇත්තේ 2015 ජූලි 02 වන දිනය. කෙසේ නමුත් සංශෝධිත සාංගමික ව්‍යවස්ථාව සමාගම් රෙජිස්ට්‍රාර් සහතික කර නොතිබූ නිසා එය සහතික කර එවන ලෙස 2015 අගෝස්තු 05 දින සමාගම වෙත දැනුම් දී ඇත. කෙසේ නමුත්, 2007 සිට 2014 දක්වා වාර්ෂික ගිණුම් වාර්තා සමාගම් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කිරීමට එම සමාගම අපොහොසත් වීම හේතු කොටගෙන, සමාගමේ ලේඛණ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කිරීමේ ගැටළු සහගත තත්වය මත නව අධ්‍යක්ෂවරයා පත් කිරීමට අදාලව අනුමැතිය ලබා දීමට මණ්ඩලයට මේ දක්වා නොහැකි වී ඇත. කරුණු එසේ හෙයින්, මේ පිළිබඳ වර්තමාන තත්ත්වය විමසා සමාගම වෙත 2016 ජූලි මස ලිපියක් යැවීමට බලාපොරොත්තු වන අතර ඊට සමාගම ප්‍රතිචාර නොදැක්වුවහොත්, සමාගම ඈවර කිරීමට, රක්ෂණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. තවද, දැනට සමාගමේ එක් ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු පමණක් සිටින හෙයින් හිමිකම් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව එකී සමාගම සමග කටයුතු කිරීමට හැකි වනුයේ සාංගමික ව්‍යවස්ථාව සංශෝධනය කිරීම තුලින් නව අධ්‍යක්ෂවරයෙකු පත් කර ගැනීමෙන් අනතුරුවය.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
4.3	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**	
(ඈ)	මණ්ඩලය විසින් 2012 අප්‍රේල් 22 දින පල කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, රක්ෂණ තැරැව්කරුවන් ලියාපදිංචි කිරීම අත්හිටුවා තිබුණු අතර එය 2016 මාර්තු මාසය වන විටත් ඉවත් කර නොතිබියදී සාමාන්‍ය රක්ෂණය සඳහා පමණක් ලියාපදිංචි වී තිබූ එක් රක්ෂණ තැරැව්කාර සමාගමක් වෙත දීර්ඝ කාලීන රක්ෂණය සඳහා 2015 මැයි මාසයේ සිට ලියාපදිංචිය ලබා දී තිබුණි. 2015 මැයි මාසයේ සිට 2016 මැයි මාසය දක්වා වසරක කාලයක් තුළ එම සමාගම දීර්ඝ කාලීන රක්ෂණය සඳහා ක්‍රියාකාරී නොවුණද, 2016 වර්ෂය සඳහා ලියාපදිංචිය අළුත් කිරීමක්ද සිදු කර තිබුණි.	114 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයකට අනුව 2012, අප්‍රේල් මස 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, නව රක්ෂණ තැරැව්කාර සමාගම් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් භාරගැනීම, මණ්ඩලය විසින් තාවකාලිකව අත්හිටුවන ලදි. එසේ නමුත්, ඒ වනවිටත් එක් රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයක් සඳහා ලියාපදිංචිය ලබාගෙන තිබූ රක්ෂණ තැරව්කාර සමාගම් (ජීවිත හෝ සාමාන්‍ය) කීපයක් විසින් අනෙක් රක්ෂණ තැරව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචිය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ අවස්ථාවල දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරුණු සලකා බලා, අදාල ලියාපදිංචිය ලබාදෙන ලදි. මෙම සමාගම විසින් දීර්ඝ කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචිය ලබා ගැනීම සඳහා 2014 නොවැම්බර් මසදි රක්ෂණ මණ්ඩලය වෙත අයදුම්පතක් ඉදිරිපත් කරන ලදී. මෙම සමාගම ඒ වන විට, එනම් 2007 ජුලි 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය රක්ෂණ තැරුව්කාර ව්‍යාපාරයේ නියැලීම සඳහා මණ්ඩලයේ ලියාපදිංචිය ලබා ගෙන තිබූ සමාගමකි. එහෙයින්, ඔවුන්ගේ අයදුම්පතට ඉඩ දෙමින් හා ඔවුන් විසින් 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත (පනත) අදාල අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති නිසා, 148 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයකට අනුව 2015 මැයි මස 20 වන සිට 2016 මැයි මස 19 දක්වා වු කාලයට, එකී සමාගම වෙත දීර්ඝකාලීන රක්ෂණ තැරුව්කාර ව්‍යාපාරයේ නියැලීමට ලියාපදිංචිය ලබා දෙන ලදී. 2016 වර්ෂය සඳහා දීර්ඝකාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචිය අළුත් කිරීමට, සමාගම විසින් 2016 මාර්තු මස රක්ෂණ මණ්ඩලය වෙත අයදුම්පත් ඉදිරිපත් කළ අවස්ථාවේදී, එකී සමාගම 2015 මැයි සිට 2016 අප්‍රේල් දක්වා වු ඔවුන්ගේ පළමු වසර සඳහා දීර්ඝ කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරයෙහි යෙදී නොතිබුණ බව නිරීක්ෂණය කරන ලදි. ඒ අනුව ඒ පිළබඳව කරුණු පැහැදිලි කරන ලෙස 2016 අප්‍රේල් 11 දිනැති ලිපිය මගින් දන්වන ලදි. ඊට පිළිතුරු වශයෙන් 2016 අප්‍රේල් 18 දිනැති ලිපිය මගින් පහත කරුණු දන්වා ඇත. 1) මෙම සමාගම විසින් දීර්ඝ කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචි වුයේ, සමාගමේ ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමේ අරමුණ ඇතිව බවත්, 2) අදාල කාලසීමාව තුළදී සමාගම වෙත සාමාන්‍ය රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා අළුත් ව්‍යාපාර අවස්ථා රාශියක් ලැබුණ හෙයින් ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවු බවත්, 3) සමාගම විසින් පළපුරුදු උපදේශක්වරයෙක් හා නියෝජිත වරයෙක් දීර්ඝ කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා බඳවා ගෙන ඇති බවත්, අප්‍රේල් මාසය තුළදී ලාෆ්ස් සමාගමේ Group life insurance හා වෙතත් තනි පුද්ගලයෙකුගේ ජීවිත රක්ෂණ ඔප්පුව පිළිබඳව කටයුතු කිරීමට අවස්ථාව ලැබුණ බවත්, 4) අළුත් ගනුදෙනු කරුවන්ගේ හා සේවකයන්ගේ පහසුව තකා තම ව්‍යාපාර ආයතනය විශාල කර ඇති බවත් දන්වා ඇත. මෙකී කරුණු සලකා බලා, දීර්ඝ කාලීන රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරය සඳහා ලියාපදිංචිය අළුත් කරන ලදී.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
4.3	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**	
(ඉ)	මණ්ඩලය විසින් අධීක්ෂණය කෙරෙමින් පැවතුණ නුබුන්වත් ආන්තික නීතිවලට (Solvency Test) හා අවදානම් පාදක ප්‍රාග්ධන (RBC) ආකෘති රීති අනුව සියලුම රක්ෂකයන් විසින් අවම නුබුන්වත් ආන්තිකයක් පවත්වා ගතයුතු වුවද මුළු ප්‍රාග්ධන වටිනාකම දිගින් දිගටම පහත වැටී තිබුණු සමාග මක් හා නුබුන්වත් බව පිළිබඳ අනුපාතය (Solvency Ratio), 2015 වර්ෂයේදී පවත්වා ගතයුතු මට්ටමට වඩා අඩු මට්ටමක පැවති සමාගමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	මෙහි සඳහන් පළමු සමාගමෙහි මුළු ප්‍රාග්ධන පහත වැටීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් 2015.10.20, 2015.11.12, 2015.12.01 දින සහ 2015.12.17 දිනයන්හි දී විමසීම් කර ඇත. 2016.01.01 සිට බලපැවැත්වෙන අවදානම් පාදක අධීක්ෂණ (Risk Based Capital) නීතිවලට අනුකූලව සමාගම් විසින් රුපියල් මිලියන 500කට වඩා මුළු ප්‍රාග්ධනයක් (Total Available Capital) පවත්වා ගත යුතු නිසා ඒ පිළිබඳව සවිස්තරාත්මක ප්‍රාග්ධන පුරෝකතනයක් (Capital Plan) සමාගමෙන් මණ්ඩලය ලබාගෙන ඇත. මණ්ඩලය විසින් මෙම ප්‍රාග්ධන පුරෝකතන ලබාගෙන ඇත්තේ 2016.06.30 දින වන විට මුළු ප්‍රාග්ධනය රුපියල් මිලියන 500ට හෝ ඊට වැඩි අගයකට පත්කර ගැනීමට සමාගම විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් දැන ගැනීම සඳහා වන අතර මේ පිළිබඳව දිගින් දිගටම අධීක්ෂණය කෙරේ. මෙම සමාගම සම්බන්ධයෙන් පනත යටතේ දැනටමත් ක්‍රියාකර ඇත. මෙහි සඳහන් දෙවන සමාගමෙහි නුබුන්වත් බවේ අනුපාතය (Solvency Ratio) 2015 වසර තුළදී පවත්වාගෙන යා යුතු මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත. මණ්ඩලය විසින් වසර 2000 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 57 වන වගන්තිය යටතේ මාසික වාර්තා ඉදිරිපත් කිරීමට සමාගම වෙත නියම කරන ලද්දේ ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීම සඳහාය. තවද මණ්ඩලය විසින් 2015.10.16 වන දින පෞද්ගලික ව්‍යවසාය සංවර්ධන අමාත්‍යංශය වෙත මෙම සමාගමේ පවත්නා ගැටළු සම්බන්ධයෙන් දන්වා යවා ඇත. තවද මණ්ඩලය විසින් 2016.04.06 වන දින මෙම සමාගමේ කොටස් හිමි ආයතනය වෙත ද මෙම ගැටළු සම්බන්ධයෙන් දන්වා යවා ඇත. තවද 2016.01.01 දින සිට බලපැවැත්වෙන අවදානම් පාදක අධීක්ෂණ නීතිවලට අනුකූලව සමාගමේ ප්‍රාග්ධන පුරෝකථනයන් මණ්ඩලය වෙත 2016.06.16 දින වන විට ඉදිරිපත් කරන මෙන් දන්වා යවා ඇත. එය අධ්‍යයනය කර බලා සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට මණ්ඩලය කටයුතු කරනු ඇත.
(ඊ)	ආයතනයක් විසින් සමාලෝචිත වර්ෂයට අදාළ කාර්තුමය වාර්තා හා අනුකූලතා සහතික (Compliance Certification) මණ්ඩලය වෙත ලබාදී නොතිබුණු නමුත් මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාළ ආයතනය ඔවුන්ගේ 2015 වර්ෂයට අදාල කාර්තුමය වාර්තා හා අනුකූලතා සහතික ආදිය මණ්ඩලය වෙත ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් ඔවුන් වෙත ලිඛිතව දන්වා යවා ඒවා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. උදාහරණ වශයෙන් මණ්ඩලයේ 2015.09.02 දින ලිපිය මඟින් 2015 වසරේ 1වන හා 2වන කාර්තුමය වාර්තා ඉදිරිපත් කරන ලෙස දන්වා යවා ඇත. ඒ කෙසේ වෙතත් එම ආයතනය 2015 වර්ෂයට අදාල ඉහත සඳහන් වාර්තාවන් යොමු කොට නොමැත. අදාළ ආයතනය 2016 වසරේ 1වන කාර්තුව සඳහා මණ්ඩලය මඟින් අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝගයක් නිකුත් කිරීමෙන් අනතුරුව අදාල කාර්තුමය වාර්තාව මණ්ඩලය වෙත 2016.06.20 දින ඉදිරිපත් කර ඇත.
(උ)	රක්ෂකයන් විසින් ආයතනවල සිදු කරනු ලබන විමර්ශන සඳහා පොදුවේ භාවිතයට ගතහැකි මාර්ගෝපදේශන සංග්‍රහයක් සකස් කිරීමට සැලසුම් කර තිබුණද, ඊට අදාළ සංශෝධිත කෙටුම්පත් වාර්තාව 2016 ජුනි 14 දින රක්ෂණ කර්මාන්තයට සම්බන්ධ පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනීමට යොමු කර තිබීම නිසා විගණිත දිනය වූ 2016 ජුනි 27 දින වන විටත් එය ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතුණි.	2016 ක්‍රියාකාරී සැලැස්මට අනුව 2015 වසරේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, රක්ෂකයන්ගේ වන්දි ඉල්ලීම් සලකා බැලීමේදී පවත්වනු ලබන විමර්ශන වලට අදාල මාර්ගෝපදේශයන් ඔවුන්ගේ අදහස් විමසීමෙන් පසුව, සමාලෝචනය කිරීමට නියමිතව ඇත. ඉන් අනතුරුව අවසන් මාර්ගෝපදේශයන් නිකුත් කිරීමට සැලසුම් කර ඇත. මූලිකව 2015.12.01 දිනැති ලිපිය මගින් රක්ෂණ සමාගම්වල අදහස් විමසන ලද අතර ඔවුන්ගේ අදහස් 2016.01.06 දින ලැබී තිබුණි. එකී අදහස් දීර්ඝ ලෙස අධ්‍යනය කොට විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව 2016.04.27 දිනැති ලිපිය මගින් සමාලෝචිත මාර්ගෝපදේශයන් නැවතත් අදහස් විමසීම සඳහා රක්ෂණ සමාගම් වෙත යොමු කරන ලදී. ඒ සඳහා නැවතත් සමාගම්වල ප්‍රතිචාරය 2016.05.16 දින ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත යොමු කර ඇති අතර, එකී අදහස් වල පිළිගතහැකි බව හා අදාල අනෙකුත් නෛතික කරුණු පිළිබඳ විමසා බැලීමෙන් පසුව මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමුකර ඇත.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
4.3	**මෙහෙයුම් අකාර්යක්ෂමතා**	
(එ)	රක්ෂකයන් විසින් හිමිකම් පෑම් ඉල්ලීම් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් හරහා විමර්ශනයන් විධිමත්ව සිදු කිරීම සඳහා 2013 වර්ෂයේ සිට මණ්ඩලය සැලසුම් කර තිබුණද, ඊට අදාළ කෙටුම්පත් මාර්ගෝපදේශන සංග්‍රහයට අවසන් අනුමැතිය 2016 ජූලි 28 දින වන විටත් ලැබී නොතිබුණි.	රක්ෂණ සමාගම් හා අතරමැදි සමාගම් විසින් පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීමේ ක්‍රමවේදයට අදාල කෙටුම්පත් කරන ලද මාර්ගෝපදේශයන්, 2015.10.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද අතර එය රක්ෂණ සමාගම් හා අතරමැදි සමාගම්වල අදහස් විමසීම සඳහා 2015.11.04 වන දින යොමු කර ඇත. අදාල මූලික ප්‍රතිචාර 2015.11.20 හා 2015.12.04 වන දිනයන්හි දී ලැබුණු අතර ඔවුන්ගේ අදහස් හා යෝජනා දීර්ඝ ලෙස අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඊට අදාල ප්‍රතිචාර 2016.02.15 හා 2016.04.27 යන දිනයන් හි දී යොමු කර ඇත. අදාල මාර්ගෝපදේශයන් කෙටුම්පත් කිරීම අවසන් කිරීමට අවශ්‍යව තිබූ වැඩි දුර තොරතුරු රක්ෂණ සමාගම් වෙතින් 2016.07.06 වන දින මණ්ඩලය වෙත යොමු කර ඇත. ඒ අනුව පවත්නා මාර්ගෝපදේශයන් තව දුරටත් සමාලෝචනය කිරීමෙන් අනතුරුව 2016 තුන්වන කාර්තුව තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත.
4.4	**කාර්ය මණ්ඩල පරිපාලනය**	
	පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.	
(අ)	මණ්ඩලයේ තනතුරුවලට අදාල බඳවාගැනීමේ පටිපාටිය සඳහා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	බඳවාගැනීමේ පටිපාටිය භාණ්ඩාගාරය වෙත පරිපාලන අත්පොත සමඟ මීට පෙර ඉදිරිපත් කර ඇත.
(ආ)	පුරප්පාඩුව පැවති අධ්‍යක්ෂ (නීති හා බලාත්මක කිරීම) තනතුර සඳහා 2015 මැයි 18 දින කොන්ත්‍රාත් පදනම මත නිළධාරියෙකු බඳවාගෙන තිබුණු අතර මෙම බඳවා ගැනීමට අදාලව පල කරන ලද පුවත්පත් දැන්වීමේ වයස් සීමාව ''අවුරුදු 35 සිට 50'' දක්වා යනුවෙන් සඳහන් කර තිබුණි. මේ සඳහා ලැබුණු අයදුම්පත් අතුරින් සුදුසුකම්ලත් නිලධාරින් 9 දෙනෙකු වූ අතර ඒ අතුරින් ස්ථිරව නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු නොකොට වයස අවුරුදු 33 ක නිලධාරියෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.	අධ්‍යක්ෂ (නීති හා බලාත්මක කිරීමේ) තනතුර සඳහා පැවැත් වූ සම්මුඛ පරීක්ෂණයේදී වෙනත් සුදුසු අයැදුම්කරුවකු නොසිටි බැවින් කොන්ත්‍රාත් පදනම මත අදාළ නිලධාරියා බඳවා ගැනීම කරන ලදී.
(ඇ)	බඳවාගැනීමේ පරිපාටියෙන් බැහැරව 2012 ඔක්තෝම්බර් මාසයේ සිට 2016 පෙබරවාරි 29 දින දක්වා විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කළ ගිවිසුමක් මත ජීවගණක උපදේශක තනතුර සඳහා නිළධාරිනියක් බඳවා ගෙන තිබුණි. ඇයගේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන 2012 ඔක්තෝම්බර් සිට 2015 දෙසැම්බර් දක්වා එකතුව රු.7,514,871 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.	ජීවගණකවරියගේ පැමිණීම පෙන්වීමට සාක්ෂි වශයෙන් අදාල ගුවන් ටිකට්පත් හා නවාතැන් පහසුකම් වලට නිකුත් කරනු ලැබූ බිල්පත් ඉදිරිපත් කළ හැකිය.
(ඈ)	අනුමත තනතුරක් නොවූ ජීවගණක තනතුර සඳහා 2015 ජූනි සිට 2016 ජූනි මාසය දක්වා මාසිකව රු. 15,000 ක දීමනාවක් මත නිලධාරියෙකු බඳවාගෙන සිටියදී බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව 2016 ජනවාරි 01 දින සිට මාසිකව රු. 200,000 ක දීමනාවක් ගෙවීමට වසර 02ක කාලයක් සඳහා පුද්ගලයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.	මෙම නිලධාරියා සේවයට බඳවා ගෙන ඇත්තේ ආධුනිකයෙකු (Intern) ලෙසටයි. මෙම ආධුනිකයා ජීවගණක අංශයට අදාළ මූලික තොරතුරු විශ්ලේෂණය සිදුකරනු ලැබේ. මණ්ඩලයට ජීවගණක ඒකකයක් ඇතිකිරීමේ බලාපොරොත්තුවද පවතින බව දැන්වීමට කැමැත්තෙමු. රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනය ලෙස සහ මෑත කාලීනව සිදු වූ වෙනස්කම්, ප්‍රධාන වශයෙන් අවදානම් පාදක ප්‍රාග්ධන ක්‍රමයකට යොමුවීම, අවදානම් පාදක ප්‍රාග්ධන සුපරීක්ෂණය, රක්ෂණ ආයතන වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි වීම යන කරුණු හේතුවෙන් පූර්ණ කාලීන වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලත් ජීවගණකවරයෙකු (Actuary) සිටීම අත්‍යාවශ්‍ය කරුණකි. එහෙත් ශ්‍රී ලංකාව තුළ අවශ්‍ය වෘත්තීය දැනුමෙන් පරිපූර්ණ හා අවශ්‍ය වෘත්තීමය සුදුසුකම්ලත් ජීවගණකවරයෙකුගේ සේවය ලබා ගැනීමේ පැවති දුෂ්කරතාවය හේතුවෙන් 2012 වසරේ සිට උපදේශනාත්මක සේවයක් ලෙස ඉන්දියාවේ ජීවගණකවරියකගේ සේවය මණ්ඩලය විසින් ලබා ගන්නා ලදී. එහෙත් පූර්ණකාලීන ජීවගණකවරයෙකු නොමැතිව අදාළ රාජකාරීන් ඉටුකර ගැනීමේදී මණ්ඩලයට මුහුණ පෑමට සිදුවූ විවිධ ප්‍රායෝගික අපහසුතා සලකා බැලීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාළ ක්ෂේත්‍රයේ පූර්ණ වෘත්තීය සුදුසුකම් (Fellow of the Institute and Faculty of Actuaries) හා දැනුමෙන් පරිපූර්ණ මෙරට ජීවගණකවරියකගේ සේවය 2016.01.01 දින සිට කොන්ත්‍රාත් පදනම මත ලබා ගැනීමට තීරණය කළේය.

විගණකාධිපති විසින් මතුකළ කරුණුවලට මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම

	විගණකාධිපති වාර්තාව	ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වීම
5	**ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**	
5.1	**ක්‍රියාකාරී සැලැස්ම**	
	2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වන ඡේදය ප්‍රකාරව, අදාළ පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවද, මණ්ඩලය විසින් ක්‍රියාකාරී සැලැස්ම එසේ සකස් කර නොතිබුණි.	ඔබගේ ලිපිය මගින් විස්තර කර ඇති 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වන ඡේදයට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම සහ අනිකුත් අවශ්‍යතා සපුරමින් 2015.12.11 දින ඔබ වෙත භාරදී ඇත. පෙර වසරවලදී ආයතනික සැලැස්ම ඉදිරිපත් කළද, උක්ත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික සැලැස්ම පිළියෙල කරන ලද අතර එමගින් දිගු කාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් 2015 වසරට අදාළ කොටස් ඉදිරිපත් කර ඇත.
5.2	**අයවැය ලේඛනමය පාලනය**	
	සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ අයිතම් 53 ක අයවැයගත හා තථ්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 100 දක්වා අධි ප්‍රතිපාදනයන් පැවතීමෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.	මණ්ඩලයේ පාලනයෙන් බැහැර හේතූන් නිසා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රවර්තන වර්ෂයේ සත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී විචලතාවන් දක්නට ලැබෙන අතර එකී විචලනයන් හැකිතාක් දුරට අවම කරමින් අයවැය ලේඛනය පිළියෙල කිරීමට මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම දරයි.
6.	**පද්ධති හා පාලනයන්**	
	විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.	අප විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පමණක් ඔබගේ උපදෙස් සැලකිල්ලට ගෙන විශේෂ අවධානය යොමු කරනු ලැබේ.
පද්ධති හා පාලන ක්ෂේත්‍ර හා නිරීක්ෂණ		
(අ)	අරමුදල් පාලනය අරමුදලට අදාළ නොවන වියදම් පියවා ගැනීම හා ඉදිරියේදී දැරීමට සිදු වන වියදම් සඳහා මුදල් වෙන් කිරීම	
(ආ)	කාර්ය මණ්ඩල පරිපාලනය ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහ ැනිව හා පත්වීම් දින නොසලකා වැටුප් වර්ධක ගෙවීම.	
(ඇ)	ආදායම් පාලනය (i) අනුමැතියකින් තොරව වාර්ෂික ගාස්තු ආපසු ගෙවීම. (ii) ආදායම් උපචිත පදනම මත හඳුනා නොගැනීම	

පරිශිෂ්ඨය I

2015 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්

අංකය	රක්ෂණ සමාගම	ව්‍යාපාර කටයුතු වර්ගය
1	ඒඅයිඒ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
2	ඒඅයිඒ ඉන්ෂුවරන්ස් ලංකා පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
3	ඒඅයිජී ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
4	ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
5	ඇලියොන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
6	අමානා තකාෆුල් ලයිෆ් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
7	අමානා තකාෆුල් පීඑල්සී	සාමාන්‍ය රක්ෂණය
8	ආර්පිකෝ ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
9	ඒෂියන් එලායන්ස් ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
10	ඒෂියන් එලායන්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
11	සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
12	සෙලින්කෝ ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
13	කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
14	කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
15	කෝප් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
16	එච්එන්බී ඇෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
17	එච්එන්බී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
18	ජනශක්ති ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
19	ජනශක්ති ඉන්ෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය
20	ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
21	එල්ඕඑල්සී ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
22	එල්ඕඑල්සී ලයිෆ් ඇෂුවරන්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය
23	එම්බීඑස්එල් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
24	ජාතික රක්ෂණ භාර අරමුදල	සාමාන්‍ය රක්ෂණය
25	ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
26	පීපල්ස් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
27	සීමාසහිත සණස රක්ෂණ සමාගම	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
28	ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
29	යූනියන් ඇෂුවරන්ස් ජෙනරල් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
30	යූනියන් ඇෂුවරන්ස් පීඑල්සී	දිගුකාලීන රක්ෂණය

පරිශිෂ්ඨය II

2015 දෙසැම්බර් 31 දිනට 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති රක්ෂණ තැරැව්කාර සමාගම්

අංකය	රක්ෂණ තැරැව්කරු	ව්‍යාපාර කටයුතු වර්ගය
1	ඒවීම්ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
2	ඒඩීඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
3	එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
4	ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
5	ඇලියෝන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
6	ඇම්ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
7	ඇක්විලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
8	අසෙකි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
9	ඇසට්ලයින් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
10	ඇක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
11	බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
12	සියෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
13	සීලාන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
14	සිනර්ජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
15	සීඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
16	කලම්බුරේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
17	කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
18	දයාසරණ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
19	ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
20	ඊඒපී - ආර්එම්එස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
21	ඉක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
22	එසාජි කර්මිජි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
23	ෆින්ලේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
24	ෆෝසයිට් ඉන්ෂුවරන්ස් ඇන්ඩ් රිඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
25	ජෝර්ජ් ස්ටුව(ර්)ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
26	ග්ලෝබල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
27	ග්‍රෑන්ඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
28	ගාඩියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
29	ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
30	ජේ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
31	ජේඑෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
32	එල්එම් ඇන්ඩ් ඩී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
33	ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
34	ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය

පරිශිෂ්ඨය II

35	මැක්වුඩ්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
36	මැක්ස්වෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
37	මර්කන්ටයිල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
38	මයි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
39	නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
40	ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
41	ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
42	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
43	ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
44	රෙඩ්මෝ ස්විස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
45	රියලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
46	රින්කූන් ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
47	සැම්සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
48	සේනාරත්න ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
49	සෙංකඩගල ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
50	ස්ට්‍රැටර්ජික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
51	ට්‍රස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
52	යූඑන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
53	යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සාමාන්‍ය රක්ෂණය
54	වෙරාසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
55	වික්ටර් එමානුවෙල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
56	වොලන්කා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය
57	සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	දිගුකාලීන රක්ෂණය සහ සාමාන්‍ය රක්ෂණය

පාරිභාෂික ශබ්ද මාලාව

සමුච්චිත වීම
එක් සමාගමක් සමඟ පවතින සැලකිය යුතු රක්ෂිත හෝ ප්‍රාරක්ෂිත අවදානම් සංඛ්‍යාවක් පාඩු ලබන සිදුවීමක් නිසා එක්වර පීඩාකාරී බවට පත්වන තත්ත්වයකි.

අත්කර ගැනීමේ වියදම්
අභිනව රක්ෂණ ගිවිසුම් අත්කර ගැනීම සහ දැනටමත් පවත්නා රක්ෂණ ගිවිසුම් අළුත්කිරීම (උදා :- කොමිස් මුදල්) යන අවස්ථාවලදී වෙනස්වීම්වලට ලක්වන සහ එයට මූලික වශයෙන් සම්බන්ධතාවක් දක්වන සියළු වියදම්.

ජීවගණකඥ
රක්ෂණය, ආයෝජනය මූල්‍ය කළමනාකරණය සහ ප්‍රජා විද්‍යාව ආශ්‍රිත ගැටළුවලට සම්භාවිතා සහ සංඛ්‍යානමය සිද්ධාන්ත යොදා ගන්නා විශේෂඥයෙකි.

පරිපාලන වියදම්
දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදන සහ සේවක පිරිවැය සහිතව වාරික එකතු කිරීමේ දී ආයෝජන කළඹ පරිපාලනයේ දී ජනනය වන පරිපාලන ස්වභාවයේ වියදම්.

ආවේශ්‍යතා දැක්විය හැකි වත්කම්
රක්ෂකයාගේ ව්‍යවස්ථාපිත නුබුන්වත්භාවය නිශ්චය කිරීමේ දී ඇතුළත් කරනු ලබන වත්කම්, මෙවැනි වත්කම් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමන පනතෙහි නිශ්චිතව දක්වා තිබේ.

වාර්ෂිකය
යම් කිසි නිශ්චිත කාලසීමාවක් සඳහා වාර්ෂිකලාභියාගේ ආයු කාලය මුළුල්ලේ හෝ වාරමය වශයෙන් ආදායම් ප්‍රතිලාභ ගෙවන ජීවිත රක්ෂණයකි. විලම්භිත හා ක්ෂණිකව ක්‍රියාත්මක වන යනුවෙන් වන මූලික වශයෙන් වර්ග දෙකකට අයත් වාර්ෂික පවතියි. ගෙවීම් සිදුකිරීම යම්කිසි අනාගත කාලයකදී ආරම්භ වන්නේනම් එය විලම්භිත වාර්ෂිකය නම්වේ. ගිවිසුම ආරම්භ වන අවස්ථාවේදීම අදාල ගෙවීම් සිදුකිරීම අරඹන්නේනම් එය ක්ෂණික වාරිකය නම්වේ.

බැංකු ගණුදෙනුකරුවන් සඳහා වූ රක්ෂණ ඔප්පු
බැංකු ගණුදෙනුකරුවන් සඳහා වූ රක්ෂණ සහ ආයෝජන ප්‍රතිලාභ ගෙනදෙන්නාවූ රක්ෂණ ඔප්පු අලෙවි කිරීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.

ප්‍රතිලාභිය
ඔප්පු හිමියාගේ මරණයක දී රක්ෂිත මුදල් සහ අනෙකුත් ප්‍රතිලාභ ලැබිය යුතු ආදායකයා ලෙස ඔප්පු හිමියා විසින් නම් කරනු ලබන පුද්ගලයා.

ප්‍රතිරක්ෂිතයා
ප්‍රතිරක්ෂණ සමාගමක සේවාදායකයෙක්. (ප්‍රාථමික රක්ෂණ සමාගම)

හිමිකම් පෑම
දේපල විනාශ වීම හෝ හානි වීම සහ ඒ ආශ්‍රිත මරණය හෝ තුවාල සිදුවීම, ආරෝග්‍යශාලා හෝ වෛද්‍ය බිල්පත් දැරීම. රක්ෂිතයාගේ මරණය හෝ ආබාධිතවීම, උපපාදන ඔප්පුවක් කල් පිරීම, විශ්‍රාමික වයසට පත්වීම යනා දී ආකාරවලට රක්ෂණයට බඳුන් වූ කාරණය සිදුවීම හේතු කරගෙන හෝ ඔප්පුවක් පවාරණය කිරීමේ දී රක්ෂණ ගිවිසුම පරිදි ගෙවිය යුතු මුදල.

දරන ලද හිමිකම් පෑම
වර්ෂය ආරම්භයේ දී සහ වර්ෂය අවසානයේ දී හිඟ තබා ඇති හිමිකම්පෑම් සඳහා වූ ප්‍රතිපාදන වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවල දී ගැලපීම් කළ පසු ගිණුම් වර්ෂයක් තුළ හිමිකම් පෑම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට දරන වියදම සහිතව ගෙවන ලද මුළු හිමිකම් පෑම් වටිනාකම.

දරන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් පෑම්
දේපල, වගකීම් සහ මූල්‍ය යන රක්ෂණ පිළිබඳව සිදුවී ඇති නමුත් රක්ෂකයා වෙත තවමත් වාර්තා කරනු ලැබ නැති අලාභ ආවරණය කිරීම සඳහා දැරීමට සිදුවනු ඇතැයි අපේක්ෂිත පිරිවැය නිරූපණය කරමින් වර්ෂය අවසානයේ දී ඇති කරනු ලබන සංචිතයකි.

හිඟ සිටි හිමිකම් පෑම් සංචිතය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
සිදු වූ නමුත් වාර්තා කරනු ලැබ නොතිබූ හිමිකම් සහ ඒවා පිළිබඳව කටයුතු කිරීමේ දී දරන්නට සිදුවන පිරිවැය සහිතව ශේෂ පත්‍ර දිනය වන විට වී ඇති සිද්ධි වෙනුවෙන් ඒවා ආවරණය කිරීමට දැරිය යුතු ඇස්තමේන්තුගත පිරිවැයෙන් එවැනි හිමිකම් පෑම් සඳහා මේ වන විටත් ගෙවා ඇති මුදල අඩු කළ පසු ලැබෙන අගය.

සහභාග රක්ෂණය
නිශ්චිත වාර මුදල් එකඟ වුණු අනුපාතයක් මත ගෙවීමේ පදනම මත අවදානම් ආවරණය සඳහා රක්ෂකයන් දෙදෙනකු හෝ කිහිප දෙනෙකු රක්ෂිතයා සමඟ අති කර ගන්නා තනි ගිවිසුමක්.

කොමිස්
රක්ෂකයාගේ නිස්පාදනයක් විණීම හෝ සේවාකරණය වෙනුවෙන් තැරැව්කරුවකුට හෝ රක්ෂණ නියෝජිතයකුට කරන ගෙවීමක්.

විලම්භිත අත්කර ගැනීමේ පිරිවැය - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
වාර්ෂික පදනමට ගිණුම්කරණයේ දී එක් ගිණුම් වර්ෂයක සිට ඊළඟ ගිණුම් වර්ෂයට ගෙන යා යුතු, අවදානම හා සම්බන්ධ ගිවිසුම්වල කල් ඉකුත් නොවූ කාලය සඳහා අදාළ වන අත්පත් කර ගැනීමේ පිරිවැය.

අත්හිටවූ මෙහෙයුම්
නිල සැලැස්මකට අනුව සම්පූර්ණ අංශයක් පරිපාලිත හෝ සමාගමක කොටසක් අදාළ සමාගමෙන් ඉවත් කිරීම.

ඉපැයූ වාරික
ගිණුම් කාලපරිච්ඡේදයක ආරම්භයේ දී සහ අවසානයේ දී නොඉපැයූ වාරික ප්‍රතිපාදන වෙනුවෙන් සැලසුම් කළ ලිඛිත වාරික මුදල්.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
ගිනි, මුහුදු, උවදුරු, මෝටර් වාහන හෝ මිශ්‍ර රක්ෂණ ව්‍යාපාර කටයුතු එකක් හෝ කිහිපයක් තනිව හෝ බද්දට පවත්වාගෙන යාම, ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ දී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු සම්බන්ධව ලද මුළු වාරික හෝ ලැබිය යුතු මුළු වාරික ප්‍රතිරක්ෂණ කටයුතු සඳහා ලැබිය යුතු වාරික ද සහිත අගය

දළ වාරිකය
වට්ටම්, ආපසු ගෙවීම් හා ප්‍රතිදාන අඩුකිරීමෙන් පසුව එහෙත් ඉඩ දෙන ලද ප්‍රතිරක්ෂණ සඳහා රක්ෂණකරුවකු විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු වාරික කිසිවක් අඩුකිරීමට පෙර වූ වාරිකය.

රක්ෂණ අවදානම
රක්ෂණයට බඳුන් වූ සිද්ධිය වීම, හිමිකම් පෑම්වල වටිනාකම හෝ හිමිකම් ගෙවීම් සිදුවන කාලය පිළිබඳව පවතින අවිනිශ්චිතතා.

රක්ෂකයා
2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස සංස්ථාපිත කර ඇති සහ 2000 අංක 143 දරන රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගමකි.

අවලංගු වූ රක්ෂණාවරණ
වාරික මුදල් නොගෙවීම මත සහන කාලයද අවසානයේදී අවලංගු වූ රක්ෂණාවරණ

දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතු
මරණයක හෝ මනුෂ්‍ය ජීවිතයට බලපාන යම් අවිනිශ්චිත සිද්ධියක් වූ විට මුදල් ගෙවීම සඳහා සහතික කෙරෙන ගිවිසුම ද ඇතුළුව මනුෂ්‍ය ජීවිතය පිළිබඳ රක්ෂණ ගිවිසුම්වලට සහ මනුෂ්‍ය ජීවිතය මත රඳා සිටිමින් යම් කාල පරිච්ඡේදයක් සඳහා වාරික ගෙවීමට යටත් ගිවිසුම්වලට එළැඹීමේ හෝ එවැනි ගිවිසුම් පවත්වාගෙන යාමේ ව්‍යාපාරයකි.

වන්දි අනුපාතය
උපයාගත් වාරික සහ වන්දි වියදම් අතර අනුපාතය

කල්පිරීම
දීර්ඝකාලීන රක්ෂණ ඔප්පුවක් යටතේ එහි වගන්ති ප්‍රකාරව කාලය අවසන් වීමෙන් රක්ෂිත මුදල් ගෙවිය යුතු අවස්ථාව

ශුද්ධ හිමිකම් පෑම් අනුපාතය හෝ ශුද්ධ අලාභ අනුපාතය
රක්ෂකයන් විසින් ශුද්ධ ආදායම් (අදාළ ප්‍රතිරක්ෂණයෙන් අඩු කළ පසු) සම්බන්ධ ශුද්ධ අලාභ වියදම් නිරූපණය කිරීමට උපයෝගී කර ගනු ලබන සූත්‍රයකි.

පාරිභාෂික ශබ්ද මාලාව

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්}}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \times 100$$

ශුද්ධ ඒකාබද්ධ අනුපාතය - ජීවිත නොවන
ශුද්ධ අලාභ අනුපාතය සමඟ ශුද්ධ වියදම් අනුපාතය සම්බන්ධ කර රක්ෂකයාගේ මෙහෙයුම්වල ලාභදායීත්වය මෙයින් නිරූපණය වෙයි. මෙම ඒකාබද්ධ අනුපාතය ගණනය කිරීමේ දී ආයෝජන අදායම් සැලකිල්ලට නොගැනෙයි.

$$\frac{\text{දරන ලද ශුද්ධ හිමිකම් පෑම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම}} \quad \frac{\text{වියදම්} \times 100}{\text{ඉපැයූ ශුද්ධ වාරික ආදායම්}}$$

ශුද්ධ ඉපැයූ වාරික - සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු
ප්‍රතිරක්ෂණ වාරික සහ නොඉපැයූ වාරිකවල වැඩිවීම සහ අඩුවීම සඳහා ගළපන ලද දළ ලිඛිත වාරික ආදායම

ශුද්ධ වියදම් අනුපාතය - ජීවිත නොවන
ආදායම් අත්පත් කර ගැනීමේ සහ පරිපාලන වියදම් (උදා :- කොමිස්, බදු, සේවක පරිවැය, අලෙවිකරණ සහ මෙහෙයුම් වියදම්) අදාළ කර ගැනීම සඳහා රක්ෂණ සමාගම් විසින් යොදා ගනු ලබන සූත්‍රයකි.

සහභාගීත්වය රහිතව ඔප්පුව - ජීවිත රක්ෂණ ව්‍යාපාර කටයුතු
ජීවිත රක්ෂණ ව්‍යාපාරය කටයුතුවල දී ඔප්පු හිමියාට අදාළ ජීවිත රක්ෂණ අරමුදලේ අතිරික්තයට හිමිකම ලැබීමට ගිවිසුම්මය අයිතියක් නොමැති රක්ෂණ ඔප්පු.

ඔප්පුව
රක්ෂණ ගිවිසුමක නියම හා කොන්දේසි ඇතුළත් කර ඇති ලියැවිල්ලකි.

ඔප්පු හිමියා
රක්ෂණකරු සමඟ අදාළ ගිවිසුමට පැමිණ අදාළ රක්ෂණ ඔප්පුවේ තත්කාලීන නෛතික හිමිකරුවන තැනැත්තා.

ඔප්පු ණය
ජීවිත රක්ෂණ ඔප්පුවක පවාරන අගය ඇපයට තබමින් ඔප්පු හිමියකු විසින් රක්ෂකයාගෙන් ගනු ලබන ණය මුදලකි. මෙම ණය මුදල සාමාන්‍යයෙන් ඔප්පුවේ වර්තමාන පවාරන වටිනාකමේ ප්‍රතිශතයක් සඳහා සීමාවන අතර එවැනි ණය මුදල් සඳහා පොලී අය කරනු ලැබේ.

ප්‍රාථමික රක්ෂකයා
රක්ෂණ වාරිකයක් වෙනුවෙන් අවදානම් බාර ගනු ලබන්නා වූ ද රක්ෂණ ඔප්පු හිමියා සමඟ සෘජු ගිවිසුම්ගත සම්බන්ධතාවක් පවත්වාගනු ලබන්නා වූ ද රක්ෂණ සමාගම් (තනි පුද්ගලයන්, ආයතන හෝ සංවිධාන)

මෙහෙයුම් ලාභය
ආයෝජන ආදායම, ශුද්ධ ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ආදායම් සැලකිල්ලට ගත් පසු සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවලින් උපයා ගන්නා ලද ලාභය

ප්‍රතිරක්ෂණය
එක් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂකයා) විසින් කිසියම් ප්‍රතිඡ්ඨාවක් සමඟ අනෙකුත් පාර්ශ්වයක් (ප්‍රතිරක්ෂිතයා - ප්‍රාථමික රක්ෂණකරු එළැඹුණු රක්ෂණ ඔප්පුවක හෝ ඔප්පුවල වගකීම්වලින් කොටසක් හෝ මුළුමණින්ම හානිපූරණය කිරීමට ඇති කර ගනු ලබන එකඟතාවකි.

ප්‍රතිරක්ෂණ කොමිස්
ප්‍රතිරක්ෂකයාට ගෙවූ හෝ ගෙවිය යුතු වාරිකවලට අදාළව ලැබුණු හෝ ලැබිය යුතු කොමිස් මුදල්

භාරගනු ලබන ප්‍රතිරක්ෂණ
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් භාර ගැනීම

භාර දෙනු ලබන ප්‍රතිරක්ෂණ
ප්‍රතිරක්ෂණ ගිවිසුමක් යටතේ අවදානම් ස්ථානගත කිරීම

ප්‍රතිරක්ෂණ ලාභ කොමිස්
ප්‍රතිරක්ෂිත ගිවිසුමක් යටතේ ප්‍රතිරක්ෂිතයා විසින් උපයන ලද ලාභය (ප්‍රතිරක්ෂණ ගිවිසුමෙහි නිර්වචනය කරනු ලැබ ඇති පරිදි) පාදක කරගෙන ප්‍රතිරක්ෂකයකුගෙන් ප්‍රාථමික රක්ෂිතයා ලද හෝ ලැබිය යුතු කොමිස් මුදල්.

රඳවා ගැනීම
භාරගනු ලැබ අවදානමින් රක්ෂණකරු / ප්‍රතිරක්ෂණකරු විසින් ප්‍රතිරක්ෂණය කරනු නොලබන / පවරනු නොලබන කොටස හෙවත් ස්වකීය ගිණුම වෙනුවෙන් රඳවාගත් ආදායම.

අවදානම් පාදක ප්‍රාග්ධනය
අවදානම් පාදක කරගෙන නුබුන්වත්භාවය තක්සේරු කිරීම සඳහා වූ ප්‍රවේශයක් සඳහා ව්‍යාපාරයේ තත්‍ය මූල්‍ය ප්‍රවාහය මත පදනම් වූවකි.

නුබුන්වත් ආන්තිකය - ජීවිත
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති, 2002 නුබුන්වත් ආන්තිකය (දිගුකාලීන රක්ෂණය) පිළිබඳ රීතියෙන් නිර්වචනය කරනු ලැබ ඇති පරිදි දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යනු ලැබීමට අවශ්‍ය වත්කම්වල අගය සහ බැරකම්වල අගය යන සංඛ්‍යා දෙකෙහි වෙනස.

නුබුන්වත් ආන්තිකය - ජීවිත නොවන (සාමාන්‍ය රක්ෂණය)
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත පනතෙහි වගන්ති අංක 26 ප්‍රකාරව පනවා ඇති, 2004 නුබුන්වත් ආන්තිකය (සාමාන්‍ය රක්ෂණය) පිළිබඳව රීතියෙන් නිර්වචනය කර ඇති පරිදි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල යෙදෙන රක්ෂකයකු විසින් පවත්වාගෙන යාමට අවශ්‍ය කෙරෙන වත්කම්වල අගය සහ බැරකම්වල අගය සහ සංඛ්‍යාවන් දෙකෙහි වෙනස.

පවාරණ අගය
ජීවිත රක්ෂණයක් සම්බන්ධව එම රක්ෂණ ඔප්පුව කල්පිරීමට පෙර ඔප්පු හිමියකු ජීවිත රක්ෂණය අත්හිටුවීමේ දී රක්ෂකයා විසින් ඔප්පු හිමියාට ගෙවනු ලැබිය යුතු මුදල පවාරණ අගයක් ඇතිවීම සඳහා අවම වශයෙන් වසර 3ක් වත් අඛණ්ඩව එම ජීවිත රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මකව පැවතිය යුතුය.

තාක්ෂණික සංචිතය
රක්ෂණ ව්‍යාපාරය හා සෘජුවම සම්බන්ධ අවිනිශ්චිත වගකීම් වේ. මෙම වෙන්කිරීම් රක්ෂණ ගිවිසුමේ සඳහන් පොරොන්දු ඉටුකරන බවට තහවුරු කරගැනීම සඳහා වේ.

ප්‍රාරක්ෂණ ලාභය
ආයෝජන ආදායම සහ අනෙකුත් ආදායම් සැලකිල්ලට නොගෙන සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ගනුදෙනු මඟින් උත්පාදනය කර ගනු ලබන තාක්ෂණික ලාභය.

නොඉපැයූ වාරිකය
ගෙවීමට නියමිත ඇතැයි ගිණුම්වලට මේ වන විටත් ඇතුළත් කරනු ලැබ ඇති නමුත් ශේෂ පත්‍රයේ දිනයෙන් අනතුරුව එළැඹෙන යම් අවදානම් කාල සීමාවකට අදාළ වාරික මුදල්වල කොටසක් මෙයින් නියෝජනය වෙයි.

නොඉපැයූ වාරික සංචිතය
දැනටමත් ක්‍රියාත්මකව පවතින රක්ෂණ ඔප්පු යටතේ අනාගතයේ දී උද්ගත විය හැකි හිමිකම් පෑම් සඳහා ප්‍රතිපාදනය කිරීම අරභයා සාමාන්‍ය රක්ෂණකරු විසින් පවත්වාගෙන යනු ලබන අරමුදලකි.

කල් ඉකුත් නොවූ ආදායම් සංචිතය
ශේෂ පත්‍ර දිනට පෙර ගිවිසුම් හමාර කළ නමුත් ශේෂ පත්‍ර දිනයෙන් පසුව ඇති විය හැකි හිමිකම් පෑම්, වන්දි සහ වියදම් සඳහා ඇස්තමේන්තු කළ අගයෙන් මේ දක්වා නොඉපැයූ වාරික වශයෙන් (කිසියම් විලම්භිත අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එය අඩු කළ පසු) ප්‍රතිපාදනය කරන ලද අගය ඉක්මන ප්‍රමාණය

පොදු තොරතුරු

කාර්යාල ලිපිනය
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01
ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9
ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

නෛතික ස්වභාවය
2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි විගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය 2001 පෙබරවාරි 23 දින රජයේ ගැසට් නිවේදන අංක 1172/27 මගින් බලය දී ඇති පරිදි 2001 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහෙයුම් කටයුතු අරඹන ලදී.

මණ්ඩලයේ අරමුණ සහ වගකීම්
ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර අවංකව, වෘත්තීයමය වශයෙන් හා විචක්ෂණශීලීභාවයෙන් පවත්වාගෙන යාම තුළින් ඔප්පු හිමියන්ගේ සහ අනාගත ඔප්පු හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කිරීම.

ගිණුම් වර්ෂය
දෙසැම්බර් 31 දක්වා

විගණකවරු
විගණකාධිපති

බැංකුකරුවන්
ලංකා බැංකුව

විගණන කමිටුව
පුෂ්පා වෙල්ලප්පිලි මෙනෙවිය
ජෙරමි බෝලින් මහතා
ආචාර්ය ඒ. ඒ. ශබීර් ගුලාම්හුසේන් මහතා

Designed & Printed by Ceylon Printers PLC

IBSL
INSURANCE
BOARD OF SRI LANKA

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2396184-9 ෆැක්ස් : +94 11 2396190
විද්‍යුත් ලිපිනය : info@ibsl.gov.lk වෙබ් අඩවිය : www.ibsl.gov.lk